328 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 328 - இல. 02
Volume 328 - No. 02

2026 ජුලි 08වන බදාදා
2026 யூலை 08, புதன்கிழமை
Wednesday, 08th July, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
- පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ළමා ආරක්ෂාව, ශාරීරික දණ්ඩනය සහ නීතිමය පසුබිම සහ ධනාත්මක ශික්ෂණයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන [තීරුව 201]
- ගරු දයාසිරි ජයසේකර මහතා විසින් මහජන පෙත්සම් පිළිබඳව 2026.06.24 දින මතු කරනු ලැබූ කරුණු [තීරුව 202]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 203]

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 207]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 207]

**ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න** [තීරු 208-223]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 224-241]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
- උතුරු සහ නැඟෙනහිර පළාත්වල හමුදාව විසින් අත්පත් කරගෙන ඇති සිවිල් ජනතාවට අයත් ඉඩම් නිදහස් කිරීම [තීරුව 242]

**මන්නාරම මහ රෝහල සඳහා CT scan යන්ත්‍රයක් ලබාදීම:**
- සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 248]

**වරප්‍රසාද:**
- ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා නොදීම [තීරුව 250]

**ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත:**
- නියෝග [තීරු 257-329]

**රේගු ආඥාපනත:**
- යෝජනා සම්මතය [තීරුව 329]

**මෝටර් වාහන පනත:**
- නියෝග [තීරුව 329]

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත:**
- නියම [තීරුව 330]

**කල් තැබීමේ යෝජනාව:**
- විදෙස්ගත ශ්‍රමිකයින් මුහුණ දෙන ගැටලු [තීරු 331-370]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
- முன்பள்ளிக் கல்வி தொடர்பான தேசியக் கொள்கை மற்றும் சிறுவர் பாதுகாப்பு, உடல் ரீதியான தண்டனை மற்றும் சட்டப் பின்புலம் மற்றும் நேர்மறையான ஒழுக்கத்தின் முக்கியத்துவம் குறித்த விழிப்புணர்வு நிகழ்ச்சித்திட்டம் [ப: 201]
- 2026.06.24ஆம் திகதி மாண்புமிகு தயாசிறி ஜயசேக்கரவால் எழுப்பப்பட்ட பொது மனுக்கள் பற்றிய விடயம் [ப: 202]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 203]

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 207]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 207]

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்** [ப: 208-223]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 224-241]

**தனி அறிவித்தல் மூல வினா:**
- வடக்கு, கிழக்கு மாகாணங்களில் இராணுவத்தினரால் கையகப்படுத்தப்பட்டுள்ள பொதுமக்களின் காணிகளை விடுவித்தல் [ப: 242]

**மன்னார் பொது வைத்தியசாலைக்கு CT scan இயந்திரம் வழங்கல்:**
- சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று [ப: 248]

**சிறப்புரிமை:**
- நிலையியற் கட்டளை 27(2)இன்கீழ் வினா எழுப்ப அனுமதி வழங்காமை [ப: 250]

**கொடுப்பனவு மற்றும் தீர்ப்பனவு முறைமைகள் சட்டம்:**
- ஒழுங்குவிதிகள் [ப: 257-329]

**சுங்கக் கட்டளைச் சட்டம்:**
- தீர்மானம் [ப: 329]

**மோட்டார் வாகனச் சட்டம்:**
- ஒழுங்குவிதிகள் [ப: 329]

**இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்:**
- கட்டளைகள் [ப: 330]

**ஒத்திவைப்புப் பிரேரணை:**
- புலம்பெயர் தொழிலாளர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகள் [ப: 331-370]

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
- Awareness Programme on National Policy on Preschool Education and Child Protection, Corporal Punishment and Related Laws and Importance of Positive Disciplining [Col. 201]
- Issues Raised by Hon. Dayasiri Jayasekara on 24.06.2026 Regarding Public Petitions [Col. 202]

AUDITOR-GENERAL'S REPORT [Col. 203]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 207]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 207]

QUESTIONS POSED TO HON. PRIME MINISTER [Cols. 208-223]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 224-241]

QUESTION BY PRIVATE NOTICE:
- Release of Civilian Lands held by Military in Northern and Eastern Provinces [Col. 242]

PROVISION OF CT SCANNER FOR GENERAL HOSPITAL, MANNAR:
- Statement by Minister of Health and Mass Media [Col. 248]

PRIVILEGE:
- Refusal to Grant Approval to Raise Question under Standing Order No. 27(2) [Col. 250]

PAYMENT AND SETTLEMENT SYSTEMS ACT:
- Regulations [Cols. 257-329]

CUSTOMS ORDINANCE:
- Resolution [Col. 329]

MOTOR TRAFFIC ACT:
- Regulations [Col. 329]

SRI LANKA EXPORT DEVELOPMENT ACT:
- Orders [Col. 330]

ADJOURNMENT MOTION:
- Issues Faced by Migrant Workers [Cols. 331-370]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ජූලි 08වන බදාදා***
*2026 யூலை 08, புதன்கிழமை*
*Wednesday, 08th July, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ළමා ආරක්ෂාව, ශාරීරික දණ්ඩනය සහ නීතිමය පසුබිම සහ ධනාත්මක ශික්ෂණයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
### முன்பள்ளிக் கல்வி தொடர்பான தேசியக் கொள்கை மற்றும் சிறுவர் பாதுகாப்பு, உடல் ரீதியான தண்டனை மற்றும் சட்டப் பின்புலம் மற்றும் நேர்மறையான ஒழுக்கத்தின் முக்கியத்துவம் குறித்த விழிப்புணர்வு நிகழ்ச்சித்திட்டம்
### AWARENESS PROGRAMME ON NATIONAL POLICY ON PRESCHOOL EDUCATION AND CHILD PROTECTION, CORPORAL PUNISHMENT AND RELATED LAWS AND IMPORTANCE OF POSITIVE DISCIPLINING

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026.05.05 දින පැවති කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේ දී එළඹි තීරණය පරිදි පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ළමා ආරක්ෂාව, ශාරීරික දණ්ඩනය සහ නීතිමය පසුබිම සහ ධනාත්මක ශික්ෂණයේ වැදගත්කම පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2026 ජූලි 08 බදාදා, එනම් අද දින පෙරවරු 11.30 සිට පස්වරු 1.30 දක්වා පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 01හිදී පැවැත්වීමට නියමිත බැවින් ඒ සඳහා සහභාගි වන ලෙස සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කාරුණිකව ආරාධනය කරනු කැමැත්තෙමි.

## II
### ගරු දයාසිරි ජයසේකර මහතා විසින් මහජන පෙත්සම් පිළිබඳව 2026.06.24 දින මතු කරනු ලැබූ කරුණු
### 2026.06.24ஆம் திகதி மாண்புமிகு தயாசிறி ஜயசேக்கரவால் எழுப்பப்பட்ட பொது மனுக்கள் பற்றிய விடயம்
### ISSUES RAISED BY HON. DAYASIRI JAYASEKARA ON 24.06.2026 REGARDING PUBLIC PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශයට භාර දෙන ලද පෙත්සම් මේ දක්වා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රමාදවීම සම්බන්ධව එතුමා විසින් 2026.06.24 දින මෙම සභාවේ දී මතු කරනු ලැබූ කරුණු පිළිබඳව පැහැදිලි කරන්නට කැමැත්තෙමි.

මේ සම්බන්ධව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශයෙන් කරුණු විමසන ලද අතර, ඒ අනුව ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් භාර දෙන ලද පෙත්සම් පිළිබඳව 2026.06.23 දින මන්ත්‍රීතුමා විසින් දූරකථනය මඟින් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශයෙන් කරුණු විමසා ඇති බවත්, ඒ අනුව මන්ත්‍රීතුමා විසින් දසවැනි පාර්ලිමේන්තුවට අදාළව පෙත්සම් 22ක් යොමු කර ඇති බවත්, ඉන් 08ක් මෙම වර්ෂය තුළ ද, ඉතිරිය 2025 වර්ෂය තුළ ද ඉදිරිපත් කර ඇති බවත් දැනුම් දී ඇති අතර, මෙම වර්ෂයට අදාළව ලැබී ඇති පෙත්සම් කථානායකවරයාගේ අනුමතියට යොමු කිරීම පිණිස අදාළ කාර්යාලයීය කටයුතු කරමින් පවතින බවත් මන්ත්‍රීතුමාට දැනුම් දී ඇත. තවද, එහිදී මහජන පෙත්සම් ගරු කථානායකතුමාගේ අනුමතියට යොමු කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධව ද මන්ත්‍රීතුමාහට කෙටි පැහැදිලි කිරීමක් ද සිදු කර ඇත.

එබැවින්, ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් මෙම සභාව තුළ කරුණු දැක්වීමේ දී මහජන පෙත්සම් 10ක් අදාළ කාර්යාලය මඟින් සිදු කළ යුතු කටයුතු නිමකොට කථානායකවරයාගේ අනුමතිය සඳහා කථානායක කාර්යාලය වෙත යවා ඇති බවට කරන ලද ප්‍රකාශය නිවැරදි නොවන බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මම ඔය තොරතුරු ගත්තේ වෙන කාගෙන්වත් නොවෙයි. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් තමයි කිව්වේ, ඔවුන් මේ වෙනකොට මහජන පෙත්සම් 10ක් කථානායකතුමාගේ අත්සනට යවලා තිබෙනවා කියලා. මේක වැරදියි කියලා කියන්න එපා, ගරු කථානායකතුමනි. මොකද, ඒ නිලධාරින්ගෙන් අහලා තමයි මම එහෙම කිව්වේ. නැතිව නිකම් කිව්වේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒ නිලධාරින්ගෙන් අහලා එහෙම කිව්වාට, අපි ඒ නිලධාරින්ගෙන් ඇහුවාම ඔවුන් අපට ලබා දීපු තොරතුරු තමයි මේවා. ඉතින් එහෙම නම් ඔබතුමා කරුණු විකෘති කිරීමක් කරනවා කියලායි මට නම් හැඟෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, නැහැ, ඒක වැරදියි. ඒකයි මම කිව්වේ. ගරු කථානායකතුමනි, එහෙම නම් ඒක ගැන පරීක්ෂණයක් කරන්න. මොකද, ඒ තොරතුරු ඒ නිලධාරින් තමයි මට දුන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දැනගැනීමටයි මම මේක කියන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම දන්නේ නැහැ, ඉතින්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අහන්න, අහන්න. මේක අහගන්න. මන්ත්‍රීතුමන්ලාට එන පෙත්සම් මගේ මේසයට ආවාම මම උදේ office එකට ආවොත් මෙතැනට එන්න කලින් ඒවාට අත්සන් කරනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක මම පිළිගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අහගන්න, ගරු මන්ත්‍රීතුමනි. මම සාමාන්‍යයෙන් මගේ රාජකාරි ජීවිතයේදී එහෙමයි කටයුතු කරන්නේ. හවස මගේ office එකෙන් එළියට යන්න කලින් තවත් පෙත්සම් තිබුණොත්, ඒවාටත් අත්සන් කරනවා. ඒ හින්දා මේ සම්බන්ධව විවාදයකට යන්න අවශ්‍යතාවක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XLIII කොටස සහ සිව්වැනි කාණ්ඩයේ XXVII, XXVIII, XXIX හා XXX කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Hon. Speaker, I present the -

(i) Annual Performance Report of the Department of Project Management and Monitoring for the year 2025;

(ii) Performance Report of the Department of Trade and Investment Policy for the year 2025;

(iii) Performance Report of the Department of National Budget for the year 2025;

(iv) Performance Report of the Department of Imports and Exports Control for the year 2025;

(v) Performance Report of the Department of Public Finance for the year 2025;

(vi) Annual Performance Report of the Department of External Resources for the year 2025;

(vii) Performance Report of the Department of State Accounts for the year 2025; and

(viii) Performance Report of the Ministry of Finance, Planning and Economic Development for the year 2025.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I also present the -

(i) Annual Performance Report of the Public Service Commission for the year 2025; and

(ii) Annual Performance Report of the Commission to Investigate Allegations of Bribery or Corruption for the year 2025.

I move that these Reports be referred to the Committee on Constitutional Affairs.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කෘෂිකර්ම සහ පශු සම්පත් අංශවල වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, 2025ஆம் ஆண்டுக்கான மீன்வளம் மற்றும் நீர்வாழ் வளங்கள் திணைக்களத்தின் செயலாற்றுகை அறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

இவ்வறிக்கை சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமென நான் பிரேரிக்கின்றேன்.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2025 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2025 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2025 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iv) 2025 වර්ෂය සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 141, 143, 144, 157අ, 168 සහ 190 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මාර්තු 19 දිනැති අංක 2480/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) (235 අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වගන්තිය යටතේ යෝජනා සම්මතය (2026 මාර්තු 03 දිනැති අංක 2478/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද); සහ

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ නියම (2026 මාර්තු 03 දිනැති අංක 2478/04 දරන සහ 2026 මාර්තු 10 දිනැති අංක 2479/38 දරන අති විශේෂ ගැසට්පත්‍රවල පළ කරන ලද)

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, කුරුණෑගල, මල්කඩුවාව, මල්කඩුවාව රවුම් පාර, රුවන්ගිරි උයන, අංක 49/1 යන ලිපිනයෙහි පදිංචි එල්.සී.එස්. ලියනගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
ගරු කථානායකතුමනි, කඹුරුගමුව, තල්අරඹ, මාරගහකොරටුව යන ලිපිනයෙහි පදිංචි එච්.ඩබ්ලිව්. දුමින්ද ඉරෝෂමන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, கல்முனை, நட்பிட்டிமுனை-04, ஹிஜ்ரா வீதி, இலக்கம் 331/பீ எனும் முகவரியில் வசிக்கும் திரு. எச்.எம். அசாம் என்பவரிடமிருந்து கிடைக்கப்பெற்ற மனுவை நான் சமர்ப்பிக்கின்றேன்.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ප්‍රශ්නය මෙයයි.

01. ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 16ට අඩු දරුවන් සඳහා සමාජ මාධ්‍ය තහනම් කිරීමක් හෝ නොඑසේ නම් සීමා කිරීමක් පිළිබඳව රජයේ අවධානය යොමු වී තිබේද?

02. එසේ නම් ඒ සඳහා වන රජයේ ප්‍රතිපත්තිය කුමක්ද?

03. දරුවන් සඳහා සමාජ මාධ්‍ය තහනම් කිරීම හෝ සීමා කිරීම සම්බන්ධයෙන් මේ වනවිට යම් ඇගැයීමක් හෝ අවශ්‍ය පාර්ශ්ව සමඟ සාකච්ඡාවක් සිදු කර තිබේද? එසේ නම් ඒ කවුරුන් සමඟද? ඒවායේ ප්‍රගතිය කවරේද?

04. වත්මන් රජය බලයට පත්ව වසර දෙකකට ආසන්න කාලයක් ගතව ඇති පසුබිමක ළමයින්ගේ සුරක්ෂිතතාව සහ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ජාතික මට්ටමේ සාධනීය ක්‍රියාමාර්ග මොනවාද? ඒවායේ ප්‍රගතිය කුමක්ද?

05. දරුවන් සඳහා සමාජ මාධ්‍ය සීමා කිරීමක් කළ යුතු බවට මා විසින් ඉදිරිපත් කර ඇති පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත මෙහිදී අවධානයට ලක් කරන්නේ ද? නොඑසේ නම් ඒ මන්ද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. ඔව්. මේ සම්බන්ධව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අවධානය යොමුව ඇත. තවද, අන්තර්ජාලය හරහා සිදුවන හිංසනයන්ගෙන් දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් වර්ල්ඩ් විෂන් ආයතනය සමඟ එක්ව ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව සඳහා සාර්ක් සංවර්ධන අරමුදලේ මූල්‍ය අනුග්‍රහය ලබා ගැනීම සඳහා මූලික කටයුතු සිදු කරමින් පවතී.

02. රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා මූලික සාකච්ඡා මේ වන විටත් පවත්වනු ලබයි. තවද, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් යුනිසෙෆ් - UNICEF - සංවිධානයේ සහයෝගය ඇතිව ගුරුවරුන් සඳහා ඩිජිටල් නිපුණතා රාමුවක් සකස් කර ඇත. එහි අන්තර්ගත මොඩියුල හතෙන් එකක් Online Safety පිළිබඳ මොඩියුලයකි. මෙම මොඩියුල යටතේ "පුහුණුකරුවන් පුහුණු කිරීමේ" වැඩසටහන යටතේ පුහුණුකරුවන් 750ක් පමණ පුහුණු කර තිබේ. අධ්‍යාපන ඩිජිටල් පරිවර්තනය සඳහා වන කාර්ය සාධක බලකායේ මඟපෙන්වීම යටතේ, එම පුහුණුකරුවන් විසින් සියලුම අධ්‍යාපන කලාප ආවරණය වන පරිදි තොරතුරු තාක්ෂණ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථාන 106ක් හරහා සියලුම විෂයන්ට අදාළ ගුරුවරුන් පුහුණු කිරීම මේ වන විට ආරම්භ කර ඇත. තවද, පාසල් සිසුන් සඳහා වන Online Safety, Cyber Security සහ Digital Well-being පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් කාර්යසාධක බලකාය විසින් සකස් කරමින් පවතී. මෙම මාර්ගෝපදේශ සංග්‍රහය මේ වසරේ සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් කෙරෙනු ඇත.

එමෙන්ම, සිසුන් සහ ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා "e-තක්සලාව" වෙබ් අඩවිය තුළ ද Cyber Security පිළිබඳ දූරස්ථ අධ්‍යාපන පාඨමාලා මොඩියුලයක් ඇතුළත් කර ඇත. මීට අමතරව, අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව විසින් පළාත් මට්ටමින් Cyber Security දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් ද පවත්වා තිබේ.

03. වයස අවුරුදු 16ට අඩු දරුවන් සඳහා සමාජ මාධ්‍ය භාවිතය තහනම් කිරීම හෝ සීමා කිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා වන මූලික සාකච්ඡාවක් පහත ආයතන සම්බන්ධ කර ගනිමින් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇත.

- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
- සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
- ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා පොලීසිය
- ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය -SLCERT-
- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය -ICTA-
- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
- මානසික සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- කොළඹ විශ්වවිද්‍යාලය
- ලයිසියම් ජාත්‍යන්තර පාසල

එම සාකච්ඡාවේදී දරුවන්ගේ සමාජ මාධ්‍ය භාවිතය හේතුවෙන් ඇතිවිය හැකි සමාජයීය, මානසික හා සෞඛ්‍යමය බලපෑම්, ඩිජිටල් ආරක්ෂාව සහ ජාත්‍යන්තර අත්දැකීම් පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලද අතර, පහත කරුණු සම්බන්ධයෙන් විශේෂ වශයෙන් සාකච්ඡා කොට ඇත.

i. වයස අවුරුදු 16ට අඩු දරුවන්ගේ සමාජ මාධ්‍ය භාවිතය අවම කිරීම සඳහා ජාතික මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම.

ii. දරුවන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් Brain Health යන සංකල්පය පදනම් කර ගනිමින් ජාතික මට්ටමේ දැනුවත් කිරීමේ කතිකාවතක් ආරම්භ කිරීම.

ඒ අනුව දැනට කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය මඟින් පවුල් සවිබලගැන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා නියමු වැඩසටහනක් ආරම්භ කර ඇත. එමඟින් අවුරුදු 18ට අඩු දරුවන් සිටින පවුල්වල ජංගම දුරකථනවලට ඇබ්බැහි වූ දරුවන් ඉන් මුදා ගැනීම සඳහා ක්‍රමවේද හඳුන්වා දී ක්‍රියාත්මක කරන අතර, නියමු ව්‍යාපෘතිවල සාර්ථක ප්‍රතිඵල ලැබී ඇති බව වාර්තා වී ඇත. ඒ සඳහා රජරට විශ්වවිද්‍යාලයේ මහාචාර්ය දුමින්ද ගුරුගේ මහතා අවශ්‍ය සම්පත්දායකත්වය හා තාක්ෂණික මඟ පෙන්වීම ලබා දෙනු ලැබේ.

04. අංක අමප/25/0816/819/008 හා 2025.05.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (ඇමුණුම) ප්‍රකාරව ළමා අපයෝජන සිද්ධීන් අවම කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් යුත් බහු ආංශික යාන්ත්‍රණයක් පහත ආයතන සම්බන්ධ කර ගනිමින් ස්ථාපනය කරන ලදී. දරුවන්ට සිදු වන අපයෝජන සහ සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ගෙන් දරුවන් ආරක්ෂා කිරීම සඳහා මැදිහත් වන සියලු රාජ්‍ය ආයතන ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම මෙම යාන්ත්‍රණය පිහිටුවීමේ මූලික අරමුණ වී ඇත. එම ආයතන පහත පරිදි වේ.

ඇමුණුම **සභාගත*** කරමි.

- කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා පොලීසිය
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
- සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
- අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
- ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තවද, අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතන මැදිහත්වීමෙන් ළමයින්ගේ සුරක්ෂිතතාව සහ ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද කටයුතු කරමින් පවතී.

i. "දිවියට සවියක්" වැඩසටහන ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සිට සමාජගත වූ අවුරුදු 50 දක්වා වූ පුද්ගලයින්ට නිවසක් නොමැතිකම නිසා අනාරක්ෂිතභාවයට පත් වූ ළමයින් වෙනුවෙන් නිවාස මිලට ගැනීමට/ නිවාස ඉදිකිරීමට/ ඉඩම් මිලට ගැනීමට/ නිවාස අලුත්වැඩියා කර ගැනීම සඳහා රුපියල් මිලියන 2ක් ලබා දීම.

ii. අර්ථ වැඩසටහන ආයතනගත ළමුන්, "දිට්වා" සුළි කුණාටුවෙන් මව පියා දෙදෙනාම හෝ දෙදෙනාගෙන් එක් අයෙක් අහිමි ළමුන් හා අනාරක්ෂිත ළමුන් වෙනුවෙන් මාසිකව රුපියල් 5,000ක් ලබා දීම.

iii. උප්පැන්න සහතිකය නොමැති ළමුන්ට උප්පැන්න සහතික ලබා දීම.

iv. පාසල් කාල වේලාවෙන් පසුව අනාරක්ෂිත වන ළමුන් සඳහා "සෙනෙහස" නමින් නියමු ව්‍යාපෘතියක් රත්මලාන-වෙඩිකන්ද ග්‍රාම නිලධාරි වසමේ හඳුනාගත් අනාරක්ෂිත ළමුන් 50ක් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ඒ සඳහා දැනට වසා ඇති පාසලක් හඳුනා ගෙන ඇති අතර, ඒ වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත. අවුරුදු 5-16 පාසල් ළමුන් පාසල් කාලයෙන් පසුව මෙම නියමු ව්‍යාපෘතිය සඳහා යොමු කර ගැනීමට අපේක්ෂා කෙරේ.

v. විකල්ප රැකවරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම යටතේ foster care නියමු ව්‍යාපෘතිය දකුණු පළාතේ සිදු කිරීම.

vi. ළමයින් ආයතනගත වූ අවස්ථාවේ පටන් සමාජගත වීම දක්වා වූ ක්‍රියාවලිය ආරම්භක තක්සේරුවකින් ආරම්භ කර ළමයින්ගේ අනාගතය සාධනීය තත්ත්වයකට ළඟා කරවීම සඳහා ආකෘතියක් ජාතික මට්ටමින් සියලු ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට හඳුන්වා දීම.

vii. ආයතනගත ළමුන් සමාජගත කිරීමේ පෙර සූදානම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ළමයින්ගේ ජීවන කුසලතා, පෞරුෂත්වය, රැකියා අවස්ථා හඳුන්වා දී ඔවුන්ගේ හැකියාවන් හා ලැදියාවන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සමාජගත කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීම.

viii. කායික දණ්ඩනය වැළැක්වීම පිළිබඳ නීතිය පාර්ලිමේන්තුගත කිරීම.

ix. ජාතික ළමා ආරක්ෂණය ප්‍රතිපත්තිය පිළිබඳ පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025 - 2029 අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව ක්‍රියාත්මක කිරීම.

x. දරුවන්ට අධිකරණයට නොගොස් දුරස්ථව සිට සාක්ෂි ලබා දීම සඳහා වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ මධ්‍යස්ථාන දෙකක් කරාපිටිය සහ අනුරාධපුර රෝහල්වල ස්ථාපනය කිරීමට කටයුතු කිරීම. (අවසන් අදියරේ පවතී)

xi. ආයතනගත දරුවන් අධිකරණයට කැඳවීමේදී ළමා මිතුරු ප්‍රවාහන සේවයක් සැලසීම වෙනුවෙන් සියලුම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු වෙත වෑන් රථ 9ක් ලබා දීම.

05. එවැනි පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය වෙත මෙතෙක් ලැබී නොමැත.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් හැටියට Online Safety Act එකට Amendment එකක් මම මේ අවුරුද්දේ මුලදී ඉදිරිපත් කර තිබෙනවා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පසුව එය නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර තිබෙනවා.

පාර්ලිමේන්තුව නීතිපති දෙපාර්තමේන්තුවට සිහි කැඳවීම් 2ක් යවා තිබෙනවා, අප්‍රේල් මාසයේ 27වන දා සහ ජූනි මාසයේ 09වන දා. Online Safety Act එකට Amendment එකක් හැටියටයි මා එම පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. වයස අවුරුදු 16ට වඩා අඩු දරුවන්ට සමාජ මාධ්‍ය යම් තහනමකට ලක් කිරීම පිළිබඳව මේ වන කොට Australia, UK, France, Denmark, Canada, Germany, Greece වාගේම ආසියාවේ Indonesia, Malaysia මෙන්ම Poland, Spain, Turkey වැනි ලෝකයේ ප්‍රධාන රටවල් ගණනාවක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ගරු අගමැතිතුමියනි, මගේ මේ ප්‍රශ්නයේ මූලික අරමුණ වන්නේත්, අපේ දූ දරුවන්ගේ ආරක්ෂාව තර කරන්න Online Safety Act එකට Amendment එකක් ගෙන ඒම සම්බන්ධයෙන් කටයුතු කිරීම. ඔබතුමියත් දන්නවා, විශේෂයෙන්ම social media හරහා දරුවන් විශාල වශයෙන් ඍණාත්මක බලපෑම්වලට ලක් වන බව. ඒ වෙනුවෙන් රජය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ වාගේම, විපක්ෂයේ වග කියන මන්ත්‍රීවරයෙකු හැටියට මා පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කරලා මේ වන කොට මාස ගණනාවක් වෙනවා. ඊට අදාළ කටයුතු ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ රජයේ ප්‍රමුඛතාව නොලැබීම නිසා දෝ කියා මට තේරෙන්නේ නැහැ. ඒ ගැන ඔබතුමියගේ අවධානය යොමු කළොත් හොඳයි කියා මම හිතනවා. ගරු අගමැතිතුමියනි, ඒ ගැන ඔබතුමියගේ අදහස පළ කළොත් හොඳයි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එතුමාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පිළිබඳව අපි සොයා බලන්නම්. ඒක Online Safety Act එක සමඟ සම්බන්ධ වෙලා තිබෙනවාද කියා අපි අධිකරණ අමාත්‍යාංශයෙන් විමසා බලන්නම්. නමුත්, මේක රජයේ ප්‍රමුඛතාවක් හැටියටත් අප මැදිහත් වන කාරණයක්. මේක එක ක්‍රියාවකින් පාලනය කරන්න හෝ කළමනාකරණය කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ කියන්නේ, දරුවන්ට සමාජ මාධ්‍ය තහනම් කිරීමෙන් විතරක් මෙය කරන්න බැහැ. මම ඒ පිළිබඳව මගේ පිළිතුර තුළ සවිස්තරව සඳහන් කළා. අපි මේ වෙලාවේ ක්‍රියාමාර්ග ගණනාවක් ගැන කථා කරමින් ඉන්නේ.

අධ්‍යාපන කටයුතුවලදීත්, වෙනත් අවස්ථාවලදීත් සමාජ මාධ්‍ය භාවිතය, digital health කියන එක ගැන අපි උපදෙස් ලබා ගනිමින් ඉන්නවා. Expert committee එකක් පත් කරලා, UNICEF එකේ ආධාරත් ඇතුව, අපේ රටට, අපේ සන්දර්භයට සුදුසුම ක්‍රියාමාර්ග මොනවාද කියන එක ගැන අපි සාකච්ඡා කරමින් ඉන්නවා. මේ අවුරුද්ද තුළ අපි එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න තමයි සැලසුම් කරලා තිබෙන්නේ. ඒ නිසා මේ

කාරණය පිළිබඳව රජය අවධානය යොමු කරනවා සහ ප්‍රමුඛතාව ලබා දෙනවා කියන එක මම අවධාරණය කරනවා. ඔබතුමාගේ Bill එක පිළිබඳව මම සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු අගමැතිතුමියනි, මා අහපු 5වන ප්‍රශ්නයට අදාළව ඔබතුමිය කිව්වේ, එහෙම දෙයක් ලැබී නැහැ කියලා ද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
5වන ප්‍රශ්නයට අදාළ කාරණාව පිළිබඳව කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය දැනුවත් නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒක නොවෙයි නේ මගේ ප්‍රශ්නය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
5 වැනි ප්‍රශ්නය ගැන නේද, ඔබතුමා අහන්නේ?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඔව්. 5 වැනි ප්‍රශ්නය තමයි, "දරුවන් සඳහා සමාජ මාධ්‍ය සීමා කිරීමක් කළ යුතු බවට මා ඉදිරිපත් කර ඇති පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත මෙහිදී අවධානයට ලක් කරන්නේද?" කියන එක.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඔව්. ඒ ගැන තමයි කිව්වේ, ගරු මන්ත්‍රීතුමා. කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ඒ පිළිබඳව දැනුවත් නැහැ. මම අධිකරණ අමාත්‍යාංශයෙන් සොයා බැලීමක් කරන්නම්. අපි ඒ අදහස භාර ගන්නවා. ඒ පිළිබඳව මම සොයා බලන්නම්.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු අගමැතිතුමියනි, මා යොමු කළ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට යන්නේ නැහැ. ඒක යන්නේ පාර්ලිමේන්තුව හරහා නීතිපති දෙපාර්තමේන්තුවට. ඊට පසුව පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් හැටියටයි එන්නේ. ඒ නිසා ඒ පිළිබඳව කටයුතු කරන්න කියලා ඔබතුමියගේ කාර්ය මණ්ඩලයට හෝ කියන්න. පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළාම ඒ ගැන අමාත්‍යාංශයෙන් අහන එක නොවෙයි කරන්න තිබෙන්නේ.

පාර්ලිමේන්තුවෙන් අහලා තමයි ඒ පිළිබඳව කටයුතු කරන්න අවශ්‍යතාව තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මට ඒ පිළිබඳ තොරතුරක් ලැබුණේ නැහැ, ඒක මේ අවස්ථාවේ කොතැනද තිබෙන්නේ කියලා. මම ඒක ගැන නැවත වතාවක් අධිකරණ අමාත්‍යාංශයෙන් විමසීමක් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා.

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் கௌரவ பிரதம அமைச்சரிடம் இந்த வினாவைக் கேட்கின்றேன்.

1. இலங்கையின் அரிசி உற்பத்தியைப் பெருக்க வேண்டுமென அரசு கூறுகின்றது. எனினும், திருகோணமலை மாவட்டத்தில் 1983ஆம் ஆண்டுக்கு முன்பு மக்கள் நெற்செய்கை மேற்கொண்டு வந்த 205 சிறு குளங்களும் 25 அணைக்கட்டுகளும் கைவிடப்பட்டுள்ளன. இதனைப் பிரதமர் அறிவாரா? இதற்கான காரணம் என்ன?

2. மேற்படி குளங்களையும் அணைக்கட்டுகளையும் மீண்டும் நெற்செய்கைப் பயன்பாட்டுக்குக் கொண்டு வருவதற்கு ஏதேனும் முயற்சிகள் மேற்கொள்ளப் பட்டுள்ளனவா? அப்படியாயின், அவை யாவை?

3. மேற்படி குளங்களையும் அணைக்கட்டுகளையும் மீண்டும் நெற்செய்கைப் பயன்பாட்டுக்குக் கொண்டு வருவதில் ஏதேனும் தடைகள் உள்ளனவா? அப்படியாயின், அவை யாவை? அவற்றைத் தீர்க்க அரசு மேற்கொண்ட நடவடிக்கைகள் யாவை?

4. திருகோணமலை மாவட்டத்தில் மக்கள் விவசாயம் செய்த, மக்களிடம் ஆவணங்கள் உள்ள 33,563 ஏக்கர் நிலத்தை வனத்துறையும் 31,627 ஏக்கர் நிலத்தை வனவிலங்குத் துறையும் கையகப்படுத்தி வைத்துக் கொண்டு, அவற்றில் மக்களுக்கு விவசாயம் செய்யவிடாமல் தடுத்து வருகின்றன. இதனைப் பிரதமர் அறிவாரா? இவற்றை விடுவிக்க அரசு எடுத்த நடவடிக்கைகள் என்ன?

5. இந்த நிலங்களை மீண்டும் மக்களிடம் ஒப்படைத்து, நாட்டின் அரிசி உற்பத்தியைப் பெருக்குவதற்கு அரசு ஆவன செய்யுமா? ஆமெனில், எப்பொழுது?

6. மேற்படி நிலங்களை விடுவித்து, குளங்களை மறுசீரமைத்து மக்கள் விவசாயம் செய்யவும் அரிசி உற்பத்தியைப் பெருக்கவும் பிரதமர் ஆவன செய்வாரா? ஆமெனில், எப்பொழுது?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු කදිරවේලු ෂන්මුගම් මහතා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. 2021 වර්ෂයේ තොරතුරුවලට අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අතහැර තිබෙන වැව් 210ක් සහ අමුණු 25ක් ලෙස සඳහන් වී ඇත.

    - අත්හැර දැමූ වැව් 210න් වැව් 15ක් ප්‍රතිසංස්කරණය කර ඇති අතර, වැව් 195ක් අතහැර දමා ඇත.

    - අතහැර දැමූ අමුණු ලෙස 2021 වර්ෂයේ තොරතුරුවලට අනුව අමුණු 25ක් සඳහන් කර ඇතත්, අමුණු 08ක් ප්‍රතිසංස්කරණය කර ඇති අතර, අමුණු 17ක් අතහැර දමා ඇත.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

- මීට හේතුව ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව යටතේ පැවැති ඉහත වැව්, අමුණු හා ඊට අදාළ කුඹුරු ඉඩම් එම දෙපාර්තමේන්තුවලින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත නිදහස් නොකිරීමත්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීමත් සඳහන් කළ යුතුය.

2. අත්හැර දමා ඇති වැව් 195 හා අමුණු 17, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු හා වනජීවී දෙපාර්තමේන්තු මායිම් තුළ පැවැති බැවින් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඒවා නිදහස් කර ගොවීන්ට ලබා දීමට බලාපොරොත්තු වේ.

3. වැව් 195ක්, අමුණු 17ක් භාවිත කිරීමට නොහැකි වන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව යටතේ දැනටමත් පැවැතීමයි.

- මේ පිළිබඳ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හෝ වගකිව යුතු දෙපාර්තමේන්තු විසින් වගා කටයුතු සඳහා එම ඉඩම් නිදහස් කර ලබා දෙන්නේ නම්, මෙම වැව් හා අමුණු ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබාදෙන විට වී වගා කටයුතු සිදු කිරීමට අවශ්‍ය පසුබිමක් සකස් කරදීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකියාව ඇත.

  මේ පිළිබඳව කමිටුවක් පත් කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මේ ගැන සොයා බලා නිදහස් කරගන්න පුළුවන් ඉඩම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඒ පිළිබඳ කටයුතු කරන්න.

4. 
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වනාන්තර වශයෙන් පරිපාලනය හා කළමනාකරණය කරනු ලබන්නේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වනාන්තර වශයෙන් කළමනාකරණය කළ හැකි රජයේ ඉඩම් පමණි.

- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වනජීවී ප්‍රදේශ තුළ ප්‍රකාශයට පත් කර ඇති වනජීවී රක්ෂිත පහත දැක්වේ.

| රක්ෂිතයේ නම | වර්ග ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|
| ත්‍රිකුණාමලය නාවික බැඩබිම අභය භූමිය | 18,130 |
| ලොකු සෝබර් දූපත් අභය භූමිය | 64.7 |
| කුඩා සෝබර් දූපත් අභය භූමිය | 6.5 |
| සේරුවිල අල්ලෙයි අභය භූමිය | 15,540 |
| ත්‍රිකෝණමඩු අභය භූමිය (කොටසක් පමණක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් වේ.) | 25,019.4 |
| පරවි දූපත ජාතික උද්‍යානය | 471.43 |

- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ පවතින උක්ත වනජීවී රක්ෂිත ප්‍රදේශ සියල්ලම වසර 23කට පෙර සිට ප්‍රකාශයට පත් කළ ඒවා වේ. තවද, ගොඩබිම පිහිටි රක්ෂිත වන නාවික වැඩබිම අභය භූමිය, සේරුවිල අල්ලෙයි අභය භූමිය, ත්‍රිකෝණමඩු ස්වභාව රක්ෂිතය පිළිවෙළින් 1963, 1970 සහ 1986 වසරවල ප්‍රකාශිත ඒවා වේ. මෑතකදී කිසිදු රක්ෂිතයක් ප්‍රකාශයට පත් කර නොමැති අතර ජනතාවගේ කුඹුරු ඉඩම් පවරා ගැනීමක්ද සිදු කර ද නොමැත. එසේ නමුදු විවිධ කාලවල ජනතාව විසින් රක්ෂිත ප්‍රදේශ නීති විරෝධී ලෙස අත් කර ගැනීම සහ වගා කිරීම් සිදු කිරීම නිරීක්ෂණය කර ඇත.

- එසේ නමුදු තිරසර ඉඩම් කළමනාකරණ වැඩසටහන යටතේ වනජීවී දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවලට අයත් රක්ෂිත තුළ 1985 වර්ෂයට පෙර පදිංචිව සිටි ජනතාව සඳහා ඉඩම් නිදහස් කිරීම හෝ ප්‍රකාශිත රක්ෂිත තුළ ජනතාව විසින් වගා කරන හෝ පදිංචි වී සිටින භූමිය ක්ෂේත්‍ර පරීක්ෂණයකින් හා සිතියම් මඟින් හඳුනාගෙන, පවතින වනාන්තරවලට හා වනජීවී වාසස්ථානවලට හානි නොවන අයුරින් මෙන්ම පවතින නීති රීතිවලට අනුකූලව නියමානුකූල කිරීමට හැකි වනු පිණිස බැහැර කිරීමට සැලසුම් කිරීම වැනි විකල්ප ලබාදීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

- දැනට මෙම ක්‍රියාවලියේ මූලික අදියර ලෙස, වනාන්තර බහුල ලෙස පවත්නා සහ යුදමය වාතාවරණය පැවැති දිස්ත්‍රික්කවලට අයත්, එනම් යාපනය, වවුනියාව, මුලතිව්, කිලිනොච්චිය, මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, අනුරාධපුර, පොළොන්නරුව සහ මොනරාගල යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ.

5. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව අදාළ ඉඩම් නිදහස් කරන්නේ නම් වගාවට යෝග්‍යතාව සොයා බලා වී වගාවට හෝ වෙනත් සුදුසු භෝගයක් වගා කර භෝග නිෂ්පාදනය ඉහළ දැමීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා කටයුතු කරනු ලැබේ.

6. අදාළ පාර්ශ්ව සමඟ සාකච්ඡා කර ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களே, விடையளித்தமைக்கு நன்றி!

திருகோணமலை மாவட்டத்தில் வெருகல் பிரதேச செயலாளர் பிரிவென்று ஒன்று உள்ளது. அந்தப் பிரதேச செயலகத்தினுடைய ஆட்சிப் பரப்பு 32,042 ஏக்கர். அதிலே 78 சதவீதமான நிலத்தை வனஜீவராசிகள் பாதுகாப்புத் திணைக்களமும், 22 சதவீதமான நிலத்தை வன வளத் திணைக்களமும் பிடித்து வைத்திருக்கின்றன. அந்த வகையில், 100 சதவீதமான நிலத்தை இரண்டு திணைக்களங்களும் பிடித்து வைத்திருக்கின்றன. அந்தப் பகுதிக்குள்ளே 4,778 குடும்பங்கள் அரசாங்கம் வழங்கிய ஆவணங்களை வைத்துக்கொண்டிருக்கின்றனர். அங்கு, 18 பள்ளிக்கூடங்கள் இருக்கின்றன; 98 சமய நிறுவனங்கள் இருக்கின்றன; DS அலுவலகம் இருக்கிறது; பிரதேச சபை இருக்கிறது; நீர் வழங்கல் சபை இருக்கிறது. எனினும் அங்கே எந்தவோர் அபிவிருத்தியும் செய்ய முடியவில்லை; ஒன்றுக்கும் அனுமதி கொடுக்கிறார்களில்லை. பிரதேச சபை அலுவலகம் ஒரு கழிவறையைக் கட்டுவதென்றால்கூட வனஜீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்திடம்தான் அனுமதி வாங்க வேண்டிய சூழல் இருக்கிறது. ஆவணங்களை வைத்திருக்கின்ற அந்த 4,778 குடும்பங்கள் ஒன்றும் செய்யமுடியாமல் இருக்கின்றன. நீண்ட காலமாக இந்தப் பிரச்சினை சிக்கலாக இருக்கிறது. தயவுசெய்து இந்த விஷயத்தில் நீங்கள் சற்று விரைந்து நடவடிக்கை எடுப்பீர்களா?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මම හිතන විදියට 2023දී කැබිනට් අනුමැතිය ලැබිලා තිබෙනවා. 1985 වනකොට තිබුණු තත්ත්වයත්

එක්ක ඒ ප්‍රදේශවල ජනතාව වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල මොනවා හරි කටයුතු කරනවා නම් ඒවා නිදහස් කිරීමට යම් තීරණයක් අරගෙන තිබුණා. හැබැයි, ඒක ක්‍රියාත්මක වෙලා නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා තමයි නැවත අපි ඒක ආරම්භ කරලා තිබෙන්නේ. පරිසර අමාත්‍යතුමා ඒක ගැන අලුත්ම තත්ත්වය ඔබතුමාට කියයි කියලා මම හිතනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, උතුරු සහ නැඟෙනහිර පළාත්වල ඉඩම් ප්‍රශ්නයට අදාළව වන සංරක්ෂණ සහ වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම්වල තිබෙන ගැටලුව විසඳන්න 2025 වසරේදී කැබිනට් මණ්ඩලය විසින් කමිටුවක් පත් කළා. ඒ කමිටුව පත් කරලා, පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මේ දිනවල අවශ්‍ය කරන යෝජනා අරගෙන එම වාර්තාව දැන් අවසන් අදියරේ තිබෙන්නේ. මේ වාර්තාවට උතුරු සහ නැඟෙනහිර පළාත් දෙකට අයත් සියලු දිස්ත්‍රික්කවල අලුත් යෝජනා ගත්තා. ඒ යෝජනා අනුව අලුත් තීන්දු තීරණ ලැබෙනවා. ඒකෙදි ඔය ගැටලු විසඳිලා තිබෙයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා. එම වාර්තාව ඉක්මනින් ලැබෙයි, ගරු මන්ත්‍රීතුමනි. ඒකෙදි ඔය ගැටලු විසඳිලා තියෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, எனது அடுத்த வினா:

ஆவணங்களை வைத்திருக்கின்ற மக்களுடைய வயலிலே ஏதாவது அபிவிருத்தி செய்ய வேண்டும் என்றால், அதற்கு அனுமதி பெற வேண்டும் என வன விலங்குத்துறை வலியுறுத்துகின்றது. ஆனால், வன விலங்குத்துறையினர் 5 மீற்றர் அகலமும் 50 கிலோமீற்றர் நீளமும் கொண்ட வீதியை காடுகளை வெட்டி அமைக்கின்ற அதேவேளை, விவசாயத் திணைக்களம் ஒன்றரைக் கிலோமீற்றர் அல்லது இரண்டு கிலோ மீற்றர் நீளமான வாய்க்காலை வெட்ட அனுமதிப்பதில்லை. இது என்ன வகையான நியாயம் என்று கௌரவ பிரதம அமைச்சர் அவர்கள் சொல்லுங்கள்! அதாவது, 5 மீற்றர் அகலமும் 50 கிலோமீற்றர் நீளமும் கொண்ட சாலை ஒன்றை -பெரிய வீதி ஒன்றை- அமைப்பதற்கு வன விலங்குத்துறை அனுமதியளித்து, வேலைகள் நடைபெறுகின்ற அதேசமயத்தில், விவசாயிகள் ஒன்றரை கிலோமீற்றர் நீளமான வாய்க்காலை அமைத்து, நீரை ஆற்றிலிருந்து வயலுக்குக் கொண்டுவருவதற்கு அனுமதி கொடுக்கிறார்களில்லை. இது சம்பந்தமாக 3 ஆண்டுகளாக நாங்களும் பேசிக்கொண்டு இருக்கிறோம். சம்பந்தப்பட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தின்போதும் கோரிக்கைகளை விடுத்து வருகின்றோம். எனினும் அதற்கு அனுமதி கிடைக்கவில்லை. அதேபோல, வெல்வேரி என்ற கிராமத்தில் இருந்த 50 குடும்பங்கள் அங்கிருந்து சென்று விட்டன. அந்தக் காணிக்குள் யாரும் போகக் கூடாது என்று வன வளத் திணைக்களம் சொல்கின்றது. ஆனால், ஹெட்டிஆரச்சி என்ற பெரிய முதலாளிக்கு அந்தக் காணியைக் கொடுத்திருக்கிறது. கௌரவ அமைச்சர் அவர்களே, அது எந்த வகையான நியாயமென்று சொல்லுங்கள்!

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා එම ප්‍රශ්නයට පිළිතුරක් සපයනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, තවමත් ඒ ගැටලුව ඇති. මොකද, අපි තවම ඒ ඉඩම් නිදහස් කළේ නැති නිසා. නමුත් අලුත් වාර්තාවත් සමඟ ඉක්මනින්ම ඔය ගැටලුව විසඳෙයි කියලා අපි විශ්වාස කරනවා. දැනට සිදුවන අපහසුතාව සම්බන්ධයෙන් අපි කනගාටු වනවා. නමුත් ඒ ඉඩම් නිදහස් කරන තුරු තවමත් අපට ඒ ප්‍රදේශවල වන සංරක්ෂණ හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියාත්මක කරන්න වෙනවා. නමුත් මේ ගැටලු විසඳා ගත් පසු අපට ඒ ඉඩම් නිදහස් කරන්න පුළුවන්. දැනට සිදුවන අපහසුතාව ගැන අපි කනගාටු වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අජන්ත ගම්මැද්දෙගේ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මම අහන ප්‍රශ්නය මෙයයි.

ශ්‍රී ලංකාවේ මැතිවරණ ඉතිහාසය පුරාම හොර ඡන්ද වැළැක්වීම සඳහා භාවිත කළේ ඇඟිල්ලේ තීන්ත ගෑමේ සාම්ප්‍රදායික ක්‍රමවේදයයි. නමුත් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත නිසි පරිදි යොදා ගැනීම නිසා වර්තමානය වන විට හොර ඡන්ද දැමීම සිදු කළ නොහැකි මට්ටමට පත්ව තිබේ. එවන් පසුබිමක තීන්ත ආලේපනය සඳහා වැය වන මුදල් ඉතිරි කර ගනිමින් කටයුතු කිරීමේ අවස්ථාව තිබේ.

01. මැතිවරණවලදී ඡන්ද දායකයන්ගේ ඇඟිලිවල නොමැකෙන තීන්ත සලකුණු කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමය අහෝසි කර, ඒ වෙනුවට හොර ඡන්ද දැමීම සම්පූර්ණයෙන් වැළැක්විය හැකි ක්‍රමවේදයක් හඳුන්වා දීමට අදාළ නීති ප්‍රතිසංස්කරණවල වත්මන් තත්ත්වය කුමක්ද?

02. සෑම මැතිවරණයකදීම විදේශයන්ගෙන් විශේෂ නොමැකෙන තීන්ත ආනයනය කිරීම සඳහා වැය වන විශාල මුදල සහ ඒ වෙනුවෙන් වන ශ්‍රම පිරිවැය මෙම නව ක්‍රමවේදය හරහා දිගු කාලීනව ඉතිරි කර ගැනීමට රජයට හැකිවන්නේ කෙසේද?

03. මෙම නව ක්‍රමවේදය මැතිවරණ කොමිෂන් සභාව හරහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත්තේ කෙසේද?

04. ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවල වෙසෙන ඡන්ද දායකයන්ට මෙම ක්‍රමය යටතේ විශ්වසනීය ලෙස තමන්ගේ ඡන්ද අයිතිය භාවිත කිරීමට ඇති සූදානම පිළිබඳව සභාව දැනුවත් කරන්නේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මෙතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු සපයන්න පෙර මට මොහොතක් දෙන්න, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවට

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

මොකක්ද වුණේ කියන එක ගැන පැහැදිලි කිරීමකට. පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් කාර්යාංශය විසින් එය යවා තිබෙනවා, නීතිපති දෙපාර්තමේන්තුවට. නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඒකට තවම පිළිතුරක් ලැබිලා නැහැ. පිළිතුරක් ලැබුණු වහාම එය සභාගත කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අජන්ත ගම්මැද්දෙගේ මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. 2004 වර්ෂයට පෙර පැවති ඡන්ද විමසීම්වලදී එක් ඡන්ද දායකයෙකු විසින් ඡන්දය දෙවරක් ප්‍රකාශයට පත් කිරීම/ හොර ඡන්ද දැමීම වැළැක්වීමට නොමැකෙන තීන්ත භාවිත කර සියලු ඡන්ද දායකයන් උචිත ලකුණින් සලකුණු කිරීමේ පියවර අනුගමනය කර ඇත. කෙසේ වෙතත්, CA (Writ) 356/2008 නඩු තීන්දුව සහ 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතේ 4වන වගන්තිය ප්‍රකාරව 2004 වර්ෂයෙන් පසු පවත්වන ලද ඡන්ද විමසීම්වලදී සියලු ඡන්ද දායකයන්ගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමට ජාතික හැඳුනුම්පත හෝ වලංගු හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය කර ඇත. ඒ අනුව ජාතික හැඳුනුම්පත මඟින් අනන්‍යතාව තහවුරු කර ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන බැවින් ඇඟිල්ලෙහි තීන්ත ආලේප කිරීම සාම්ප්‍රදායික ක්‍රමයක් වී ඇත. මෙම ක්‍රමය සියලු පනත්වලින් ඉවත් කිරීමට අවශ්‍ය නීති සකස් කිරීම සඳහා අමප/26/1185/801/017 අංක දරන හා 2026.06.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් දැනුම් දී ඇත. ඇමුණුමෙහි විස්තර දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

02. උචිත ලකුණින් සලකුණු කිරීම සඳහා නොමැකෙන තීන්ත ආනයනය කිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන අතර, 2019 වසරේ පැවති ජනාධිපතිවරණයේදී ආනයනික නොමැකෙන තීන්ත පෑන් යොදාගෙන ඡන්ද දායකයින් සලකුණු කිරීම සඳහා රුපියල් 66,892,334ක මුදලක් වැය වී ඇත.

2020 පාර්ලිමේන්තු මැතිවරණයේදී සෞඛ්‍ය ආරක්ෂණ රීති අනුගමනය කරමින් ඡන්ද දායකයන් සලකුණු කිරීමට දේශීය ප්‍රසම්පාදන ක්‍රම මඟින් තීන්ත බෝතල් සහ ඉටි කූරු යොදා ගැනීමට රුපියල් 14,926,195ක මුදලක් වැය වී ඇති අතර, 2024 පැවති ජනාධිපතිවරණයේදී, 2024 පාර්ලිමේන්තු මැතිවරණයේදී සහ 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී නොමැකෙන තීන්ත පෑන් යොදාගෙන ඡන්ද දායකයින් සලකුණු කිරීම සඳහා පිළිවෙළින් රුපියල් 30,107,700ක්, රුපියල් 22,656,000ක් සහ රුපියල් 27,517,600ක් වැය වී ඇත.

එසේම නොමැකෙන තීන්ත භාවිතයට අමතරව සෑම ඡන්ද මධ්‍යස්ථානයකම සෑම පෝලිමක් සඳහාම ඡන්ද දායකයන් උචිත ලකුණින් සලකුණු කිරීමට වෙනමම නිලධාරියෙක් යෙදවීමටද සිදු වේ. ඒ අනුව 2024 ජනාධිපතිවරණයේදී, 2024 පාර්ලිමේන්තු මැතිවරණයේදී සහ 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී පිළිවෙළින් ඡන්ද මධ්‍යස්ථාන 13,421ක්, 13,380ක් සහ 13,764ක් සඳහා සලකුණු කිරීමේ නිලධාරින් 62,700ක් පමණ යොදවා ඇති අතර ඒ සඳහා රුපියල් 203,775,000ක පමණ මුදලක් වැය වී ඇත.

එම නිලධාරින්ට ගෙවා ඇති සංයුක්ත දීමනා සහ ප්‍රවාහන වියදම් මීට එකතු කළ විට මෙම අගය රුපියල් මිලියන 400ද ඉක්මවනු ඇත.

ඒ අනුව මෙම නව ක්‍රමවේදය හඳුන්වා දීම හරහා ඉහත පරිදි විශාල මුදලක් රජයට ඉතිරි කර ගත හැක.

03. උචිත ලකුණින් සලකුණු කිරීමට අමතර වශයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේදී වලංගු හැඳුනුම්පතක් මඟින් ඡන්ද දායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම මැතිවරණ කොමිෂන් සභාව මේ වන විටත් සිදු කරනු ලබන අතර, ජාතික හැඳුනුම්පතට අමතර වශයෙන් ඒ ඒ ඡන්ද විමසීමේදී වලංගු ලෙස සලකනු ලබන හැඳුනුම්පත් කවරේද යන්නත් ප්‍රසිද්ධ කරනු ලබයි. උචිත ලකුණින් සලකුණු කිරීම මැතිවරණ පනත්වලින් ඉවත් කර වලංගු හැඳුනුම්පතක් මඟින් ඡන්ද දායකයන්ගේ අනන්‍යතාව තහවුරු කර සිය ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලබා දීම මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම නීතිය සංශෝධනය වීමත් සමඟ ඉදිරි මැතිවරණවලදී සිදු කරනු ඇත. එසේම ඡන්ද හිමි නාම ලේඛන සැකසීමේදී ඡන්ද හිමියන්ගේ බහු ඡන්ද ලියාපදිංචි වීමද මැතිවරණ කොමිෂන් සභාව විසින් වළක්වා ඇත.

04. සෑම ඡන්ද දායකයෙකුටම සමාන අයිතිවාසිකම් ලබා දෙමින් නිදහස් සහ සාධාරණ මැතිවරණයක්/ඡන්ද විමසීමක් පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ අරමුණ වන අතර, ජාතික හැඳුනුම්පතට අමතරව ඡන්ද දායකයෙකුට සිය අනන්‍යතාව තහවුරු කිරීමට තවත් අනන්‍යතා ලේඛන හයක් ඡන්දය ප්‍රකාශ කිරීමට වලංගු අනන්‍යතා හැඳුනුම්පත් ලේඛන ලෙස ප්‍රකාශයට පත් කරනු ලබයි. වලංගු අනන්‍යතා ලේඛන කිහිපයක් මඟින් ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමත් සහ හැඳුනුම්පතක් නොමැති ඡන්ද දායකයෙකුට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහාම පමණක් තාවකාලික සුදුසු වැඩ පිළිවෙළක්ද මැතිවරණ කොමිෂන් සභාව මඟින් ක්‍රියාත්මක කරන බැවින් සෑම අයෙකුටම සිය අනන්‍යතාව තහවුරු කර ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් තිබීමත් නිසා ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශ ඇතුළු සියලුම ඡන්ද දායකයින්ට විශ්වසනීය ලෙස සිය ඡන්ද අයිතිය භාවිත කිරීමට හැකිය.

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

ගරු කථානායකතුමනි, මම ගරු අගමැතිතුමියගෙන් අතුරු ප්‍රශ්නයක් විධියට මේ කාරණය විමසනවා. රටට විදේශ විනිමය ලබා දෙන බලවේග ලෙස විදේශීය වෘත්තිකයින් ලෙස කටයුතු කරමින් සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් රැකියා කරනු ලබන රට තුළ සිටම ලංකාවේ මැතිවරණවලට ඡන්දය ලබා දීමට හැකි වන පරිදි ඒ අවශ්‍ය පහසුකම් හා නීති සම්පාදනය කළ යුතු බවට පසුගිය කාලවල මතයක් පළ වී තිබුණා. ඔවුන්ට එවැනි අවස්ථාවක් ලබා දීමට හැකියාව තිබෙනවාද, ඒ සඳහා කටයුතු ආරම්භ කිරීමට මැදිහත් වීමක් කරනවාද කියලා මම අගමැතිතුමියගෙන් අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒකට ප්‍රතිපත්තියක් හැටියට අපි එකඟ වන අතර, එය ක්‍රියාත්මක කිරීම සඳහා අනන්‍යතාව තහවුරු කිරීමට තිබෙන සුදුසුම ක්‍රියාවලිය තහවුරු කර ගන්න තමයි අපි මේ වෙලාවේදී උත්සාහ කරන්නේ. Digital ID එක ලබා දීමේ ක්‍රියාවලියත් සමඟ අපට මේක ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙනවා, ගරු කථානායකතුමනි. මැතිවරණ කොමිෂන් සභාව මේ වනකොටත් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, මේ පිළිබඳව ක්‍රමවේද යෝජනා කරලා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

ගරු අගමැතිතුමියනි, තවත් කාරණයක් මම දැනගන්න කැමතියි. පසුගිය කාලයේ මැතිවරණ පැවැත්වුණු දිනවල පෞද්ගලික අංශය ඡන්දය පාවිච්චි කිරීමේදී විශාල වශයෙන් බාධා මතු වුණා. ඒ බාධා ඉවත් කරන්න කටයුතු සූදානම් කරලා තිබෙනවාද කියලා මම ඔබතුමියගෙන් දැනගන්න කැමතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, පෞද්ගලික අංශයටත් නිවාඩු ලබා දීම පිළිබඳව නීතියක් තිබෙනවා. තමන්ගේ සේවකයා පදිංචි දුර ප්‍රමාණය අනුව ලබා දිය යුතු නිවාඩු ප්‍රමාණයක් තිබෙනවා. ඒක ලබා නොදීම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක්. ඊට අමතරව, සමහර තැන්වලින් වාර්තා වෙලා තිබෙනවා, එවැනි ප්‍රශ්න තිබෙන බව. ඒ අනුව ඔවුන්ට දුර පළාත්වලට ගිහිල්ලා ආපහු එන්න බැරි ප්‍රශ්න තිබෙනවාය කියාත් වාර්තා වෙනවා. මේ සඳහාත් මැතිවරණ කොමිෂන් සභාව විසින් යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. එහිදී වෙනත් ප්‍රශ්න නිර්මාණය නොවන ලෙස ඒවා ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගන්න ඕනෑ. නමුත් නීතිය අනුව සෑම පෞද්ගලික ආයතනයක්ම නිවාඩු ලබා දිය යුතුයි, ඡන්දය ප්‍රකාශ කිරීමට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අගමැතිතුමිය වෙත යොමු කරනු ලබන මීළඟ ප්‍රශ්නය, ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය.

**ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2027 අධ්‍යයන වර්ෂය සඳහා වන නව චක්‍රලේඛය මේ වනවිට නිකුත් කර තිබෙනවා. ඒ සම්බන්ධව තමයි මම පහත ප්‍රශ්න ඉදිරිපත් කරනු ලබන්නේ.

1. පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදී පසුගිය කාල වකවානුවල මව්පියන්ට පදිංචිය සම්බන්ධව සහ පදිංචිය තහවුරු කිරීමේ ගැටලුවලට බහුලව මුහුණ දීමට සිදු වුණා. විශේෂයෙන් පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කිරීමට අදාළ ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත්, ඉන් ඉදිරියට ඇති ලකුණු උපයා ගැනීමේ හැකියාවත් ඔවුන්ට අහිමි වෙනවා. මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් නව චක්‍රලේඛය මඟින් එකී පදිංචිය තහවුරු කිරීමේ ගැටලුවලට නිසි විසඳුම් ලබා දී තිබේද?

2. පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය තුළ පසුගිය කාල වකවානුවලදී විවිධ අක්‍රමිකතා සිදු වූ බව නිරීක්ෂණය විය. විශේෂයෙන්ම පොරොත්තු ලේඛනයේ පවා නම සඳහන්ව නොමැති සිසුන් ඇතැම් පාසල්වලට ඇතුළත් කරගෙන ඇති බවට එල්ල වූ චෝදනා නැවත සිදුවීම වළක්වා ගැනීමටත්, ඇතුළත් කිරීම විධිමත් කිරීමටත් මෙවර චක්‍රලේඛය මඟින් ගෙන ඇති පියවර සහ පිළියම් මොනවාද?

3. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේදී වඩාත් ඵලදායී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් උදෙසා පන්ති කාමර කළමනාකරණය ප්‍රධාන සාධකයක් වේ. කෙසේ වුවද, දැනට පන්ති කාමරවල සිටින අධික සිසුන් සංඛ්‍යාව මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට බාධාවක් බව පෙනී යන බැවින් ඒ වෙනුවෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු නිලූෂා ලක්මාලි ගමගේ මන්ත්‍රීතුමිය විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. පදිංචි ස්ථානය තහවුරු කිරීම සම්බන්ධයෙන් විද්‍යුත්පතිවරුන්ගෙන්, මානව හිමිකම් කොමිෂන් සභාවෙන් හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් ලැබී ඇති නිර්දේශද පදනම් කර ගනිමින් පහත සංශෝධන 2027 පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ 25/2026 චක්‍රලේඛයට ඇතුළත් කර ඇත. එය ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

   - එම චක්‍රලේඛයේ 7.2.1.1 වගන්තිය පරිදි පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ අයදුම්කරු/ කලත්‍රයා අඛණ්ඩව වසර අටකට වඩා වැඩි කාලයක් රජයේ ඉඩමක (අදාළ ලිපිනයේ) පදිංචි බවට අදාළ ප්‍රදේශයේ නාගරික කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතික සඳහා ලකුණු පහක් ලබා දෙයි.

     (මෙමඟින් රජයේ ඉඩමක වසර අටකට වඩා වැඩි කාලයක් පදිංචිව සිටින පුරවැසියන් සඳහාද වැඩි අවස්ථාවක් ලබා දීම සඳහා සලකා බලනු ලබයි.)

   - වෙනත් පිළිගත හැකි ලේඛන සඳහා පදිංචි ස්ථානයට අදාළව අයදුම්කරු/කලත්‍රයා අදාළ ලිපිනයේ අඛණ්ඩව ස්ථිර පදිංචිකරුවෙකු නම්, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජූනි 30 දින වනවිට පූර්වාසන්න වර්ෂ හයක් දක්වා වූ කාලයක් පදිංචි ලිපිනය සනාථ කෙරෙන පහත ලේඛන අතරින් ලේඛන හතරක් සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබා දෙයි.

| කාලය | ලබා දිය යුතු උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| වර්ෂ 01ට වැඩි වර්ෂ 02 දක්වා | ලකුණු 0.8 |
| වර්ෂ 02ට වැඩි වර්ෂ 03 දක්වා | ලකුණු 1.6 |
| වර්ෂ 03ට වැඩි වර්ෂ 04 දක්වා | ලකුණු 2.4 |
| වර්ෂ 04ට වැඩි වර්ෂ 05 දක්වා | ලකුණු 3.2 |
| වර්ෂ 05ට වැඩි වර්ෂ 06 දක්වා | ලකුණු 04 |

   - සලකා බලනු ලබන වර්ෂයක් සඳහා අයදුම්කරු/ කලත්‍රයා නමින් පවතින පහත එක් ලේඛනයකට ලකුණු 0.2 බැගින් හෝ අයදුම්කරුගේ/කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමින් පවතින පහත එක් ලේඛනයකට ලකුණු 0.1 බැගින් හෝ ලබා දීම.

     විදුලි බිල්පත්, ජල බිල්පත්, වරිපනම් බදු බිල්පත්, අක්කර බදු බිල්පත්, අයදුම්කරු/කලත්‍රයාගේ උප්පැන්න සහතික (විදුලි බිල්පත්/ජල බිල්පත් ඉදිරිපත් කිරීම ගැටලු සහගත වන අවස්ථාවලදී අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජූනි 30 දින වනවිට පූර්වාසන්න වර්ෂ හයක කාල සීමාව තුළදී පදිංචි ස්ථානයේ අදාළ බිල්පත් සඳහා බිල්පත්හිමියා ලෙස ලියාපදිංචි කර ඇති සියලුම පුද්ගලයින් හා ලියාපදිංචි කළ දින සඳහන් වන පරිදි අදාළ ආයතනය විසින් නිකුත් කරන ලද ලිපියක් ඉදිරිපත් කළ හැකිය. මෙහිදී එම ලිපියේ/ලිපිවල නිරවද්‍යතාව අදාළ ආයතනවලින් තහවුරු කර ගැනීමට විද්‍යුත්පතිවරුන් විසින් කටයුතු කළ යුතුය.)

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

- ග්‍රාම නිලධාරී විසින් අයදුම්කරු/කලත්‍රයා අදාළ ලිපිනයේ පදිංචි බවට සහතික කරන්නේ නම්, ඉහත වගුවේ සඳහන් කාල සීමා අතරින් අයදුම්කරු විසින් ලේඛන ඉදිරිපත් කරනු ලබන කාල සීමාව සඳහා පමණක් ලකුණු ලබා දිය යුතුය. එසේ ලකුණු ලබා දීම සඳහා අවම වශයෙන් ඉහත ලේඛනවලින් තුනක්වත් අදාළ කාල සීමාව ආවරණය වන පරිදි තිබිය යුතුය.
- අදාළ කාලය තුළ අයදුම්කරුගේ හෝ කලත්‍රයාගේ මව්/ පියා නමින් ගෙවන ලද බිල්පත් පසුව අයදුම්කරු හෝ කලත්‍රයා නමින් ගෙවා ඇත්නම්, ඒ ඒ පාර්ශ්ව විසින් බිල්පත් ගෙවන ලද කාලච්ඡේද දෙකම සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙනු ලබයි.

2. ඇතැම් පාසල්වල පොරොත්තු ලේඛනයේ සිටින සිසුන් ඇතුළත් කිරීමෙන් අනතුරුව තවදුරටත් පුරප්පාඩු පවතින අවස්ථාවලදී සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් වාර්තා වී ඇති පැමිණිලි මත පදනම්ව ඒ සඳහා අවශ්‍ය වන විධිවිධාන පහත පරිදි චක්‍රලේඛයට ඇතුළත් කර ඇත.

   25/2026 චක්‍රලේඛයේ 9.3.1 ඡේදය අනුව, 2027 වර්ෂයේ සමාන්තර පන්තියකට සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 35කි. තාවකාලික ලැයිස්තුවට අමතරව, ලකුණු ප්‍රමුඛතා අනුව එක් එක් ගණයකින් වෙන වෙනම පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සියයට 50ක් වන සේ තාවකාලික පොරොත්තු ලේඛනයක්ද සකස් කළ යුතුය.

   යම් හෙයකින් පාසලේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා උක්ත සියයට 50 සීමාව ඉක්මවා තාවකාලික පොරොත්තු ලේඛනය සකස් කිරීම අවශ්‍ය වන්නේ යැයි නිරීක්ෂණය වන්නේ නම්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අනුව ජාතික පාසල් සඳහා ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂකගේද, පළාත් පාසල් සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේද පූර්ව අනුමැතිය මත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සියයට සියයක් වන සේ තාවකාලික පොරොත්තු ලේඛනය සකස් කිරීම හෝ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ සියලුම අයදුම්කරුවන් ඇතුළත් වන සේ තාවකාලික පොරොත්තු ලේඛනය සකස් කිරීම හෝ සිදු කළ යුතුය.

3. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පන්තියක සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව සම්බන්ධයෙන් මේ වනවිට සමාලෝචනය කරමින් පවතින අතර, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සකස් කරනු ලබන ප්‍රතිපත්තියට අනුකූලව ඉදිරියේදී පන්තියක සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

ගරු කථානායකතුමනි, මේක එක වතාවට කරන්න පුළුවන් වෙනසක් නොවෙයි. කාලයක් තිස්සේ, පන්තියක සිටින ළමයි සංඛ්‍යාව වැඩි වෙමින් පවතින නිසා ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම්, මානව සම්පත් දියුණු කරමින් තමයි අපිට ඒ අවශ්‍ය මට්ටමට ගන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා තමයි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න අහන්නේ නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමියනි, පිළිතුරු ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -1189/2025- (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද ආයෝජන ව්‍යාපෘති: ආයෝජකයින්ට ලබා දෙන සහන
## வன்னித் தேர்தல் மாவட்டத்தில் ஆரம்பிக்கப்பட்ட முதலீட்டுக் கருத்திட்டங்கள்: முதலீட்டாளர்களுக்கு வழங்கப்படும் சலுகைகள்
## INVESTMENT PROJECTS STARTED IN THE VANNI ELECTORAL DISTRICT: CONCESSIONS TO INVESTORS

1409/2025

**2. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයේ රැකියා අවස්ථා ලබා දීම සඳහා ආරම්භ කර ඇති රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට රජය විසින් ලබා දෙනු ලබන සහන කවරේද;

(iii) ආයෝජකයින්ට දුෂ්කරතාවකින් තොරව රජයේ ඉඩම් ලබා ගැනීම සඳහා සරල ක්‍රමවේදයක් හඳුන්වා දී තිබේද;

(iv) සියලු සේවා එකම ස්ථානයකින් සැපයීමට හැකි වන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ආයෝජන මණ්ඩලය මඟින් විශේෂ ඒකක ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, ඒවා ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2009ஆம் ஆண்டு தொடக்கம் இதுவரை வன்னித் தேர்தல் மாவட்டத்தில் தொழில்வாய்ப்புகளை வழங்குவதற்காக ஆரம்பிக்கப்பட்டுள்ள அரசாங்க மற்றும் தனியார்துறை முதலீட்டுக் கருத்திட்டங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) முதலீட்டாளர்களை கவர்வதற்கு அரசாங்கம் வழங்குகின்ற சலுகைகள் யாவை என்பதையும்;

(iii) முதலீட்டாளர்களுக்குச் சிரமங்களின்றி அரசாங்கக் காணிகளைப் பெற்றுக்கொள்வதற்கு இலகுவான ஒரு செயன்முறை அறிமுகப்படுத்தப் பட்டுள்ளதா என்பதையும்;

(iv) அனைத்துச் சேவைகளையும் ஒரே இடத்தில் வழங்கும் வகையில், முதலீட்டுச் சபையானது மாவட்டச் செயலகங்களில் விசேட அலகுகளை ஆரம்பிப்பதற்குத் திட்டமிட்டுள்ளதா என்பதை யும்;

(v) ஆமெனில், அவை செயற்படுத்தப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) separately, the number of investment projects in the public sector and private sector that have been initiated to provide employment opportunities in the Vanni Electoral District since 2009 to date;

(ii) the concessions provided by the Government to attract investors;

(iii) whether a simple procedure has been introduced for investors to obtain State lands without difficulty;

(iv) whether plans have been made to establish special units by the Board of Investment within District Secretariats to provide all services in one place; and

(v) if so, the date on which such units will be put into operation?

(b) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2009 සිට ආයෝජන මණ්ඩල ව්‍යාපෘති 19ක් වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයේ - මන්නාරම, වවුනියාව සහ මුලතිව් දිස්ත්‍රික්ක - වාණිජ මෙහෙයුම් ආරම්භ කර ඇත.

(ii) ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට දැනට පවතින සහන පහත දැක්වේ.

- සේවා අපනයනය සඳහා සියයට 15ක සහනදායී ආයතනික ආදායම් බදු ප්‍රතිශතයක් ලබා දීම.
- ඇමෙරිකානු ඩොලර් මිලියන 3 ඉක්මවන ආයෝජන (නව හෝ ව්‍යාපෘති ව්‍යාප්ත කිරීම්) සඳහා ආයෝජනය සහ පිහිටීම මත පදනම්ව සියයට 100 සිට සියයට 200 දක්වා වැඩිදියුණු කළ ප්‍රාග්ධන දීමනා - Enhanced Capital Allowances - සහ වසර 10-25 දක්වා පාඩු ඉදිරියට ගෙන යාමේ - loss carryforward - අවස්ථාව ලබා දීම.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයනය කිරීමේදී රේගු බදු නිදහස් කිරීම.
- ඇමෙරිකානු ඩොලර් මිලියන 50 ඉක්මවන ආයෝජන සඳහා, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය කිරීමේදී PAL - වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු - සහ සෙස් බදුවලින් නිදහස් කිරීම.
- උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත - Strategic Development Projects Act - යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ ආයෝජකයින් සඳහා බදු සහන ලබා දෙනු ලැබේ.
- කොළඹ වරාය නගරය තුළ ආයෝජනය කරන ආයෝජකයින් සඳහා බදු නිදහස් කිරීම්/ සහන ලබා ගත හැකිය.

(iii) ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන ව්‍යාපෘතියක් ආයෝජන මණ්ඩල කලාප ඉඩමක් තුළ මෙහෙයුම් ආරම්භ කිරීමට තෝරා ගන්නේ නම්, අවම කාල රාමුවක් තුළ ඉඩම වෙන් කිරීමට ආයෝජන මණ්ඩලයට පියවර ගත හැකිය. ආයෝජකයා වෙනත් රජයේ ආයතන සතු ඉඩම් ලබා ගැනීමට අදහස් කරන්නේ නම්, අදාළ ඉඩම් හිමිකාරී ආයතනය විසින් අනුගමනය කරන ලද ඉඩම් වෙන් කිරීමේ ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතුය.

(iv) සෘජු විදේශ ආයෝජන - FDI - ආකර්ෂණය කර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය - BoI - නියෝජිතායතනය ලෙස කටයුතු කරන අතර, ආයෝජකයින්ට අන්තර්ජාලය හරහා ආයෝජන අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවස්ථාව සපයා ඇත. ආයෝජකයින්ට ඔවුන්ගේ ව්‍යාපෘතිවල ජීවන චක්‍රය පුරාවටම ආයෝජන මණ්ඩලය ප්‍රධාන කාර්යාලය මඟින් මෙන්ම රට පුරා පිහිටුවා ඇති ආයෝජන මණ්ඩල කලාප සහ ප්‍රාදේශීය කාර්යාල හරහා පහසුකම් සපයනු ලබන අතර, සැම අදියරකදීම කාර්යක්ෂම සහ පුළුල් සහයෝගයක් සහතික කෙරේ.

(v) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**

(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)

(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

முதலீடுகளுக்கு காணி பெறுவதென்பது மிகவும் கஷ்டமான ஒரு விடயமாக இருக்கிறது. எனக்குத் தெரியக்கூடியதாக, பல முதலீட்டாளர்கள் எங்களுடைய பிரதேசத்துக்கு வந்து, காணிக்காக ஒவ்வொரு திணைக்களமாக அலைந்துதிரிந்து, முதலீடு செய்யாமலேயே இந்த நாட்டை விட்டுப்போய் இருக்கிறார்கள். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் BoI Projectஐ மாத்திரம் சொல்கிறீர்கள். நான் சொல்ல வருகின்ற விடயம் என்னவென்றால், சிறு கைத்தொழில், micro initiatives போன்றவற்றுக்கு முதலீட்டுச் சபைக்குப் போய் வருவதென்பது பாரியதொரு பிரச்சினையாக இருக்கிறது

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

என்பதைத்தான். எனக்குத் தெரிய, பிரதேச செயலாளர் ஊடாக முதலீட்டுக்காக காணிக்கு விண்ணப்பித்தவர்கள், கடந்த 3 வருடங்களாக அலைந்துதிரிந்தும், இன்றுவரை அவர்களுக்குக் காணி வழங்கப்படவில்லை. மேலும், முதலீட்டுக்கான காணியை வழங்கிவிட்டு, அதில் அவர்கள் முதலீட்டுக்கான செயற்பாடுகளை மேற்கொள்ள முயற்சிக்கும்போது, அவற்றை இடைநிறுத்துமாறு கூறுகின்ற சம்பவங்களும் இடம் பெறுகின்றன.

எனக்குத் தெரிந்த ஒரு சம்பவத்தைச் சொல்கின்றேன். வவுனியாவில் 5 மில்லியன் ரூபாய் செலவழித்து காணியைத் துப்புரவு செய்த பிற்பாடு, வேறு தேவைக்காக அந்தக் காணியைக் கொடுக்கப் போவதாகக் கூறி, அதில் மேற்கொள்ளப்படும் செயற்பாட்டை நிறுத்துமாறு கூறியிருக்கிறார்கள். பிரதேச செயலாளர் ஊடாக பிரதேச செயலக மட்டத்தில் மற்றும் மாவட்ட மட்டத்தில் காணிப் பயன்பாட்டு ஆணைக்குழுவின் அனுமதி எடுத்து, காணித் திணைக்களத்துக்குப் போகவேண்டி இருப்பதால், அந்த முதலீட்டை ஆரம்பிப்பதற்கான காலம் வருடக் கணக்கில் இழுபடுகிறது. எனவே, சிறிய மற்றும் நடுத்தர முதலீடுகளை ஊக்குவிப்பதற்காக காணிக்கான ஏதாவது ஏற்பாட்டை மாவட்ட மட்டத்தில் உங்களால் செய்ய முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, අපි රජයක් විධියට ඒ ගැන අවබෝධ කරගෙන තිබෙනවා. මොකද, ආර්ථිකය වර්ධනය කරගන්න සෘජු විදේශ ආයෝජන සහ වෙනත් ආයෝජන ඉතාම වැදගත්. ඒ නිසා ආයෝජකයින්ට අවශ්‍ය ඉඩම් ඉතා ඉක්මනින් ලබා දීම ඉතාම වැදගත්. ගරු මන්ත්‍රීතුමා අසන ප්‍රශ්නය, අතීතයේ ඉඳලාම - දිගු කාලීනව - තිබුණා. ආයෝජකයෙකුට ඉඩමක් ගන්නකොට ලොකු කාල සීමාවක් ගතවෙනවා. අපි ඒවා අවබෝධ කරගෙන තිබෙනවා. ඒ නිසා අපි ඉදිරියේදී ඉඩම් බැංකුවක් - land bank එකක් - සකස් කරලා සියලුම ඉඩම්වල තොරතුරු ඒකට ඇතුළත් කරලා ආයෝජකයෙක් ඉඩමක් ඉල්ලන අවස්ථාවක ඉතා කඩිනමින් එය ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් සිටිනවා.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே! இந்தச் செயன்முறைக்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதை நீங்கள் சொல்ல வேண்டும். எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

எங்களுடைய பிரதேசங்களில் நிறைய விளைபொருட்கள் value addition செய்ய முடியாத காரணத்தால் வீணாகிப் போகின்றன. Value addition - பெறுமதி சேர் தொழில்முயற்சிகளை ஏற்படுத்துவதற்கான பயிற்சி மற்றும் இலகு கடன் வசதிகளைச் செய்துகொடுப்பதற்கு இதுவரை எந்த ஏற்பாடும் இல்லை. அதற்கான ஏற்பாடுகளைச் செய்ய முடியுமா? எனக் கேட்கின்றேன். ஏனெனில், இலங்கையில் இருக்கின்ற 9 மாகாணங்களில் வடக்கு மாகாணம் 4 சதவீதமான பங்களிப்பையே GDPக்கு வழங்குகின்றது. அதாவது, GDPக்கு மிகவும் குறைந்தளவு பங்களிப்புச் செய்கின்ற மாகாணமாக வடக்கு மாகாணம் இருக்கிறது. அங்கு முதலீடுகளைக் கொண்டுவந்தால்தான் GDPக்கான பங்களிப்பை அதிகரிக்க முடியும். பெறுமதி சேர் தொழில்முயற்சிகளை ஏற்படுத்துவதற்கு நீங்கள் மாவட்ட மட்டத்தில் என்ன ஒழுங்குகளைச் செய்திருக்கிறீர்கள் என்பதைத் தெளிவுபடுத்த முடியுமா?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, අපි අගය එකතු කිරීමේ හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙනුවෙන් පසුගිය අය වැයෙන් රුපියල් බිලියන 95ක් වෙන්කරලා තිබෙනවා, විවිධ ණය යෝජනා ක්‍රම සඳහා. ඒවායෙන් ව්‍යාපාරිකයින්ට සහන ලබා ගන්න පුළුවන්. ඊට අමතරව අගය එකතු කිරීමට අදාළව නව යන්ත්‍රෝපකරණ ගේනවා නම් ඒවාට බදු සහන ලබා ගන්නත් පුළුවන්. ඒවා ගෙන්වන්න යන වියදමට වඩා දෙගුණයක මිලක් අඩු කර ගන්න පුළුවන්. බදු ප්‍රතිපත්තිය ඇතුළේ ඒ වාගේ සහන ප්‍රදානය කරලා තිබෙනවා. ඊට අමතරව රජය විධියට ලබා දෙන ණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අවශ්‍ය කටයුතුවලට ලබා ගැනීමට හැකියාව තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -1494/2025- (1), ගරු තුරෛරාසා රවිකරන් මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි, ගරු කථානායකතුමනි. ගරු අගමැතිතුමිය සභාවේ සිටින නිසා මා කාරණයක් අහන්න කැමැතියි. මන්ත්‍රීවරුන්ට සහ රජයේ නිලධාරින්ට තිබුණු තෙල් තහංචිය ඊයේ ඉවත් කළා. ඒක ත්‍රිරෝද රථ හිමියන්ට සහ සංචාරක කර්මාන්තයට විවෘත කරන්නේ නැත්තේ ඇයි කියලා මම අහන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන හොයලා බලලා මම උත්තරයක් සපයන්නම්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බොහොම ස්තුතියි.

## උතුරු පළාතේ සංවර්ධන නිලධාරීන්: විස්තර
வட மாகாணத்திலுள்ள அபிவிருத்தி உத்தியோகத்தர்கள்: விபரம்
DEVELOPMENT OFFICERS IN NORTHERN PROVINCE: DETAILS

1494/2025

**3.** ගරු තුරෙරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මේ වනවිට සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) උතුරු පළාතේ -

(i) අනුමත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව, මේ වනවිට සිටින සහ ඒ අනුව අතිරික්ත/හිඟ සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව සහ සේවා ස්ථානය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වසර 05කට වැඩි කාලයක් එකම සේවා ස්ථානයේ සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දීර්ඝ කාලයක් දුෂ්කර ප්‍රදේශවල සේවය කරන සංවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සඳහා කරන ලද ඉල්ලීම්, ආදේශකයන් නොමැතිවීම හේතුවෙන් අවලංගු වන බව දන්නේද;

(iv) සංවර්ධන නිලධාරීන් සඳහා සාධාරණ සහ විනිවිදභාවයෙන් යුත් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) இன்றளவில் பணியில் ஈடுபட்டுள்ள அபிவிருத்தி உத்தியோகத்தர்களின் எண்ணிக்கை மாவட்ட வாரியாக வெவ்வேறாக யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) வட மாகாணத்தில் -

(i) அங்கீகரிக்கப்பட்டுள்ள அபிவிருத்தி உத்தியோகத் தர்களின் எண்ணிக்கை, தற்போதுள்ள உத்தியோகத்தர்களின் எண்ணிக்கை, இதற்கமைவாக மிகை/பற்றாக் குறையாகவுள்ள எண்ணிக்கை ஆகியன மாவட்ட வாரியாகவும் பணியிட வாரியாகவும் வெவ்வேறாக யாது என்பதையும்;

(ii) 05 வருட காலத்துக்கு அதிகமாக ஒரே பணி யிடத்தில் பணியாற்றும் அபிவிருத்தி உத்தியோகத்தர்களின் எண்ணிக்கை மாவட்ட வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) நீண்ட காலமாக கஷ்டப் பிரதேசங்களில் பணிபுரியும் அபிவிருத்தி உத்தியோகத்தர்களின் இடமாற்றக் கோரிக்கைகள் பதிலீடு இன்மை யால் இரத்துச் செய்யப்படுவதை அறிவாரா என்பதையும்;

(iv) அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு நியாயமான மற்றும் வெளிப்படையான இடமாற்றக் கொள்கையை நடைமுறைப்படுத்து வதற்காக எடுக்கப்படும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House of the number of Development Officers currently in service, separately for each district?

(b) Will he also inform this House -

(i) the number of approved Development Officers, the number currently in service and the corresponding surplus/deficit, separately for each district and place of service in the Northern Province;

(ii) the number of Development Officers who have been serving in the same place of service for more than five years, separately for each district in the said province;

(iii) whether he is aware that requests for transfers of Development Officers serving in difficult areas for a long time are cancelled due to the lack of replacements in the said province; and

(iv) the steps that will be taken to implement a fair and transparent transfer policy for Development Officers in the said Province?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government**)**
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවය කරන නිලධාරීන් 27,571ක් එක් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වැය ශීර්ෂ යටතේ ගණනය කර ඇති අතර, දිස්ත්‍රික්ක අනුව සේවය කරන නිලධාරීන් සංඛ්‍යාව ඇමුණුම මඟින් දක්වා ඇත. එය පහත පරිදි වේ.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

| | | දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ග්‍රාම නිලධාරි වසම් ගණන | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවය කරන සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| බස්නාහිර පළාත | 1 | කොළඹ | 577 | 686 | 946 |
| | 2 | ගම්පහ | 1177 | 1458 | 1472 |
| | 3 | කළුතර | 762 | 1090 | 1231 |
| දකුණු පළාත | 4 | ගාල්ල | 896 | 2082 | 1989 |
| | 5 | මාතර | 650 | 1056 | 1517 |
| | 6 | හම්බන්තොට | 576 | 786 | 1056 |
| මධ්‍යම පළාත | 7 | මහනුවර | 1187 | 1564 | 1831 |
| | 8 | මාතලේ | 539 | 696 | 984 |
| | 9 | නුවරඑළිය | 491 | 663 | 622 |
| සබරගමු පළාත | 10 | රත්නපුර | 575 | 675 | 923 |
| | 11 | කෑගල්ල | 573 | 758 | 2026 |
| ඌව පළාත | 12 | බදුල්ල | 567 | 700 | 978 |
| | 13 | මොනරාගල | 319 | 523 | 720 |
| වයඹ පළාත | 14 | කුරුණෑගල | 1610 | 2269 | 2795 |
| | 15 | පුත්තලම | 548 | 751 | 835 |
| නැගෙනහිර පළාත | 16 | ත්‍රිකුණාමලය | 230 | 408 | 509 |
| | 17 | මඩකලපුව | 345 | 657 | 1489 |
| | 18 | අම්පාර | 503 | 778 | 1435 |
| උතුරු මැද පළාත | 19 | අනුරාධපුර | 694 | 933 | 1079 |
| | 20 | පොලොන්නරුව | 294 | 412 | 331 |
| උතුරු පළාත | 21 | යාපනය | 435 | 747 | 1599 |
| | 22 | කිලිනොච්චිය | 190 | 183 | 357 |
| | 23 | මන්නාරම | 153 | 213 | 272 |
| | 24 | මුලතිව් | 136 | 241 | 331 |
| | 25 | වවුනියා | 102 | 190 | 244 |

අනෙකුත් නිලධාරීන් 51,602ක සංඛ්‍යාව ඒ ඒ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල වැය ශීර්ෂය යටතේ ගණනය වී ඇති බැවින් එම නිලධාරීන් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් බෙදී ගොස් ඇති අතර, එම නිලධාරීන් දිස්ත්‍රික්කයන්ට අනුයුක්තව සේවය කරන ආකාරය පිළිබඳ තොරතුරු එක් එක් අමාත්‍යාංශ මඟින් ලබා ගෙන ඉදිරිපත් කළ හැක.

(ආ) (i) 2025.06.01 දිනට උතුරු පළාතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන අනුමත සංඛ්‍යාව සහ අතිරික්ත සංඛ්‍යාව පහත සඳහන් කර ඇත.

| අනු අංකය | දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවය කරන සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | යාපනය | 747 | 1599 | 852 |
| 2 | කිලිනොච්චිය | 183 | 357 | 174 |
| 3 | මන්නාරම | 213 | 272 | 59 |
| 4 | මුලතිව් | 241 | 331 | 90 |
| 5 | වවුනියාව | 190 | 244 | 54 |

(ii) එක් සේවා ස්ථානයක වසර 05කට වැඩි කාලයක් සේවය කරන ලද නිලධාරීන්ගේ තොරතුරු කැඳවනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ස්ථාන මාරු පටිපාටිය අනුව වාර්ෂිකව නිකුත් කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය අනුවය. 2025.07.21 දිනැතිව නිකුත් කරන ලද ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 02/2025 අනුව ලබා ගත් තොරතුරු අතරින් ස්ථාන මාරු ලබා දිය හැකි නිලධාරීන්හට 2025 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු ලබා දී ඇත. 2026 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කළ පසු එක් ස්ථානයක වසර 05ක සේවා කාලයක් සේවය කරන නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි ස්ථාන මාරු කටයුතු සිදු කළ හැක.

(iii) අනුප්‍රාප්තිකයන් නොමැති වීම හේතුවෙන් වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් අවලංගුවීමක් සිදු නොවේ. වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් මඟින් සිදු කරනු ලබන්නේ සේවා ස්ථාන කිහිපයක සේවය කරන නිලධාරීන් සේවා ස්ථාන අතර චක්‍රයක් වන පරිදි වන අතර, දිස්ත්‍රික්ක අතර සමානුපාතිකව නිලධාරීන් අනුයුක්ත කර නොමැති වීම, දුෂ්කර ප්‍රදේශයන් සඳහා වන ස්ථාන මාරු ඉල්ලීම් අවම වීම හේතුවෙන් ස්ථාන මාරු ඉල්ලීම් ඉටු කිරීමට නොහැකි වී ඇත.

(iv) ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කරන ලද සාධාරණ හා විනිවිදභාවයෙන් යුතු පොදු ස්ථාන මාරු ප්‍රතිපත්තියක් පවතින අතර, එම ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් වසරක් පාසා වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කරනු ලබයි. එම ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව අදාළ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් අනුව ස්ථාන මාරු ලබා දෙනු ලබන අතර, එම කාර්යයේදී එම නිලධාරී කණ්ඩායම්වල වෘත්තීය සමිති නියෝජනයන් සඳහා ද නිරීක්ෂණ හා අදහස් ලබා දීමට ඉඩ ප්‍රස්ථා සලසා දෙනු ලැබේ. ඉන්පසු වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවා තීරණ ලබා දීම සිදු කරන අතර, එම තීරණ සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධාරීන්හට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ ස්ථාන මාරු තීරණ සමාලෝචනය කිරීමට ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි ය. සමාලෝචන අවස්ථාවෙන් පසුව නිකුත් කරන වාර්ෂික ස්ථාන මාරු පිළිබඳව සෑහීමකට පත් නොවන නිලධාරීන්හට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමටත් එම තීරණවලින් අතෘප්තියට පත් නිලධාරීන්හට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත අභියාචනා කිරීමටත් ඉඩ ප්‍රස්ථාව ඇත.

නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්වලට අනුව අදාළ රීති ප්‍රකාරව වඩාත් සාධාරණ ලෙස නිලධාරියාට ලබා දිය හැකි සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරු ලබා දීමට සෑම විටම කටයුතු කරනු ලැබේ.

ස්ථාන මාරු තීරණ ලබා දීමේදී නිලධාරියාගේ සේවා කාලය, ඉල්ලුම් කරන සේවා ස්ථානවල ගැළපීම් කළ හැකි නිලධාරීන් සිටීද යන්න මෙන්ම ප්‍රතිලාභ සහිත ආයතන වෙත කරනු ලබන ඉල්ලීම් ආදිය සලකා බැලෙන අතර, එම නිර්ණායක මත පදනම්ව ස්ථාන මාරු ලබා දෙනු ලැබේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினா, பதிலீடு இன்றிய நிலையில் வெளிமாவட்டங் களில் பணிபுரியும் அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கான தீர்வு தொடர்பானது.

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சால் கடந்த 2025.07.21 அன்று வெளியிடப்பட்ட இணைந்த சேவைகள் சுற்றிக்கை 02/2005இன் 2.2.2 மற்றும் 2.2.3 ஆகிய பகுதிகளின்படி, இணைந்த சேவையிலுள்ள அலுவலர்களுக்கான வருடாந்த இடமாற்றக் கொள்கையில், "ஒரு சேவை நிலையத்தில் 5 வருட சேவைக் காலத்தை நிறைவுசெய்த அலுவலர்கள் இடமாற்றப்பட வேண்டும்" எனக் குறிப்பிடப்பட்டுள்ளது. "அவ்வாறு தகுதியுள்ள ஒருவர் வேறொரு சேவை நிலையத்துக்கு இடமாற்றத்தைக் கோரும் போது, அக்கோரிக்கையை நிறைவேற்றுவதற்காக அதிகூடிய சேவைக் காலம் பணியாற்றும் அலுவலர்களை வெளியிடங் களுக்கு இடமாற்றலாம்" என்று குறித்த இடமாற்றக் கொள்கையின் பகுதி 2.4 குறிப்பிடுகின்றது.

2026ஆம் ஆண்டுக்குரிய இடமாற்றத்தில், வட மாகாணத்தில் யாழ்ப்பாணம் தவிர்ந்த ஏனைய 4 மாவட்டங் களிலும் பொது நிருவாக அமைச்சின்கீழ் இணைக்கப்பட்டு, மாவட்டச் செயலகங்களிலும் பிரதேச செயலகங்களிலும் பணிபுரியும் 136 அபிவிருத்தி உத்தியோகத்தர்கள் இடமாற்றத் துக்கு விண்ணப்பித்துள்ளபோதும் அவர்களுக்கான இடமாற் றங்கள் இதுவரை வழங்கப்படவில்லை என அறியமுடிகிறது. கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய பதிலில் யாழ்ப்பாணத்தில் 800க்கும் மேற்பட்ட அபிவிருத்தி உத்தியோகத்தர்கள் பணிபுரிவதாகக் குறிப்பிட்டிருந்தீர்கள். ஆனால், அங்கு 1,000க்கும் மேற்பட்ட அபிவிருத்தி உத்தியோகத்தர்கள் மிகையாகப் பணிபுரிவதாகக் கூறப் படுகிறது. மறுபுறம், 5 ஆண்டுகள் தாண்டிய சேவைக் காலத்தை வெளிமாவட்டங்களில் நிறைவுறுத்தியும் அவர்கள் இடமாற்றம் பெற வழியில்லாமல் அல்லற்படுகின்றார்கள். இந்த ஓரவஞ்சனை ஏன்? உங்களால் வெளியிடப்பட்ட வருடாந்த இடமாற்றக் கொள்கையை இறுக்கமாக நடைமுறைப்படுத்தி, இப்படியான அபிவிருத்தி உத்தியோகத் தர்களுக்குப் பதிலீட்டுடனான இடமாற்றத்தை வழங்குவதற்கு இன்னும் எத்தனை மாத காலம் அல்லது எத்தனை ஆண்டுகாலம் அவர்கள் வெளிமாவட்டங்களில் ஏக்கத்தோடு பணிபுரிய வேண்டும்?

எனவே, பதிலீடு இன்றிய நிலையில் நெடுங்காலம் வெளிமாவட்டங்களில் பணிபுரியும் அபிவிருத்தி உத்தியோகத் தர்களுக்கான தீர்வை அமைச்சு வழங்குமா? என்பதை என்னுடைய முதலாவது மேலதிகக் கேள்வியாகக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කාරණා පිළිබඳව සොයා බලන්න පුළුවන්. දැනටත් වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී කිසිම ගැටලුවක් පැන නොනඟින බව තමයි අපේ වාර්තාවලට අනුව පෙනී යන්නේ. නමුත්, එතුමා සඳහන් කළ ආකාරයට යම් ගැටලුවක් තිබෙනවා නම්, ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගන්න පුළුවන්. මොකද, උතුරු පළාතේ දිස්ත්‍රික්ක පහේම අතිරික්ත සංඛ්‍යාවක් ඉන්නවා. එම නිසා එම ස්ථාන මාරුවීම් කරන්න බාධාවක් නැහැ. ඒ අනුව ඒ ගැන සොයා බලා කටයුතු කරන්න අපි පියවර ගන්නවා.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ அமைச்சர் அவர்களே, எல்லா மாவட்டங்களிலும் என்பதை நான் மறுக்கின்றேன். ஏனென்றால், முல்லைத்தீவு சம்பந்தப்பட்ட முழுமையான விவரம் என்னிடம் உள்ளது.

என்னுடைய இரண்டாவது மேலதிக வினாவும் இவ்வாறு வெளி மாவட்டத்தில் பணிபுரியும் அபிவிருத்தி உத்தியோகத் தர்களை மையப்படுத்தியதுதான். இந்தத் தீவிலுள்ள எந்தவோர் இடமும் கஷ்ட, அதிகஷ்டப் பிரதேசமாகக் காணப்படக்கூடாது என்பதுவே சமத்துவ நிலையின் வெற்றியாக அமையும். ஆனால், பல ஆண்டுகளாகத் தொடர்ந்தும் பல்வேறு துறைகளிலும் வன்னித் தேர்தல் மாவட்டத்தின் பெரும்பகுதிகள், குறிப்பாக முல்லைத்தீவு, மன்னார் மாவட்டங்கள் கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்களாகக் கருதப்படுகின்றன. இலங்கையிலேயே கஷ்டப் பிரதேச பொது மருத்துவமனைகள் முல்லைத்தீவிலும் மன்னாரிலும்தான்

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

உள்ளன என்று அறிகின்றோம். அதுபோலவே, வன்னி யிலுள்ள வளங்குன்றிய பெரும்பாலான பிரதேசங்களில் பணியாற்றும் ஆசிரியர்கள் மற்றும் சுகாதாரத்துறை சார்ந்தவர்களுக்கு கஷ்டப் பிரதேசப் படி, அதிகஷ்டப் பிரதேசப் படி வழங்கப்படுவதையும் அறிகின்றோம்.

ஒரு பாடசாலையில் பணிபுரியும் ஆசிரியர் கஷ்டப் பிரதேசப் படியைப் பெறுகின்றார். ஆனால், அதே பாடசாலையில் பணிபுரியும் அபிவிருத்தி உத்தியோகத்தருக்கு அந்தப் படி வழங்கப்படுவதில்லை. ஒரே சூழலில் பணிபுரியும் ஒரு வகையான ஊழியர்களுக்கு கஷ்ட, அதிகஷ்டப் பிரதேசப் படிகள் வழங்கப்படும் வேளையில், அபிவிருத்தி உத்தியோகத் தர்களுக்கு அவ்வாறான படிகள் வழங்கப்படாது விலக்கி வைப்பது, அரச சேவையில் பணியாளர்களுக்கு இடையிலான ஓரவஞ்சனையைத்தானே சான்றாக்குகின்றது. நகரத்தில் பணிபுரியும் ஒருவரையும் துணுக்காய், மாந்தை கிழக்குக்கு நான்கைந்து பேருந்துகளில் ஏறி, இறங்கி ஆண்டுக்கணக்கில் பணிபுரிபவரையும் சமதட்டில் வைத்து நியாயப்படுத்துவது எவ்வளவு அநீதி! அதேநேரம் அங்கு பணிபுரியும் ஆசிரியர்களை ஒரு வகையிலும், அபிவிருத்தி உத்தியோகத் தர்களை இன்னொரு வகையிலும் அளவிடுவது எவ்வகையில் நியாயம்? கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்களில் பணியாற்றும் அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கும் உரிய ஊக்கப்படிகளை வழங்கி, அவர்களுக்கும் சமத்துவநீதியைத் தங்கள் அமைச்சு வழங்குமா? எனக் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, සංවර්ධන නිලධාරින්ගේ අතිරික්තයක් නොමැති බවට ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පළමු කාරණයට මම එකඟ වන්නේ නැහැ. මං කලිනුත් සඳහන් කළ ආකාරයට යාපනයේ 852ක්, කිලිනොච්චියේ 174ක්, මන්නාරමේ 59ක්, මුලතිව් 90ක් සහ වවුනියාවේ 54ක් වශයෙන් අතිරික්ත පිරිසක් ඉන්නවා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ලේඛනය මට ලබා දුන්නොත්, මේ දෙක අතර තිබෙන පරස්පරතාව පිළිබඳව අවධානය යොමු කරන්න පුළුවන්.

ඒ වාගේම, එතුමා සඳහන් කළ ආකාරයට, දුෂ්කර දීමනා ලබා දීමේදී සේවා ව්‍යවස්ථාවේ තිබෙන කොන්දේසිවලට අදාළව කටයුතු කරන නිසා තමයි සමහර වෙලාවට එහෙම වෙන්නේ. එතුමා කියන කාරණයට අපිත් එකඟයි. දුෂ්කර තත්ත්වයන් යටතේ කටයුතු කරන අනෙකුත් නිලධාරින්ටත් එම දුෂ්කර දීමනාව ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. ඉදිරි කාලයේදී අපි ඒ සඳහා වඩාත් සුදුසු ක්‍රමවේදයක් ගැන සලකා බලන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1656/2025- (1), ගරු චානක මාදුගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1854/2026- (2), ගරු රොෂාන් අක්මීමන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය: ලියාපදිංචි නොකිරීම

### கிளிநொச்சி மாவட்ட கிரிக்கெட் சங்கம்: பதிவுசெய்யாமை

### CRICKET ASSOCIATION OF KILINOCHCHI DISTRICT: NON-REGISTRATION

1189/2025

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சிவஞானம் சிறீதரன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Sivagnanam Shritharan)

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ක්‍රිකට් සංගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එමඟින් දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි ක්‍රිකට් සංගම් 25ක් ක්‍රියාත්මක වන්නේද;

(iii) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, ක්‍රිකට් සංගමයක් පිහිටුවීමට අදාළ අනුමැතිය මෙතෙක් ලබා නොදීමට හේතු කවරේද;

(iv) එම දිස්ත්‍රික්කයේ ක්‍රිකට් සංගමය විසින් තම සංගමය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි ලියාපදිංචි කිරීම සඳහා අවස්ථා කිහිපයකදී අයදුම් කර තිබුණද, එය මෙතෙක් ලියාපදිංචි නොකිරීමට හේතු කවරේද;

(v) 2010 වර්ෂයෙන් පසුව කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයට අමාත්‍යාංශය විසින් ලබාදී ඇති ආධාර සහ පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது இயங்குகின்ற கிரிக்கெட் சங்கங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அதன்படி, 25 மாவட்டங்களும் உள்ளடங்கும் வகையில் 25 கிரிக்கெட் சங்கங்கள் செயற்படு கின்றனவா என்பதையும்;

(iii) கிளிநொச்சி மாவட்டத்தில், கிரிக்கெட் சங்கமொன்றை அமைப்பதற்கு இதுவரையில் அனுமதி வழங்காமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி மாவட்டத்திலுள்ள கிரிக்கெட் விளையாட்டுச் சங்கத்தால் தமது சங்கத்தை இலங்கை கிரிக்கெட் நிறுவனத்தில் பதிவு செய்வதற்குப் பல தடவை விண்ணப்பித்துள்ள போதிலும், இதுவரையில் அதனைப் பதிவு செய்யாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) 2010ஆம் ஆண்டின் பின்னர் கிளிநொச்சி மாவட்ட கிரிக்கெட் விளையாட்டுச் சங்கத்துக்கு அமைச்சினால் வழங்கப்பட்டுள்ள உதவிகள் மற்றும் வசதிகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) the number of cricket associations currently functioning in Sri Lanka;

(ii) whether 25 cricket associations covering all 25 districts thus function;

(iii) the reasons for not granting approval to establish a Cricket Association in the Kilinochchi District so far;

(iv) the reasons for not registering the Association with Sri Lanka Cricket in spite of the fact that the Cricket Association of the said district has applied for registration with Sri Lanka Cricket on several occasions; and

(v) the assistance and facilities provided by the Ministry to the Kilinochchi District Cricket Association after 2010?

(b) If not, why?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පළාත් ක්‍රිකට් සංගම් 04ක් සහ දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් 25ක් ක්‍රියාත්මක වේ.

(ii) දිස්ත්‍රික් 25ම ආවරණය වන පරිදි දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් 25ක් ක්‍රියාත්මක වේ. එයින් කිලිනොච්චිය, මන්නාරම සහ මුලතිව් යන දිස්ත්‍රික්ක සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සාමාජිකත්වය ලැබී නොමැත.

(iii) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයක් පිහිටුවා ඇති අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ප්‍රකාරව සාමාජිකත්වය ලබාගත නොහැකි වීම මත එම දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය හට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සාමාජිකත්වය මේ වන තෙක් ලබා ගත නොහැකි වී ඇත. එසේ වුවද, සාමාජිකත්වය රහිතව වුවද, කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වන දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය ලෙස එම සංගමය ක්‍රියාත්මක වේ.

(iv) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ප්‍රකාරව දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයක් ලියාපදිංචි කිරීමට අවශ්‍ය කොන්දේසි සපුරා නොතිබීම.

(v) අමාත්‍යාංශයේ පවතින පොත්පත් හා ලිපිලේඛන අනුව 2010 වර්ෂයෙන් පසුව කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයට අමාත්‍යාංශයෙන් ආධාර සහ පහසුකම් ලබා දී ඇති බවට තොරතුරු අනාවරණ කරගත නොහැක.

(ආ) පැන නොනඟී.

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අරමුදල් ලබා දීම: විස්තර

### பாராளுமன்ற உறுப்பினர்களுக்கு பன்முகப்படுத்தப்பட்ட நிதி வழங்குதல்: விபரம்

### PROVISION OF DECENTRALIZED FUNDS TO MEMBERS OF PARLIAMENT: DETAILS

1656/2025

**4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චානක මාදුගොඩ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சானக மாதுகொட சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chanaka Madugoda)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) 2025 වර්ෂය සඳහා -

(i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අරමුදල් ලබාදී තිබේද;

(ii) එසේ නම්, එක් මන්ත්‍රීවරයෙකුට ලබාදී ඇති මුදල කොපමණද;

(iii) විමධ්‍යගත අරමුදල් ලබාදී ඇති මන්ත්‍රීවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අරමුදල් මන්ත්‍රීවරුන්ට ලබා දීමේ නිර්ණායක කවරේද;

(v) විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අරමුදල් ලබා නොදීමට හේතු කවරේද;

(vi) ඉදිරි කාලය තුළ එම අරමුදල් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටද ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2025ஆம் ஆண்டுக்கென -

(i) பாராளுமன்ற உறுப்பினர்களுக்குப் பன்முகப் படுத்தப்பட்ட நிதி வழங்கப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், உறுப்பினர் ஒருவருக்கு வழங்கப் பட்டுள்ள தொகை எவ்வளவு;

(iii) பன்முகப்படுத்தப்பட்ட நிதி வழங்கப்பட்டுள்ள உறுப்பினர்களின் எண்ணிக்கை யாது;

(iv) மேற்படி நிதியை உறுப்பினர்களுக்கு வழங்கு வதற்கான அளவுகோல்கள் யாவை;

(v) பன்முகப்படுத்தப்பட்ட நிதி எதிர்க்கட்சியிலுள்ள உறுப்பினர்களுக்கு வழங்கப்படாமைக்கான காரணங்கள் யாவை;

(vi) எதிர்காலத்தில் மேற்படி நிதியை எதிர்க்கட்சியி லுள்ள உறுப்பினர்களுக்கும் வழங்க நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House, for the year 2025 -

(i) whether decentralized funds have been provided to the Members of Parliament;

(ii) if so, the amount provided to each Member of Parliament;

(iii) the number of Members of Parliament who have been provided with the decentralized funds;

(iv) the criteria, adopted in providing aforesaid funds to the Members of Parliament;

(v) the reasons for not providing decentralized funds to the Opposition Members of Parliament; and

(vi) whether steps will be taken to provide the aforementioned funds to the Opposition Members of Parliament as well in the future?

(b) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2025 වර්ෂයේ විමධ්‍යගත අය වැය වැඩසටහන සඳහා ප්‍රතිපාදන වශයෙන් රුපියල් මිලියන 2,250ක ප්‍රතිපාදනයක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාළ වැය ශීර්ෂය යටතේ ලබා දීමට කටයුතු කර ඇත. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය යටතේ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලැබූ යෝජනා පරීක්ෂා කර බලා අවසන් අනුමැතිය සහ ප්‍රතිපාදන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර ඇත.

එහිදී විමධ්‍යගත අය වැය වැඩසටහන යටතේ එක් එක් දිස්ත්‍රික්කයට වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදනය, මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කළ අංක MF/02/2025 දරන හා 2025.01.29 දිනැති චක්‍රලේඛයේ ඇමුණුම 2 යටතේ දක්වා ඇත. අදාළ චක්‍රලේඛයෙහි පිටපතක් ඇමුණුම I** ලෙස ඉදිරිපත් කර ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(vi) මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කළ අංක MF/02/2026 දරන 2026.01.16 දිනැති චක්‍රලේඛය අනුව 2026 වර්ෂයේ විමධ්‍යගත අය වැය වැඩසටහන යටතේ එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් රුපියල් මිලියන 10ක් බැගින් ප්‍රතිපාදන වෙන් කර ඇත. අදාළ චක්‍රලේඛයෙහි පිටපතක් ඇමුණුම II** ලෙස ඉදිරිපත් කර ඇත.

(ආ) පැන නොනඟී.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ධාන්‍යගම නිවාස සංකීර්ණය: පරිපාලනය
## உணவு ஆணையாளர் திணைக்களத்துக்குச் சொந்தமான தான்யகம வீட்டுத் தொகுதி: நிருவகித்தல்
## DHANYAGAMA HOUSING COMPLEX BELONGING TO FOOD COMMISSIONER'S DEPARTMENT: MANAGEMENT

1854/2026

**5. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු රොෂාන් අක්මීමන මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு ரொஷான் அக்மீமன சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Roshan Akmeemana)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර සහ කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ධාන්‍යගම ප්‍රදේශයේ, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් නිවාස සංකීර්ණයක් තිබෙන බවත්;

(ii) එම නිවාස සංකීර්ණය නිසි පරිදි පරිපාලනය නොවන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත නිවාස සංකීර්ණයේ මේ වනවිට පවතින නිවාස ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ලබාදීමේ ක්‍රමය සහ නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை மாவட்டத்தின், திருகோணமலை பட்டினமும் சூழலும் பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள தான்யகம பிரதேசத்தில் உணவு ஆணையாளர் திணைக்களத்துக்குச் சொந்தமான வீட்டுத் தொகுதியொன்று உள்ளது என்பதையும்;

(ii) மேற்படி வீட்டுத் தொகுதி முறையாக நிருவகிக்கப்படுவதில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வீட்டுத் தொகுதியில் தற்போதுள்ள வீட்டு அலகுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவ்வீடுகளை வழங்கும் வழிமுறை மற்றும் அளவுகோல்கள் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Is he aware that -

(i) a housing complex belonging to the Food Commissioner's Department exists in the Dhanyagama area of the Trincomalee Town and Gravets Divisional Secretaray's Division in the Trincomalee District; and

(ii) the said housing complex is not being properly administered?

(b) Will he inform this House the -

(i) number of housing units currently available in the said housing complex; and

(ii) procedure followed and the criteria applied in the allocation of those housing units?

(c) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දනිමි.

(ii) විධිමත් පරිදි පරිපාලනය කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

(ආ) (i) 366කි.

(ii) 2016 වර්ෂයේ සිට පොරොත්තු ලේඛනයක් භාවිත කරමින් නිවාස ලබා දීම සිදු කර ඇති අතර, එහිදී රාජ්‍ය හා අර්ධ රාජ්‍ය නිලධාරින් සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇත.

එසේ නමුත් මෙම නිවාස ලබා දීමේදී සිදු වී ඇති ගැටලු සහගත තත්ත්වයන් හේතුවෙන් සහ නිවාස නැවත පවරා ගැනීමට හා හිඟ මුදල් අය කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කරමින් පැවතීම හේතුවෙන් 2025 වර්ෂයේ සිට අලුතෙන් නිවාස ඒකක ලබා දීම තාවකාලිකව අත්හිටුවා ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27.(2) යටතේ ප්‍රශ්නය, ගරු ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### උතුරු සහ නැඟෙනහිර පළාත්වල හමුදාව විසින් අත්පත් කරගෙන ඇති සිවිල් ජනතාවට අයත් ඉඩම් නිදහස් කිරීම
### வடக்கு, கிழக்கு மாகாணங்களில் இராணுவத்தினரால் கையகப்படுத்தப்பட்டுள்ள பொதுமக்களின் காணிகளை விடுவித்தல்
### RELEASE OF CIVILIAN LANDS HELD BY MILITARY IN NORTHERN AND EASTERN PROVINCES

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Speaker, I ask the following Question from the Hon. Minister of Defence:

Despite the end of the armed conflict more than 17 years ago, substantial extents of privately owned civilian lands in the Northern and Eastern Provinces remain under military occupation. The National People's Power - NPP - in its Election Manifesto pledged to expedite the release of military-held civilian lands and facilitate the resettlement of affected communities.

The continued occupation of civilian lands and the prolonged military presence in civilian areas delay normal civil administration and it undermines confidence-building in the reconciliation process. The release of occupied lands and demilitarization of the Northern and Eastern Provinces with military deployment progressively reduced to levels comparable with the rest of Sri Lanka, except where genuine national security considerations require otherwise, are essential for reconciliation, resettlement and economic recovery.

What I am trying to say, Sir, is that the Northern Province and the Eastern Province have a higher military presence. So, when there is no operation or combat happening, there is no need for that level of military presence just in the North and East, compared to other areas of the country.

While I welcome the release of lands occupied by two military camps in Batticaloa following representations I made at the Ministerial Consultative Committee on Defence, which was chaired by His Excellency the President as Minister of Defence, I must also say that many affected communities continue to protest over the slow pace of land releases.

Sir, I must acknowledge that the President was able to release lands held by two military camps in Batticaloa. We are very thankful to him for releasing those lands. After we made representations at the Ministerial Consultative Committee on Defence, those lands occupied by both the Murakkoddanchenai and the

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

Paruthithurai Camps were released by the President. We acknowledge it and thank him for that. However, Sir, still, there are various protests happening across the North and the East pertaining to land release.

Will the Hon. Minister inform this House -

(a) the total extent of private and State lands occupied by the armed forces in the Northern and Eastern Provinces, district-wise, the extent, locations and dates of lands released since the present Government assumed office, the extent of lands that remain under military occupation and the Government's timeline for releasing the remaining lands?

(b) what action has been taken to complete the release of civilian lands in Valikamam North, where lands under 16 Grama Niladhari Divisions have not been fully released and those of three Grama Naladhari Divisions remain entirely unreleased?

Now, Sir, மயிலிட்டிப் பிரதேசத்தில் Myliddythurai North J/251, Myliddythurai South J/248, Myliddy North J/246 ஆகிய கிராம அலுவலர் பிரிவுகளில் மொத்தம் 700 குடும்பங்களுக்குச் சொந்தமான 556 ஏக்கர் காணி விடுவிக்கப்படாமல் இருக்கின்றன. அதேபோல், மயிலிட்டி கலைமகள் மகா வித்தியாலயத்தின் விளையாட்டு மைதானமும் விடுவிக்கப்படாமல் இருக்கின்றது. கௌரவ சபாநாயகர் அவர்களே, J/252 பலாலி தெற்கு, J/253 பலாலி கிழக்கு, J/254 பலாலி வடக்கு, J/255 பலாலி மேற்கு, J/255 Palaly North West ஆகிய கிராம அலுவலர்கள் பிரிவுகள் உள்ளடங்கிய பகுதி ஒரு வட்டாரமாகும். இதில் 300க்கும் அதிகமான குடும்பங்கள் வாழ்கின்றன. இந்தக் காணி விடுவிப்பு சம்பந்தமான கோரிக்கையை முன்வைத்து, கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தலில் அவர்கள் தேசிய மக்கள் சக்திக்குத்தான் வாக்களித்தார்கள். எனினும், இதுவரை அந்தக் காணிகள் விடுவிக்கப்படவில்லை. இதில் மொத்தம் 556 ஏக்கர் இருக்கிறது.

So, Sir, I want to know the extent of land that remains completely unreleased. I already have the details, but I want the Hon. Minister to respond.

(c) what action has been taken in the Jaffna District regarding the protests in Myliddy and Palaly and to restore access to Myliddy Kaanikai Matha Church, Vasavilan Manampirai Pillayar Kovil, St. Sebastian's Church, Myliddy Roman Catholic School and Vasavilan Sri Veluppillai Vidyalayam?

Sir, to that school, kovil and churches I mentioned, access has still not been provided.

இந்த இடங்களுக்கு மக்களுக்குப் போகக்கூடிய சூழல் இப்பொழுது இல்லை. பலாலி தெற்குப் பிரதேசத்தில் விமான நிலையத்தின் விஸ்தரிப்புக்காக காணி தேவை என்று சொன்னாலும்கூட, அதற்கு அந்தக் காணி தேவைப்படாது. தற்பொழுது, அதில் இராணுவம் விவசாயம் செய்கின்றது.

(d) what action has been taken in Kilinochchi District to release lands occupied for the expansion of the Karachchi Pradeshiya Sabha - the lands are being held by Division 551 - the lands belonging to Iranamadu Kanakambikai Amman Temple, Iranamadu Junction and the land belonging to the Department of Agriculture?

இதில் கிளிநொச்சி மாவட்டத்தின் கரைச்சி பிரதேச சபையின் நூலகம் இருக்கின்றது. அதனை விஸ்தரிப்புச் செய்வதற்குத் தேவையான காணி இதுவரை விடுவிக்கப்பட வில்லை. அதேபோல், இரணைமடு சந்தியிலுள்ள விவசாய ஆராய்ச்சி நிலையத்துக்குச் - Regional Agriculture Research and Development Centreக்குச் - சொந்தமான காணியும் இதுவரை விடுவிக்கப்படவில்லை. இந்த விடயங்கள் சம்பந்தமாகவும் கௌரவ அமைச்சர் அவர்களிடம் பதிலை எதிர்பார்க்கின்றேன்.

(e) what action has been taken in Mullaitivu District to release the remaining 59 acres plus the 100 acres of civilian land in Keppapilavu?

கௌரவ சபாநாயகர் அவர்களே, கேப்பாப்புலவு பிரதேசத்தில் 55 பேருக்குச் சொந்தமான 59.5 ஏக்கர் தனியார் காணியும், middle-class schemesஇன்கீழ் 4 பேருக்கு வழங்கப்பட்ட 100 ஏக்கர் காணியும் விடுவிக்கப்படாமல் இருக்கின்றது. கௌரவ சபாநாயகர் அவர்களே, சனாதிபதி அவர்களின் தலைமையில் நடைபெற்ற ஆலோசனை குழுக் கூட்டத்தில் கௌரவ ரவிகரன் அவர்கள் இந்த விடயம் சம்பந்தமாகக் கேட்டபோது, அவற்றுக்கு மாற்றுக் காணி வழங்கப்பட்டதாகச் சொன்னார்கள். சீனியார்மோட்டை பிரதேசத்தில் 44 பேருக்கு தற்காலிகமாக இருப்பதற்குத்தான் காணி வழங்கப்பட்டது.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please wind up now.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir. I am winding up.

கௌரவ சபாநாயகர் அவர்களே, இந்தக் காணிகள் தற்காலிகமாகத்தான் வழங்கப்பட்டன. இவை நந்திக் கடலோரத்தில் இருக்கும் பிரதேசங்கள். நான் இந்தக் கேள்விகளை கேட்பதற்கான காரணம், தற்பொழுது கேப்பாப்புலவு பிரதேசத்தில் இரண்டு வாரங்களுக்கும் மேலாக மக்கள் தொடர்ச்சியாக ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டு வருகின்றார்கள். பலாலி, மயிலிட்டி பிரதேசத்திலும் மக்கள் தொடர்ச்சியாக ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டு வருகின்றார்கள். குரும்பசிட்டி என்ற பிரதேசத்தில் இந்து மயானம் விடுவிக்கப்படாமல் இருக்கின்றது.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please wind up now.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, I am winding up, Sir.

அதேபோல், வசாவிளான் பிரதேசத்தில் J/244, J/245 ஆகிய கிராம அலுவலர் பிரிவுகளில் 170 குடும்பங்களுக்குச் சொந்தமான 140 ஏக்கர் காணி விடுவிக்கப்படாமல் இருக்கின்றது. கௌரவ சபாநாயகர் அவர்களே -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have already read out what had been submitted.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Yes. But, I am trying to explain it to the Minister.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Now, you have taken seven minutes.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I will wind up within a minute, Sir.

நான் இந்தக் கேள்விகளை எழுப்புவதற்கு முக்கிய காரணம், தற்பொழுது வடக்கு, கிழக்கில் போராட்டங்கள் இடம்பெற்று வருகின்றன. இதேபோல்தான் பொத்துவிலிலும் மட்டக்களப்பிலும் காணிகள் விடுவிக்கப்பட வேண்டும். தற்பொழுது, வடக்கு, கிழக்கில் போராட்டங்கள் தொடர்ச்சியாக இடம்பெற்று வருகின்றன. இந்தப் போராட்டங்கள் 2-3 வாரங்களென தொடர்ச்சியாக நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. தேசிய மக்கள் சக்தியின் பிரதிநிதிகள் இது சம்பந்தமாக கவனம் செலுத்துவதில்லை.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, now you have taken eight minutes. Please, wind up.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir, I am winding up.

அதன் காரணமாகத்தான் நாங்கள் கேள்வி கேட்கின்றோம். எங்களுடைய மக்களின் காணிகள் விடுவிக்கப்பட வேண்டும் என்பதில் நாங்கள் தொடர்ச்சியாக அக்கறையோடு இருக்கின்றோம். இதற்கான பதிலை அமைச்சரிடம் நான் எதிர்பார்க்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එතුමා අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා කල් ඉල්ලා සිටිනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order. [Interruption]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Order එක,-

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I raised the Question. So, allow my point of Order first.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order, ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, අපේ සභානායකතුමාගේත් අවධානයට මා මෙම කාරණය යොමු කරනවා. ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ප්‍රශ්න සම්බන්ධයෙන් අපි පිළිතුරු බලාපොරොත්තු වෙනවා, ගරු සභානායකතුමනි. මොකද, එක අමාත්‍යාංශයක් සම්බන්ධයෙන් ප්‍රශ්න අහන්න කියලා අපට කිව්වා; කෙටියෙන් ලියන්න කිව්වා; එක කාරණයක් ගැන ලියන්න කිව්වා. අපි දිගටම අහපු ප්‍රශ්නවලට, - agriculture සම්බන්ධව අහන ප්‍රශ්නවලට සමහර විට මාස දෙකකින් තමයි උත්තරය ලැබෙන්නේ. ඒක නිසා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් එක අමාත්‍යාංශයකින් අහනකොට, ඒවාට පිළිතුරු ලබා දෙන්න කියලා. ගරු ඇමතිතුමා අපට කිව්වේ එහෙම නේ. අමාත්‍යාංශ තුන හතරක් ගැන එකවර අහන්න එපා, කෙටියෙන් අහන්න කියලා නේ කිව්වේ. ඉතින් එහෙම අහලත් අපට ඒවාට උත්තර ලැබෙන්නේ නැතිකොට පොඩ්ඩක් මේ පිළිබඳව කරුණාවෙන් සලකන්න කියා ඉල්ලා සිටිනවා. මොකද, අද උදේ ඇමතිතුමා හිටියා නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්න සඳහා හැකි ඉක්මනින් පිළිතුරු ලබා දෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු ප්‍රශ්නය තමයි මුලින්ම ඇති වෙලා තිබුණේ. තවමත් ඒ ගැටලුව එහෙමම තිබෙනවා. ඊළඟට, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමක් තිබුණා, තමනුත් සහභාගි වෙන දිනයක ඒ පිළිතුරු ලබා දෙන්න කියලා. එහෙම කල් ගිය අවස්ථාත් තිබෙනවා. ඒ නිසා මෙතැනින් එහාට ඇත්තටම පිළිතුර ලැබුණාට පසුව ඒ පිළිතුර ඔබතුමාට ඉදිරිපත් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඒ කාරණය අවසානයි.

ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමා, මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මේක ගැටලුවක් කරගන්නේ නැතුව විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක කියන්න. *[බාධා කිරීමක්]* ඔබතුමා point of Order එක raise කරන්න; raise your point of Order, Hon. (Dr.) Ramanathan Archchuna.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, பாராளுமன்ற நிலையியற் கட்டளை 36(k) -

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මොකක්ද, මේකේ තේරුම? මේක සාමූහිකව ඉවර කරන්න ඕනෑ කාරණයක්. එතුමා දැන් කිව්වා, සමහර මන්ත්‍රීවරුන්ගේ requests තිබෙනවා කියලා. ඔබතුමා මේ පැත්ත බලලා තත්පර 30ක් දෙන්න, එතකොට මේ ප්‍රශ්නය ඉවරයි. නැත්නම් මේක, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, සභාව නිශ්ශබ්ද කරලා දෙන්න, නැත්නම් මට කථා කරන්න බැහැ නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කථා කරන්න. ඔබතුමාට මම අවසරය දුන්නා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම පොඩි වෙලාවක් ඉල්ලන්නේ. මේ නලින්ද ඇමතිතුමා, - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No debate could be allowed. Hon. Member, you raised the Question, a point of Order, and the Chief Government Whip made his response.

ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, you can raise your point of Order. - *[Interruption.]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை - *[இடையீடு]* මේක නවත්වලා දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, I will move on; I am not going to give any more chances to you.

අමාත්‍යාංශ නිවේදන, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

## මන්නාරම මහ රෝහල සඳහා CT scan යන්ත්‍රයක් ලබාදීම: සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## மன்னார் பொது வைத்தியசாலைக்கு CT scan இயந்திரம் வழங்கல்: சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று
## PROVISION OF CT SCANNER FOR GENERAL HOSPITAL, MANNAR: STATEMENT BY MINISTER OF HEALTH AND MASS MEDIA

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, 2026.06.26 දින වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ), (ආ) මන්නාරම් දිස්ත්‍රික් මහ රෝහලෙහි රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීම කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා CT scan යන්ත්‍රයක් මිලදී ගැනීමට රුපියල් මිලියන 250ක මූල්‍ය ප්‍රතිපාදන 2026 වර්ෂය සඳහා වන ප්‍රතිපාදන යටතේ ලබාදීමට මේ වන විටත් පියවර ගෙන ඇති අතර, ඒ සඳහා වන ප්‍රසම්පාදන කටයුතු 2026.04.26 දිනැතිව ආරම්භ කර ඇත.

ගරු කථානායකතුමනි, 2025 මැද භාගයේදී මම මන්නාරම් දිස්ත්‍රික් මහ රෝහලට ගිය වෙලාවේ අපේ අධ්‍යක්ෂතුමා සහ එම කාර්ය මණ්ඩලය වාගේම රෝහල් සංවර්ධන කමිටුවත් මේ ඉල්ලීම ඉදිරිපත් කළා, CT scan යන්ත්‍රයක් ලබා ගැනීම සම්බන්ධයෙන්. ඒ සඳහා 2025 වර්ෂයේදී මුදල් වෙන් කරලා තිබුණේ නැහැ. 2026 වර්ෂයේදී මුදල් වෙන් කළා. ඒ අනුව හලාවත දිස්ත්‍රික් මහ රෝහලටත්, මන්නාරම මහ රෝහලටත් CT scan යන්ත්‍ර මිලදී ගැනීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ලිපිලේඛන පිළියෙළ කිරීම ආරම්භ කර තිබෙනවා, 2026.04.26වන දා. ඒ අනුව තව මාස එකහමාරකින් පමණ අපට tender එක open කරන්න පුළුවන්. මේ CT scan යන්ත්‍රය මේ වසර අවසන් වීමට ප්‍රථම මන්නාරම දිස්ත්‍රික් මහ රෝහලට ලබා දීම තමයි අපේ බලාපොරොත්තුව.

(ඈ) මන්නාරම දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවිත ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම CT scan යන්ත්‍රය 2026 වර්ෂයට අදාළ ප්‍රතිපාදන භාවිත කරමින් 2026 වර්ෂයේ දෙසැම්බර් මසට ප්‍රථම ලබා දීමට කටයුතු සිදු කරනු ලැබේ.

ඒ අනුව අපි ඒ යන්ත්‍රය ලබා දීමට මේ වසරේදී කටයුතු කරනවා, ගරු කථානායකතුමනි. ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Under Standing Order No. 36(k) -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I gave you the chance, but you did not raise your point of Order.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, give me 30 seconds. එතුමා කැගහනකොට මම කොහොමද කථා කරන්නේ? මට තත්පර 30ක් දෙන්න.

ගරු කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 27(2) යටතේ මීට මාස එකහමාරකට කලින් මෙතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයම අහලා තිබෙනවා. ඒකට තවම උත්තර ලැබිලා නැහැ. එකම ප්‍රශ්නය තමයි දෙවැනි සැරේට මේ ඉදිරිපත් කර තිබෙන්නේ. දෙවැනි සැරේ මෙතුමා ඉදිරිපත් කර තිබෙන්නේත් මම අහපු ප්‍රශ්නය. ඒකට උත්තර දීලා නැහැ. කවදාද ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නේ කියලා විතරයි මම අහන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## වරප්‍රසාද: ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා නොදීම
## சிறப்புரிமை: நிலையியற் கட்டளை 27 (2) இன்கீழ் வினா எழுப்ப அனுமதி வழங்காமை
## PRIVILEGE: REFUSAL TO GRANT APPROVAL TO RAISE QUESTION UNDER STANDING ORDER NO. 27(2)

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ, එනම් "රීති විරෝධී යැයි කථානායකවරයා විසින් තීන්දු කරනු ලබන යම් ප්‍රශ්නයක් හැර මහ ලේකම්වරයාට දැනුම් දීම් ලැබ ඇති සියලු ප්‍රශ්න, දැනුම් දෙන ලද දින සිට සම්පූර්ණ දින හතක් ඉකුත් වන්නට මත්තෙන් නොයෙදෙන දිනයකදී පිළිතුරු ලැබීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුවද, ප්‍රශ්නය අවසානයේදී දී පොදු වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් අදාළ අමාත්‍යවරයාට විධිමත් ලෙස දැනුම් දීමකින් අනතුරුව පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා හෝ පිළිගත් දේශපාලන පක්ෂ නායකවරයෙකු විසින් අසනු ලැබිය හැකිය"

යන්න යටතේ 2026.07.08 දින මා විසින් ඉදිරිපත් කිරීමට නියමිත වූ මීගමුව බන්ධනාගාරයේ ඇති වූ නොසන්සුන්තාව පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙනි.

එහිදී මා විසින් ඉදිරිපත් කරනු ලැබූ පහත ප්‍රශ්න,

1. මීගමුව බන්ධනාගාරය තුළ ඇති වූ මෙම ගැටුම්කාරී තත්ත්වයට මූලික හේතුව රජය විසින් අනාවරණය කරගෙන තිබේද? එසේ නම්, ඊට මූලික වූ හේතුව කුමක්ද?
2. තත්ත්වය පාලනය කිරීම සඳහා පොලිස් විශේෂ කාර්ය බලකාය, පොලිසිය හෝ වෙනත් ආරක්ෂක අංශ මැදිහත් කිරීමට නියෝගය ලබා දුන්නේ කවුරුන්ද? එම නියෝගය ලබා දීම සඳහා පැවති නීතිමය ප්‍රතිපාදන කවරේද? එම නියෝග නිසි කලට ලබා දුන්නේද?
3. මෙම සිදුවීමෙන් අද වන විට වාර්තා වන පරිදි සිදු වූ ජීවිත හානි හා දේපළ හානි කොපමණද?
4. මෙම සිදුවීම සම්බන්ධයෙන් ස්වාධීන, අපක්ෂපාතී සහ විනිවිදභාවයෙන් යුත් විමර්ශනයක් සිදු කර එහි වාර්තාව මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
විපක්ෂ නායකතුමා මේ ඉදිරිපත් කරන්නේ වරප්‍රසාද ප්‍රශ්නයක්ද, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයක්ද, මොකක්ද මේ කාරණය කියන එක මම දැනගන්නට කැමැතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා මේවා ඉදිරිපත් කළා. ඒවා ඉදිරිපත් කිරීමට නොදීමෙන් වරප්‍රසාද කඩ වුණා කියලා තමයි එතුමා කියන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඉදිරිපත් කරන්න තිබුණු එකද මේ කියන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. වරප්‍රසාද කඩවීම තමයි මේ ඉදිරිපත් කරන්නේ. මේ ඒ content එකේ අන්තිම ටික, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි.

ගරු විපක්ෂ නායකතුමා, ඔය තිබෙන document එකේ ඉතිරි කොටස ඔබතුමාට කියවන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අමාත්‍යතුමා, ගරු කථානායකතුමාට ඉදිරිපත් කළ ලේඛනය තමයි මම මේ කියවන්නේ. මේක වරප්‍රසාද ප්‍රශ්නයක්.

5. මිය ගිය රැඳවියන්ගේ පවුල්වලටත්, තුවාල ලැබූ රැඳවියන්ටත් රජය ලබාදීමට අපේක්ෂා කරන වන්දි, සහන සහ අනෙකුත් ක්‍රියාමාර්ග මොනවාද?

   විශේෂයෙන්ම රැඳවියන් වාගේම නිලධාරීන් ගැනත් මම සඳහන් කරන්න කැමැතියි.

6. බන්ධනාගාර දෙපාර්තමේන්තුව ස්ථිර කොමසාරිස් ජෙනරාල්වරයෙකු නොමැතිව කොපමණ කාලයක් දැන් ක්‍රියාත්මක වන්නේද? බන්ධනාගාර තුළ පවතින අධික තදබදය, ආරක්ෂක හා පරිපාලන දුර්වලතා මෙම සිදුවීමට බලපෑවේද? එසේ නම් ඒවා නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

7. වැලිකඩ, මහර සහ මීගමුව යන බන්ධනාගාර තුළ අඛණ්ඩව මෙවැනි බරපතළ සිදුවීම් වාර්තා වීම සැලකිල්ලට ගෙන රජය භාරයේ සිටින රැඳවියන්ගේ ජීවිත ආරක්ෂා කිරීම සහ මෙවැනි සිදුවීම් නැවත ඇති නොවීම සඳහා රජය අනුගමනය කරන ජාතික වැඩ පිළිවෙළ කුමක්ද?

"කල් තැබීමේ යෝජනාවේදී ආවරණය වී ඇත" යන හේතුව මත මට අද දින මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කළා.

Erskine May: Parliamentary Practiceහි පරිච්ඡේද 12(1) අනුව මන්ත්‍රීවරුන්ට ඇති ප්‍රශ්න කිරීමේ නිදහස අයිතිවාසිකමක් සේ සලකනු ලබන අතර, එය නොසලකා හරින විට වරප්‍රසාද කඩ කිරීමක් ලෙස සලකනු ලබන නිසාවෙන්ද,

ස්ථාවර නියෝග 27(2) යටතේ පක්ෂ නායකයෙකුට ජාතික වැදගත්කමක් ඇති හදිසි කරුණක් පිළිබඳව නිශ්චිත හා සංඛ්‍යාත්මක තොරතුරු රජයෙන් විමසීමේ අයිතියක් ඇති නිසාවෙන්ද, එවැනි කරුණක් සංශෝධනය කර ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බැවින්ද,

මා විසින් යොමු කළ ප්‍රශ්නය දේශපාලන විවාදයකට අදාළව නොව, මීගමුව බන්ධනාගාරයේ ඇති වූ නොසන්සුන්තාව පිළිබඳ නිශ්චිත දත්ත ඉල්ලා සිටින කරුණක් නිසාවෙන්ද,

කල් තැබීමේ යෝජනාවකදී සිදු වන සාමාන්‍ය විවාදයක් සහ නිශ්චිත තොරතුරු ලබා ගැනීම සඳහා ස්ථාවර නියෝග 27(2) යටතේ යොමු කරන ප්‍රශ්නයක් අතර ස්වාභාවික වෙනසක් පවතින නිසාවෙන්ද,

කල් තැබීමේ යෝජනාවකදී විවාදයක් සිදු වුවද, එය රජයට නිශ්චිත තොරතුරු හා වගකීම් සහිත පිළිතුරු සපයන නියමිත ක්‍රමවේදයක් නොවන නිසාවෙන් ද,

2026.07.07 දින පැවති විවාදයේදී විෂය භාර අමාත්‍යවරයා විසින් සිදු කළ ප්‍රකාශය තුළ මවිසින් ඉදිරිපත් කළ ප්‍රශ්න සඳහා නිශ්චිත පිළිතුරු අඩංගු වී නොමැති බැවින් ද,

ඉහත හේතුව මත ප්‍රශ්නය ප්‍රතික්ෂේප කිරීම - ඒ කියන්නේ, මම අහපු ප්‍රශ්නය ප්‍රතික්ෂේප කළා. ඊයේ හැන්දෑවේම ප්‍රතික්ෂේප කළා - විපක්ෂ නායකවරයා වශයෙන් පාර්ලිමේන්තු කාර්යභාරය හා වගකීම් ඉටු කිරීමට ඇති වරප්‍රසාදයට හානි වන බැවින් ද,

මෙවැනි ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට ඉඩ නොදීම ජනතාවට සත්‍ය තොරතුරු දැනගැනීමේ අයිතිය හකුළාලීමක් වන බැවින් ද,

මෙමඟින් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 03 වගන්තිය ප්‍රකාරව "පාර්ලිමේන්තුවේ භාෂණයේ, විවාද කිරීමේ හෝ කටයුතුවල නිරත වීමේ නිදහස තිබිය යුතුය" යන්න උල්ලංඝනය වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, බූස්ස බන්ධනාගාරයට ගෙනිච්ච සිරකරුවෙකුගේ ජීවිතය අහිමි වෙලාය කියනවා. අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ මොනවා වෙනවා ද, වැලිකඩ බන්ධනාගාරයේ මොනවා වෙනවා ද කියලා අපි දන්නේ නැහැ. එම නිසා ඒවා පිළිබඳවා සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ගරු කථානායකතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියනවා, මේක සහමුලින්ම වැරදි ක්‍රමවේදයක් බව. පාර්ලිමේන්තුවේ තිබෙන පිළිගත් ක්‍රමයක් තමයි, කල් තැබීමේ විවාදයක් පැවැත්වූවාට පසුව

ඒ හා සමාන ප්‍රශ්නයක් නැවත ඉක්මනින් විවාදයට නොගැනීම. සමහර අවස්ථාවල අවුරුද්දක් යන තුරු ඒ හා සමාන ප්‍රශ්නයක් නැවත ඉදිරිපත් කරන්න අවස්ථාව දීලා නැහැ. අපි ඊයේ විවාදයට පැය තුනක් දුන්නා. ස්ථාවර නියෝග අනුව එහෙම එකකට තිබෙන්නේ පැය දෙකයි; ඇත්තටම තිබෙන්නේ පැය එකහමාරයි. අපි පැය තුනක් දුන්නා. ඒ විවාදය කළා. ඒ විවාදය කළාට පසුව අද මොකක්ද මේ කරන්නේ?

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කියන්නේ, භාෂණයේ නිදහස තමයි. ඒ භාෂණයේ නිදහස 225දෙනාටම සැලසෙන්න ඕනෑ නිසාත්, මේ සභාවේ විය යුත්තේ එකම කටයුත්ත ගැන කථා කිරීම පමණක් නොවන නිසාත්, ස්ථාවර නියෝගවලින් ඒ භාෂණයේ නිදහස ක්‍රියාවට නඟන්න ඉතාම ප්‍රජාතන්ත්‍රවාදී සහ පිළිගත් ක්‍රමවේදයක් හදලා තිබෙනවා. ඒක තේරුම් ගන්න බැරිකම හෝ ඒක දැනුවත්ව උල්ලංඝනය කරනවා. ගරු කථානායකතුමනි, ඒකෙන් උල්ලංඝනය වෙන්නේ ඔබතුමා ඇතුළු මන්ත්‍රීවරුන් 225දෙනාගේ වරප්‍රසාද. මේ කළේ සහමුලින්ම වැරදි දෙයක්. ඒ නිසා මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා. මෙහෙම වුණාම හැම කෙනාටම පුළුවන් නේ වරප්‍රසාද කියලා එක එක ප්‍රකාශ කරන්න. ඔබතුමා 225දෙනාගේම වරප්‍රසාද බලන්න ඕනෑ. ඒ සඳහා තමයි ස්ථාවර නියෝග තිබෙන්නේ.

විපක්ෂ නායකතුමනි, ඔබතුමන්ලාට පුළුවන් මාධ්‍යයට ඕනෑ තරම් අදහස් දක්වන්න. අද කථා කිරීමේ නිදහස තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙවැනි දේවල් මින් ඉදිරියට සිදු වෙන්න දෙන්න එපා කියන ඉල්ලීම කරනවා. ස්ථාවර නියෝග අනුව මෙය සහමුලින්ම වැරදි ක්‍රියාවක්. පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත උල්ලංඝනය කරමින් තමයි මේ කටයුතු කරන්නේ. භාෂණයේ නිදහස කියන්නේ, ඕනෑ වෙලාවක ඕනෑ දෙයක් කියන එක නොවෙයි. ඒ නිසා තමයි පාර්ලිමේන්තුව මේ නීති හදලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මට කියන්න තිබෙන්නේ මේ කාරණය තමයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සභානායකතුමා සියලුදෙනා නොමඟ යවනසුලු විධියට තමයි මගේ ප්‍රකාශය අර්ථ දැක්වූයේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න.

මම ප්‍රශ්නයෙන් ඇහුවේ, නිශ්චිත කරුණු කාරණා, නිශ්චිත දත්ත, නිශ්චිත සංඛ්‍යාලේඛන සහ නිශ්චිත පිළිතුරු. ඊයේ දවසේ විවාදය ආරම්භ වන්නටත් පෙර පස් වරු තුනකුත් ගණනකට - විවාදය පටන් ගත්තේ පස් වරු තුනහමාරට නේ, ඊටත් පෙර - අපට ලිපියක් එවනවා, "මේ ප්‍රශ්නය ප්‍රතික්ෂේපිතයි" කියලා.

මම කියන්න කැමැතියි, මම ඇහුවේ නිශ්චිත ප්‍රශ්නයක් බවත්, මම ඉදිරිපත් කළේ නිශ්චිත තොරතුරු බවත්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point එකක් නොවෙයි, ගරු විපක්ෂ නායකතුමනි. උත්තර දෙන එකයි, point of Order එකයි කියන්නේ කාරණා දෙකක්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සභානායකතුමාට උත්තර දෙන්න පුළුවන් ද, එහෙම?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා point of Order එකක් ගත්තා. ඔබතුමාගේ කරුණු දැක්වීම සභාවේ තිබෙන ක්‍රියාකලාපයට ඔබින්නේ නැහැ කියන කාරණාව මූලික කරගෙන තමයි එතුමා ඒ point of Order එක ගත්තේ. ඔබතුමාගේ point එක මොකක්ද, ගරු විපක්ෂ නායකතුමා?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, දැන් අද වරප්‍රසාද ප්‍රශ්නය, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කළා නේ. ඒ සම්බන්ධයෙන් අපි සොයා බලමු, වරප්‍රසාදයක් තිබෙනවාද, නැද්ද කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක මම ඔබතුමා හමු වෙලා ඉදිරිපත් කළ එකක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු සභානායකතුමනි?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා එතුමාට අවසර දීලා එතුමා ප්‍රකාශයක් කළා. එතකොට, ස්ථාවර නියෝග සහ මේ පනතට

[ගරු බිමල් රත්නායක මහතා]

අනුව අපි පැහැදිලිව කියනවා, ඒක වැරදියි කියලා. ඒක තමයි අපට තිබෙන අයිතිය. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ ගැන අධ්‍යයනය කරලා Ruling එකක් දෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු කරන්නම්, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම කරන්න බැහැ. ඕවා වරප්‍රසාද ප්‍රශ්න නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක විවාදයක් නොවෙයි, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අවස්ථාව දෙන්න, තත්පර 10ක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තත්පර 10ක් දෙනවා, අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සභානායකතුමා කියනවා, ඒක වැරදියි කියලා. අපි කියනවා, ඒක හරි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්නම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මේ විහිළුවට ඉඩ දෙන්න එපා. මේ විහිළුවට ඉඩ දෙන්නත් එපා, විහිළුකාරයින්ට ඉඩ දෙන්නත් එපා. වරප්‍රසාද කඩවීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරලා ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නයකට අදාළ සියලු දේවල් පාර්ලිමේන්තුවේ කියවනවා. දැන් මේ ප්‍රශ්නයට උත්තර දෙන්නේ ඔබතුමාද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේක ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරන්නේ කොහොමද කියන්නකෝ, ගරු කථානායකතුමනි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
කවුද මේකට උත්තර දෙන්නේ කියන්නකෝ, ගරු කථානායකතුමාද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා මේක ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරන්නේ කොහොමද කියන්න, ගරු කථානායකතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, පැහැදිලියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, දැන දැන වැරදි කරන අයට අවස්ථාව දෙන්න එපා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
දෙන්න එපා, අවස්ථාව. මේවා මේ විහිළුවක් වෙලා තිබෙන්නේ. එළියේ විහිළුකාරයෝ වුණාට කමක් නැහැ. පාර්ලිමේන්තුව ඇතුළේ විහිළුකාරයෝ වෙන්න දෙන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේ වරප්‍රසාද ප්‍රශ්නය සභාවට එන්නේ තමුන්නාන්සේට යොමු කළාට පස්සේ. ඔබතුමා අවසරය දීලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 3.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.
න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 5 දක්වා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

## ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත: නියෝග
## கொடுப்பனவு மற்றும் தீர்ப்பனவு முறைமைகள் சட்டம்: ஒழுங்குவிதிகள்
## PAYMENT AND SETTLEMENT SYSTEMS ACT: REGULATIONS

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
Hon. Speaker, I move,

> "That the Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 17 read with Section 11 of the Payment and Settlement Systems Act, No. 28 of 2005 and published in Gazette Extraordinary No. 2468/06 of 23rd December, 2025, which were presented on 23.06.2026, be approved.
>
> (Cabinet approval signified.)"

Sir, I also move Item No. 2 - Resolution under the Customs Ordinance, Item No. 3 - Regulations under the Motor Traffic Act - and Item Nos. 4 and 5 - two Orders under the Sri Lanka Export Development Act - to be approved by the House.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද ඔබතුමාගේ point of Order එක, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 131(7) යටතේ මම මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද කියලා කියන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Jaffna Teaching Hospital එකේ Director post එක ගැන මම තුන් සැරයක් පාර්ලිමේන්තුවේදී අහන කොට ඔබතුමා කිව්වා, Sectoral Oversight Committee එකේ සභාපතිතුමා ලිඛිතව පාර්ලිමේන්තුවට submit කරනවා කියලා. ඒ ප්‍රශ්නයට මාස හතරකට වඩා ගත වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන හොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

To start the Debate, the Hon. Nishantha Jayaweera. You have 11 minutes.

[පූ.භා. 11.13]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග, රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියම දෙකක් සහ මෝටර් වාහන පනත යටතේ වන නියෝග අද පාර්ලිමේන්තුවේ සම්මත වීම සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා.

[ගරු නිශාන්ත ජයවීර මහතා]

ආදායම් සංරක්ෂණ පනත යටතේ ඉදිරිපත් කරලා තිබෙන සංශෝධනය තමයි, රේගු ආනයන බදු ප්‍රතිපත්තිය. 2026 අය වැයෙන් යෝජනා කරනවා, නව ජාතික තීරු බදු ප්‍රතිපත්තියක් රටට හඳුන්වා දෙන්න ඕනෑය කියලා. ඒ අනුව අපි මේ වනකොට ජාතික තීරු බදු ප්‍රතිපත්ති කමිටුවක් පත් කරලා, ඒ කමිටුවෙන් නිර්දේශ ලබාගෙන, එක්සත් ජාතීන්ගේ පුළුල් ආර්ථික වර්ගීකරණයේ පස්වන සංස්කරණයේ, එහෙම නැත්නම් United Nations' Classification by Broad Economic Categories - Revision 5 පදනම් කරගෙන රේගු ආනයන බදු ව්‍යුහයට නව සංශෝධනයක් ඉදිරිපත් කරන්න ගැසට් නිවේදනයක් නිකුත් කළා. ඒ නිකුත් කරපු ගැසට් නිවේදනය අනුව නව සංශෝධන අප්‍රේල් 1වැනි දා ඉඳන් ක්‍රියාත්මක වනවා.

මෙතෙක් රේගු ආනයන බදු අය කරනු ලැබුවේ කාණ්ඩ තුනක් යටතේ. සියයට 0, 15 සහ 20 කියන කාණ්ඩ තුන යටතේ තමයි මෙතෙක් බදු අය කරනු ලැබුවේ. මේ ප්‍රතිශත වෙනස් කරලා මේක අලුතින් කාණ්ඩ හතරකට යටත් කරනවා. ඒ අනුව 0, 10, 20, 30 කියන ප්‍රතිශත යටතේ කාණ්ඩ හතරකට බෙදලා රේගු බදු 2026 අප්‍රේල් 1වැනි දා ඉඳන් අය කිරීම සිදු වනවා. මේ යටතේදී අත්‍යවශ්‍ය භාණ්ඩ, ඖෂධ, ඇතැම් කාර්මික අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන යන්ත්‍රෝපකරණ වාගේ ඒවා සියයට 0ට තමයි යටත් වන්නේ. ඊටත් අමතරව මූලික කාර්මික භාණ්ඩ සහ අතරමැදි නිෂ්පාදන වාගේ දේවල් සියයට 10ට යටත් වනවා. සාමාන්‍ය පාරිභෝගික භාණ්ඩ සියයට 20ට යටත් වනවා. සුඛෝපභෝගී භාණ්ඩ සහ දේශීයව නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ සියයට 30ට තමයි යටත් වන්නේ.

රේගු බදු අය කරන්න මෙන්න මේ නිශ්චිත කාණ්ඩවලට අමතරව තවත් තිබුණා, මිශ්‍ර අනුපාත කියලා එකක්. ඒ මිශ්‍ර අනුපාතවලත් යම් සංශෝධනයක් මේ යටතේ සිදු වනවා. ඊටත් අමතරව මීට කලින් විශේෂිත අනුපාත යටතේ රේගු බදු අය කරනු ලැබුවා. ඒ අනුපාත වෙනස්වීමකට ලක් වන්නේ නැහැ. ඊට අමතරව මීට කලින් සියයට 20 යටතේ රේගු බදු අය කළා, අතරමැදි භාණ්ඩ සඳහා. ඒ අතරමැදි භාණ්ඩ සඳහා මෙතෙක් සියයට 20 අය කරපු භාණ්ඩවල ඒ ප්‍රතිශතය නොවෙනස්ව මේ සංශෝධනය යටතේ පවතිනවා. ඒත් එක්කම මේ සංශෝධනයේදී සියයට 0ට HS codes 3,756කුත්, සියයට 10 යටතේ HS codes 406කුත්, සියයට 20 යටතේ HS codes 2,195කුත්, සියයට 30 යටතේ HS codes 582කුත්, මිශ්‍ර අනුපාතය යටතේ HS codes 411කුත්, විශේෂ අනුපාත යටතේ HS codes 875කුත් සම්පූර්ණ එකතුව HS codes 8,225කුත් සඳහා මේ බදු සංශෝධනය බලපානවා. මේ බදු සංශෝධන යටතේ පසුගිය අවුරුදුවල රේගු ආනයන බද්ද ලැබිලා තිබෙන්නේ මොන ආකාරයෙන්ද කියලා බැලුවොත්, 2021 අවුරුද්දේ අපිට රේගු ආනයන බදු විධියට රුපියල් බිලියන 64ක් ලැබිලා තිබෙනවා. 2022 අවුරුද්දේ රුපියල් බිලියන 50ක්, 2023 අවුරුද්දේ රුපියල් බිලියන 105ක්, 2024 අවුරුද්දේ රුපියල් බිලියන 111ක් සහ 2025 අවුරුද්දේ රුපියල් බිලියන 276ක් අපිට රේගු ආනයන බදු විධියට ලැබිලා තිබෙනවා.

මෙන්න මේ සංශෝධනය ක්‍රියාත්මක කළාට පස්සේ සහ ඊට කලින් මොන වාගේ බදු ආදායමක්ද අපිට ලැබිලා තිබෙන්නේ කියලා අපි බලමු. මේ සංශෝධනය ක්‍රියාත්මක වෙන්නේ 2026 අප්‍රේල් 01වැනි දා ඉඳන් ඉදිරියට. 2025 අප්‍රේල් 01වැනි දා ඉඳන් මැයි 15 දක්වා කාල සීමාව ගත්තොත්, අපිට රේගු ආනයන බදු විධියට රුපියල් බිලියන 24ක් ලැබිලා තිබෙනවා. හැබැයි, මේ සංශෝධනය කළාට පස්සේ 2026 අප්‍රේල් 01වැනි දා ඉඳන් 2026 මැයි 15 දක්වා කාල සීමාවේදී අපිට රේගු ආනයන බදු විධියට රුපියල් බිලියන 39ක ආදායමක් ලැබිලා තිබෙනවා. මේක තමයි ගැසට් නිවේදනයක් මඟින් පළමුවැනි වරට රේගු ආනයන බද්ද සඳහා කරන සංශෝධනය.

මීට අමතරව අද ඉදිරිපත් කර තිබෙනවා, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියමයන් 2ක්. ඒ නියම 2ක මඟින් සිද්ධ වෙන්නේ රේගු ආනයන බද්ද කාණ්ඩ 4කට යටත් කිරීමයි. ඊට සමගාමීව para-tariff කියලා එකක් තිබුණා. ඒ කියන්නේ, යම්කිසි කෙනෙක් ආනයනයක් කරනවා නම් සෙස් බද්දකුත්, ඊට පස්සේ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ බද්දකුත් - PAL එකකුත් - ගෙවන්න ඕනෑ කියන එකයි. එතකොට, මෙන්න මේ බදු වර්ග දෙකත් ක්‍රමානුකූලව ඉවත් වෙනවා. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ ගෙනෙන නියමයන් දෙකෙන් වෙන්නේ අදියර කිහිපයක් යටතේ සෙස් බද්ද ඉවත් කරන්න කටයුතු කිරීමයි. මේ නියමයන් යටතේ HS Codes 37කට සෙස් බද්ද අලුතින් පැනවීමක් සිදු වෙනවා.

ඊළඟට, ආහාරයට ගන්නා තෙල් ගත්තාම, 2026 අය වැය යෝජනා අනුව HS Codes 17කට අදාළ සෙස් බද්ද ඉවත් කිරීමක් සිද්ධ වෙනවා. ඊටත් අමතරව, ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම අනුව අලුතින් HS codes 2ක් හඳුන්වා දීමත් මේ යටතේ සිද්ධ වෙනවා. ඊට අමතරව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14වැනි වගන්තිය යටතේ තෝරා ගත්ත භාණ්ඩ ආනයනයේදී වන සෙස් බද්ද අදියර වශයෙන් ඉවත් කිරීමක් තමයි මෙහිදී සිදු වෙන්නේ. තීරු බදු ව්‍යුහයේ ප්‍රතිසංස්කරණයක් ඇති කිරීම තමයි මේකෙන් බලාපොරොත්තු වන්නේ. මේක 2023 අය වැයෙනුත් කරලා, පළමුවැනි අදියර විතරක් ක්‍රියාත්මක කරලා එතැනින් එහාට ඒක සම්පූර්ණයෙන්ම ඇනහිට තිබුණා. 2026 අය වැය මඟින් එය නැවතත් බලගන්වා ඒ යෝජනා අනුව අපි අදියර 4කින් මෙන්න මේ විධියට තමයි සෙස් බද්ද ඉවත් කිරීම සිදු කරන්නේ. ප්‍රධාන කාණ්ඩ 5ක් යටතේ තමයි මේ සෙස් බද්ද ඉවත් කිරීම සිද්ධ වෙන්නේ.

පළමුවැනි එක තමයි, ආන්තික අනුපාතවලට යටත් වන HS codes 46ක් හඳුනාගෙන ඒ HS codes 46ට අදාළ සෙස් බද්ද 2026 අවුරුද්දේ සියයට සියයකින්ම සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමකට ලක් කිරීම. ඊට පස්සේ අතරමැදි භාණ්ඩ සහ ප්‍රාග්ධන භාණ්ඩ - intermediate goods and capital goods - කියන ඒවා සඳහා HS codes 693ක් හඳුනාගෙන, ඒ HS codes 693ට අදාළව 2026දී සියයට 50කුත්, 2027දී සියයට 25කුත්, 2028දී සියයට 25කුත් විධියට 2028 අවුරුද්ද ඉවර වෙනකොට සෙස් බද්ද සියයට සියයක්ම ඉවත් වීම සිදු වෙනවා.

විවිධ කර්මාන්තකරුවන් ඇවිල්ලා කර්මාන්ත අමාත්‍යාංශයත් එක්ක කථා කරලා තිබෙනවා. ඒගොල්ලන් ඉදිරිපත් කරපු කරුණු සලකා බලා මේ සෙස් බද්ද අඩු කිරීම තුළ ඒගොල්ලන්ට ඇති වන බලපෑම අවම කිරීම සඳහා විශේෂයෙන්ම හඳුනා ගත්ත HS codes 107කට අදාළ ආනයන වෙනුවෙන් පනවන සෙස් බද්ද අපි 2026දී ඉවත් කරන්නේ නැතුව 2027දී සියයට 25කුත්, 2028දී සියයට 25කුත් සහ 2029දී සියයට 50කුත් විධියට සම්පූර්ණයෙන්ම ඉවත් කරන විධියට තමයි කටයුතු සම්පාදනය කරලා තිබෙන්නේ මේ නියමය මඟින්.

ගරු කථානායකතුමනි, 2026 අය වැයෙන් මෙන්න මේ යෝජනාව ඉදිරිපත් කළා. අපේ දේශීය රෙදිපිළි නිෂ්පාදනයට VAT එකක් අය වෙනවා. රෙදිපිළි ආනයනයට ඒ වෙනකොට VAT එකක් අය වුණේ නැහැ. කර්මාන්තවලින් ලැබුණු ඉල්ලීමක් අනුව අය වැය යෝජනාවක් විධියට තිබුණා, ආනයනික රෙදිපිළිවලට VAT එකක් පනවනවා කියලා. ඒ VAT එක පැනවීමට අවශ්‍ය කටයුතු කරද්දි ආනයනික රෙදිපිළිවලට අදාළ සෙස් බද්ද ඉවත් කරන්න වෙනවා. මෙහිදී ආනයනික රෙදිපිළිවල HS codes 265කට අදාළ සෙස් බද්ද 2026 අවුරුද්දේ ඉවත් කිරීමත් මේ නියමය මඟින් සිද්ධ වෙනවා. ඊට අමතරව

පරිභෝජන භාණ්ඩ 1,523ක් සඳහා වන සෙස් බද්ද 2029දී සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට කටයුතු කෙරෙනවා. ඒ ආකාරයට තමයි අදියර කිපයක් යටතේ සෙස් බද්ද ඉවත් කිරීම සිද්ධ වෙන්නේ.

මේ සංශෝධන කිරීමට බලපෑ ප්‍රධාන හේතු මොනවාද කියලා අපි බලමු. ඒ සඳහා බලපෑ පළමුවැනි හේතුව මේකයි. අපේ බදු ප්‍රතිපත්තිය ඇතුළේ ඉතාම සරල බදු ප්‍රතිපත්තියක් හඳුන්වා දෙනවා කියලා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කරලා තිබෙන බව අප කවුරුත් දන්නවා. එම නිසා අපේ බදු ප්‍රතිපත්තිය සරල කිරීම මේකේ ප්‍රධාන අරමුණක්. ඊට අමතරව විනිවිදභාවය වැඩිදියුණු කරන එකත් ප්‍රධාන අරමුණක් වනවා. වෙළෙඳ ගිවිසුම් සඳහා ඇතුළත් වනකොට para-tariff කියන එක ලොකු බාධාවක් වෙලා තිබුණා. වෙළෙඳ ගිවිසුම් සඳහා ඇති වන ඒ බාධා ඉවත් කර ගැනීමත් මේකේ එක අරමුණක්. ඊට අමතරව විශේෂයෙන්ම අතරමැදි භාණ්ඩ සඳහා සෙස් බද්ද අයින් වීම තුළ නිෂ්පාදන අමුද්‍රව්‍යවලට වැය වන ආනයනික පිරිවැය අඩු වෙනවා. ආනයනික පිරිවැය අඩු වීම තුළ නිෂ්පාදනවල පිරිවැයත් අඩු වෙනවා. ගරු කථානායකතුමනි, නිෂ්පාදන පිරිවැය අඩු වෙනකොට අපේ රටේ ඉන්න දේශීය ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන සඳහා හොඳ අපනයන වෙළෙඳ පොළක් විවෘත වෙනවා. ඒ ආකාරයට දේශීය නිෂ්පාදකයන්ට හොඳ අපනයන වෙළෙඳ පොළක් විවෘත කර දීමත් මේකේ ප්‍රධානතම අරමුණක්. ඒ තුළින් දේශීය නිෂ්පාදනය වර්ධනය කිරීම සහ ජාත්‍යන්තර වෙළෙඳාමට පවතින බාධා ඉවත් කිරීම කියන ප්‍රධාන කරුණු - කාරණා තමයි මේකෙන් බලාපොරොත්තු වෙන්නේ.

Payment and Settlement Systems Act එක යටතේ නියෝග අපි ඉදිරිපත් කර තිබෙනවා. මෙතැනදී අපි බලාපොරොත්තු වෙන්නේ මේකයි. අපේ රටේ පවතින විද්‍යුත් මුදල්, ජංගම යෙදවුම් තිබෙනවා. මුදල් ප්‍රේෂණ සේවා තිබෙනවා. බලපත්‍රලාභී මුදල් හුවමාරු මධ්‍යස්ථාන තිබෙනවා. මේ ආයතන විසින් සිදු කරන ලද විද්‍යුත් සහ වෙනත් සේවා සැපයීම් විධිමත් නියාමනයකට ලක් කරන්න අවශ්‍ය කටයුතු සිද්ධ කිරීම තමයි මෙතැනදී බලාපොරොත්තු වෙන්නේ. ඒකට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන තමයි මෙතැනදී වඩාත් තහවුරු කරලා තිබෙන්නේ. අපි මේ සියලු කාරණාවලින් බලාපොරොත්තු වෙන්නේ අපේ රටේ සංවිධිත ආර්ථිකය වඩාත් කාර්යක්ෂම කරලා, තමන්ගේ වෙළෙඳ ව්‍යාපාරයන්ට හොඳ ආර්ථික වටපිටාවක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු කිරීමයි. මේවා අනුමත කිරීම සඳහා සියලුදෙනාගේම සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker).
Next, the Hon. S.M. Marikkar. You have ten minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.25]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තවශයෙන්ම වර්තමාන ආණ්ඩුව පත් වෙලා මේ වනකොට මාස 22ක් වෙනවා. මේ මාස 22 පිළිබඳ review එකක් කරලා බැලුවොත් අපට අවසානයට ඉතුරු වෙන්නේ කියපු බොරු ටිකයි, අන්දපු ටිකයි විතරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ආර්ථිකය පැත්තෙන් ගත්තොත්, පසුගිය අය වැය ඉදිරිපත් කරනකොට කිව්වා, මේ අවුරුද්දේ ආර්ථික වර්ධන වේගය සියයට 7කට ගෙනෙනවා කියලා. දැන් ඒකට හේතුව විධියට කියයි, යුද්ධය හින්දා කියලා. ඒ නිසා මම දකුණු ආසියාවේ තත්ත්වයත් අරගෙන ඒ කාරණය ඔප්පු කරන්නම්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කරලා තිබෙනවා, මේ අවුරුද්දේ ආර්ථික වර්ධන වේගය සියයට 3ක් කියලා. ඒ වාගේම ලෝක බැංකුව ආර්ථික වර්ධන වේගය සියයට 3.1ක් කියලා පුරෝකථනය කරලා තිබෙනවා. ඊළඟට, ආසියානු සංවර්ධන බැංකුව පුරෝකථනය කරලා තිබෙනවා, මේ අවුරුද්දේ ආර්ථික වර්ධන වේගය සියයට 4ක් සහ ලබන අවුරුද්දේ සියයට 4.2ක් කියලා. මේවා මම කියන ඒවා නොවෙයි.

මැද පෙරදිග පවතින යුදමය තත්ත්වය මුළු ලෝකයටම බලපෑවා. විශේෂයෙන්ම අපේ කලාපය උදාහරණයකට ගනිමුකෝ. කලාපයක් වශයෙන් ගත්තොත්, මේ අවුරුද්දේ වැඩිම ආර්ථික වර්ධන වේගය තිබෙන්නේ දකුණු ආසියානු කලාපයේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදාහරණයක් ගත්තොත් 2026 අවුරුද්දේ අපේ GDP growth එක තිබුණේ සියයට 3 - 4 දක්වායි. හැබැයි, ඉන්දියාවේ සියයට 6.9යි. සමස්තයක් විධියට කලාපයේ GDP growth එක සියයට 6.3යි. ඔන්න, ඇවිදින පුස්තකාල ගෙනැල්ලා වෙලා තිබෙන වැඩේ.

ඊළඟට උද්ධමනය ගත්තොත්, මේ අවුරුද්දේ අපේ රටේ උද්ධමනය සියයට 5.2 ඉඳලා සියයට 6.8ක් දක්වා ඉහළ යනවා. හැබැයි, ඉන්දියාවේ සියයට 4යි. කලාපයේ අනෙක් රටවල අපට වඩා අඩුයි.

ඊළඟට, මේ කලාපයේ IMF Programme එක අයින් කරනවාය කියලා, IMF එකට වැඳ වැටීගෙන ඉන්නේ අපි. දැන් පාකිස්තානය අරගෙන බැලුවොත්, අපේ කලාපයේ අනෙක් රටවල් අරගෙන බැලුවොත්, යුරෝපා හවුල සහ එක්සත් රාජධානිය එක්ක තිබෙන නිදහස් වෙළෙඳ ගිවිසුම් නිසාම ඒ රටවල ආර්ථිකය විශාල වේගයකින් ඉදිරියට යනවා. අපි compare කරලා බලන්න ඕනෑ. අඩුම තරමින් අපට අල්ලපු රටෙන් ඇවිල්ලා තිබෙන යටිතල පහසුකම් ආයෝජන පවා ගන්නේ නැහැ. උදාහරණයක් ගත්තොත්, ඉන්දියානු රජය ඩොලර් මිලියන 64.5ක grant එකක් දීලා තිබෙනවා, කන්කසන්තුරේ වරාය හදන්න. ආණ්ඩුව අවුරුදු දෙකක් තිස්සේ අත පත ගගා ඉන්නවා. අපි කැමැති වුණත්, අකැමැති වුණත් පිළිගන්න ඕනෑ, දෙමළ ඩයස්පෝරාව දකුණේ ආයෝජනය කරන්නේ නැහැ කියලා. මේ වරාය හැදුවාම වරාය විතරක් නොවෙයි, ආනුෂංගික යටිතල පහසුකම් දියුණු වීමත් එක්ක ඒ පළාතට ආයෝජන එනවා. ඒ එක්කම දකුණු ඉන්දියානු වෙළෙඳ පොළ අපට විවෘත වෙනවා. ඊළඟ අවුරුදු තුන හතරේ දකුණු ආසියාවේ දියුණුතම වෙළෙඳ පොළ බිහි වෙන්නේ හයිද්‍රාබාද්වලයි, බැංගලෝර්වලයි. අපට ඒ වෙළෙඳ පොළෙන් ප්‍රයෝජන ගන්න පුළුවන්. නමුත් තටම තටම ඉන්නවා. ඊළඟට, තෙල් bunkeringවලට ගිවිසුමක් ගැහුවා කියලා ඇන්දුවා. අච්චර එනවා, මෙච්චර එනවා, බටෙන් මේවා ගේනවා, අරවා ගේනවා කියලා කිව්වා. මොකුත් වෙලා නැහැ.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සුමාන දෙකකට කලින් පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් ඇහුවා, ඔය කයිය ගහනවා වාගේ උත්තර දෙන්න කියලා. මේ මාස 22ක කාලය තුළ ආපු සෘජු විදේශ ආයෝජන මොනවාද කියලා මම ඇහුවා. එක ඩොලරයක්වත් ඇවිත් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම ගෙනාවා නම් මොනවාද ව්‍යාපෘති, පටන් අරගෙන තිබෙන්නේ කවදාද, ඉවර වෙන්නේ කවදාද, ඒවායේ නිෂ්පාදනය කරන්නේ මොනවාද, රැකියා අවස්ථා කොච්චර බිහි වෙලා තිබෙනවාද කියලා ඇහුවා. ඒකට උත්තර දුන්නේ නැහැ, කල් ගත්තා. උත්තර දෙන්න බැහැ නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කටින් බතල කොළ හිටවනවා වාගේ මොන බොරුව කිව්වත්, මොන සුරංගනා කථාව කිව්වත්, ලස්සන රචනාවක් වාගේ කිව්වත් මහ පොළොවේ යථාර්ථය මොකක්ද කියා තේරෙනවා. මම උදාහරණයක් දෙන්නම්කෝ. "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේ ගරු ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කිව්වා, තහඩුවක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කියලා. තහඩුවක් ගියත් ලක්ෂ 10ක් දෙනවා කිව්වා. *[බාධා කිරීමක්]* කොහේද? පොඩ්ඩක් ඉන්න. මේක අහගන්න. මම කියන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාටත් ඡන්දය දුන්න ජනතාව කොලොන්නාවේ ඉන්නේ. "දිට්වා" සුළි කුණාටුවෙන් තනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් හැටියට වැඩිම ආපදාවට ලක් වුණේ කොලොන්නාව. පවුල් 30,000ක් හානියට ලක් වුණා. ඒ සඳහා නිවාස වන්දිය රුපියල් ලක්ෂ 50 නොවෙයි, ලක්ෂ 10 නොවෙයි, ලක්ෂ 5ක් දෙනවා කිව්වා. ඒකෙනුත් ලක්ෂ 3ක්ලු, දෙන්නේ. ඒක දෙන්නේ ඔප්පු තිබෙන අයට විතරයිලු. පවුල් 17,000ක් ඉන්නවා, ඔප්පු තිබෙන අය. ඒකෙන් 7,000ටයි දීලා තිබෙන්නේ. සතියට 500 ගානේලු දෙන්නේ. ඇයි? සමෘද්ධි බැංකු හරහා බෙදන්නේ නැතිව සංදර්ශන දාන්න, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ගෙනිහිල්ලා තිබෙනවා බෙදන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මනාප 12,000ක් ලැබුණා, කොලොන්නාවෙන්. හොයලා බලන්න මේක ගැන. ඔප්පු නැති අයට සල්ලි දෙන්නේ නැහැ. පසුගිය 30වැනිදා පැවැති ව්‍යසන කළමනාකරණ රැස්වීමේදී මම මේ කාරණය ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කළා. නමුත්, ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ. ඔප්පුවක් තිබෙන ගෙදරට සල්ලි දෙනවා. ඔප්පුවක් නැති අල්ලපු ගෙදරට සල්ලි දෙන්නේ නැහැ. අර නයා ඇවිල්ලා බලාගෙන ඉන්නවා වාගේ ගංවතුර ඇවිල්ලා අහන්නේ නැහැ, ඔයාට ඔප්පු තිබෙනවාද, නැද්ද කියලා; ඔයාට සල්ලි තිබෙනවාද නැද්ද කියලා; ඔයා JVP එකට ඡන්දය දුන්නාද, SJB එකට ඡන්දය දුන්නාද කියලා. පවුල් 10,000කට මුදල් ලැබිලා නැහැ. ඇත්ත වශයෙන්ම මේ ජනතාවම තමයි මේගොල්ලන්ව ගෙනාවේ. අද මේගොල්ලන්ට ඡන්දය දුන්න අයම තමයි ඇවිත් අපට දුක්ගැනවිලි කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ දැනගැනීම සඳහා මම මේ කාරණයත් කියන්නම්. 2016දී අපි ගෙවල් 19,905කට රුපියල් ලක්ෂ 23,00ක් වන්දි වශයෙන් ලබා දුන්නා. ඔප්පු තිබුණාද, නැද්ද කියා බැලුවේ නැහැ. ඒ ඔක්කෝම අයට දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්. ඔප්පු නොදී හිටියාම පදිංචිය අතහැරලා යයි කියලා මේගොල්ලන් හිතනවා නම්, ඒක වැරදියි. කොලොන්නාවේ මිනිස්සු එහෙම යන්නේ නැහැ. පවුල් 10,000කට වන්දි ලබා නොදුන්නා කියන්නේ සාහසික ක්‍රියාවක්. ඒ පවුල් 10,000න් වැඩි හරියක් මේ අය බලයට පත් කරන්න - ගරු ජනාධිපතිතුමාව බලයට පත් කරන්න, මේ පොල් ලෙලි, පා පාසි ගේන්න - ඡන්දය දුන්න කට්ටිය. ඒ නිසා මම විශ්වාස කරනවා, ජනාධිපතිතුමා මේ සම්බන්ධව සානුකම්පිතව කල්පනා කරලා තීරණයක් ගනීවි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අයට ඒ ඉන්න ගෙදරට ඡන්දය තිබෙනවා, ටැක්ස් බිල තිබෙනවා, වතුර බිල තිබෙනවා, කරන්ට් බිල තිබෙනවා. හැබැයි, ඔප්පු නැහැ කියලා වන්දි දෙන්නේ නැහැ. ගංවතුර ආපු වෙලාවේ ඒ ගෙවල්වල පදිංචිව වෙලා සිටියා කියලා ඔප්පු කරන්න ඕනෑ තරම් සාධක තිබෙනවා. එහෙම තිබියදීත් තමයි වන්දි දෙන්නේ නැත්තේ. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. උද්ධච්ච විධියට හැසිරෙන්න එපා. අඩු ගණනේ sensible වෙන්න ඕනෑ තැන්වල පොඩ්ඩක් sensible වෙන්න. එතකොට මේ ගොඩක් ප්‍රශ්න මඟ හැර ගන්න පුළුවන්. එහෙම නේද, මා මිත්‍ර ලාල් කාන්ත ඇමතිතුමා? ඔබතුමා මගේ මිත්‍රයා. මම ඔබතුමාට සලකනවා, sensible වෙන හින්දා. එසේ sensible නොවීමේ විපාකයක් විධියට තමයි මීගමුව බන්ධනාගාරයේ සිදුවීම වුණේත්. ඒ, sensible නොවීමේ විපාකය!

බලන්න, පාර්ලිමේන්තු සතියේදී දිනපතාම පාර්ලිමේන්තුවට උදෙන්ම එන පුද්ගලයෙක් තමයි අපේ අධිකරණ ඇමතිතුමා. අද එතුමා පැත්ත පළාතක නැහැ. අද නැහැ. ඒ ඇයි? දැන් කියාවි, මීගමුවට ගියා කියලා. 27දෙනෙක් මැරුණාට පසුව මොන වැඩකටද දැන්? එහෙම නම් එම සිද්ධිය වුණු පළමුවෙනි දවසේ රෑ දෙදෙනෙක් මැරෙනකොට, - එදා රෑ එතැන අපරාධ ස්ථානයක් - 2,400ක් මිනිස්සු එතැන හිටියා. ඒ මොහොතේ එය කළමනාකරණය කරන්න ඕනෑ. ඒ 2,400දෙනාම එම ගැටුමට සම්බන්ධ අය නොවෙයි. ඒ ගැටුමට සම්බන්ධ අයව isolate කරලා සුදුසු ආරක්ෂිත ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. මාධ්‍යයෙන් ඒ ගැන ඇහුවාම එතුමා කිව්වා, "මම සමාජ මාධ්‍ය බැලුවේ නැහැ, පැය තුන-හතරකින්" කියලා. මොන උත්තරයක්ද මේක? පළමුවෙනි දවස් දෙක අයින් කරමුකෝ. ඊළඟ දවසේ සිදු වුණු මිනීමැරුම් 25ට ආණ්ඩුව වගකියන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. S.M. Marikkar, you have only two more minutes.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම wind up කරන්නම්.

මම දැක්කා, එතුමා කියනවා විපක්ෂ නායකතුමා අයින් වෙන්න ඕනෑලු, ජනාධිපතිවරණය පැරදුණු නිසා කියලා. එහෙම නම් අනුර කුමාර මැතිතුමා දහ වතාවක් විතර අයින් වෙන්න ඕනෑ, ජනාධිපතිවරණ, මහ මැතිවරණවලදී සියයට තුන, සියයට තුන ගත් එකට. නේද? එහෙම නම් මේ ඉන්නා ඇමති මණ්ඩලය මහ මැතිවරණයකින් පැරදුණොත් එතැනින් අයින් වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොඳ වෙලාවට JVP එකේ කට්ටිය මේ විපක්ෂය පැත්තේ නැත්තේ. මොකද, හර්ෂණ නානායක්කාර ඇමතිතුමා මාලිමාවේ. එහෙම නම් කුඩු වෙන්න ගහන්නේ, නේද? මොකද, වත්මන් ජනාධිපතිතුමා නේ, ඒ දවස්වල මෙතැන ඉඳගෙන කිව්වේ, ආණ්ඩුව වගකියන්න ඕනෑ; අයින් වෙන්න ඕනෑ කියලා. අපේ නලින්ද ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමා ඒ වෙලාවේ පොඩි තල්ලුවකුත් දුන්නා ඒකට. ඒවා අපි කියපු ඒවා නොවෙයි. ඒගොල්ලන් කිව්වේ.

බලන්න, දොර අඟුළුවලින් තුවක්කුව දමා වෙඩි තිබ්බාම, දැන් සමාජ මාධ්‍ය තුළ campaign එකක් කරනවා, "බණ කියන්නද?

කියලා අහලා. අද එහෙම අහන උදවියම ඒ කාලයේ කිව්වේ මොනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ වෙලාවේ පෙන්වන මේ ඡායාරූපය **සභාගත*** කරනවා.

මේ ඡායාරූපයේ තිබෙන්නේ ගරු අගමැතිතුමියයි, පෝල්රාජ් ඇමතිතුමියයි protest කරන එකක්, "සිරකරුවන් ඇතුළු සියලු ජනතාවගේ ජීවත්වීමේ මානව අයිතිය සුරකිනු!" කියලා. එතකොට ඒ දවස්වල කියපු ඒවා දැන් වලංගු නැද්ද? වලංගු නැද්ද?

ඊළඟට, මම තවත් ඡායාරූපයක් පෙන්වනවා. මම මේ ඡායාරූපයත් **සභාගත*** කරනවා.

මෙම ඡායාරූපයේ ඉන්නේ කොළඹ දැන් ඉන්නා නගරාධිපතිතුමිය. එතුමිය protest කර තිබෙනවා, "ඉල්ලුවේ බෙහෙත්. දුන්නේ bullet" කියලා. මේ, ප්‍රගතිශීලී ස්ත්‍රී එකමුතුව කියපු ඒවා. දැන් කෝ? මේ අපි කියපු ඒවා නොවෙයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. S.M. Marikkar, your time is up now.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
I am going to wind up, Sir.

මේවා අපි කියපු ඒවා නොවෙයි. ඔයගොල්ලන් කියපු ඒවා අපි ප්‍රතිරාවය කරනවා. නැද්ද, ලාල් කාන්ත ඇමතිතුමා? අපි කියලා නැහැ නේ. අපි කිව්වේ නැහැ. ඔයගොල්ලන් කියපු ඒවා තමයි දැන් ප්‍රතිරාවය වෙන්නේ.

මම අවසාන වශයෙන් ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි, මේ කාරණයත්. මේ ආණ්ඩුවට අපි කියන්නේ උද්ධච්චකම අත හැරලා, මහන්තත්තකම අත හැරලා - ඇති මහන්තත්තකමක් නැහැ. මචා ගත්ත එකක් තිබෙන්නේ - ආර්ථිකමය වශයෙන් වේවා, සමාජයීය වශයෙන් වේවා, සංස්කෘතිකමය වශයෙන් වේවා, ඒ ඒ ක්ෂේත්‍රවල අයට සාවධානව ඇහුම් කන් දුන්නා නම්, මීට වඩා ගොඩක් දේවල් කරගන්න පුළුවන් බවයි. ඒ බවත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Bimal Rathnayake. You have 13 minutes.

[පූ.භා. 11.35]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානාකතුමනි, අද දින මගේ අමාත්‍යාංශයට අදාළව තිබෙන මෝටර් වාහන පනත යටතේ ගෙනෙන නියෝග සම්බන්ධයෙන් වන සාකච්ඡාවට එන්න කලින්, මීට පෙර කථා කළ කථිකයෙක් කියපු දෙයක් සම්බන්ධව අදහසක් දක්වන්න ඕනෑ. එතුමා South Asian countriesවල economic growth එක ගැන කිව්වා. මම දන්නේ නැහැ, මලපොත බලලාද කිව්වේ කියලා. මෙහි, "According to the World Bank's regional outlook, the overall South Asian growth is projected to average 6.3 per cent for the full year of 2026. The Quarter 1 - Q1 - 2026 GDP breakdowns for the region’s prominent economies indicate the following performance metrics" යනුවෙන් සඳහන් වෙනවා. වෙලාව යන නිසා මම කෙටියෙන් කියන්නම්. India, 7.8 per cent GDP growth එකක් මේ අවුරුද්දේ බලාපොරොත්තු වෙනවා. Q1 එකේ 7.1 per cent තිබෙනවා, ගිය අවුරුද්දට වඩා. ඊට පසුව, Sri Lanka. "Sri Lanka has sustained its steady macroeconomic recovery path, showing resilient expansion despite recent localized climate challenges" ලෙස සඳහන් වෙනවා. GDP growth, 5.1 per cent; 2025 පළමුවෙනි කාර්තුවේ සිට 2026 පළමුවෙනි කාර්තුවට දමා තිබෙනවා, සියයට 5.1ක growth එකක්.

අනෙක් රටවල ඒවා අපට වඩා හොඳයි කිව්වා නේ. බංග්ලාදේශයේ සහ පාකිස්තානයේ තිබෙන්නේ, වර්ධනය සියයට 4.1යි. ඊට පස්සේ inflation ගැනත් කිව්වා නේ. Inflation ගැන තිබෙන්නේත් ඒ විධියටම තමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පළ වී තිබෙන වාර්තාවේ තිබෙන්නේ, 2026 පළමුවැනි කාර්තුවට අදාළව විතරයි. ඉන්දියාවේ inflation එක ජනවාරි මාසයේ සියයට 2.74යි; පෙබරවාරි මාසයේ සියයට 3.21යි; මාර්තු මාසයේ සියයට 3.4යි. එතකොට ශ්‍රී ලංකාවේ? ජනවාරි මාසයේ සියයට 2.3යි; පෙබරවාරි මාසයේ සියයට 1.6යි; මාර්තු සියයට 2.2යි. In the Rest of the region? Pakistan and Bangladesh, while experiencing a gradual easing compared to the severe double -digit shocks of previous fiscal years. එහෙම නම්, මළ පොත තමයි බලන්න ඇත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි එක තමයි,-

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I will come back to you. -*[Interruption.]* Hon. Minister, do you wish to be interrupted?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා අවස්ථාව දෙන්නේ නැත්නම් මට කථා කරන්න පුළුවන්. එකම දේ, මට disturb කරන්න දෙන්න එපා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Member? I will give you 30 seconds, that is all.

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මූලාශ්‍රය නම්, "Corporate Finance and Treasury Briefing". එතුමාට කියන්න මූලාශ්‍රය කියන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you may please continue.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පිස්සන්ව අවුස්සන්නේ නැහැ. මම නම කිව්වේ නැහැ නේ. *[බාධා කිරීමක්]* මම පිස්සෝ අවුස්සන්නේ නැහැ.

දෙවැනි කාරණය මේකයි. එක්කෙනෙක් කිව්වා මහන්තත්තකම ගැන, උඩඟුකම ගැන, උද්ධච්චකම ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා බලන්න, ඒ කථාවේ එතුමා කියනවා, මේ රටේ මහජනතාව පත් කරපු මන්ත්‍රීවරුන්ට, "පාපිසි" සහ "පොල්ලෙලි" කියලා. එතකොට මේගොල්ලෝ අරාබි නිසොල්ලාසයේ එන Golden Carpet එක ද? *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්නේ මේකයි. පිස්සෝ කලබල වුණාට අපි කලබල වෙන්නේ නැහැ. ඒ කථාව කවුරු කිව්වා වුණත්, මම කියන්නේ මේකයි. අපි උදාහරණයක් ගනිමු. තමන් කථාවක් කරනවා මෙතැන කට්ටිය උද්ධච්චයි කියලා. ඒ ගමන්ම, ජනතාව පත් කරලා එවපු මන්ත්‍රීවරුන්ට අර වාගේ අපහාසාත්මක දේවලුත් කියනවා. ඒක හරිද? මම 2000දී පාර්ලිමේන්තුවට ආවේ. මම නම් එදා ඉඳන්, මැතිවරණයකින් පත් වෙලා එන ඕනෑම මන්ත්‍රීවරයෙකුට ගරු කරනවා. මම මේක හැමදාම කියන දෙයක්. චාමර සම්පත් මන්ත්‍රීතුමාට නඩු තිබෙනවා. නමුත්, එතුමා elected Member. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් එතුමාට කරන්න පුළුවන් හැම දේම මම කරනවා. නඩු තිබෙන තවත් අය ඉන්නවා. ඡන්ද ගණන කීයද, මනාප ගණන කීයද කියන ඒවාට අපි සතපහකට සලකන්නේ නැහැ. අපි මන්ත්‍රීවරුන්ට ගරු කරන්න දන්නවා. මා ඇමති ධුරය දරද්දීත්, 2004දී නියෝජ්‍ය ඇමති ධුරය දරද්දීත් ඕනෑම පක්ෂයක මන්ත්‍රීවරුන්ගේ, ඇමතිවරුන්ගේ ලියුම්වලට වෙනම ෆයිල් එකක් තබාගෙන හිටියා. මම ඒවාට උත්තර දුන්නා. අපි elected අයට සලකනවා, ඒගොල්ලෝ ඡන්දය දිනුවේ කොහොම වුණත්. අපට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. දැන් මොකක්ද මෙතැනදී කළේ? අපට උද්ධච්චයි කියන මිනිහා කියනවා, පත් වෙලා ආපු මන්ත්‍රීවරු "පොල්ලෙලි" සහ "පාපිසි" කියලා. මේ, golden carpets.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදේ සෙට් එකක් මොකක්ද පටියක් බැඳගෙන හිටියා අපි දැක්කා. අපි අහන්න කැමැතියි, ඒක අපිත් බඳින්න ඕනෑ එකක්ද කියලා. එහෙම නැත්නම් කෘත්‍යාධිකාරි මණ්ඩලයේ කට්ටිය හිරේ ඉන්න නිසා වෙච්ච දෙයක්ද? එහෙමත් නැත්නම්, දැන් එය ගලවා තිබෙන්නේ ඇයි? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවුද මේ? ඕවා නිසා තමයි අපට මේගොල්ලෝ ගැන ඔය විධියට හිතෙන්නේ. අපිත් විපක්ෂයේ ඉඳලා තිබෙනවා. අපි මන්ත්‍රීතුමන්ලා, ඇමතිතුමන්ලා එක්ක වැඩ කරලා තිබෙනවා. අපි කවදාවත් මන්ත්‍රීවරයෙකුගේ, අගමැතිවරයෙකුගේ උපාධි දිහා බලලා, හැසිරීම් දිහා බලලා එතුමන්ලා මෙතැනදී හැල්ලු කරලා නැහැ. මේ මනෝ රෝගයක් තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා doctor කෙනෙක් නිසා කරුණාකරලා මේ පාර්ලිමේන්තුවේ ක්ලිනික් එකක් දමන්න,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

බෙහෙත් දෙන්න. පව්, මේගොල්ලෝ. මෙතුමන්ලාට තිබෙන ප්‍රශ්නය මේකයි. මොකක් හරි බොරුවක් කියනවා. මොකද, කට සද්දයි නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවාද, අද ගරු හර්ෂණ ඇමතිතුමා මෙතැනට එන්නේ නැත්තේ ඇයි කියලා? මට අද උදේ එතුමා කිව්වා. මා හිතන විධියට නජිත් මන්ත්‍රීතුමාත් එතැනට ගියාද කොහේද. මම වටගල ඇමතිතුමාටත් යන්න කිව්වා. අද උදේ තමයි, මරා දමන ලද බන්ධනාගාර නිලධාරින්ගේ - ඒ රජයේ සේවකයන්ගේ - මෘත දේහ බන්ධනාගාර මූලස්ථානයට අවසන් ගෞරව දැක්වීම සඳහා ගෙන එන්නේ. ඔබතුමා දැක්කා නම් ඒ සිදුවීම, බලාගෙන ඉන්න අමාරුයි. තම සහෝදර නිලධාරි මහත්ම මහත්මීන් කොච්චර නම් වේදනාවෙන් හැපෙනවාද කියලා බලන්න. ඒ දේහයන්ට අවසන් ගෞරව දක්වන්න තමයි හර්ෂණ ඇමතිතුමා ගියේ. මා කියන්නේ ඒ මන්ත්‍රීතුමා ඒ කථාව කියපු වෙලාවේ එතුමාගේ body language එක බලන්න කියලායි. "26ක් මැරුණාට පස්සේ මොන පාර්ලිමේන්තුද?" කියලා අහන්නේ පුදුම සතුටකින්. ඔබතුමාට මම කියන්නේ ඒ කථාව කියපු වෙලාවේ එතුමාගේ body language එක බලන්න කියලායි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අන්න ඒ වගේ කට්ටිය, මේ. හරිද? ඒ නිසා අපි ජනතාවට කියන්න කැමැතියි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ටික අයින් කරලා දෙයියනේ කියලා අපට සාධාරණ, සබුද්ධික විපක්ෂයක් දෙන්න කියලා. මා හිතන්නේ, අදට ඔය ඇති. මොකද, දැන් ඔබතුමන්ලාට ෆැරන්හයිට් අංශක 104ට විතර උණ හැදිලා ඇති. ගිහිල්ලා බෙහෙත් ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන් මාතෘකාවට අදාළ කථාවට ඉතා ඉක්මනින් එන්නම්. අද අපි මෝටර් වාහන පනත යටතේ වන නියෝග ද ඉදිරිපත් කර තිබෙනවා. අපි පක්ෂ, විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා, අපේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී අපට එය සම්මත කරලා දුන්නාට. ඒ කියන්නේ, මෝටර් වාහන පනත යටතේ නියෝග සංශෝධනය කිරීම සඳහා ප්‍රකාශයට පත් කරන ලද 2026 මාර්තු 19 දිනැති අංක 2480/22 දරන ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න එතුමන්ලා අනුමත කර දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නියෝගවල සරල අදහස මේකයි. අධිවේගී මාර්ගවල ධාවනය කරන වාහනවල ඉස්සරහ seatsවල සහ පිටුපස seatsවල යන ඔක්කෝටම අපි seatbelts අනිවාර්යය කළා. මොකද, වාහනය පැයට කිලෝමීටර 100ක වේගයෙන් යන්නේ. Seatbelt එකක් නොතිබුණොත් වාහනයේ පිටුපස යන අය තමයි වැඩිම අනතුරට ලක් වෙන්නේ. අධිවේගී මාර්ගවල මිය යන සංඛ්‍යාව සාපේක්ෂව අඩු වුණාට, මිය යන අයගෙන් සැලකිය යුතු පිරිසක් පිටුපස seatsවල යන අයයි මැරෙන්නේ; බොහෝ විට ඒ වාහනයටම යට වෙලායි මැරෙන්නේ. ඒ නිසා තමයි අපි අධිවේගී මාර්ගයේ ධාවනය කරන සෑම වාහනයකම යන සෑම කෙනෙකුටම seatbelts දාන්න කියලා අනිවාර්යය කළේ. ඒ, මිනිසුන්ට තිබෙන ආදරය නිසා. එහෙම නැතිව අපට දඩ මුදල් ගන්න නොවෙයි. අපට එහෙම රෝගයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිවේගී මාර්ගයේ ගමන් කරන වාහන වර්ග ගණනාවක් තිබෙනවා. ඒවා අතර තිබෙනවා, වාහනය නිෂ්පාදනය කරද්දී නිෂ්පාදකයා විසින් ආසන පටි සවි කරලා ආපු නැති වාහනත්. ඒ කියන්නේ, ඒ වාහනවලට seatbelts නැහැ. ඒ නිසා අපි නියෝගයක් පැනෙව්වා, ඒවාට seatbelts හදා ගන්න කියලා. අපි 2025 අවුරුද්දේ සැප්තැම්බරයේ තමයි ඒ නියෝගය ලබා දුන්නේ. ඒ හැම වෙලාවේම අපි යම්කිසි සහන කාලයක් ඒ වාහන හිමියන්ට ලබා දුන්නා, අධිවේගී මාර්ග භාවිත කරන්න ඕනෑ නම් seatbelts සවි කර ගන්න කියලා. අපි ඒ සහන කාලය අවස්ථා දෙකකදී දීර්ඝ කර තිබෙනවා. අපි අද ඉදිරිපත් කර තිබෙන මේ ගැසට් එකෙන් කරලා තිබෙන්නේ නිෂ්පාදකයා විසින් ආසන පටි සවි කරපු නැති වාහනවලට seatbelts හදා ගන්න ජූනි 19 දක්වා කල් දීලා තිබීම. අපි දැන් තවත් මාස තුනකට - සැප්තැම්බර් 19 දක්වා - මේ ගැසට් එක දීර්ඝ කර තිබෙනවා. ඒ දීර්ඝ කිරීම කරපු ගැසට් එකත් ඉදිරි කාලයේදී අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

අධිවේගී මාර්ගය පාවිච්චි කරන හැම කෙනාටම අපි කියන්න කැමැතියි, අවුරුද්දක්ම මේ සහන කාලය දීලා තිබෙන බව. එහෙම දිය යුතුයි. මොකද, එක පාරම මේක කරන්න බැහැ. ඒ නිසා අන්තිම දවස වන සැප්තැම්බර් 18වන දා seatbelts සවි කර ගන්න යන්නේ නැතිව කරුණාකරලා ඊට පෙර seatbelts සවි කර ගන්න. තවමත් seatbelts සවි කරගෙන නැති නම්, තවත් මාස තුනක කාලයක් තිබෙනවා. කරුණාකර ඊට පෙර seatbelts සවි කර ගන්න. එහෙම නැතිනම්, ඔබතුමන්ලාට ඊට අදාළ කරන අනතුරුවලට මුහුණ දෙන්න සිද්ධ වෙයි. ඒ වාගේම මගීන්ද seatbelts තිබෙන වාහනවල අනිවාර්ය වශයෙන් seatbelts පාවිච්චි කරන්න ඕනෑ. “My life, my petrol” කියලා යන්න බැහැ. මොකද, මගීන් තුවාල වුණාම ඉස්පිරිතාලවලට ගෙවන්නේත් අපේ රටේ ජනතාවගේ බදු සල්ලි. ඒ පුද්ගලයා අසරණ වුණොත්, අනාථ වුණොත්, එහෙම නැත්නම් ඒ පුද්ගලයා මැරුණොත් හෝ ලොකු අනර්ථයක් වුණොත් ඒ පවුල නඩත්තු කරන්න වෙන්නේත් ආණ්ඩුවට. කොහොමටත් ලංකාවේ නීතිය අනුව සිය දිවි නසා ගැනීම අයිතියක් විධියට පිළිගන්නේ නැහැ නේ. ඒ නිසා seatbelts දා ගෙන යන්න. මොකද, පැයට කිලෝමීටර් 100ක වේගයෙන් ගිහිල්ලා කොහේ හෝ වැදුණොත්, seatbelts දා ගෙන හිටියේ නැත්නම් විශාල අනතුරක් වෙනවා. එම නිසා මගීන්ගේ ආරක්ෂාව තමයි අපි මෙම නියෝගවලින් බලාපොරොත්තු වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊට අමතරව මම තවත් දෙයක් කියන්න කැමැතියි. මෑතකදී අපට සිද්ධ වුණා, මගී ප්‍රවාහන බස් ගාස්තු වැඩි කරන්න. එසේ බස් ගාස්තු වැඩි කරන්න සිද්ධ වුණේ ඇයි? බස් ගාස්තු සකස් කරද්දී මීට කලින් සිට එකඟ වෙච්ච ක්‍රමවේදයක් තිබෙනවා. ගාස්තු ක්‍රමවේදය හදන්න සූත්‍රයක් - formula එකක් - තිබෙනවා. ඒකට ඉන්ධන වියදම්, බැංකු ණය, බස් එකේ ක්ෂය වීම, සේවක පඩි නඩි ආදිය ඇතුළත්ව තිබෙනවා. එවැනි කරුණු 12කින් තමයි එය හැදෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අනුව ගත්තාට පස්සේ සාමාන්‍යයෙන් කැබිනට් මණ්ඩලය මීට කලින් සිටම එකඟ වී තිබෙන ප්‍රතිපත්තිය තමයි, සෑම වසරකම ජූලි 01වන දාත්, ජූලි 31වන දාත් අතර බස් ගාස්තු සංශෝධනය කළ යුතුයි කියන එක.

ඒ වාගේම, අපේ රටේ තෙල් ගාස්තුව පහුගිය කාලයේම වැඩි වුණේ නැහැ. පසුගිය මාර්තු 10 දක්වා සාමාන්‍ය විධියට තමයි වැඩි වුණේ. ඒ නිසා අපේ ආණ්ඩුවේ පළමුවැනි මාස 18 ඇතුළේ බස් ගාස්තු සාමාන්‍ය මට්ටමින් පවත්වාගෙන යන්න අපට පුළුවන් වුණා. ඊට පස්සේ ඇමෙරිකාවෙන් පටන් ගත්ත Iran war එක ආවාට පස්සේ ලෝකයේ තෙල් ගාස්තු වැඩි වුණා. ඒක බස් හිමියන්ට බලපෑවා. ඒකත් තවත් සාධකත් අරගෙන තමයි අපි බස් ගාස්තු ගණනය කරලා තිබෙන්නේ. ඒ අනුව කැබිනට් මණ්ඩලය අපට අවසර දුන්නා, සියයට 15ක බස් ගාස්තුවක් වැඩි කරන්න. නමුත්, ඒ යෝජනාව කැබිනට් මණ්ඩලයට යන දවසේ ලංකාවේ තෙල් මිල අඩු වෙච්ච නිසා අපි සියයට 12ට අඩු කරලා තමයි බස් ගාස්තුව වැඩි කරලා තිබෙන්නේ. මේ ගාස්තු වැඩිවීම ජනතාවට අමාරුයි කියලා අපි දන්නවා. ඇත්තටම ගත්තොත්, ඒක වැඩි විය යුතු දෙයක් නොවෙයි. විශේෂයෙන්ම පොදු ප්‍රවාහනයේ ගාස්තු අඩු වෙන්න ඕනෑ. නමුත්, පොදු ප්‍රවාහනයේ ගාස්තු අඩු කරන්න වෙන්නේ රටේ සමස්ත ආර්ථිකයත් එක්ක තියලා බලලායි.

ඒ කෙසේ වෙතත්, බස් ගාස්තුව සියයට 12කින් වැඩි වුණා. අපි බලාපොරොත්තු වෙනවා අගෝස්තු මාසයේ හෝ ඊළඟ මාසවල තෙල් ගාස්තු අඩුවීමත් එක්ක ක්‍රමානුකූලව මේ බස් ගාස්තු තව අඩු කරන්න. දුම්රිය ගාස්තු වැඩිවීමක් අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ. හරියට ගත්තොත්, ඒවාත් වැඩි කරන්න ඕනෑ. සූත්‍රවලට දාලා බැලුවොත් දුම්රිය ගාස්තුත් වැඩි කරන්න ඕනෑ. දුම්රිය සහ බස් කියන්නේ පොදු ප්‍රවාහන මාධ්‍ය. ඇත්තටම පුළුවන් නම්, රටට සල්ලි තිබෙන වෙලාවක නගරාශ්‍රිතව පොදු ප්‍රවාහනය නොමිලේ කරලා, කාර් ගෙවල්වල තියන්න තමයි ඕනෑ. ඒක තමයි යන්න තිබෙන තැන. නමුත්, දැන්ම එතැනට යන්න බැහැ.

හැබැයි, මේ කැබිනට් පත්‍රිකාවෙන් බස් ගාස්තු ඇතුළු තවත් කරුණු රාශියක් සඳහා අපට අවසර දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මම ඉතා ඉක්මනින් ඒවා කියන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ වෙච්ච හොඳ දේවල් ටිකකුත් තිබෙනවා. බස් ගාස්තු වැඩිවීම නොවෙයි. පොදු කැබිනට් පත්‍රිකාවෙන් වෙච්ච හොඳ දේවල් ටිකකුත් තිබෙනවා. එකක් මේක. මීට කලින් සාමාන්‍ය බස් එකක ගාස්තුව රුපියල් 100ක් නම්, A/C bus එකක ගාස්තුව රුපියල් 200යි. ඒ වාගේම, අධි සුඛෝපභෝගී කියලා බස් ජාතියක් තිබුණා. ඒ බස්වල ගාස්තුව රුපියල් 300යි. එක, දෙක, තුන; එවැනි අනුපාතයකට තමයි ඒ ගාස්තු අය කළේ. නැත්නම් එක, දෙක, දෙකයි දශම පහ විධියට. එහෙම තමයි තිබුණේ. නමුත්, කැබිනට් මණ්ඩලය තීන්දු කර තිබෙනවා, එසේ නොකරන්න. ඒ නිසා මින් ඉදිරියට බස් ගාස්තු ඒ විධියට එක, දෙක, දෙකයි දශම පහ ලෙස වැඩි වෙන්නේ නැහැ. ඊට වඩා අඩු ප්‍රමාණවලින් තමයි වැඩි වෙන්නේ. තේරෙන විධියට කිව්වොත්, කොළඹ-යාපනය අතර ධාවන normal bus එකකට වැඩි වන ගාස්තු ප්‍රමාණය luxury කියන category එකට වැඩි වෙන්නේ නැහැ. කොළඹ-අනුරාධපුරය අතර ධාවන normal bus එකකට වැඩි වන ගාස්තු ප්‍රමාණය, ඒ විධියට වැඩි වෙන්නේ නැහැ. මොකද, අපි හොඳින්ම දන්නවා, ඒ සුඛෝපභෝගී බස් රථවල තමයි මිනිස්සු යන්න කැමති, යන්න උත්සාහ කරන්නේ කියලා. ඒ නිසා මේ බස් ගාස්තු සංශෝධනයත් එක්ක සුඛෝපභෝගී බස් රථවල යන මිනිස්සුන්ට මේ තුළින් සහනයක් ලැබෙනවා.

දෙවැනි කාරණාව මේකයි. ඔබතුමන්ලාත් දන්නවා, ලංකාවේ දුර ගමන් බස් තමයි ගොඩක්ම බෙල්ල කඩාගෙන යන ස්වභාවයෙන් වැඩිපුරම තිබෙන්නේ කියලා. කොටන ඒවා වැඩිවෙලා තිබෙන්නේත් දුර බස්වල. මරාගෙන මැරෙන්න යන ඒවා තිබෙන්නේත් දුර ගමන් බස්වල. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතෙක් තිබිච්ච සූත්‍රය අනුව ගත්තාම ඈතට ඈතට යන්න යන්න ඒ බස් එකට පාඩුයි. එම නිසා ඒ සූත්‍රය වැරදියි. ඒ නිසා අපේ අමාත්‍යාංශයේ ඉන්න නිලධාරීන් සහ අපේ අමාත්‍යාංශයට එකතු වෙලා ඉන්න volunteersලා එකතු වෙලා ඉතාම ආසන්න වශයෙන් නිවැරදි අලුත් formula එකක් හැදුවා. ඒ නිසා අපි දැන් බස් වර්ග දෙකකට මේක වෙනස් කර තිබෙනවා. ඒ මොකක්ද? සාමාන්‍ය බස් සහ සුඛෝපභෝගී බස්. ඒවා අතර අධි සුඛෝපභෝගී කියලා category එකක් නැහැ. හැබැයි මේ බස් අතර තව ජාතියක් තිබෙනවා අර්ධ සුඛෝපභෝගී කියලා. මාර්ග අංක 87 කොළඹ සිට පුත්තලම හරහා වවුනියාව දක්වා යන්නේ අර්ධ සුඛෝපභෝගී කියන බස් රථ. ඒකේ කිසි වෙනසක් නැහැ.

[ගරු බිමල් රත්නායක මහතා]

මම හිතන විධියට ඒ වාගේ බස් රථ බදුල්ල දක්වාත් යනවා. අධිකරණයෙන් දීපු රීට් ආඥාවකින් තමයි දැනට ඒගොල්ලන් ඒ අර්ධ සුඛෝපභෝගී බස් රථ පවත්වාගෙන යන්නේ. මේ සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරලා කරලා, දැනට අර්ධ සුඛෝපභෝගී බස් රථ හිමියන් 100කට වැඩි ප්‍රමාණයක් ඒ අර්ධ සුඛෝපභෝගී තත්ත්වයෙන්, එක්කෝ අධි සුඛෝපභෝගී කියන තත්ත්වයට මාරු වෙලා තිබෙනවා. නැත්නම්, සාමාන්‍ය තත්ත්වයට මාරු වෙලා තිබෙනවා. නමුත්, මේ නඩුව තවමත් අභියාචනාධිකරණයේ තිබෙනවා. අභියාචනාධිකරණයෙන් අපට උපදෙස් දීලා තිබෙනවා, මේ දිගු දුර බස් රථවල යන අයට වන අඩු පාඩු සම්බන්ධයෙන් පිළිගත හැකි සූත්‍රයක් හදලා ඉදිරිපත් කරන්න කියලා. අපි මේ කැබිනට් පත්‍රිකාවෙන් ඒ පිළිගත හැකි සූත්‍රය ඉදිරිපත් කරලා තිබෙනවා. උසාවියෙන් මේ තීන්දුව ලබා දුන්නොත්, ඉන් පස්සේ මේ අර්ධ සුඛෝපභෝගී - semi-luxury - කියලා තිබෙන බස් ක්‍රමානුකූලව අවසන් වෙයි කියලා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාගරික - urban - ප්‍රවාහනයට මෙට්‍රෝ බස් ඇවිල්ලා තිබෙනවා. මගේ දැනීමේ හැටියට සැප්තැම්බර් මාසය වෙනකොට හෝ අගෝස්තු මාසය අග වෙනකොට තවත් බස් එකසිය ගණනක් ඒකට එකතු වෙනවා. ඒ වාගේම අපි ලබන අවුරුද්ද තුළදී විවිධ අය එකතුකරගෙන මේ බස් ප්‍රමාණය වැඩි කරගන්නවා. මේක, luxury. නමුත් නාගරික - urban - සීමාව ඇතුළත තමයි තිබෙන්නේ. ඒ වාගේම අපි නව ගාස්තු ප්‍රතිපත්තියක් හදන්න බලාපොරොත්තු වෙනවා, බස්වලට, school vansවලට, office vansවලට සහ ත්‍රිරෝද රථවලට. ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් අපට අවසර ලබා දීලා තිබෙනවා. ඒ අනුව අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා, අමාත්‍ය මණ්ඩලය ලබා දුන් උපදෙස මත ජාතික කමිටුවක් පිහිටුවලා නව ගාස්තු ප්‍රතිපත්තියක් සකස් කරන්න. අපට ඒ සම්බන්ධ නීතිමය බලතල National Transport Commission Act එකෙන් ලැබී තිබෙනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ පක්ෂ, විපක්ෂ ගරු මන්ත්‍රීවරු සියලුදෙනාම පීඩාවට පත්වෙන කරුණක් තමයි ලංගම බස්වලට අවශ්‍ය රියැදුරු සහ කොන්දොස්තර මහත්වරු නැති එක. ඒකට එක් හේතුවක් තමයි, බස්නාහිර පළාතෙන් කොන්දොස්තර මහත්වරු, ඩ්‍රයිවර් මහත්වරු සේවයට බැඳෙන්නේ නැති එක. මෙට්‍රෝ බස් කොම්පැනියට ඩ්‍රයිවර්ලා recruit කරන්න දැන්වීම් පළ කළාට අවශ්‍ය ප්‍රමාණයට එන්නේ නැහැ. අපි හිතනවා, ආදායම් ප්‍රශ්නයකට වඩා එතැන සමාජ පිළිගැනීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන්නේ කියලා. නැත්නම් ඒවායේ වැටුප නරකම නැහැ. සාමාන්‍ය රජයේ සේවකයෙකු ලබන මුදලට හා සමාන මුදලක් බස් රථ රියැදුරෙක් ගන්නවා. හැබැයි, පිළිගැනීමක් නැහැ. නමුත්, නවසිය හැට හැත්තෑ ගණන්වල ඉතාම ඉහළ පිළිගැනීමක් තිබුණු රැකියාවක් තමයි ලංගම රියැදුරු කියන්නේ. නමුත් අද ඒක ඉතාම පහළට වැටිලා තිබෙනවා. ඒක, එක් හේතුවක්. පිළිගැනීම නැති නිසා එන්නේ නැහැ. අනෙක් ප්‍රශ්නය තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංගමය අමුතු ක්‍රමයක් හදාගෙන තිබුණා. මාත් අවුරුද්දක් විතර ඔට්ටුවෙලා තමයි යන්තම් ඒක විසඳා ගත්තේ. ටිකට් පත් වංචා කරලා මුදල් වංචා කරපු කොන්දොස්තරලාට සහ ඩ්‍රයිවර්ලාට ලංගමයේ තිබුණු ක්‍රමය තමයි වැඩ තහනම් කරන එක. හිතන්නකෝ, ටිකට් නොදී 10 දෙනෙක් එක්කගෙන ගිහිල්ලා අහුවුණා කියලා. ඊට පස්සේ ඒ අයගේ වැඩ තහනම් කරනවා. හැබැයි, වැඩ තහනම් කළාට පඩි ගෙවනවා. පඩි ගෙවන අතරේ පරීක්ෂණය යනවා. ඒ අතරේ සමහරු ඩිපෝ එකට ඇවිල්ලා කකා බිබී ඉන්නවා. තවත් සමහරු private busesවල වැඩට යනවා. ඒගොල්ලන්ට පඩි ගෙව්වාට බස් එක දුවන්නේ නැහැ.

සාමාන්‍යයෙන් ලංගම රියැදුරු සහ කොන්දොස්තර මහත්වරු 800කට ආසන්න ප්‍රමාණයකගේ - අපි එනකොට 1,200ක් විතර - වැඩ තහනම් කර තිබෙනවා, රුපියල් 250, 500, 1,000, 1,500 මුදල් වංචා කිරීම නිසා. ඔවුන්ගේ වැඩ තහනම් කරලා තිබෙනවා. හැබැයි, පඩි ගෙවනවා. එතකොට ඩ්‍රයිවර්ලා කොන්දොස්තරලා නැතිව බස් 300ක්, 400ක් දුවන්නේ නැතිව තියාගෙන ඉන්නවා. ඒක මොන හේතුවකට හදාගත් නීතියක්ද කියලා මම නම් දන්නේ නැහැ. අපි මේකට දිගටම නියෝග දුන්නා. එක එක කාලවලදී සභාපතිවරුන්ට කියලා අධ්‍යක්ෂ මණ්ඩල තීන්දු පවා ගන්න කටයුතු කළා වැරැද්දක් කළොත් දඩයක් ගහන්න, දෙපාරක් වැරදි කළත් දඩයක් ගහන්න, තුන්වැනි පාරටත් හොරකමක් කරලා තිබෙනවා නම් වැඩ තහනම් කරලා විනය පරීක්ෂණයක් කරන්න කියලා. 1,200කගේ විනය පරීක්ෂණ කරන්න අවුරුද්දකට දෙකකට වඩා කාලයක් යනවා. ඒ වාගේම ඒවාට නිලධාරීන් පත් කරන්නත් ඕනෑ. හැබැයි, ඒක කළේම නැහැ. ඒ නිසා ගමේ මන්ත්‍රීලා කියනවා, සහෝදරයා බස් එක නතර වෙලා කියලා. අපි ඒක ගැන හොයලා බැලුවාට පස්සේ SLTB එකේ සභාපතිතුමා කියනවා, "ඇමතිතුමා, ඩ්‍රයිවර්ලා නැහැ, කොන්දොස්තරලා නැහැ" කියලා. ඒගොල්ලෝ කොහේද කියලා ඇහුවාම කියනවා, ඒගොල්ලෝ පඩි අරගෙන ඉන්නවා, හැබැයි වැඩ තහනම් කියලා. ගොඩක් වෙලාවට විනය පරීක්ෂණවලිනුත් ඒ අය වැරදිකරුවන් වෙන්නේත් නැහැ. මොකද, හුඟක් වෙලාවට ඒ විනය පරීක්ෂණ කරන්නෙත් යාළුවෝ සහ මාළුවෝ. අනෙක් එක තමයි, රුපියල් 250කට වැඩ තහනම් කරලා මිනිහෙක් ගෙදර යවන්නත් බැහැ නේ. ඒ නිසා අවුරුද්දකට පස්සේ reinstate වෙනවා.

අපි ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගත්තාට පස්සේ දැන් ලංගමයෙන් තීන්දුවක් අරගෙන නියෝගයක් නිකුත් කරලා තිබෙනවා, "ප්‍රවේශපත් විෂමාචාර සම්බන්ධ විනය ක්‍රියාවලිය" කියලා. එතකොට ඉදිරියේදී ටිකට් පත් වංචාවක් හෝ ඒ ආශ්‍රිත වංචාවක් සිදු කළොත් එයාගේ වැඩ තහනම් වෙන්නේ නැහැ. හැබැයි, දඩයක් වදිනවා. ඒ වැරැද්ද දෙවැනි පාරට කළත් දඩයක් වදිනවා. හැබැයි, ඒ දඩය නම් ඒ පුද්ගලයාට දැනෙන්නම දෙනවා කියලා තමයි මට නම් හිතෙන්නේ. ඒ නිසා මම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, තවදුරටත් ටිකට්පත් වංචා නිසා වැඩ තහනම් කරලා බස් දුවගන්න බැහැ කියලා ලංගම ඩිපෝ අධිකාරිවරු කිව්වොත්, කරුණාකරලා ඒ හිඟය ඇතිවෙලා තිබෙන්නේ කොහොමද කියන එක හොයලා බලන්න කියලා. ප්‍රවාහනයට අදාළව මේ කරුණු ටික කියන්න තමයි මම බලාපොරොත්තු වුණේ. *[බාධා කිරීමක්]* ඔව්, කොන්දොස්තර තමයි වංචාව කරන්නේ. ඊට පස්සේ දෙන්නා බෙදා ගන්නවා. අපි උත්සාහ කරමින් ඉන්නවා, මේ කටයුතු පිළිවෙළක් කරන්න.

මීට අමතරව මාර්ග ආරක්ෂාව පිළිබඳව පොඩි කාරණයක් කියන්න මම කැමැතියි. මගී ප්‍රවාහනය කරන බස්, වෑන් සියල්ල සම්බන්ධයෙන් අපි ගැසට් නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒගොල්ලන් හැම කෙනෙකුම කිලෝමීටර 3,000කට අඩු කාලයක දී, නැත්නම් මාස තුනකට අඩු කාලයකදී සාමාන්‍ය මට්ටමේ roadworthiness පරීක්ෂණයක් කර ගන්න ඕනෑ. එහෙම නොකර, අවුරුද්දකට සැරයක් renewal එකේදී විතරක් ඒවා කර ගන්න ගියාම තමයි brake නැතිව හැප්පෙන ඒවා වාගේ විශාල අනතුරු වෙන්නේ. ඔන්න ඔය කරුණු ටික ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Chamara Sampath Dasanayake. You have ten minutes.

[පූ.භා. 11.57]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අද වෙළෙඳ ඇමතිතුමාටත් පොඩ්ඩක් ඉන්න කියලා කිව්වා. අද මේ රෙගුලාසි ගැන කථා කරන අතරේ අපේ පළාතේ උඩරට අල ගොවියා ගැන ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මම ඉදිරිපත් කරනවා, ඒ කාරණය. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ කාලයේ බීජ අල ටොන් එකක් රුපියල් 8,000යි. මහින්ද රාජපක්ෂගේ කාලයේ පොහොර මිටියක් රුපියල්1,500යි. මහින්ද රාජපක්ෂගේ කාලයේ වස බෝතලයක්, නැත්නම් කෘමිනාශක බෝතලයක් රුපියල් 1,500යි. මහින්ද රාජපක්ෂගේ කාලයේ කම්කරුවෙකුට ගෙව්වේ රුපියල් 1,500යි. මම අල ගොවීන්ගේ ප්‍රශ්නයක් හැටියටයි මෙය ඉදිරිපත් කරන්නේ. මොකද, වෙළෙඳ ඇමතිතුමාත් සභාවේ ඉන්න නිසා. මම වෙළෙඳ ඇමතිතුමාට පොඩ්ඩක් නවතින්න කිව්වා, මේක අහන්න ඕනෑ නිසා.

මහින්ද රාජපක්ෂගේ කාලයේ අල කිලෝව රුපියල් 200ට, රුපියල් 250ට ගත්තා. දැන් අල කිලෝව ගන්නෙත් රුපියල් 250ටයි. ගරු වෙළෙඳ ඇමතිතුමනි, බීජ අල පෙට්ටියක් රුපියල් 38,000යි. දැන් පොහොර මිටියක් රුපියල් 16,000යි, 18,000යි, 13,000 ඉඳන් ඉස්සරහට යනවා. දැන් අල කොටුවක වැඩ කරන සේවකයෙකුට රුපියල් 3,500ක් ගෙවන්න ඕනෑ. දැන් කෘමි නාශක බෝතලයක් රුපියල් 5,000න් එහා විකිණෙන්නේ. හැබැයි, මහින්ද රාජපක්ෂගේ කාලයේ රුපියල් 8,000ට තිබුණු බීජ අල පෙට්ටියක් අද රුපියල් 38,000යි. අද වෙනකොට අල ගොවියාගේ අල කර්මාන්තය සම්පූර්ණයෙන්ම බිමට වැටෙන්න යන්නේ වෙළෙඳ ඇමතිතුමනි. කෘෂිකර්ම ඇමතිවරු දෙපොළක් මෙතැන ඉන්නවා. කෘෂිකර්ම ඇමතිවරු දෙපොළට මේකට කිසිම දෙයක් කරන්න බැහැ. කෘෂිකර්ම ඇමතිවරුන්ට කරන්න බැරි මොකද, ඔබතුමා අතේ තමයි හැන්ද තිබෙන්නේ, ගරු ඇමතිතුමනි. ඔබතුමා අතේ හැන්ද නැතිව කෘෂිකර්ම ඇමතිලා දෙන්නා ඔළුවෙන් හිට ගත්තත් අල ප්‍රශ්නය විසඳන්න බැහැ. දැන් කෘෂිකර්ම ඇමති නැඟිටලා යනවා. කෘෂිකර්ම නියෝජ්‍ය ඇමති ඉන්නවා. නියෝජ්‍ය ඇමතිතුමාවත් මේවා අහගන්න.

ගරු ඇමතිතුමනි, මේ මාසයේ 30වෙනි දා වෙනකොට අල හැදිලා ඉවරයි. එතකොට නොවැම්බර් මුල අල ගැලවෙනවා. මම ඔබතුමාගෙන් වැඳලා ඉල්ලන්නේ මේකයි. අපේ පළාතේ මිනිස්සු දැන් මෙච්චර කල් ඉවසුවා, ඉවසුවා, ඉවසුවා. වෙළෙඳ ඇමතිතුමනි, කුකුළු මස් කිලෝවක් කීයද, රුපියල් 1,600යි. වීන ඌරු මස් කිලෝවක් රුපියල් 3,500යි. හරක් මස් කිලෝවක් රුපියල් 3,000යි. මේ සාමාන්‍යයෙන් දැන් යන rate එක. දේශීය නිෂ්පාදකයෝ නිෂ්පාදනය කරන මේ උඩරට අල තමයි මරණෙට, මඟුලට, දානෙට, පිරිතට, හැමදේටම ගන්නේ. අල හොඳ හඳනවාම නේ. ඒ දේශීය අල ගෙඩිය රුපියල් 400ට රටේ මිනිස්සුන්ට කන්න බැහැ කියන්න බැහැ; දේශීය අල ගෙඩියක් රුපියල් 400ට කන්න බැහැ කියන්න බැහැ. එහෙම වුණොත් ඒක සාධාරණ නැහැ. අපි රුපියල් 400ට අල කන්න හදමු. වැඩිය එපා. අල ගෙන්වන එක වහාම නවත්වන්න ඕනෑ. මේ වෙනකොට ගැසට් එක ගහන්න පටන් ගන්න, ඇමතිතුමා. ලබන මාසයේ ගැසට් එක ගැහුවොත්, අල ගැලවෙනකොට අල කිලෝව රුපියල් 300ට විකුණන්න අඩිතාලමක් දමා ගන්න පුළුවන්. අන්න ඒක තමයි මගේ පළමුවන ප්‍රශ්නය. මොකද, අද තිබෙන මේ ප්‍රශ්නයට උග්‍රව මුහුණ දෙන්න වෙනවා. ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් කැප්පෙටිපොළ ගිය වෙලාවේ දැක්කා මේ ප්‍රශ්නය තිබෙන බව. අපේ පළාත නියෝජනය කරන සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාට මේ ප්‍රශ්නය මීට වැඩිය ඇවිල්ලා ඇති. නියෝජ්‍ය ඇමතිතුමාත් එහා පැත්තේ ඉන්නවා. මේක උඩරට ජීවත් වෙන අප සියලු දෙනාටම තිබෙන පොදු ප්‍රශ්නයක්. මේකට කෙටි උත්තරයක් හැටියට මම ඉල්ලන්නේ, මෙන්න මේක කරන්න කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට මම වෙන කාරණාවකට යනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඔබතුමා උත්තරයක් දෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා මතු කරපු ඒ ප්‍රශ්නයට මම කෙටියෙන් උත්තරයක් දෙන්නම්.

අපේ රටේ අල මාස 9ක් තිස්සේ ගලවනවා නේ, මන්ත්‍රීතුමා. දැනුත් ගලවනවා. ගිය මාසෙත් ගැලෙව්වා. ටික ටික තමයි ගලවන්නේ. නොවැම්බර්, දෙසැම්බර් මාසවල තමයි අපේ රටේ වැඩිම අල අස්වැන්න ලැබෙන්නේ. අපේ රටේ අල හදන්නේ සියයට 15යි. සියයට 85ක් පිටරටින් තමයි ගෙන්වන්නේ. පිට රටින් ගෙනෙන අලවලට අපි ගිය අවුරුද්දේ රුපියල් 80ක බද්දක් ගැහුවා. දැනුත් රුපියල් 80ක බද්දක් තිබෙනවා. අපට ඉන්දියාවෙන් අල වර්ග එනවා; පාකිස්තානයෙන් එනවා; චීනයෙන් එනවා; ඉරානයෙන් එනවා. ඒ වාගේම ලංකාවේ අලවලටත් ඉල්ලුමක් තිබෙනවා. පසුගිය මාසෙත් අල ගන්නේ නැහැ කිව්වාම, රුපියල් 180ට, 190ට යනකොට අපි සතොස හරහා රුපියල් 240 දක්වා දීලා අල මිලදී ගත්තා. අද වෙනකොටත් දේශීය අල - local potatoes - කිලෝව රුපියල් 280ට, 290ට තිබෙනවා. අද දඹුල්ලේ අල රුපියල් 310යි. හැබැයි, මිලෙහි වෙනස්කම් තිබෙනවා. දේශීය ගොවියාගේ අල මිල ආරක්ෂා කරගන්න තමයි රුපියල් 80ක බද්දක් ගැහුවේ. මීට පෙර ඒක තිබ්බේ රුපියල් 50ට. සමහර බීජවල තිබෙන මිල මේකට බලපා තිබෙනවා. කෘෂි රසායනවල මිල මේකට බලපා තිබෙනවා.

මැද පෙරදිග යුද්ධය නිසා ඇතිවෙච්ච සමහර ප්‍රශ්න පොහොර, කෘෂි රසායන වර්ගවලටත් බලපා තිබෙනවා. ඒ නිසා අපි රජයක් හැටියට යම් සහතික මිලකට අල මිලදී ගැනීමේ ක්‍රියාවලිය කරන්න උත්සාහ කරනවා. ඒ නිසා අපි රුපියල් 220න් පටන් ගෙන රුපියල් 240 දක්වා අල මිලදී ගත්තා. දැන් රුපියල් 280ට, 260ට ගන්නවා. අද රුපියල් 300ටත් මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. අද දඹුල්ලේ අල කිලෝවක මිල රුපියල් 310යි. රුපියල් 280යි, 290යි, 300යි අතර මිලක් දිගටම පවතිනවා. ඒ නිසා දේශීය අල ගොවියාගේ අල ටික ගැලවෙනකොට වෙළෙඳ පොළ ඇතුළේ ගොවියාගේ අල ටික මිලදී ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක තමයි ආණ්ඩුව ඉන්නේ. අපි මිලදී ගැනීම් කරනවා. යම් ප්‍රමාණයකට මිලදී ගත්තාම, අලවල මිල මේ විධියට රඳවා ගන්න පුළුවන්කම තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා අපි අල ගොඩක් මිල දී ගත්තේ නැහැ. හැබැයි අපි අල මිලදී ගත්තාට පස්සේ මාර්කට් එකේ අල කිලෝවක මිල රුපියල්

[ගරු වසන්ත සමරසිංහ මහතා]

270න්, 280න් ඉහළට ආවා. ගොවීන් අපට කිව්වේ, ඒගොල්ලන්ට අවශ්‍ය රුපියල් 220යි, 240යි අතර මිලක් කියලායි. ඒ මිලට අල මිලදී ගැනීම සඳහා අපි කටයුතු කළා. දැන් රුපියල් 280ටයි තිබෙන්නේ. ඒ නිසා අප මැදිහත් වෙන්න ඕනෑ නැහැ, වෙළෙඳ පොළ ඇතුළෙන් මේක පාලනය වෙනවා. හැබැයි යම් විධියකට ඉදිරියේදී මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති වුණොත්, අපි රජය හැටියට ඒකට මැදිහත් වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

අල ප්‍රශ්නය සම්බන්ධයෙන් උත්තර දීම ගැන ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. හැබැයි අර ඇමතිතුමාගෙයි, නියෝජ්‍ය ඇමතිතුමාගෙයි photos දාලා ඒවාට කඩුවලින් කපනවා, ගහනවා වාගේ තත්ත්වයක් නොවැම්බර් මාසය වෙනකොට වැලිමඩ සහ ඌව පරණගම මිනිස්සුන්ගෙන් වෙළෙඳ ඇමතිට සිදු නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒ තත්ත්වයට පත් වෙන්නත් එපා කියලා මම කියනවා. උද්ඝෝෂණ නැතුව අල කිලෝවක මිල රුපියල් 300ට ගියොත්; රුපියල් 300ට අල වික්කොත්, ඔබතුමාගේ photo එක වැලිමඩ ටවුමේ තියලා, සමන්ත විද්‍යාරත්නත්, අර නියෝජ්‍ය ඇමතිත් එක්කගෙන ගිහිල්ලා මම ඇමතිතුමාට වඳිනවා. ඒක නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. හැබැයි, අර තත්ත්වයට පත් වෙන්නත් එපා.

ඊළඟ කාරණය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමාත් වෛද්‍යවරයෙක් නිසායි මම මේක කියන්නේ. වෛද්‍යවරු නැහැ කියලා ගල්නෑව නෑගම්පහ - ජනාධිපතිතුමාගේ ගමේ - ඉස්පිරිතාලය වහන්න හදනවා. මේක ජනාධිපතිතුමාගේ ගමේ ඉස්පිරිතාලය. ඒක වැහුවොත් හරි ලජ්ජාවක්. ජනාධිපතිතුමා ඉන්නතුරුවත් මේ ඉස්පිරිතාලය විවෘතව තියන්න කියන්න. මොකද, මේක තිබෙන්නේ ජනාධිපතිතුමාගේ ගමේ. දැන් බලන්න, ඒ ඉස්පිරිතාලයේ වෛද්‍යවරු නැති එකට අපේ මේ සෞඛ්‍ය ඇමතිතුමා හිතුවක්කාර තීන්දුවක් අරගෙන තිබෙනවා. විදේශ රටවල වෛද්‍ය උපාධි ගත්ත සිසුන් 542ක් ඉන්නවා. මේගොල්ලන් ලංකාවේ ERPM කියන විභාගයට මුහුණ දීලා සමත් වෙච්ච අය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක ඔබතුමාත් දන්නවා. ඔබතුමාටත් තිබෙන්නේ විදේශ උපාධියක් වෙන්න ඇති. මේගොල්ලන්ගේ සීමාවාසික පුහුණුවට අපේ සෞඛ්‍ය ඇමතිතුමා බැම්මක් දාලා. ඒ, චීනය, රුසියාව ඇතුළු රටවල උපාධිය අරගෙන ලංකාවට ආපු අය. ඒ අය බඳවා ගත්තා නම් හොඳයි. අපේ පළාතේ - බදුල්ල දිස්ත්‍රික්කයේ - ගොඩක් රෝහල්වල වෛද්‍යවරු නැහැ. මඩොල්සීම, මහදෝව, ලුණුගල වාගේ දුෂ්කර ඉස්පිරිතාලවල වෛද්‍යවරු නැහැ. ගොඩක් වෛද්‍යවරු රට යනවා. සීමාවාසික පුහුණුව දෙන්නේ නැතිව මේ වෛද්‍යවරු බඳවා ගන්නේ නැහැ. ඒක, එක ප්‍රශ්නයක්.

ඊළඟ ප්‍රශ්නය කරාපිටිය රෝහල ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් වෛද්‍යවරයෙක් නිසායි මම කියන්නේ. කරාපිටිය රෝහලේ ප්‍රතිකාර ලබන පිළිකා රෝගීන්ගේ හමට විදින injection එක දැන් ඒ අය සල්ලි දීලා ගන්න ඕනෑ. එහෙම වුණොත් "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වෙන්නේ නැහැ නේ. සල්ලි දීලා injections ගන්න බැහැ නේ. ඒකයි කරාපිටිය රෝහලේ තත්ත්වය. සල්ලි දීලා තමයි injections ගන්න ඕනෑ.

ඊළඟට, මම මහරගම පිළිකා රෝහල ගැන කියන්නම්. ප්‍රතිශක්තිකරණය අඩු රෝගීන් සඳහා මහරගම පිළිකා රෝහලේ ගෙවන වාට්ටුවක් තිබෙනවා. ප්‍රතිශක්තිකරණය අඩු අයට රුපියල් 10,000ක් ගෙවලා නවතින්න පුළුවන් වාට්ටුවක් එහි තිබෙනවා. ප්‍රතිශක්තිකරණය අඩු අය ඒ ගෙවන වාට්ටුවට ඇතුළත් වුණාම මුල් කාලයේ බෙහෙත් නොමිලයේ දුන්නා. හැබැයි දැන් මේ ආණ්ඩුවෙන් චක්‍රලේඛයක් ගහලා තිබෙනවා, ප්‍රතිශක්තිකරණය අඩු අය මහරගම පිළිකා රෝහලේ ඒ කාමරයේ ඉන්නවා නම්, සල්ලි දීලා බෙහෙත් ගන්න ඕනෑ කියලා. මේ දේවල්වලින් මේ රට පොහොසත් රටක් කරන්න, නැත්නම් ජනතාවට ලස්සන ජීවිතයක් ගත කරන්න බැහැ. මේ විධියට ගත්තාම ජනතාවට දීපු පොරොන්දුවල ගොඩක් ප්‍රශ්න තිබෙනවා. මම මේ ප්‍රශ්න එකින් එක, එකින් එක හරියටම හඳුනාගෙන තමයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලිස් සහායක තනතුර ගත්තොත්, ඒකෙත් ප්‍රශ්නයක් තිබෙනවා. දැන් බන්ධනාගාරයේත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුවේ මැති ඇමතිවරුන් බන්ධනාගාරය ගැන අද කොච්චර කථා කළත්, බන්ධනාගාරයේ සේවකයින්ට තමයි අඩුම පඩිය ලැබෙන්නේ. බන්ධනාගාර සේවකයින්ගේ වැටුප් වැඩි කරලා නැහැ. ඒ වාගේම පොලිස් දෙපාර්තමේන්තුවේ ඉන්නවා, නිල් පාට ඇඳුම අඳින, පොලිස් සහායකයින් කියලා කණ්ඩායමක්. 2009 වර්ෂයේ ඉඳලා මෙච්චර කාලයක් ඔවුන්ට රුපියල් 25,000ක දීමනාවක් දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පොලිස් සහායකයින්ට ලබා දුන් දීමනාව දැන් නවත්වන්න යනවා. පොලිස් සහායකයින්ට ආහාර සඳහා ලබා දුන් දීමනාව මේ ආණ්ඩුවෙන් නතර කරන්න යනවා. ඔන්න, තව ප්‍රශ්නයක්.

ඊළඟ ප්‍රශ්නය තමයි, සිවිල් ආරක්ෂක නිලධාරින්ගේ ප්‍රශ්නය. පොලිසිය භාර ඇමතිතුමා ඒ සිවිල් ආරක්ෂකයින් attach කළා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට දැම්මාම ඒ මිනිස්සුන්ට දෙන්නේ රුපියල් 250යි. ඒ මිනිස්සුන්ට කෑමත් නැහැ, ඉන්න තැනකුත් නැහැ, ඈත කැලයකට ගිහිල්ලා දාලා තිබෙනවා. ඒ මදිවාට දැන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනික් නිලධාරින් උද්ඝෝෂණය කරනවා, ඔවුන්ට සිවිල් ආරක්ෂක නිලධාරින් එපා කියලා. මේ වාගේ ගොඩක් ප්‍රශ්න තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආණ්ඩුවක් හැටියට මේගොල්ලන් මේවා ගැන හොඳින් සොයා බැලුවා නම්, මේ ප්‍රශ්නවලට මීට වඩා හොඳින් මුහුණ දෙන්න තිබුණා.

ඊළඟ එක තමයි, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල පිළිබඳ ප්‍රශ්නය. මේ රෝහලේ තිබුණු, පුරස්ථි ග්‍රන්ථි ඔපරේෂන් කරන යන්ත්‍රය කැඩිලා. ශ්‍රී ජවර්ධනපුර මහ රෝහල කියන්නේ, ප්‍රතිකාර සඳහා සල්ලි ගෙවලා මිනිස්සු නවතින රෝහලක්. මේ පළාතේ විශාල පිරිසක් මෙම රෝහල තමයි පාවිච්චි කරන්නේ. මේ රෝහලේ තිබුණු පුරස්ථි ග්‍රන්ථි ඔපරේෂන් කරන යන්ත්‍රය කැඩිලා දැන් රෝගීන් 300ක් විතර පෝලිමේ ඉන්නවා. ඒ ප්‍රශ්නයත් විසඳිලා නැහැ. වෛද්‍යවරයෙකු හැටියට සෞඛ්‍ය ඇමතිතුමා මේ රටේ දියුණුව වෙනුවෙන් මීට වඩා විශාල වැඩ කොටසක් ඉටු කරයි කියලා මේ රටේ මිනිස්සු බලාපොරොත්තු වුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, your time has finished.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මේ රට තුළ දවසින් දවස මේ වාගේ ප්‍රශ්න ඇති වුණා කියලා විපක්ෂයට බැණ බැණ ඉඳලා වැඩක් නැහැ. මම බලාගෙන, ඊයේ

සුනිල් වටගල මහත්මයා මෙතැන ඉඳගෙන, මහින්ද රාජපක්ෂ ජුලම්පිටියේ අමරේත් එක්ක හිටියා, මෙහෙම හිටියා කියලා මහා ලස්සනට කියන්න පටන් ගත්තා. හැබැයි, සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා මීට සති දෙකකට කලින් ජනාධිපති නීතිඥ උපුල් කුමරප්පෙරුම මහත්මයාගේ පුතාගේ මළ ගෙදරට ගිහින් මහින්ද රාජපක්ෂ ළඟ දණ ගහනවා. එහෙම කරලා ඊයේ මෙතැනට ඇවිල්ලා මහින්ද රාජපක්ෂගේ පතුරු අරිනවා. ඒ වාගේ දේවල් පාර්ලිමේන්තුවේ කියනවා වාගේම, එතුමාට කොන්දක් තිබෙනවා නම් ඒ කොන්ද කෙළින් තියාගෙන ඉන්න කියන්න. ලජ්ජයි නේ. ඇයි, උපුල් කුමරප්පෙරුමගේ පුතාගේ මළ ගෙදරට ගිහිල්ලා නැමිලා ඉඳලා, ඊයේ මෙතැනට ඇවිල්ලා මහින්ද රාජපක්ෂගේ පතුරු අරිනවා. දැන් මහින්ද රාජපක්ෂගේ පතුරු ඇරලා වැඩක් නැහැ. දැන් ඒ මනුස්සයා පෙන්ෂන් ගිහිල්ලා ගෙදරට වෙලා ඉන්නේ. ඒ මනුස්සයාගේ පුතා මෙතැනට ආවාම මුහුණට මුහුණ ඉඳගෙන ඔහුගේ පතුරු යවන්න. නිකම් කොන්දක් නැති කෙනෙක් වගේ කථා කරන්න එපා. ලජ්ජයි. අපි නම් ඕනෑම දෙයක් මුහුණුට මුහුණ කියලා විසඳනවා. එහෙම නම්, මම ඉදිරිපත් කරපු කරුණු කාරණා අවබෝධ කරගෙන කටයුතු කරන්න කියා ඉල්ලමින් නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Upali Pannilage. You have 13 minutes to participate in this Debate.

[අ.භා. 12.11]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රේගු ආඥාපනත යටතේ වූ යෝජනා සම්මතයක් පිළිබඳවත් අද දින විවාද කරනවා. විශේෂයෙන්ම අපේ සමාජය තුළ සිදු වන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම යන කාරණා පිළිබඳ කරුණු කිහිපයක් ඒ ඔස්සේ සාකච්ඡා කරන්න මම කැමැතියි.

ඒ කරුණු සාකච්ඡා කරන්නට පෙර මම සඳහන් කරන්න කැමැතියි, අර කලින් කියපු යම් යම් කරුණු කීපයක් සම්බන්ධයෙන්. විශේෂයෙන්ම අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව වර්තමාන රජයේ ප්‍රතිපත්තිය තමයි නිදහස් සෞඛ්‍ය, ඒ වාගේම ප්‍රාථමික සෞඛ්‍ය ගොඩනැංවීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය වසර කිහිපය දෙස අවධානය යොමු කිරීමේදී, විශේෂයෙන්ම 2025 වර්ෂයේදීත්, 2026 වර්ෂයේදීත් අපි රුපියල් බිලියන 400කට වැඩි ප්‍රමාණයක් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා වැය කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් යම් තැන්වල හුදෙකලා සිද්ධි නොවෙයි, සමස්තයක් විධියට අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය නඟාසිටුවීම සඳහා අපි කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් කථා කළ මන්ත්‍රීතුමා සඳහන් කළා, අපේ ජනාධිපති නීතිඥ උපුල් කුමරප්පෙරුම මහතාගේ මළ ගෙදරක් ගැන. එතුමා පසුගිය මැතිවරණයේදී ජාතික ජන බලවේගයෙන් ඡන්දය ඉල්ලපු මහත්මයෙක්. එතුමාගේ මළ ගෙදරක තමයි අපේ නියෝජ්‍ය ඇමතිතුමා ගියේ. ඉතින් ඒ නිසා ජාතික ජන බලවේගයෙන් ඡන්දය ඉල්ලපු අපේ ජනාධිපති නීතිඥතුමාගේ ගෙදරට දණ ගාගෙන ගියේ කවුද කියලා මම හිතන විධියට රටේ ජනතාව දැක්කා. ඒ නිසා මම ඒ පිළිබඳව වැඩිය කථා කරන්න යන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම අද සාකච්ඡාවට ගැනෙන 2025 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග අපේ සමාජයට ඉතාම වැදගත් වනවා. ප්‍රධාන වශයෙන්ම අපි දන්නවා, අපේ රටට විදේශයන්හි උපයා මුදල් ගලාගෙන ඒමේදීත්, ඒ වාගේම අපේ රටේ උපයන මුදල් යම් ප්‍රමාණයක් විවිධ ක්‍රමවලින් නැවත පිටරටවලට පිටකර හැරීමේදීත් නීත්‍යනුකූල නොවන මාර්ගවලින් මේ කටයුතු සිදුවන බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ හරහා නීත්‍යනුකූල නොවන, විධිමත් නොවන මූල්‍ය ආර්ථිකයක් අපේ සමාජයේ, අපේ රටේ ගොඩනැඟිලා තිබෙනවා. මෙන්න මේ නීත්‍යනුකූල නොවන, ඒ අනීතික මූල්‍ය ආර්ථිකය නියාමනය කිරීම තමයි මේ සංශෝධනයේ අපේ ප්‍රධානතම අරමුණ වෙන්නේ.

අපි දන්නවා, පසුගිය දශක කිහිපයේ නීත්‍යනුකූල නොවන ක්‍රම මඟින් විශේෂයෙන්ම විදෙස් රටවල සිට මෙරටට මුදල් ගෙන ඒමත්, ඒ වාගේම මෙරටින් පිටරටට මුදල් පිට කර හැරීමත් සාමාන්‍යකරණය වෙලා තිබුණු බව. මොකද සමාජයේ ජනතාවත් දන්නේ නැහැ, මේ උණ්ඩියල්, හවාලා වැනි ක්‍රම නීති විරෝධීයි කියලා. ඒවා කරන අය නම් ඒ ගැන දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් සාමාන්‍ය ජනතාව අතර මේවා නීත්‍යනුකූල නොවන ක්‍රම කියන මතයවත් නිර්මාණය වෙලා නැති තත්ත්වයක් තිබෙන්නේ. ඉතින් මේ හරහා ඇති වන බලපෑම නිසා අපේ රටේ අනීතික මූල්‍ය ආර්ථිකයක් ගොඩනැඟෙනවා වාගේම මෙලෙස අපේ රටට ගලා එන මුදල් අනීතික ක්‍රියාවලට භාවිත කිරීම පසුගිය දශක කිහිපය පුරාම අපේ සමාජය අත්වින්ද තත්ත්වයක්. අන්න ඒ නිසා ඒ තත්ත්වයන් වළක්වා ගැනීමට වගකිව යුතු රජයක් විධියට අපි කටයුතු කරමින් ඉන්නවා. ඒක අනිවාර්ය සාධකයක් බවට අද සමාජයේ පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මේ මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් අපට තිබෙන ඇගැයීම ඉතාම හොඳ තත්ත්වයක නොවෙයි තිබෙන්නේ. ජාත්‍යන්තර වශයෙන් විදේශීය රටවල සිට මෙරටට මුදල් ගෙන ඒමත්, ඒ වාගේම අපේ රටේ සිට වෙනත් රටවලට මුදල් සංක්‍රමණය වීම සම්බන්ධයෙනුත් අපේ රටේ තිබෙන නියාමන රෙගුලාසි ප්‍රමාණවත් නොවීම අපේ රට ආර්ථික වශයෙන් වෙනත් ආයතනත් එක්ක negotiationsවලට යනකොට, ජාත්‍යන්තර ආයතනත් එක්ක ගනුදෙනු කරන්න යනකොට අපට ඒක ඉතාම නිශේධනීය විධියට බලපානවා. ඒක එක පැත්තක් විතරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් ඊට වඩා ඉතාම බරපතළ වන්නේ අනීතික විධියට මුදල් සැරිසරණය වීම හරහා ඒ මුදල් කොහේටද ගමන් කරන්නේ කියන එක පිළිබඳවත් සමාජයේ විශාල සාකච්ඡාවක් ගොඩනැඟිලා තිබීමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සාකච්ඡාව කොතරම් පුළුල් වෙලා තිබෙනවාද කියන එක ගත්තොත්, අනීතිකව මුදල් හෙව්වාට පස්සේ ඒ මුදල් නැවත ආයෝජනය කරන්නේ කොහේද කියන එක පිළිබඳව හෙළිදරව් කිරීමට බොහෝ වෙලාවට මෙලෙස අනීතිකව මුදල් උපයන අය අසමත් වෙලා තිබෙනවා.

ඒ නිසා තමයි පසුගිය කාලයේ අපට සමහර සිදුවීම් පිළිබඳව අහන්න ලැබුණේ. ප්‍රසිද්ධ වෙච්ච සිදුවීම් ගත්තොත්, මල්වානේ වෙන්න පුළුවන්, ඔරුතොට වෙන්න පුළුවන්, එහෙම නැත්නම් මාතර, Brown's Hillවල වෙන්න පුළුවන්, කතරගම වෙන්න පුළුවන්, කොළඹ, බොරැල්ලේ වෙන්න පුළුවන්, ඒවායේ ඉඩම්, නැත්නම් නිවාස, මන්දිර හදපුවා අයිතිකාරයෝ නැති තත්ත්වයට පත් වුණා. මේ අයිතිකාරයෝ නැති දේපළ සමාජයේ තිබෙන්නේ කොහොමද? අයිතිකාරයෝ නැති දේපළ නිර්මාණය වුණේ කොහොමද? අයිතිකාරයෝ නැති දේපළ නිර්මාණය වුණේ මෙන්න මේ විධියට අනීතිකව උපයපු මුදල් නිසායි. මෙලෙස

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

අනීතිකව මුදල් උපයන්න පුළුවන්කම තිබෙන්නේ කාටද? පසුගිය කාලයේ හෙළිදරව් වුණු මේ අයිතිකාරයෝ නැති දේපළ කාගේද? මේවාට දේශපාලන සම්බන්ධකම් තිබුණා. හිටපු දේශපාලන ප්‍රබලයින්ගේ නම් මේවා එක්ක ඇඳිලා තිබුණා. ඒ නිසා මේවා නියාමනය කිරීම අද වනකොට අත්‍යවශ්‍ය සාධකයක් බවට පත් වෙලා තිබෙනවා.

අනීතික ලෙස මුදල් ඉපැයීමත්, ඒ හරහා අනීතිකව මත්ද්‍රව්‍ය ජාවාරමට යොමු වීමත්, මේ සඳහා පාතාලය භාවිත කිරීමත් කියන අර අපරාධ රාජ්‍යය නිර්මාණය කිරීම සඳහා මෙන්න මෙවැනි නියෝග ශක්තිමත් නොවීම අපට කිසියම් ආකාරයකට බලපා තිබුණා. ඒ නිසා ඒවා නියාමනය කිරීම ඉතාම වැදගත්. මේ තත්ත්වය කොතරම් දුරට සංකීර්ණ වෙලා තිබෙනවාද කිව්වොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අයිතිකාරයෝ නැති දේපළ ගැන විතරක් නොවෙයි, සමහර වෙලාවට අත්අඩංගුවට ගත්ත සැකකාර පුද්ගලයින් මරා දැමීමටත්, නොමරා සිටීමටත් මෙන්න මේ මුදල් භාවිත කරන බවට මෑත කාලයේදී අපට වාර්තා වුණා. පසුගිය කාලයේ සමාජය තුළ ඒ ගැන කතිකාවක් ගොඩනැඟුණා. ඊට අදාළ සැකකරුවන් මේ වනකොට අත්අඩංගුවට අරගෙන තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මඟින්. මේ ස්වභාවය අනුව මේ අපරාධ රාජ්‍යය, මේ පාර රාජ්‍යය සිදු කරන මෙන්න මේ අනීතික කටයුතුවලින් සම්පූර්ණයෙන්ම අපේ සමාජය වෙළාගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒවා වැළැක්වීම සඳහා අපට මේ වාගේ නියෝග වාගේම නීති අවශ්‍යයි. ඒ වාගේම, ජාත්‍යන්තර වශයෙන් ඇගැයීම් ලබා ගැනීම සඳහා අපට මේ නියෝග අවශ්‍යයි. ඒ නිසා අද දින ඉදිරිපත් කරන මේ නියෝග විශේෂයෙන්ම අපේ සමාජය වෙළාගෙන තිබෙන අපරාධ වැළැක්වීම සඳහාත්, මත්ද්‍රව්‍ය, අපරාධ සහ පාතාලය සම්බන්ධයෙන් රාජ්‍යයේ ගොඩනැඟී තිබෙන ස්වභාවය, එහි පැතිරීම වැළැක්වීම සඳහාත් ඉවහල් වන බව විශේෂයෙන් මම මෙහිදී සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද තවත් ඉතා වැදගත් පනතක් වන රේගු ආඥාපනත යටතේ වන යෝජනා සම්මතයද අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. අපි දන්නවා, අපේ භාණ්ඩාගාරයට මුදල් එන ප්‍රධානතම මූලාශ්‍ර තුනක් තිබෙන බව. ඒ මූලාශ්‍ර තුන අතර ප්‍රධානතම මූලාශ්‍රයක් තමයි, ශ්‍රී ලංකා රේගුව. ඊට අමතරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව වැනි ආයතනවලින් තමයි භාණ්ඩාගාරයට ප්‍රධාන වශයෙන් මුදල් ගලාගෙන එන්නේ. එලෙස ගලාගෙන එන මුදල් තමයි අපේ රටේ සෞඛ්‍යයට, අධ්‍යාපනයට, ප්‍රවාහනයට වාගේම රාජ්‍ය සේවය පවත්වාගෙන යෑම සඳහා වැටුප් සහ දීමනා ගෙවීම වැනි සියලු කටයුතු සඳහා භාවිත කරන්නේ. ඒ නිසා රේගුව හරහා අපට එන මුදල් අපි නිසි ලෙස කළමනාකරණය කරන්න ඕනෑ. ඒ මුදල් නිසි විධියට ලබා ගැනීම සඳහා අවශ්‍ය නීති, රෙගුලාසි අපි පනවා ගන්න ඕනෑ වාගේම ඒවා ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් තමයි අපි මේ තීරුබදු සම්බන්ධව යෝජනා සම්මතය ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ වාගේම, රේගු ආඥාපනත හරහා ඒ බදු ක්‍රමය සරල කිරීම සඳහා අපි අද මේ යෝජනා සම්මතය අනුමත කිරීමට ඉදිරිපත් කර තිබෙනවා.

විශේෂයෙන්ම මම මේ කාරණයත් සඳහන් කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පසුගිය වසරේදී තමයි ලංකා ඉතිහාසයේ වැඩිම ආදායමක් ශ්‍රී ලංකා රේගුව විසින් උපයා ගත්තේ. අපි පසුගිය වර්ෂ 3 ගත්තොත්, 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව උපයා ගත්තේ රුපියල් බිලියන 970යි. 2024 වර්ෂයේදී උපයා ගත්තේ රුපියල් බිලියන 1,533යි. නමුත්, ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට ශ්‍රී ලංකා රේගුව 2025 වර්ෂයේදී රුපියල් බිලියන 2,557ක් උපයා ගත්තා. ඒ මුදල උපයා ගන්න පුළුවන් වුණේ අපි කාර්යක්ෂමව මේ කටයුතු කළමනාකරණය කරපු නිසාත්, මෙන්න මේ බදු ක්‍රමයෙන් සරල කර ගැනීමත් හරහායි. 2026 වර්ෂයේ ගෙවුණු මාස 6 තුළ විතරක් රුපියල් බිලියන 1,373ක් උපයා ගැනීමට ශ්‍රී ලංකා රේගුව සමත් වුණා. අලුතින් බදු පනවන්නේ නැතිව, අලුතින් ක්‍රම හඳුන්වා දෙන්නේ නැතිව, කාටවත් වෙන බදු බරක් පටවන්නේ නැතිව බදු ආදායම වැඩි වෙනවා කියන්නේ අපි එය ක්‍රමානුකූල කරලා තිබෙනවා, ඒ වාගේම මේ ආයතන කාර්යක්ෂම කරලා තිබෙනවාය කියන එකයි. ඒ වාගේම එම ආයතනවල සේවය කරන නිලධාරින්, ඒ කාර්ය මණ්ඩල ඉතාම උද්යෝගයෙන් වැඩ කරනවා. එහෙම වැඩ කිරීම හරහා තමයි අපට ඒ බදු ආදායම් නිසි ලෙස උපයා ගන්නත් හැකියාවක් ලැබෙන්නේ. එහෙම උපයා ගන්නා බදු ආදායම තමයි ආපසු ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන්, ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් භාවිත කරන්නේ.

රේගු බදු සරල කිරීම හරහා අපි පළමුවෙන්ම බලාපොරොත්තු වෙනවා, සාධාරණ බදු ක්‍රමයක් අපේ රටට හඳුන්වා දෙන්නට. අපි මේ වෙනකොට ඒ කටයුත්ත ඉටු කරමින් ඉන්නවා. දෙවැනි එක තමයි, රජයේ ආදායම් වැඩි කර ගැනීම. එලෙස ආදායම් වැඩි කර ගත්තාට පස්සේ ඒ ආදායම නැවතත් ජනතාවට ප්‍රතිලාභ ලබා දීම සඳහා භාවිත කරනවා. ඒ වෙනුවෙනුත් මේ යෝජනා සම්මතය අපට ඉතාම වැදගත් වනවා. මේ බදු සරල කිරීම හරහා අපේ දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගැනීමත් අපි අපේක්ෂා කරනවා.

කලින් කථා කළ මන්ත්‍රීතුමා සඳහන් කළා, අල ගොවීන්ගේ ප්‍රශ්නයක් පිළිබඳව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ගොවීන් පිළිබඳව අපි ඉතාම සංවේදීයි. අපි දන්නවා, සාමාන්‍යයෙන් අපේ රටේ ජනගහනයෙන් සියයට 24ක් විතර කෘෂි කර්මාන්තයෙන් ජීවත් වෙන බව. අපි අල ගොවීන් ගැන කල්පනා කරන්න ඕනෑ. අපි දේශීය නිෂ්පාදනය ශක්තිමත් කර ගන්නවා වාගේම පාරිභෝගිකයන් ගැන හිතන්නත් ඕනෑ. දේශීය වශයෙන් අපේ නිෂ්පාදන ආරක්ෂා කර ගන්න ගමන් රටේ ජනතාවගේ පරිභෝජනය ගැනත් හිතලා තමයි අපි තීරණ ගන්න ඕනෑ. ඒ අනුව දේශීය කර්මාන්ත, දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කර ගැනීමත් මේ බදු ප්‍රතිපත්ති හරහා අපි අපේක්ෂා කරනවා. ඒ අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් තමයි අපි මේ නියෝග අනුමත කර ගැනීමට යොමු කරලා තිබෙන්නේ. මේ සරල බදු ප්‍රතිපත්ති හඳුන්වා දීම හරහා අපි අපේක්ෂා කරනවා, විශේෂයෙන්ම ඒ කර්මාන්තකරුවන්ට, ආනයනකරුවන්ට සහ අපනයනකරුවන්ට පහසු බදු ක්‍රමයක් හඳුන්වා දෙන්න. එතකොට කලින් තිබුණා වාගේ ලිපි ලේඛන ගොඩක් අවශ්‍ය කරන්නේ නැහැ. අපි CESS, PAL වාගේ බදු ක්‍රමයෙන් ඉවත් කරලා, තනි බදු ක්‍රමයකට ගෙනැල්ලා බදු සරල කරනවා.

මේ රේගු ආඥාපනත යටතේ ගෙනෙන යෝජනා සම්මතය මඟින් අපි ක්‍රමානුකූලව වැඩිපුර ආදායමක් උපයා ගන්නවා වාගේම අනෙක් පැත්තෙන් දේශීය කර්මාන්ත නඟා සිටුවීමටත් අපේක්ෂා කරනවා. ඒ හරහා ජනතාවට ආපසු ප්‍රතිලාභ ලබා දීම තමයි අපේ අපේක්ෂාව. ඒ සඳහා අද ඉදිරිපත් කර තිබෙන නියෝග සහ යෝජනා සම්මතයත්, හෙට දවසේ අපි සම්මත කර ගැනීමට අපේක්ෂා කරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පතත් ප්‍රයෝජනවත් වන බව සඳහන් කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Thurairasa Ravikaran. You have eight minutes.

[பி.ப. 12.24]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய விவாதத்துக்கு வருவதற்கு முன்னர் எங்களுடைய மாவட்டத்தில் தற்போது நடைபெறும் போராட்டம் சம்பந்தமாகக் கருத்துச் சொல்ல விரும்புகின்றேன். முல்லைத்தீவு, கரைதுறைப்பற்றுப் பிரதேச செயலாளர் பிரிவிலுள்ள கேப்பாபுலவு மக்கள் தமது பூர்வீகக் காணிகளை விடுவிக்குமாறு வலியுறுத்தி, இன்றோடு 15ஆவது நாளாகத் தொடர் போராட்டத்தில் ஈடுபட்டுள்ளனர். கடந்த 5ஆம் திகதி ஞாயிற்றுக்கிழமை காணி விடுவிப்பை வலியுறுத்தி அந்த மக்களால் பாரிய ஆர்ப்பாட்டம் ஒன்றும் முன்னெடுக்கப் பட்டிருந்தது. குறிப்பாக, கேப்பாப்புலவில் 55 குடும்பங்களுக் குரிய 59.5 ஏக்கர் பூர்வீக வாழ்விடக் காணிகளும், 04 குடும்பங்களுக்குரிய 100 ஏக்கர் மத்திய வகுப்புக் காணிகளுமாக மொத்தம் 59 குடும்பங்களுடைய 159.5 ஏக்கர் காணிகளை இராணுவத்தினர் கையகப்படுத்தி வைத்திருக் கின்றனர். இராணுவத்தினரால் கையகப்படுத்தப்பட்டுள்ள குறித்த பகுதிக்குள், பாடசாலை, பொதுநோக்கு மண்டபம், கோவில், விளையாட்டு மைதானம் உள்ளிட்ட கட்டமைப்புக்களும் தென்னை, மா, பலா, பனை, வேம்பு உள்ளிட்ட பயன்தரு மரங்களும் காணப்படுகின்றன.

அதனைவிட, மக்களுடைய பெருமளவான கால்நடைகளை இராணுவத்தினர் அந்தப் பகுதிக்குள் அபகரித்து வைத்திருப்பதாகவும், பால் உற்பத்தியைப் பெறுவதாகவும் மக்களால் எம்மிடம் முறையீடு செய்யப்பட்டுள்ளது. மேலும், தமது வளங்களைப் பயன்படுத்தி இராணுவத்தினர் இயற்கை உரம் தயாரித்து விற்பனை செய்வதுடன், நந்திக் கடல் வாழ்வாதார வளத்தினைப் பயன்படுத்திக் கொள்ள முடியாதவாறு முடக்கி வைத்திருப்பதாகவும் மக்களால் எம்மிடம் முறையீடு செய்யப்பட்டுள்ளது. எதிர்வரும் 16.07.2026 அன்று பாதுகாப்புப் பிரதி அமைச்சர் அருண ஜயசேகர அவர்கள் முல்லைத்தீவு மாவட்டத்திற்கு வருகைதர உள்ளதாக அறிய முடிகின்றது. அவ்வாறு வருகைதருகின்ற பாதுகாப்புப் பிரதி அமைச்சர், காணி விடுவிப்பை வலியுறுத்தித் தொடர் போராட்டத்தில் ஈடுபட்டுள்ள கேப்பாப்புலவு மக்களைச் சந்தித்துக் கலந்துரையாட வேண்டும் என்று கேட்டுக்கொள்ளுகின்றேன். நன்றி!

அடுத்ததாகக் குறிப்பிடவேண்டிய ஒரு முக்கிய விடயம் நீர்கொழும்புச் சிறைச்சாலைச் சம்பவம் பற்றியது. கடந்த 5ஆம், 6ஆம் திகதிகளில் நீர்கொழும்புச் சிறைச்சாலையில் ஏற்பட்ட கலவரம், மற்றுமொருமுறை அரசின் காவல் கட்டமைப்பின் தர நிலையை உலகுக்கு வெளிப்படுத்தியிருக்கிறது. இதற்கு முன்னரும் இலங்கையின் சிறைகளில் கலவரங்கள் நடந்திருக்கின்றன. ஆயினும், அரசே முன்னின்று, அரசே திட்டமிட்டு முன்னகர்த்தி, அரசே துணைநின்று அரங்கேற்றிய சிறைக் கலவரங்களிலிருந்து மேற்படி 2026 யூலை நீர்கொழும்புச் சிறைக் கலவரம் வேறுபட்டு நிற்கிறது.

1983ஆம் ஆண்டு வெலிக்கடைச் சிறைச்சாலையில் 53 தமிழ் அரசியல் கைதிகள், சிங்களக் கைதிகளால் வெட்டியும் குத்தியும் படுகொலை செய்யப்பட்டனர். வெவ்வேறான இரண்டு நாட்களில், 35பேர், 18 பேர் எனத் தமிழ் அரசியல் கைதிகள் வெட்டிக் கொலை செய்யப்பட்டமை தமிழர்மீது இலங்கை அரசால் மேற்கொள்ளப்பட்ட இன அழிப்புத் தாக்குதலாகவே கருதப்படுகிறது. அந்தச் சிறையில் வைக்கப்பட்டிருந்த குட்டிமணி, நீதிமன்றில் மரண தண்டனை விதிக்கப்படும்போது தனது இறுதி ஆசையை இவ்வாறு விபரித்தார்: "எனது மரண தண்டனையை நிறைவேற்றுமுன் என் கண்களை எடுத்துப் பார்வையற்ற ஒருவருக்குப் பொருத்துங்கள்! நான் பார்க்க முடியாத தமிழீழத்தை என் கண்களாவது பார்க்கட்டும்!" என்று அவர் குறிப்பிட்டிருந்தார். அந்தத் தாக்குதலின்போது சிறைச்சாலை அதிகாரிகளே அறைக் கதவுகளின் திறப்புகளைச் சிங்களக் கைதிகளுக்குக் கொடுத்ததாகத் தப்பிப் பிழைத்தவர்களின் வாக்குமூலங்கள் சான்றுப்படுத்தின. அப்போதைய அரசின் கட்டமைப்புகள் சிறைக் கலவரங்களையும், சிறைகளில் இடம்பெற்ற படுகொலைகளையும் முன்னின்று நடாத்தியதற்குக் காலவெளியில் எண்ணற்ற சான்றுகள் காணப்படுகின்றன.

பிந்துனுவெவ புனர்வாழ்வு முகாம் இதற்கு மற்றொரு சான்று. அங்கு தங்கவைக்கப்பட்டிருந்த தமிழ் இளைஞர்கள் 27 பேர் 2000.10.25ஆம் திகதி கொல்லப்பட்டனர்; பதினான்கு இளைஞர்கள் காயமுற்றனர். சம்பவ தினத்துக்கு முதல் நாள் "புலிக்குட்டிகளின் சதைகளை எங்கள் நாய்களுக்குப் போடுவோம்" எனச் சிங்களத்தில் எழுதப்பட்ட சுவரொட்டிகள் முகாமைச் சுற்றிப் பல இடங்களில் காணப்பட்டதாகவும், குறித்த தாக்குதல் ஒரு திட்டமிட்ட தாக்குதல் எனவும், பிந்துனுவெவ படுகொலைகளுக்குப் பொலிஸாரே பதில் கூறவேண்டும் எனவும் 'சிலுமின' என்ற சிங்களப் பத்திரிகை செய்தி வெளியிட்டிருந்தது. முன்னைய காலங்களில் அரச கட்டமைப்புகளால் தமிழர்கள்மீது நடாத்தப்பட்ட இத்தகைய சிறைக் கலவரங்கள் இன்றும் அதே அரச கட்டமைப்பின் மனித நேயமற்ற, வினைத்திறனற்ற காவல் கட்டமைப்பை உலகுக்கு வெளிக்காட்டியுள்ளது. வெலிக்கடையிலும் பிந்துனுவெவ விலும் களுத்துறையிலும் தமிழர்கள் என்ற நிலையில் பாதிக்கப்பட்டவர்களுக்குக் கிட்டாத நீதி, நீர்கொழும்பில் பாதிக்கப்பட்டவர்களுக்காவது கிட்டவேண்டும் என்று நான் கேட்டுக்கொள்ளுகிறேன்.

அடுத்ததாக, ஒரு முக்கிய விடயமாக செம்மணி புதைகுழியைப் பற்றிய ஒரு சிறு குறிப்பைப் பதிவு செய்கின்றேன். இந்தச் செம்மணி புதைகுழி தொடர்பாக முன்னாள் ஜனாதிபதி சந்திரிகா பண்டாரநாயக்க குமாரதுங்க அவர்களிடம் விசாரணை நடாத்தப்பட வேண்டும். ஏனெனில், செம்மணி மனிதப் புதைகுழி தொடர்பில் உண்மைகளை வெளிப்படுத்தக்கூடாதென அப்போதைய ஜனாதிபதி சந்திரிகா பண்டாரநாயக்க குமாரதுங்க தன்னிடம் கேட்டுக்கொண்டதான தகவல்களை சோமரத்ன ராஜபக்ஷ வெளிப்படுத்தியிருந்தார். அப்போதைய அரசாங்கத்தில் அமைச்சராக இருந்த ஜெயராஜ் பெர்னாண்டோபுள்ளே அவர்களால் சிறைச்சாலை அதிகாரி ஒருவர்மூலம் கடிதம் ஒன்று தனக்கு அனுப்பி வைக்கப்பட்டிருந்ததாகவும், அந்தக் கடிதத்தை முன்னாள் ஜனாதிபதி சந்திரிகா பண்டாரநாயக்க குமாரதுங்கவே அனுப்பி வைத்திருந்ததாகவும் சோமரத்ன ராஜபக்ஷ தெரிவித்திருக் கின்றார். மனிதப் புதைகுழி தொடர்பில் எதனையும் கூற வேண்டாமெனவும் அவருக்குப் பொதுமன்னிப்பு வழங்க நடவடிக்கை எடுக்கப்படுமெனவும் அந்தக் கடிதத்தில் குறிப்பிடப்பட்டிருந்ததாகவும் மேலும் அவர் தெரிவித்துள்ளார். எனவே, சோமரத்ன ராஜபக்ஷ வெளிப்படுத்திய தகவல்களின் அடிப்படையில் முன்னாள் ஜனாதிபதி சந்திரிகா பண்டாரநாயக்க குமாரதுங்க அவர்களிடமும் விசாரணைகள் மேற்கொள்ளப்பட வேண்டுமென, செம்மணி மனிதப் புதைகுழியுடன் தொடர்புடைய அனைத்து மக்களும் வேண்டுகின்றனர். எனவே, செம்மணி மனிதப் புதைகுழியுடன் தொடர்புடைய அனைத்துக் குற்றவாளிகளும் கைது செய்யப்பட்டு, அவர்களுக்கெதிராக மிகக் கடுமையான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டுமென இவ்வுயரிய சபையினூடாகக் கேட்டுக்கொள்ளுகின்றேன்.

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

அடுத்து, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கொடுப்பனவு மற்றும் தீர்ப்பனவு முறைமைகள் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள், சுங்கக் கட்டளைச் சட்டத்தின்கீழ் இறக்குமதித் தீர்வை தொடர்பான தீர்மானம், மோட்டார் வாகனச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள்,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Thurairasa Ravikaran, your time has been exhausted.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Sir, give me a minute, please.

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டத்தின்கீழான இரு கட்டளைகள் என்பவற்றை அங்கீகரிக்கும் இன்றைய விவாதப்பொழுதிலே, சமத்துவ அனுபவங்களுக்குச் சவாலாகும் சில விடயங்களையே இங்கும் முன்வைக்க விரும்புகின்றேன்.

வங்கிச் சேவைகளும் பணம் மற்றும் மதிப்பு மாற்றும் சேவைகளும் இன்னமும் கிடைத்திராத பிரதேசங்கள் பல வன்னிப் பிராந்தியத்தில் உண்டு. பிரித்தானியரிடம் இருந்த இத்தீவு கைமாற்றப்பட்டதன் பின்னர், சாண் ஏற முழம் சறுக்கும் வகையில் பல்வேறு சவால்களை ஓர் இனமாக ஈழத் தமிழர்களாகிய நாம் எதிர்கொண்டிருந்தோம். 1950களில் எமது மொழி உரிமை பறிக்கப்பட்டது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please wind up?

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
1950, 1970, 1980ஆம் ஆண்டுகளில், எம்மீது இனக்கலவரங்கள் கட்டவிழ்த்து விடப்பட்டன. இத்தீவு முழுவதும் பரந்து விரிந்து கல்வியிலும் பொருளாதாரத்திலும் வளர்ச்சிபெற்ற எங்களின் சொத்துகள் எரித்து நாசமாக்கப்பட்டன.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is over. We have to suspend for lunch.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
நேரம் போதாமையால் எனது மிகுதி உரையை நான் சபாபீடத்துக்குச் ***சமர்ப்பிக்கின்றேன்.** நன்றி!

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Namal Karunaratne. You have six minutes.

[අ.භා. 1.00]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වී ගොවියාගේ ප්‍රශ්නය පිළිබඳව මේ දවස්වල සමාජයේ ලොකු කතිකාවක් නිර්මාණය වෙලා තිබෙන නිසා ඒ පිළිබඳව මේ රටේ ගොවි ජනතාවට පණිවුඩයක් ලබා දීමටත්, රට දැනුවත් කිරීමටත් මම මේ අවස්ථාව යොදා ගන්නවා.

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනත මඟින් තමයි වී අලෙවි මණ්ඩලය පිහිටෙව්වේ. අද මේ සභාවේ ගොඩක් මන්ත්‍රීවරු මේ වන කොට ගොවීන් පිළිබඳව විශාල වේදනාවකින් කථා කරනවා; වී කිලෝ එකකට රුපියල් 150ක මිලක් ඉල්ලනවා; ලොකු අඳෝනාවක් නඟමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1977දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මේ රට භාර ගත්තාට පසුව 1981 වර්ෂය වන කොට වී අලෙවි මණ්ඩලයේ සේවකයෝ හිටියා 1980ක්; ලොරි රථ තිබුණා 17ක්; ජීප් රථ තිබුණා 59ක්. එහි ගබඩා සංකීර්ණ විශාල ප්‍රමාණයකුත් තිබුණා. ප්‍රධාන වශයෙන්, රජය සතු වී මෝල් 17ක් තිබුණා. හැබැයි ඒ පාලන යුගවලින් පසුව අලුත් ආණ්ඩුව විධියට අප මේ රට භාර ගන්න කොට වී අලෙවි මණ්ඩලයේ හිටියේ සේවකයන් 159යි. එච්චර අඩු වෙලා තිබෙන්නේ සේවකයන් 1980කට වැඩි ප්‍රමාණයක් හිටපු තැනින්. අප මේ රට භාර ගන්න කොට වී අලෙවි මණ්ඩලයේ ලොරි රථ තිබුණේ, 1යි. ගබඩා විශාල ප්‍රමාණයක් වැසී ගිහිල්ලා තිබුණා; සදහටම වසා දමා තිබුණා. ඒ ගබඩා කැලේට ඇරලා තිබුණේ; සතුන්ට ඇරලා තිබුණේ. ඒ ගබඩා ප්‍රතිසංස්කරණය කරන්න පළමුවැනි වටයේ රුපියල් ලක්ෂ 700කට වැඩි මුදලක් වෙන් කරන්න රජය විධියට අපට සිද්ධ වුණා. ඒ තත්ත්වයයි තිබුණේ. වී මිල දී ගැනීමක් සිද්ධ කළේ නැහැ. එය නතර කරලායි තිබුණේ. ඒ පරිසරය තුළ වී කිලෝ එකකට මිලක් නියම කර තිබුණා, රුපියල් 105ක. කිලෝවකට රුපියල් 105ක මිලක් නියම කරලා තිබුණාට එදා වී මිල දී ගැනීමක් කළේ නැහැ. ගබඩා වහලා තිබුණේ. ඔන්න ඔය තත්ත්වය ඇතුළේ තමයි අප මැදිහත් වුණේ.

අපට පළමුවෙන්ම සිද්ධ වුණා, ගබඩා ටික ප්‍රතිසංස්කරණය කරන්න; හමුදාව යොදවා අනෙකුත් ප්‍රජාවගේත් සහයෝගය ඇතිව සුද්ද පවිත්‍ර කරන්න. ඊළඟට, නාඩු වී කිලෝවකට රුපියල්

120ක්, සම්බා වී කිලෝවකට රුපියල් 130ක්, කීරි සම්බා වී කිලෝවකට රුපියල් 140ක් වශයෙන් නියම කර වී මිල දී ගැනීම ආරම්භ කළා. පසුගිය කන්න තුනක් ගත වුණා, වී ගොවියාගෙන් කිසිම ගැටලුවක් -ප්‍රශ්නයක්- ආවේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගොවි නායකයෝ සියලුදෙනාම අපේ අමාත්‍යාංශයටම ඇවිල්ලා මාධ්‍යයට ප්‍රකාශ කළා, "මේ මිල පිළිබඳව අපි සතුටු වෙනවා, ගබඩා ඇරපු එක පිළිබඳව අපි සතුටු වෙනවා" කියලා. ඒ විධියට තමයි ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ සතුට, ප්‍රසාදය පළ කළේ. ඔන්න ඔය විධියටයි අපි කටයුතු කරගෙන ආවේ. ඒ අතරේ "දිට්වා" ව්‍යසනය ආවා. "දිට්වා" ව්‍යසනය නිසාත් හානියක් සිදු වුණා. අපි ඒකට මුහුණ දුන්නා. ඊට පසුව ලෝක යුද්ධයක් ආවා. ඒ යුද්ධයත් එක්ක මුළු ලෝකයටම බැට කන්න සිද්ධ වුණා. ඒ පරිසරය ඇතුළේ ගොවියා ආරක්ෂා කර ගන්න අපි විශාල මැදිහත් වීමක් කළා.

ගොවියා ප්‍රධාන වශයෙන්ම බැට කෑ දෙයක් තමයි පොහොර ප්‍රශ්නය. අපි ආණ්ඩුව විධියට පොහොර මෙට්‍රික් ටොන් 62,000ක් ඉතාම සාධාරණ මිලකට ගොවියාට බෙදා හැරියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට කියන්නම් අපි අවසාන පොහොර තොගය ගත්තේ කීයටද කියලා. අපි පොහොර මෙට්‍රික් ටොන් 7,100ක් ගත්තා. පොහොර මිටියක් රුපියල් 17,000 ගණනේ ගත්තේ. තවත් තොගයක් ගත්තා. එය පොහොර මිටියක් රුපියල් 15,940 ගණනේ ගත්තේ. තවත් තොගයක් ගත්තා. එය පොහොර මිටියක් රුපියල් 13,970 ගණනේ ගත්තේ. අන්න ඒ ගණන්වලට අරගෙන පොහොර මිටියක් රුපියල් 9,900ට, 10,000ට, 10,200ට - 10,200ට වඩා අඩු ගණනකට - ගොවි ජනතාවට ලබා දුන්නා. මීට කලින් කවදාවත් ආණ්ඩුවක් ඒ විධියට ගොවියාගේ පැත්තට හැරිලා කටයුතු කරලා නැහැ.

අප ආණ්ඩුව භාර ගන්න කොට ගොවියෙකුට පොහොර සහනාධාරය වශයෙන් හෙක්ටෙයාර දෙකක් සඳහා හම්බ වුණේ, රුපියල් 30,000යි. මේ වන කොට අපි එය රුපියල් 60,000ක් කරලා තිබෙනවා. ඒ පැත්තෙනුත් අපි මැදිහත් වුණා. හැබැයි අපි පිළිගන්නවා, මේ කන්නයේදී ට්‍රැක්ටර් ගාස්තුවලින්, අස්වනු නෙළන යන්ත්‍රවලට ගෙවන ගාස්තුවලින් - අස්වනු නෙළන යන්ත්‍රයට ගොවියෝ කියන්නේ "බූතයා" කියලා. බූතයා ගාස්තුවලින් - ගොවියාට යම්කිසි පීඩනයක් එල්ල වුණු බව. පොහොර සම්බන්ධයෙන් මැදිහත් වුණාට මේ කියපු පැත්තෙන් ඒ විධියට ඒක balance කර ගන්න අපට අවස්ථාවක් ආවේ නැහැ.

අපි ගොවි ජනතාවට කියන්න කැමැතියි එන මහ කන්නය වන කොට ඒ තත්ත්වය අනිවාර්යයෙන් වෙනස් කරන බව සහ වෙනස් වන බව. එතකොට ඔය මිල ගාස්තු වෙනස් කරනවා සහ වෙනස් වෙනවා; පොහොර මිලත් වෙනස් වෙනවා. ලෝක මට්ටමින් පවතින යුද්ධයත් එක්ක තමයි යල කන්නයේ ඔය ප්‍රශ්නය ආවේ.

ඊළඟට, අපි විශේෂයෙන් කියන්න ඕනෑ අස්වනු වැඩි වෙලා තිබෙන බව. දැන් සෑම තැනකම අස්වනු වැඩි වෙලා තිබෙනවා. නිෂ්පාදන වියදම ගණන් හදන්නේ වියදම අස්වැන්නෙන් බෙදලායි. ඒ විධියට තමයි නිෂ්පාදන වියදම හදන්නේ. දැන් අස්වනු වැඩි වෙලා තිබෙනවා. ඔන්න ඔය තත්ත්වය හමුවේ පසුගිය දවසක මෝල් හිමියන් සහ මෝල් සංගම් එක්ක අපි සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේදී සියලු මෝල් හිමියෝ රජය නියම කළ මිලට වී මිල දී ගැනීමට එකඟතාව පළ කළා. අපි ඒ බව ගොවි ජනතාවට කියනවා. අපි කොහොමත් ගබඩා ටික අරිනවා. අපි සැලසුම් කරලා තිබෙනවා බොහෝදුරට හෙට දවස වන කොට - 09වන දා වන කොට - මඩකලපුවේ ගබඩා 4ක් විවෘත කරන්න. අපි ලබන සඳුදා හෙවත් 13වන දා වන කොට කිලිනොච්චිය, වවුනියාව, මුලතිව් සහ අම්පාර කියන දිස්ත්‍රික්කවල වී ගබඩා විවෘත කරනවා. ඒ වාගේම, 15වන දා වන කොට මොනරාගල, හම්බන්තොට ප්‍රදේශවල වී ගබඩා විවෘත කරනවා. ගොයම් කැපෙන විධිය අනුව ඉතිරි ගබඩා ටික විවෘත කරනවා. පොළොන්නරුවේ ගබඩා අරින්නේ ලබන මාසයේ. ඒකට තව මාසයක් විතර තිබෙනවා. මොකද, එහේ ගොයම් කැපෙන්නේ ඒ කාලය වන විටයි. ඒත් එක්කම රජය නාඩු වී කිලෝවක් රුපියල් 120ට, සම්බා වී කිලෝවක් රුපියල් 130ට සහ කීරි සම්බා වී කිලෝවක් රුපියල් 140ට රජයේ ගබඩාවලට මිල දී ගැනීම ආරම්භ කරනවා. එම නිසා අපි ගොවි ජනතාවට කියනවා ඔබ මේ වෙලාවේ ඔබගේ වී රුපියල් 80 ගණන්වලට, 90 ගණන්වලට, 100ට විකුණන්න එපා කියලා. වී මෝල් හිමියන්, මෝල් සංගම් සමඟ අපි එකඟතාවකට ආවා. ඒ අයත් එකඟ වුණා රජය නියම කරපු මිලට වී මිල දී ගන්න. එහෙම නම්, දැන් රජය වී මිල දී ගන්න සූදානම්. ගබඩාත් විවෘත කරනවා. පෞද්ගලික අංශයත් සූදානම් ඒ මිල ගණන්වලට වී මිල දී ගන්න. එම නිසා මම ගොවි ජනතාවට කියනවා, ඔබේ වී රුපියල් 90 ගණන්වලට දෙන්න එපා කියලා. ඒ මිලට වී දෙන එක නතර කරන්න, නතර කරලා මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්න කියලා මම මේ අවස්ථාවේ අපේ ගොවි ජනතාවට මතක් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Namal Karunaratne, you have exhausted your time.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය කියලා මම කථාව අවසාන කරන්නම්.

වී කිලෝවකට රුපියල් 150ක් ලබා දෙන ලෙස විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ඉල්ලනවා. මම විපක්ෂයෙන් අහන්න කැමැතියි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් ආවා නම් වී කිලෝවක මිල රුපියල් 150ක් කරනවාද කියලා. වී කිලෝවක මිල රුපියල් 150ක් කරලා හාල් කිලෝ එකක් කීයටද දෙන්නේ? අන්න ඒකටත් උත්තර දෙන්න. නිකම් ආවාට ගියාට කථා කරන්න එපා. ඔව්, එක අවස්ථාවකදී මගේ කටින්ම කිව්වා තමයි, වී කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 154ක මට්ටමට ඇවිත් තිබෙනවා කියලා. ඒ කිව්වේ, එදාට අදාළව. විපක්ෂ නායකතුමා මේ ගරු සභාවේදී ප්‍රකාශ කළා, රසායනික පොහොර භාවිතය තහනම් කළ කාලයේ වී නිෂ්පාදනය සියයට 35කින් අඩු වුණා කියලා. ඔව්, ඒක ඇත්ත. රසායනික පොහොර තහනම් කළ යුගය තුළ වී නිෂ්පාදනය සියයට 35කින් අඩු වුණා නම්, පොහොර මිටියක් රුපියල් 40,000ට, රුපියල් 50,000ට ගන්න සිද්ධ වුණා නම්, ට්‍රැක්ටර් ගාස්තු ආදී ඔක්කොම වැඩි වුණා නම්, කලින් වී කිලෝ 100ක් ගත්තු ගොවියාට අස්වැන්න ලැබුණේ කිලෝ 65ක් නම් නිෂ්පාදන වියදම ගණන් හදලා බලන්න. වී කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 150 පනින්නේ නැද්ද? රුපියල් 150 පනිනවා. අන්න ඒකයි මම එදා එහෙම කිව්වේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Deputy Minister, your time is up. Kindly, wind up.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ.

[ගරු නාමල් කරුණාරත්න මහතා]

ගරු වාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා කිව්වා, මහින්ද රාජපක්ෂ යුගයේ පොහොර මිල මේ මේ ආකාරයට අඩු කළා කියලා. ඒ මහින්ද රාජපක්ෂ යුගයේම තමයි රසායනික පොහොර තහනම් කළේ. අපි ඒකත් කියන්න ඕනෑ. එතකොට මහින්ද රාජපක්ෂ තමයි රටේ අගමැති; ගෝඨාභය තමයි ජනාධිපති. ඒ කාලයේ තමයි රසායනික පොහොර තහනම් කළේ. ඒ ඉතිහාසය අමතක කරලා වර්තමානය ගැන කථා කරන්න එපා කියන එකත් අපි කියන්න ඕනෑ.

අපි මේ රටේ ගොවි ජනතාවට සහතික වෙනවා, ඒ අයට තිබෙන ගැටලු විසඳන බවට. වී අලෙවි මණ්ඩලය දැන් වී වේළන යන්ත්‍ර ස්ථාපිත කරන්න පටන් අරගෙන තිබෙනවා. රජය ඒ වෙනුවෙන් - වී වේළන යන්ත්‍ර ස්ථාපිත කරන්න - මුදල් වෙන් කරලා තිබෙනවා. රුපියල් ලක්ෂ 5,000ක් වෙනම වෙන් කරලා තිබෙනවා වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය හරහා. අනෙක් පැත්තෙන්, පෞද්ගලික අංශයත් සම්බන්ධ කරගෙන සහල් සැකසුම් මධ්‍යස්ථාන ඉදිරියේදී නිර්මාණය වෙනවා. ඒ වාගේම තමයි silos නිර්මාණය කිරීමට අදාළවද සැලසුම් සකස් කර තිබෙනවා. ලොරි රථ කිහිපයක් මිල දී ගැනීමටත් මේ වන කොට සැලසුම් කර තිබෙනවා. අපි වී අලෙවි මණ්ඩලය යථාවත් කරලා ගොවි ජනතාවට ඉතා විශාල සේවයක් කරන ඉතාම ආකර්ෂණීය ආයතනයක තත්ත්වයට ඒ ආයතනය ගෙනෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කලබල වෙන්න එපා, ගොවි ජනතාවගේ ගැටලු අප එකින් එකට ක්‍රමානුකූලව විසඳනවා කියන කාරණයත් අපි මේ වෙලාවේ අවධාරණය කරන්න කැමැතියි. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Mujibur Rahuman. You have seven minutes.

[අ.භා. 1.10]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා හොඳ දෙයක් කිව්වා. ඒ තමයි, ඉතිහාසය අමතක කරලා කථා කරන්න එපා කියන එක. එහෙම කියපු එක හොඳයි. මොකද, ඔබතුමන්ලා ඉතිහාසයේ කියපු දේවල් තමයි අපි දැන් මතක් කර කර ඉන්නේ. ඒවා අමතක කරන්න බැහැ. ඉතිහාසයේ ඔබතුමන්ලා ගොවීන් සම්බන්ධව කියපු හුඟක් දේවල් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය ඉරිදා බන්ධනාගාරයේ ඇති වුණු සිදුවීමත් එක්ක ඉතාම අවාසනාවන්ත දෙයක් සිදු වුණා. ඒ තමයි, බන්ධනාගාර නිලධාරීන් ඇතුළුව 27දෙනෙකුගේ ජීවිත අහිමි වීම. ඒ මිය ගිය සියලුදෙනා වෙනුවෙන් අපගේ ශෝකය එම පවුල්වලට ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි දැක්කා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා ඇමතිතුමා ඒ නිලධාරීන්ගේ අවමංගල්‍යයට සහභාගි වෙන්න වැලිකඩ බන්ධනාගාරයට ගියාම බන්ධනාගාර නිලධාරියෙක් ඇවිල්ලා එතුමාට කියපු දේ. "නියපොත්තෙන් කඩන්න තිබුණු දේ මේක, සර්, අපට order එක දුන්නා නම්" කියලා ඔහු කිව්වා. මොකක්ද ඒ කියන්නේ? නියපොත්තෙන් කඩන්න තිබුණු දේ තමයි, අන්තිමට පොරොවෙන් නතර කරන්න සිද්ධ වුණේ. නියපොත්තෙන් කඩන්න තිබුණු දෙයට තීන්දු ගත්තේ නැත්තේ කවුද, ඇයි ඒ? ඒ තීන්දු ගත්තේ නැති නිසා නේද මේ දේවල් වුණේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසය පුරාම බන්ධනාගාරයේ මෙවැනි සිදුවීම් ඇති වෙලා තිබෙනවා. මේක පළමු සිදුවීම නොවෙයි. ඒක ඇත්ත. තමුන්නාන්සේලා 2024දී ඉදිරිපත් කළ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන පොතේ 208, 209 පිටු බලන්න. එම පිටුවල, බන්ධනාගාරයේ තිබෙන තදබදය ඇතුළු ප්‍රශ්න ගැන තමයි සම්පූර්ණයෙන්ම කථා කරලා තිබෙන්නේ. එහෙම නම්, බන්ධනාගාර විෂය භාර ඇමතිවරයා 2024 ඉඳන් දැනගෙන හිටියා බන්ධනාගාරයේ මෙවැනි තදබදයක් තිබෙනවා කියලා. ඒකට විසඳුම් පවා යෝජනා කරලා තිබෙනවා. එහෙම නම් ඒ සඳහා ක්‍රියාමාර්ග නොගත්තේ ඇයි? ඒකයි තිබෙන ප්‍රශ්නය. ඒකයි අප මේ මතු කරන්නේ. අද අර නිලධාරියා කියන්නේත් ඒකයි. "මේක අපට නියපොත්තෙන් කඩන්න තිබුණ දෙයක් සර්" කියලා ඇයි ඒ නිලධාරියා කියන්නේ? එහෙම නම් එය නවත්වා ගන්න තිබුණු දෙයක්. නවත්වා ගන්න තිබුණු දේ ඇයි නවත්ත ගන්න බැරි වුණේ? ඒකයි ප්‍රශ්නය.

එදා, ඉරිදා, සිරකරුවන් දෙන්නෙකුගේ ජීවිත අහිමි වුණාම එදා හවස විදේශ රටවල සිරකරුවන් 12දෙනෙක් මාරු කළා වෙනත් බන්ධනාගාරවලට. එහෙම නම්, ප්‍රචණ්ඩකාරී විධියට හැසිරෙන කවුරු හරි මේක ඇතුළේ ඉන්නවා නම් ඔවුන් හඳුනා ගෙන ඔවුන් මාරු කරන්නත් තිබුණා නේ, ඉරිදා හවස. ඇයි ඒක කළේ නැත්තේ? ඒක කරන්න තිබුණා. නමුත්, ඒක කළේ නැහැ. විදේශ සිරකරුවන් මාරු කළා නම්, මේක ඇතුළේ හිටිය ප්‍රචණ්ඩකාරී විධියට හැසිරෙන අයත් මාරු කරන්න තිබුණා. ඒක කළේ නැහැ.

ඊළඟ කාරණය මෙයයි. අපේ ඇමතිතුමා වගකීම භාර ගත්තා. වගකීම විතරක් නොවෙයි, වග වීමත් අවශ්‍යයි. වග වෙන්නත් ඕනෑ. වගකීම භාර ගත්තා කියලා මොකුත් වෙන්නේ නැහැ නේ. මෙතැනට ඇවිල්ලා ලස්සන වචන කිව්වාට මොකුත් වෙන්නෙත් නැහැ. වගවීම කියන්නේ මොකක්ද? අද ජනාධිපතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිශ්චයකාරයෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර තිබෙනවා මේ ගැන හොයන්න. ඇමතිවරයා ඒ කමිටුව ඉස්සරහට ගිහිල්ලා, මේ තදබදය සහ මෙවැනි දේවල් වළක්වා ගන්න එතුමා ගත්ත ක්‍රියාමාර්ග පිළිබඳව උත්තර දෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ උත්තර දෙන එක ඇමතිකමේ ඉඳගෙන කරන්න බැහැ. එතුමා ඇමතිකමින් අයින් වෙන්න ඕනෑ. ඇමතිකමින් අයින් වෙලා තමයි එතුමා ගත්ත ක්‍රියාමාර්ග මොනවාද කියලා කියන්න ඕනෑ. මේවා වළක්වා ගන්න මාස 18ක් තුළ එතුමා ගත්ත ක්‍රියාමාර්ග මොනවාද කියලා කමිටුව ඉදිරියට ගිහිල්ලා කියලා, ඒවා ඔප්පු කරලා එතුමාට නිර්දෝෂ වෙන්න පුළුවන්. එහෙම නිර්දෝෂීභාවය ලබා ගන්න නම්, එතුමා තාවකාලිකව මේ ඇමතිකමින් අයින් වෙන්න ඕනෑ. ඒකයි අපි මේ විපක්ෂයේ ඉඳගෙන කියන්නේ. මොකද, අලුත් දේශපාලන සංස්කෘතියක් ගැන නේ, කථා කළේ තමුන්නාන්සේලා; අලුත් culture එකක් හදන්න නේ, කථා කළේ. පසුගිය ආණ්ඩු කාලයේ මෙතැන ඉඳගෙන තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු මෙවැනිම චෝදනා කළා නේ, හිටපු ආණ්ඩුවේ ඇමතිවරුන්ට, මෙවැනි ආදර්ශ දෙන්න කියලා. දැන් ඇයි තමුන්නාන්සේලා ඒ ආදර්ශය දෙන්නේ නැත්තේ? අද බන්ධනාගාර නිලධාරියා කරපු ප්‍රකාශය ඉතාම බරපතළයි. ඔහු පැහැදිලිවම ඇමතිතුමාටම කියනවා, "මේක නියපොත්තෙන් කඩන්න තිබුණු දෙයක් සර්" කියලා.

අනෙක් කාරණය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවුරුද්දකට වැඩි කාලයක් වනවා, බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් කෙනෙක් පත් කරලා නැහැ. බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්වරයා අයින් වෙලා අවුරුද්දක් වෙනවා. එතුමාගේ වැඩ තහනම් කරලා. මාසයක්, දෙකතුනක් නම් කමක් නැහැ, අවුරුද්දක් තිස්සේ මේ තනතුරට කෙනෙක් පත් කරන්න බැරි වුණේ ඇයි? මොකක්ද ඒකේ තිබෙන සාධාරණත්වය? බන්ධනාගාරය වාගේ ගැටලු තිබෙන තැනක, විවිධ ප්‍රශ්න තිබෙන තැනක, නිතරම ගැටුම් ඇති වන තැනක බන්ධනාගාර කොමසාරිස් නරාල්වරයාගේ වැඩ තහනම් කරලා අවුරුද්දක් වෙනවා. අවුරුද්දක් තිස්සේ තමුන්නාන්සේලාට ඒ පත් කිරීම කරන්න බැරි වීම විශාල වරදක්. ඒක විශාල වරදක්. ඒකෙන් ගැලවෙන්න බැහැ ඇමතිතුමාට. මේකේ වගකීම එතුමා භාර ගන්න ඕනෑ. "මම වගකීම භාර ගන්නවා" කියන එක විතරක් ප්‍රමාණවත් නැහැ. එතුමා ආදර්ශ වෙන්න ඕනෑ. මේවා ඉතිහාසයේ වෙලා තිබෙනවා.

1988දී බන්ධනාගාර රැඳවියන් කිහිප දෙනෙක් බන්ධනාගාරය කඩාගෙන පැනලා ගියා. එතකොට නිශ්ශංක විජයරත්න ඇමතිවරයායි, නියෝජ්‍ය ඇමතිවරයායි ඉල්ලා අස් වුණා. ඊළඟට, අපේ රවී කරුණානායක මැතිතුමාට චෝදනාවක් ආවා, මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධව. ඒ පරීක්ෂණ ඉවර වනකල් එතුමා ඇමති ධුරයෙන් අයින් වුණා. ඊළඟට, තිලක් මාරපන ඇමතිවරයා නීතිය හා සාමය පිළිබඳ ඇමති ධුරය දරනකොට චෝදනාවක් ආවා; ඉල්ලා අස් වුණා. ඊළඟට, හිටපු රවුෆ් හකීම් ඇමතිතුමාට, කබීර් හෂීම් ඇමතිතුමාට, අබ්දුල් හලීම් ඇමතිතුමාට, රිසාඩ් බදියුදීන් ඇමතිතුමාට පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා රාශියක් එල්ල වුණා. පොලිස්පතිතුමා ඒ පරීක්ෂණ ඉවර කරනකල් එතුමන්ලා තාවකාලිකව ඇමති ධුරවලින් අයින් වුණා. අයින් වෙලා ඒ පරීක්ෂණවලට මුහුණ දුන්නා. ඊට පස්සේ ඒ පරීක්ෂණවලින් නිදහස් වුණාට පස්සේ තමයි නැවත ඇමති ධුර භාර ගත්තේ.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ජනාධිපතිතුමා සියලු ගල් අඟුරු ගනුදෙනු ගැන හොයන්න ජනාධිපති කොමිසමක් පත් කළා. ඒ ජනාධිපති කොමිසම පත් කරපු ගමන් තමුන්නාන්සේලාගේ ඇමතිවරයා අයින් වුණා. එතුමා ඒ ධුරයෙන් අයින් වෙලා, ඒකට මුහුණ දෙන්න ලෑස්ති වෙලා ඉන්නවා. ඒක හොඳ දෙයක්. අන්න ඒ විධියට කමිටුවට මුහුණ දෙන්න පුළුවන් සද්භාවය, අවංකභාවය තිබෙනවා නම්, අද එතුමා අයින්වෙලා ඒ ත්‍රිපුද්ගල කමිටුවට ගිහිල්ලා කරුණු ටික කියන්න ඕනෑ, මෙවැනි දේවල් වළක්වා ගන්න එතුමා ගත්ත ක්‍රියාමාර්ග මොනවාද, එතුමා ඒවා ක්‍රියාවේ යොදවලා තිබෙනවාද, මාස 18ක් තිස්සේ මේවා නවත්වන්න වැඩ කළාද කියලා. ඒ කමිටුව ඉස්සරහට ගිහිල්ලා ඒවා කියලා එතුමා ඒකෙන් නිදහස් වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලා අලුත් දේශපාලන සංස්කෘතියක් හදන්නයි ආවේ. ඔබතුමන්ලා ආදර්ශවත් වෙන්න. ඉදිරියේදී එන අයට ආදර්ශවත් වෙන සංස්කෘතියක් හදන්න. අන්න ඒ සංස්කෘතියට තමයි අපි system change කියන්නේ. System change කියන්නේ මේවා තමයි. අල්ලාගෙන ඉන්න එක නොවෙයි, system change කියන්නේ. තමන්ගේ අතින් වරදක් වුණා නම්, තමන්ගේ අතින් අඩුපාඩුවක් වුණා නම්, තමන්ගේ නොහැකියාව නිසා සිද්ධියක් වුණා නම් ඒක පිළිඅරගෙන ඒ කමිටුව ඉස්සරහට යන්න ලෑහැස්ති වෙන්න ඕනෑ. එවැනි දේශපාලන සංස්කෘතියකට තමයි ජනවරම ගත්තේ. ඒක මතක් කරලා දෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ruwan Wijeweera. You have ten minutes.

[අ.භා. 1.18]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ආර්ථිකය සහ සමාජ ස්ථාවරභාවය සම්බන්ධ කාරණාවේදී ඉතා වැදගත් පනත් කිහිපයකට අදාළව ගෙනෙන නියෝග, නියම සහ යෝජනා සම්මතයක් අද පාර්ලිමේන්තුවේ විවාදයට ගැනෙනවා. මේ මොහොතේ ඒ විවාදයට එකතු වෙන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

අද ඉදිරිපත් කරන කරුණු අතර 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ පනවන නියෝග අනුමත කිරීම, රේගු ආඥා පනත යටතේ පනවන යෝජනා සම්මත කිරීම, මෝටර් වාහන පනත යටතේ පනවන නියෝග අනුමත කිරීම සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියම දෙකක් අනුමත කිරීම තිබෙනවා. ඒවා තමයි අද විවාදයට ගැනෙන්නේ සහ කරුණු සාකච්ඡා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ආර්ථික ස්ථාවරභාවය ගැන කථා කරන කොට විශේෂයෙන්ම මේ පනත්, ප්‍රතිපත්ති සහ ඊට අදාළ යම් යම් කාරණා නියමානුකූල කිරීම ඉතාම වැදගත් ස්වභාවයක් ගන්නවා. අපේ රටේ ආර්ථික ස්ථාවරභාවය කරා යන ගමනේදී, ආර්ථික සංවර්ධනය කරා යන ගමනේදී අපනයන ආර්ථිකය - export economy එක - විසින් කරන්නා වූ මැදිහත් වීම සහ එහි කාර්යභාරය සුවිශේෂ දායකත්වයක් ලබා දෙනවා.

අපි අපේක්ෂා කරනවා, අපේ රටේ අපනයන ක්ෂේත්‍රය 2030 පමණ වෙනකොට වේගයෙන් වැඩි දියුණු කරගන්න. පසුගිය වසරේ - 2025 වසරේ - අපේ රටේ අපනයන ආර්ථිකය තිබුණේ ඩොලර් බිලියන 17.6ක් වාගේ ගණනක්. ඒක අපේ රටේ ඉතිහාසයේ අපනයන ආර්ථිකය විසින් අත්පත් කරගත් උපරිම ජයග්‍රහණය විධියට සලකනු ලැබුවා. ඒත් එක්කම, විවිධ ප්‍රතිපත්ති තීන්දු, විවිධ සැලසුම්, විවිධ සහන සහ පහසුකම් සැලසීම තුළින් අපේ රටේ අපනයන ක්ෂේත්‍රය ඉහළ නැංවීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. මේ ක්‍රියාමාර්ග සියල්ල ඇතුළේ 2030 පමණ වනවිට අපේ රටේ ආර්ථික සංවර්ධනය ඩොලර් බිලියන 36කට පමණ ගෙන යන්නට අවශ්‍ය වටපිටාව, ඒ පරිසරය සකස් කරන්නට අවශ්‍ය කටයුතු තමයි මේ ගනිමින් තිබෙන්නේ. ඒ අනුව තමයි අද ඉදිරිපත් වන කාරණා අතර විශේෂයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පනවන නියම ඉදිරිපත් වෙන්නේත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා අපේ රටේ ආර්ථික ස්ථාවරභාවය ගැන. ආර්ථික ස්ථාවරභාවය ස්ථාපිත කිරීමේදී එය හුදු හුදෙකලා වෙච්ච කාරණාවක් නොවෙයි. ආර්ථික ස්ථාවරභාවය නිර්මාණය කිරීම සඳහා දේශපාලන ස්ථාවරභාවය ඉතා වැදගත් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලන ස්ථාවරභාවය කියන්නේ කිසියම් ආණ්ඩුවකට තුනෙන් දෙකක් ඉක්මවා ගිය බලයක් තිබෙන එක නොවෙයි. ඒක පමණක්ම නොවෙයි. එහෙම නම්? දේශපාලන ස්ථාවරභාවය නිර්මාණය වීම සඳහා සමාජ, ආර්ථික සහ මහා පුද්ගල එකතුවකින් සැදුම්ලත් අතිවිශාල වටපිටාවක් සහ වපසරියක් තිබිය යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අපේ ජනවරම ගැන කථා කළා. ඒ ජනවරමට අනුව මේ තිබෙන දේශපාලන සංස්කෘතිය වඩා ශිෂ්ට සම්පන්න වූ දේශපාලන සංස්කෘතියක් කරා

[ගරු රුවන් විජේවීර මහතා]

රැගෙන යන එක අපි කළ යුතුයි. ඒ සඳහා අවශ්‍ය ජවය සහ බලය තමයි ජනතාව විසින් අපට ලබා දුන්නේ. අපේ රටේ තිබිච්ච දේශපාලන සංස්කෘතිය මොන වාගේ එකක්ද?

අද වෙනකොට රටේ නිර්මාණය වෙලා තිබෙන තත්ත්වය ගැනත් මම යමක් කියන්න ඕනෑ. පෙරේදා ජීවිතක්ෂයට පත් වෙච්ච බන්ධනාගාර නිලධාරින්ගේ නිසල දේහවලට අවසන් ගෞරව දැක්වීම සඳහා අද උදෑසන ඒ ස්ථානයට අරගෙන ගියාම එතැනට ආපු ඒ මිය ගිය නිලධාරින්ගේ අම්මලා, බිරින්දෑවරු, දරුවෝ ඒ දේහ අසල අඬා වැළපෙන විධිය, ඒ දේහ අසල ඔවුන් රැඳී ඉන්න විධිය, ඔවුන්ගේ කඳුළු තුළින්, ඔවුන්ට දරා ගන්න බැරි වේදනාව තුළින් කුමක්ද කියා පාන්නේ? ඔවුන් මත මුදාහරින ලද කෲරත්වය කියාපාන්නේ කුමක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කියාපාන්නේ වෙන කිසිවක් නොවෙයි. ජනවරමට අනුව ආණ්ඩුවක් විධියට අපි අනුගමනය කරමින් තිබෙන ක්‍රියාමාර්ගවලට මතු වෙන ප්‍රති විරෝධතාවන් විසින් ඇති කරන ලද තත්ත්වයක් කියන එක අපි මේ වෙලාවේදි කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ගත්තොත්, අපි වෙනස් කළේ මොන වාගේ දේශපාලන සංස්කෘතියක්ද? අපි වෙනස් කරපු දේශපාලන සංස්කෘතිය අනුගමනය කරමින් මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරපු දේශපාලකයෝ හිටියා. මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන්ගෙන්, එතැනින් එහාට ගියාම අනීතික ව්‍යාපාර කරන ව්‍යාපාරිකයන්ගෙන්, ඊට අනුගතව හිටපු ප්‍රාදේශීය චණ්ඩින්ගෙන් සැදුම්ලත් දැවැන්ත දේශපාලන චෞර වළල්ලක් හිටියා. එහෙම චෞර වළල්ලක් විසින් පාලනය කරපු රටක්, දැඩි අශිෂ්ට වූ, අසභ්‍යත්වයෙන් යුත් දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරලා තිබුණා. අපි ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කරමින් තිබෙනවා. මේකට උදාහරණ කිහිපයක් මම කියන්නම්. ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්තුමාට පහර දුන් සනත් නිශාන්තගේ ඉඳලා, කප්පම් අරගෙන දැනට සිරගත වෙලා ඉන්න ගම්පහ සරණ ගුණවර්ධනගේ ඉඳලා සුදු ඇඳගෙන සුදු මල් වට්ටියක් අරගෙන පන්සල්වලට ගිහිල්ලා ඒවා බෞද්ධ සංස්කෘතියේ මුදුන් මල්කඩ විධියට පෙන්වන්න හදපු විජේදාස රාජපක්ෂලා සහ ඔවුන් වටා හිටපු ඔවුන්ගේ දරුවන් ඇතුළු සියලුදෙනා විසින් නිර්මාණය කරපු අශිෂ්ට දේශපාලන සංස්කෘතියක් තිබුණා. ඒ අශිෂ්ට දේශපාලන සංස්කෘතිය ශිෂ්ට දේශපාලන සංස්කෘතියක් කරා ගෙනයන්නට අවශ්‍ය කරන මැදිහත්වීම අපි කරනවා.

විශේෂයෙන්ම අපි ආණ්ඩුවක් විධියට "රටම එකට" ජාතික වැඩ පිළිවෙළ ආරම්භ කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය මාස 6 තුළ රුපියල් බිලියන 150කට වඩා වටිනා මත්ද්‍රව්‍ය - හෙරොයින් කිලෝ 2,000කට වඩා, අයිස් කිලෝ 2,500කට වඩා - අත්අඩංගුවට ගෙන තිබෙනවා. සමස්තයක් වශයෙන් ගත්තොත්, මත්ද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 5කට වඩා අත්අඩංගුවට ගෙන තිබෙනවා. දළ වශයෙන් ගණන් බැලුවොත්, ඒවායේ මුළු වටිනාකම රුපියල් බිලියන 150කට වැඩියි. විදේශයන්හි හිටපු මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෝ නැවත මේ රටට ගෙනැල්ලා තිබෙනවා. මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදිලා හිටපු godfathersලා 30කට වැඩි ගණනක් මේ රටට ගෙනැල්ලා තිබෙනවා. මේ වෙනකොට ඔවුන් රැඳවුම් බන්ධනාගාරවල ඉන්නවා. ඔවුන් අධිකරණ කටයුතු සඳහා එළියට එනකොට සහ ආපසු ඇතුළට යනකොට " අන්න මම අරයාට සල්ලි දුන්නා. අන්න අර හිටපු ඇමතිට දුන්නා. මෙන්න මෙයාට දුන්නා. මෙයාත් ගත්තා. අර පොලිස්පතිත් ගත්තා. අරයාත් ගත්තා" කියලා ඔවුන් කියනවා. එයින් කියාපාන්නේ කුමක්ද? එයින් කියාපාන්නේ වෙන කිසිවක් නොවෙයි, අති දරුණු, ඛේදනීය වූ දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරලා තිබුණා කියන එකයි. ඒ දේශපාලන සංස්කෘතිය අපි වෙනස් කරමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදේත් මේක කිව්වා. අපි දේශපාලනික වශයෙන් අත්පත් කරගත්ත දෙයක් නැහැ කියලායි මා කියන්නේ. ආර්ථිකය - economy එක - ගත්තොත්, ආර්ථිකය නිවැරදි තැනට අරන් ගිහිල්ලා නැහැ කියලා කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය ජූලි පළමුවැනි දා ලෝක බැංකුව මඟින් නිකුත් කළ වාර්තාවක් තිබෙනවා. එම වාර්තාවේ මෙසේ සඳහන් කරලා තිබෙනවා:

> "Sri Lanka has made significant progress in stabilizing its economy, and now it is critical to advance reforms that can unlock private investment, facilitate high value export and create jobs,"

ඒක කියන්නේ ලෝක බැංකුවේ අපේ රට පිළිබඳව කටයුතු කරන නිලධාරියා. ඔහු තමයි මේ කාරණාව කියන්නේ. So, economic stabilization has been done by this Government. This statement had been made not by us, but by those particular relevant and responsible officials. So, that is what it states.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකෙන් විතරක් නොවෙයි එම කාරණය ඔප්පු වන්නේ. මම තව කරුණු කිහිපයක් ඔබතුමාට කියන්න කැමැතියි. ගෙවුණු කාලය ගත්තොත්, පසුගිය වසර ගත්තොත්, අපි බලයට ඇවිල්ලා පෝය 18ක් ගත වෙලා තිබෙනවා කියලා කියනවා. ඔව්, පෝය 18ක් ඇතුළත මත්ද්‍රව්‍ය සම්බන්ධව, මත්ද්‍රව්‍ය ජාවාරම තුරන් කිරීම සම්බන්ධව දැවැන්ත පියවර ගණනාවක් රටක් විධියට, ආණ්ඩුවක් විධියට අරගෙන තිබෙනවා. Nobody would have taken those steps, but we have taken those steps towards the progress of the economy of this country as we are responsible for the people of this country.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය වසරේදි ලොව හොඳම වෛද්‍ය සංචාරක ගමනාන්ත 50 අතරට අපේ රට එක්වනවා කියලා එක අවස්ථාවක කියනවා. ඒ විතරක් නොවෙයි, "Big 7 Travel" විසින් ශ්‍රී ලංකාව ලෝකයේ හොඳම දූපත කියලා නම් කරනවා. ඒ වාගේම සඳහන් වෙනවා, "Sri Lanka named world's top trending wellness destination for 2026". ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. 2025 වර්ෂයේදී අපේ රට දූෂණ සංජානන දර්ශකයේ 121 ඉඳලා 107 දක්වා ස්ථාන 14කින් ඉදිරියට එනවා. ඒ, වෙන කිසිවක් නිසා නොවෙයි. දූෂණයට එරෙහිව දූෂණ විරෝධී ආණ්ඩුවක් විධියට අපි කරපු වැඩ පිළිවෙළ නිසායි.

ඒ විතරක් ද නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි 2026 ගෝලීය සාම දර්ශකයේ ස්ථාන 14ක් ඉදිරියට එමින් 67වැනි ස්ථානය දක්වා එනවා. දකුණු ආසියාවේ දෙවැනි සාමකාමීම රට බවට අපි පත් වෙනවා. There is not only economic stability, but also political stability and social stability and most of the achievements have been made by this Government.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මෙයයි. අපට මේ රට පිළිබඳව, මේ රටේ සිටින දරුවෝ පිළිබඳව, මේ රටේ ගොවියෝ, වෛද්‍යවරු ඇතුළු වැඩ කරන ජනතාව පිළිබඳව අදහසක් තිබෙනවා. ඒ නිසා මේ රට මතින් තොර, මත්ද්‍රව්‍යයෙන් තොර, ජාවාරම්කරුවන්ගෙන් තොර, චෞර වළල්ලක් විසින් පාලනය නොකරන රටක් බවට, ශිෂ්ට සම්පන්න පාලකයන් විසින් පාලනය කරන රටක් බවට පරිවර්තනය කරන්න අවශ්‍ය කරන මැදිහත් වීම අපි සියලු දෙනා කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Rauff Hakeem. The Floor is yours and you have eight minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. M.K.M. Aslam to the Chair?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

[අ.භා. 1.28]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විශේෂයෙන්ම ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ ගෙනෙන නියෝග, රේගු ආඥා පනත යටතේ වන යෝජනා සම්මතය, මෝටර් වාහන පනත යටතේ වන නියෝග සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ ගෙනෙන නියමයන් දෙකක් සාකච්ඡාවට බඳුන් කරනවා. මේ රටේ ආර්ථිකය තවත් දියුණු කිරීම සඳහා අවශ්‍ය වන මේ වාගේ නීති රීති ගෙන එන අවස්ථාවකදී මේ රටේ තිබෙන නීතියේ පාලනය පිළිබඳව, නීතිය හා සාමය රැකීම සම්බන්ධයෙන් එල්ල වෙලා තිබෙන අභියෝග පිළිබඳව, මේ රටේ සමස්ත නීතියේ ආධිපත්‍යය පිළිබඳව විශාල ප්‍රශ්නාර්ථයක් ගොඩ නැඟී තිබෙනවා, විශේෂයෙන්ම මේ බන්ධනාගාර සිද්ධියත් එක්ක.

බන්ධනාගාරවල ඇතුළේ සිදු වෙන මෙවැනි සිද්ධීන් රාශියක් අපි දැකලා තිබෙනවා. අවුරුදු කීපයකට කලින් වැලිකඩ බන්ධනාගාරයේ මෙවැනි සිද්ධියක් සිදු වුණා. ඒ වාගේම මහර බන්ධනාගාරයේත් සිදු වුණා. දැන් මීගමුව බන්ධනාගාරයේත් එවැනි සිදුවීමක් වෙලා තිබෙනවා. මෙවායේ පවතින තදබදය මෙයට කාරණාවක් හැටියට අපි ගත්තාට, මේ තුළ පවතින්නා වූ යම් සංස්කෘතීන්, විශේෂයෙන්ම රැඳවියන් අතරේ බලවත් අය තමන්ට වුවමනා පරිදි තමන්ට අවශ්‍ය ඉඩකඩ ලබා ගැනීම විතරක් නොවෙයි, අනෙකුත් රැඳවියන්ට හිරිහැර කරන තත්ත්වයන් ඕනෑ තරම් සිදු වෙනවා. ඒත් එක්කම බන්ධනාගාර නිලධාරින් අතරේ දූෂිත නිලධාරින් සිටින බවත් අපි කලින් දැකලා තිබෙනවා. නමුත්, මේ ශෝචනීය තත්ත්වය ඇති වීම පිළිබඳව අපේ කම්පනය පළ කළ යුතුයි. මෙවැනි සිදුවීමක් නැවත සිදු නොවීමට අපි වග බලා ගත යුතුයි.

නමුත්, ඒ අතරතුරදී අධ්‍යාත්මිකව ඒ රැඳවියන්ට තම තමන්ගේ ආගම් පිළිපැදීම සඳහා අවශ්‍ය වූ ඉඩකඩ හැම බන්ධනාගාරයක් තුළම ලබා දීලා තිබෙනවා. මෑතකදී මේ සම්බන්ධයෙන් නොයෙකුත් කැලඹීම් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මුස්ලිම් ජනතාවට තමන්ගේ දේව ඇදහීම් සඳහා ඉඩකඩ ලබා දීලා තිබෙනවා. වැලිකඩ බන්ධනාගාරයේ මෑතකදී සිදු වෙලා තිබුණු සිද්ධියක් මම කියන්නම්. එහි "L" Hall කියලා hall එකක් තිබෙනවා. ඒකේ විවිධ sections තිබෙනවා. විශේෂයෙන්ම "L" Hall එකේ ඉන්නේ suspects under appeal, ඒ කියන්නේ අභියාචනා කළ රැඳවියන්. ඔවුන් විශාල ගණනක් - දහස් ගණන් - ඉන්නවා. ඒ වාගේම C1, C3, B1, B2, B3 කියලා විශේෂ ශාලාවල් තිබෙනවා. ඒ "L" ශාලාවේ තුන්වැනි මහලේ බෝධි මලුවක් තිබෙනවා. එතැන බෞද්ධ ආගමේ ඇදහීම් කටයුතුවලට අවශ්‍ය ඉඩකඩ ලබා දීලා තිබෙනවා. දෙවැනි මහලේ church එකක් තිබෙනවා, ක්‍රිස්තියානි ආගම අදහන රැඳවියන්ට අවශ්‍ය වූ වැඩ කටයුතු කරගන්න. ඒ වාගේම පහළ මහලේ මුස්ලිම්වරුන්ට දේව නැමදීම් කරන්න ඉඩ ලබා දී තිබෙනවා. අපට මේ පාර්ලිමේන්තුවේත් කාමරයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාත් එතැනට එනවා, අපිත් යනවා. අපි පස් වේලක් වඳින අය. හැමදාම 30දෙනෙක්, 40දෙනෙක් විතර ඇවිල්ලා පස් වේලම වැඳුම් කටයුතු කරගෙන ඉන්න ඒ කාමරය දැන් වහලා දාලා තිබෙනවා.

එතැනට යන්න බැහැ. මේක හදිසියෙන් කරපු දෙයක්. මේ පිළිබඳව සොයා බලන්න ඕනෑ. මොකද මේවා අධ්‍යාත්මික කටයුතුවලට ලබා දීලා තිබෙන ඉඩකඩ. මේ වාගේ සිද්ධීන් වනකොට, අපි මේ වාගේ දේවල් ආරක්ෂා කර ගැනීමට සහාය ලබා දෙන්න ඕනෑ, තවත් රුකුලක් ලබා දෙන්න ඕනෑ. නමුත් එහෙම කරන්නේ නැහැ.

ඒ වාගේම මහර බන්ධනාගාරයේ තිබුණු පල්ලියත් සම්පූර්ණයෙන් ඉවත් කළා. මම මේ මෑතකදී දැක්කා, අපේ මරික්කාර් මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහද්දි අධිකරණ ඇමතිතුමා කොහේදෝ යන වැල්වටාරම් කථා කියනවා. අපටත් ඔය වාගේ දේවල් වෙලා තිබෙනවා. මමත් අධිකරණ ඇමති හැටියට ඉන්නකොට නිලධාරින් පිළිතුරු සහිත ලේඛන ලබා දෙනවා. බන්ධනාගාර නිලධාරින් හරි, අනෙක් නිලධාරින් හරි තමන්ට ලබා දෙන පිළිතුරු අපි කියවා බලන්න ඕනෑ. ඒකේ ඇත්ත නැත්ත සොයන්න ඕනෑ, මෙතැනට ඇවිල්ලා ගිරව් වාගේ ඒවා කියවන්නේ නැතිව. මහර පල්ලියට වෙලා තිබෙන දේ බලන්න. පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ - it is a racist attitude - වාර්ගික පදනමින් කටයුතු කරපු කිහිපදෙනෙක් එකතු වෙලා ඒ පල්ලිය සම්පූර්ණයෙන්ම වහලා දැම්මා. ඒක අවුරුදු සිය ගණනක් පැරණි පල්ලියක්. මලායි සොල්දාදුවන් සිටි කාලයේ ලබා දුන් පල්ලියක් ඒ සමූහයට නැති කළා. නැති කරලා ඒ බන්ධනාගාර නිලධාරින් දැන් ලෝකේ නැති කථා කියනවා. ඇමතිතුමා ඇවිත් ගිරවෙක් වාගේ ඒවා මෙතැන දොඩවනවා. ඒක නොවෙයි ඇත්ත. ඔය සම්පූර්ණයෙන් බොරු කථා, අනවශ්‍ය කථා. දැන් වෙනත් ආගමික කටයුතු සිදුවේගෙන යනවා, ඒ පල්ලිය තිබුණු තැන. ඒකයි වෙන්නේ. මුස්ලිම් ජනතාව දිගින් දිගටම ඉල්ලීම් කළත්, ඒක ලබා දෙන්නේ නැහැ.

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

දැන් මුනීර් මුලාෆර් මැතිතුමා ඒ සිද්ධියට මැදිහත් වෙලා ඒක වෙන ඉඩමකට අරගෙන යනවා කියනවා. මෙතැන ආරක්ෂාව මදි, එහෙම දෙන්න බැහැ කියනවා. අවුරුදු සිය ගණනක් තිබුණු පල්ලියක්, එතෙක් ආරක්ෂාවට කිසිම ප්‍රශ්නයක් නැතිව පැවතුණු පල්ලියක් සම්පූර්ණයෙන් වහලා දාලා වෙන තැනකට ගෙනියන්නේ මොකටද? ඒක ලබා දෙන්න කියලායි අපි ඉල්ලන්නේ. ඒ වාගේ සිද්ධි පිළිබඳව සොයා බැලිය යුතුයි. විශේෂයෙන්ම ඇමතිතුමා නිලධාරින් කියන කථා විතරක් මෙතැනට ඇවිත් දොඩවන්නේ නැතිව ඒ පිළිබඳව ඇත්ත සොයාගන්න ඕනෑ.

Sir, I see an important article by Kamanthi Wickramasinghe in the middle pages - a double-page article - of a newspaper today, particularly on the prison issue and the shortcomings in prisons. Several comments made have been reported in that and particularly those by Ambika Satkunanathan, former Commissioner of the Human Rights Commission, have brought to light very, very important - salient - issues, which must be discussed.

Justice Priyantha Fernando, recently retired Supreme Court Judge, had been appointed as Chairman of the Committee inquiring into the Negombo Prison incident. That Committee's probe should not be limited to this incident alone; it must look at the broader aspect of solving all the problems in the prison system. The entire criminal justice system needs to be revised and several other issues have to be discussed, particularly about the condemned prisoners and their life sentences because they have no right to get remission of their sentences. So, those people have been protesting all the time. It is a serious mental issue for the condemned prisoners. Therefore, that issue has to be discussed. Mr. Milinda Gunetilleke, former Additional Solicitor General of the Attorney-General's Department is also there in the Committee. The Committee, I think, should also consist of a retired Commissioner General of Prisons so that he would also be able to bring up issues relating to the Prisons Ordinance, the Police Ordinance and then everything would be looked at.

And, we have to bring in more reforms to resolve these problems, particularly which relate to those who cannot pay fines. Almost 60 per cent of the prisoners are either drug offenders or people who cannot pay fines. Those are very small fines that have to be paid. That is what you call punishing people who are in poverty and it is a very serious issue. So, as a humanitarian issue, the Government can create certain funds for, at least, those who cannot afford to pay the fines. Then, those who cannot pay the fines could be released with that very simple solution. Together with that, the drug offenders must be treated as patients. They could be provided with rehabilitation facilities to rehabilitate them from their addiction, not prisons. That is an important thing. So, several such issues will have to be addressed and all these problems will have to be solved.

In the meantime, this racist attitude in certain prisons, where Muslim prisoners have been prevented from using their prayer rooms for daily five-time prayers, must be dismissed and that practice should be restored immediately with action and the mosque in Mahara should also be restored to its original position. That position taken by the authorities of the Mahara Prison must be dismissed because that is a very racist attitude. That is an incident where this Government, as it always claims to be non-racist, should not believe what the officials tell you, but instead look at what really is happening on the ground and solve the problem for those people.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.38]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ අධිවේගී මාර්ග පද්ධතිය සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරන බව. දැන් ක්‍රමයෙන් මේ අධිවේගී මාර්ග පද්ධතිය පුළුල් වෙමින් ඊළඟ අවුරුද්දේත්, 2028 සහ 2029 කාලය ඇතුළතත් අතරමඟ නතර වෙලා තිබුණු ඉදිකිරීම් කටයුතු අවසන් වනවා. ඒ වාගේම අපේ රටේ මඟී ප්‍රවාහනයට යොදා ගන්නා පෞද්ගලික වාහන විශාල වශයෙන් වැඩි වෙමින් පවතිනවා. ඒ වාගේම විශාල පිරිසක් අධිවේගී මාර්ග පද්ධතිය දැනටත්, ඉදිරියේදීත් යොදාගන්නට නියමිතයි.

අපට දීර්ඝ කාලයක් තිස්සේ නිරීක්ෂණය වනවා, අපේ රටේ මාර්ග භාවිත කරන පදිකයන්, රියදුරන්, රථවාහන හිමිකරුවන් ආරක්ෂාව සම්බන්ධයෙන් දක්වන අවධානයේ විශාල මදි පාඩුවක් හෝ අඩුපාඩුවක් තිබෙනවා කියලා. මාර්ගවල තත්ත්වය සහ ආරක්ෂාව වැනි විවිධ හේතු ද ඒ සඳහා බලපා තිබෙනවා. මේ හේතුවෙන් වසරකට ජීවිත විශාල ප්‍රමාණයක් නැති වනවා. ඒ වාගේම අනතුරු විශාල ප්‍රමාණයක් සිද්ධ වනවා. දීර්ඝ කාලීනව ගත්තොත්, එය රටකට විශාල වශයෙන් සිද්ධ වන පාඩුවක්.

2025 වසර තුළ මාරක අනතුරු 2,583ක් පමණ සිදු වී තිබෙනවා. එම වසර තුළ සිදු වී තිබෙන සමස්ත අනතුරු සංඛ්‍යාව 22,153ක් පමණ වෙනවා. අධිවේගී මාර්ගවල විතරක් නොවෙයි, අනෙකුත් මාර්ගවලත් විවිධ පරිමාණයේ අනතුරු සිද්ධ වෙලා තිබෙනවා. අපි පසුගිය කාලයේ අධිවේගී මාර්ගවල ගමන් ගන්නා වාහනවල රියැදුරන්ට විතරක් නොවෙයි, මඟීන් සඳහාත් ආරක්ෂක ආසන පටි - seat belts - පැළඳීම අනිවාර්ය කළා. හැබැයි, එතැනදී ප්‍රායෝගික ගැටලු කිහිපයක් මතු වුණා. මොකද, පැරණි බස් රථ, වෑන් රථ සහ වෙනත් රථවල ආසන පටි ක්‍රියාත්මක වෙන්නේ නැහැ. විශේෂයෙන්ම පිටුපස ආසනවල ආසන පටි ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ වාගේම තමයි නිෂ්පාදකයා විසින් ආසන පටි සවි කර එවා නැති වාහනත් තිබෙනවා. සාමාන්‍යයෙන් මේ ආසන පටියක මිල ගත්තොත්, රුපියල් 2,000, රුපියල් 2,500 වාගේ ගණන්වලට තිබුණේ. හැබැයි, මේ නීතිය ආවත් එක්කම වෙළෙඳ පොළේ මේවායේ මිල ඉතා ඉහළට යනවා අපි දැක්කා.

මේ නීති හඳුන්වා දෙන්නේ එක පැත්තකින් අපේ ප්‍රවාහන පද්ධතිය ජාත්‍යන්තර ප්‍රමිතියට සරිලන ආකාරයෙන් සුරක්ෂිත කර ගන්නත්, අනෙක් පැත්තෙන් විවිධ අනතුරු නිසා අපේ රටේ මානව සම්පතට සහ දේපළවලට සිද්ධ වන හානිය අවම කර ගන්නත්, වළක්වා ගන්නත් තමයි. හැබැයි, අපි එම නීති හඳුන්වා දුන්නාට පසුව ප්‍රායෝගිකව සිද්ධ වුණේ මොකක්ද? අපි විවිධ වීඩියෝ පටවලත් ඒක දැක්කා. ඒ කියන්නේ නිසි පරිදි සවි කර නැති ආසන පටි පෙනෙන්න විතරක් දමාගෙන යන බවක් අපි දැක්කා. මේ තුළ යම් ආකාරයකින් ආකල්පමය ප්‍රශ්නයකුත් තිබෙනවා. ඇත්තටම අපි Clean Sri Lanka වැඩසටහන හරහාත් පාරිසරික, සමාජයීය සහ ආකල්පමය වශයෙන් වන පරිවර්තනයක් වෙනුවෙන් තමයි වැඩ කරන්නේ. මොකද, අපේ රටේ ඇතැම් කණ්ඩායම්, පුරවැසියන් නීතියෙන් බේරීම සඳහා පමණක් සමහර ක්‍රියාමාර්ග ගන්නා බව අපි දන්නවා. එහි ගැඹුර සහ අවශ්‍යතාව පැහැදිලි කරගන්නේ නැතුව යම් නීතියක් තිබෙනවා නම් එම නීතියෙන් ගැලවීම සඳහා පමණක් කටයුතු කරනවා. එහෙම නැත්නම් ඒ වෙනුවෙන් විතරක් වැඩ කරනවා. එහෙම ප්‍රශ්නයකුත් තිබෙනවා. ඒක නිසා නිසි ආකාරයෙන් ආකල්පමය වශයෙනුත් වෙනස්වීමක් කරගන්න ඕනෑ වෙලා තිබෙනවා. මේකේ අරමුණ සහ බරපතළකම අවබෝධ කර දෙන්නත් යම් කාලයක් ගත වෙනවා.

මෙහිදී ප්‍රායෝගිකව පවතින ගැටලු ගත්තොත්, මිල ගණන් සම්බන්ධ ප්‍රශ්න, පැරණි වාහනවලට නිෂ්පාදකයා විසින් ආසන පටි සවි කර නොතිබුණාම කොහොමද ආසන පටි සවි කර ගන්නේ කියන කාරණා සම්බන්ධයෙන් විවිධ පාර්ශ්ව අප සමඟ කථා කළා. එහෙම කථා කිරීමේ ප්‍රතිඵලයක් විධියට මේ වසරේ සැප්තැම්බර් 19 දක්වා සහන කාලය තවත් දීර්ඝ කර තිබෙනවා, විශේෂයෙන්ම අධිවේගී මාර්ගවල ධාවනය වන වාහන සඳහා. හැබැයි, අපේ ප්‍රවාහන ක්ෂේත්‍රය පිළිබඳව අපි දැන් වෙනත් විධියකට හිතමින් පවතින නිසා අපි මේ සම්බන්ධව පොදුවේ තමයි බලන්න ඕනෑ.

අපේ රටේ මාර්ග අනතුරු සිද්ධ වීමට විවිධ හේතු සාධක බලපානවා. ඒ කියන්නේ, ආසන පටි නොපැළඳීම කියන කාරණාව විතරක්ම නොවෙයි, මාර්ග අනතුරු සිද්ධ වෙන්න බලපාන්නේ. ඒ සඳහා බලපාන හේතු විශාල ප්‍රමාණයක් තිබෙනවා. පසුගිය කාලයේ වාර්තා වෙලා තිබෙන කාරණා ගත්තොත්, අනාරක්ෂිත ලෙස හෝ නුසුදුසු ලෙස වාහන ඉස්සර කිරීම නිසා අනතුරු විශාල ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා. එසේ වාහන ඉස්සර කිරීම අනතුරුවලට ප්‍රමුඛතම හේතුව වශයෙන් වසර කිහිපයක සිටම පවතිනවා. ඊළඟට, වාහන හැරවීමේදී සිදු වන අනතුරු තිබෙනවා. වාහන හරවන්න බැරි තැන්වල, හරවන්න හොඳ නැති තැන්වල සහ අපරීක්ෂාකාරී ලෙස වාහන හරවන්න යෑම නිසා සිදු වුණු අනතුරු තමයි ඊට පසුව තිබෙන්නේ. ඊළඟට, මාර්ග නීති උල්ලංඝනය කිරීම ගැන සඳහන් වෙනවා. ඒ වාගේම අන්තරායදායක ලෙස සහ නොසැලකිලිමත් ලෙස වාහන පැදවීම නිසාත් අනතුරු සිදු වෙනවා. එමෙන්ම අනවශ්‍ය වේගයකින් හෝ අනුමත වේගයට වඩා වැඩි වේගයකින් වාහන පැදවීම නිසාත් අනතුරු සිදු වෙනවා. ඒ වාගේම අපි දන්නවා, මාර්ග පද්ධතියේ ඉංජිනේරුමය හෝ තාක්ෂණික දෝෂ, එහෙම නැත්නම් නඩත්තුවේ ගැටලු තිබෙන්න පුළුවන් බව. මේ වාගේ විවිධ හේතු නිසාත් වාහන අනතුරු සිද්ධ වෙනවා. ඒ වාගේම කාලගුණික තත්ත්වය සහ ස්වාභාවික හේතු නිසාත් අනතුරු සිද්ධ වෙනවා. අධික වෙහෙස හෝ රියැදුරාට නින්ද යෑම, බීමත්ව රිය ධාවනය සහ වාහනවල තිබෙන යාන්ත්‍රික දෝෂ නිසාත් අනතුරු සිද්ධ වෙන්න පුළුවන්. එමෙන්ම පදිකයන්ගේ නොසැලකිල්ල සහ වෙනත් විවිධ කාරණාත් මාර්ගවල සිද්ධ වන අනතුරුවලට හේතු වෙලා තිබෙනවා, විශේෂයෙන්ම පසුගිය කාලය දෙස බැලුවාම. මේ හේතු නිසා අපට රටක් විධියට සිද්ධ වන පාඩුව ඉතාම වැඩියි. ඒ නිසා විශේෂයෙන්ම මාර්ගවල සිද්ධ වන අනතුරු මොන හේතු නිසාද සිද්ධ වෙන්නේ කියන කාරණය සම්බන්ධයෙන් අපි හොඳ අධ්‍යයනයක් සිදු කරන්න ඕනෑ. නීතිරීති ශක්තිමත් කරන ගමන්, අනතුරු සිදු වීමට බලපාන අර කියපු හේතු අවම කර ගැනීම සඳහා ඉදිකිරීම් සිදු කිරීමේදී පවා නැවත හිතා බලන්න ඕනෑ. ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයට අදාළ උපදේශක කාරක සභාවේදීත් මේ ගැන සාකච්ඡා කරලා, නීතිමය රාමු ශක්තිමත් කිරීම සඳහාත්, ඒ වාගේම වෙනස් කළ යුතු දේවල් මොනවාද කියලා අත්හදා බැලීම සහ උත්සාහ කිරීම සඳහාත් විවිධ අනුකමිටු පත් කරලා තිබුණා. පවතින තත්ත්ව යටතේ අපි ඉදිරියට අත්හදා බලන්න සූදානම් වෙනවා, මෝටර්සයිකල් සඳහා වෙනම මංතීරු සකස් කිරීම සඳහා පුළුවන් තැන් මොනවාද, ඒ සඳහා වෙන් කිරීමට කොහොම හරි ඉඩ ගන්න පුළුවන් තැන් තිබෙනවාද කියලා. ඒක අභියෝගාත්මක කාරණයක්. මොකද, අපිට පෙනෙනවා, මෝටර්සයිකල්වලින් සිදු වන අනතුරු ප්‍රමාණය වැඩි වෙලා තිබෙන බව.

2026 ජනවාරි මස 01වැනි දා සිට ජූනි මස 09වැනි දා දක්වා මාර්ග රිය අනතුරු 1,179ක් සිදු වෙලා, 1,240ක් ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා. ඒකෙන් වැඩි පිරිසක් පදිකයන් වෙනවා. ඊට අමතරව යතුරු පැදිකරුවන් 424ක්, මගීන් 115ක්, රියැදුරන් 107ක්, පාපැදිකරුවන් 84ක්, පසු පැදිකරුවන් 81ක් සහ වෙනත් පුද්ගලයන් 3ක් මේ අතර ඉන්නවා. ඒ අනුව වගකිව යුතු ආණ්ඩුවක් විධියට, රජයක් විධියට මේ තත්ත්වය වෙනස් කර ගැනීම කරන්න ඕනෑ කියන එක අපි මූලික වශයෙන් හිතන කාරණයක්. ඒ නිසා ප්‍රවාහන ක්ෂේත්‍රය වෙනස් කර ගන්නා විට පොදු ප්‍රවාහනයත් ආරක්ෂිතව වෙනස් කර ගැනීම අවශ්‍ය වෙනවා. ඒ නිසා ඉදිරි කාලයේදී ලංකාවට පොදු ප්‍රවාහනය සඳහා ගෙන්වන බස් රථවල specifications අපේ රටට, අනාගතයට ගැළපෙන විධියට වෙනස් කරලා තිබෙනවා.

ඒ වාගේම, roadworthiness ගැන අපි ඉදිරියට හිතනවා. ඒ සඳහා විවිධ අණපනත් සංශෝධනය කරන්න නියමිතයි. මොකද, මාර්ගයට වාහනයක් එකතු කරනවා නම් ඒ වාහනයේ ආරක්ෂාව සම්බන්ධයෙන් රියැදුරු විතරක් නොවෙයි, අයිතිකරුවාත් වගකිව යුතුයි කියලා අපි හිතනවා. ඒ නිසා අයිතිකරුවාටත් එහි වගකීමක් පැවරෙන විධියට නීතිරීති සම්පාදනය කිරීම සම්බන්ධයෙන් අපි ඉදිරියේදී සලකා බලනවා. ඒ වෙනුවෙන් විවිධ පාර්ශ්ව එක්ක මේ වෙනකොට සාකච්ඡා පවත්වමින් ඉන්නවා.

ඒ වාගේම රියැදුරු බලපත්‍රලාභීන්ට, එහෙම නැත්නම් රියැදුරන්ගේ බලපත්‍රවලට ලකුණු ක්‍රමයක් හඳුන්වා දීම සහ දිගින් දිගටම වැරැදි කරනවා නම් ඒ ලකුණු අඩු වෙලා ගිහිල්ලා යම් නිශ්චිත ක්‍රියාමාර්ගයක් ගැනීම දක්වා නියාමනයක් අවශ්‍ය වෙයි කියලා අපි හිතනවා. අධිවේගී මාර්ගවල ගමන් කරන වාහනවලට ආසන පටි පැළඳීම අනිවාර්යය කර තිබෙනවා වාගේම සියලු වාහන සඳහා ආසන පටි අනිවාර්ය කිරීම අපේ රටේ ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන්, සුරක්ෂිත ප්‍රවාහන සේවයක් වෙනුවෙන් ගත හැකි හොඳ ක්‍රියාමාර්ගයක් විධියට අපි දකිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.47]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද උදෑසන අපිට ප්‍රවෘත්තියක් අහන්න ලැබුණා, දැනට ගාල්ල මහමෝදර පිහිටි පැරැණි රෝහල් පරිශ්‍රය අතිවිශේෂ ගැසට් පත්‍රයකින් බන්ධනාගාරයක් ලෙස නම් කරන්න තීරණයක් ගත්තා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම එම කටයුත්ත කරන්නේ මේ මොහොතේ පවතින ගැටලුවට තාවකාලික විසඳුමක් ලෙස නම් ඒකට අපිට එකඟ වෙන්න පුළුවන්. නමුත්, මහමෝදර පැරැණි රෝහල කියන්නේ, ගාල්ල නගරයේ තිබෙන අතිශයින්ම වාණිජ වටිනාකමක් තිබෙන, අපේ ආණ්ඩුව වාගේම වත්මන් ආණ්ඩුව ක්‍රියාත්මක කරන නගර සැලස්ම තුළ විවිධ යෝජනා ඉදිරිපත් කරපු, විවිධ යෝජනා ක්‍රියාත්මක කරන්න තිබෙන ඉතාම වැදගත් ස්ථානයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මහමෝදර පැරැණි රෝහල කියන්නේ, ආරක්ෂාව අතිනුත් ඉතාම අභියෝගාත්මක තැනක්. ඒ ස්ථානයේ සිට මීටර් 20යි, 30යි මුහුදට තිබෙන්නේ. ඒ වාගේම, එය ගාල්ල-කොළඹ ප්‍රධාන මාර්ගය ආසන්නයේ තිබෙන්නේ. පසුගිය දවසේ මීගමුවේදී සිදු වෙච්ච ඉතාම ඛේදනීය තත්ත්වය වැනි තත්ත්වයකට මුහුණ දෙන්න රජයකට, එහෙම නැත්නම් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ඉතාම අභියෝගාත්මක තැනක තමයි ඒ භූමිය පිහිටලා තිබෙන්නේ. ඒ නිසා අපි මේ අවස්ථාවේදී රජයට යෝජනාවක් කරනවා.

මම නැවතත් කියන්න ඕනෑ, ගාල්ල මහමෝදර පැරැණි රෝහල අතිවිශේෂ ගැසට් පත්‍රයකින් බන්ධනාගාරයක් විධියට නම් කරන්න අද කටයුතු කර තිබෙනවාය කියන එක. දැනට ගාල්ලේ තිබෙන බන්ධනාගාරයත් වෙනත් ස්ථානයකට ගෙනියන්න යෝජනා වෙච්ච වෙලාවක තමයි ගාල්ලට අලුතින් බන්ධනාගාරයක් ඉදි කරන්න යෝජනා කරලා තිබෙන්නේ. එම නිසා ඒ සම්බන්ධයෙන් අපේ විරෝධය මේ මොහොතේ ප්‍රකාශ කරනවා. මේක දැන් මේ ඇති වී තිබෙන තත්ත්වය සමනය කර ගැනීම වෙනුවෙන් ගත් තාවකාලික පියවරක් නම්, ඒක ගැටලුවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මීගමුව බන්ධනාගාරයේ ඒ ගැටලුව පිළිබඳව කථා කරනකොට එහි රෝගීන් පිළිබඳව කථා වුණා, රෝගීන්ට බෙහෙත් ලබා ගැනීම පිළිබඳව කථා වුණා. අද ගාල්ලේ තිබෙන බන්ධනාගාරය තුළත් මාස ගණනක සිට මේ වනතෙක් වෛද්‍යවරයෙක් නැහැ. ඒ නිසා අපි ආණ්ඩුවට මතක් කරනවා, අපි ආණ්ඩුවෙන් මේ මොහොතේ ඉල්ලා සිටිනවා, අනාගතයේදී යම් ගැටලුවක් මතු වෙන්න පෙර ඒ කාරණයත් විසඳා දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව තුළ තිබෙන ගැටලුවකුත් මතු කරන්න කැමැතියි. විශේෂයෙන්ම 2022දී අපේ ආණ්ඩුව තිබෙන කාලයේ, අපේ ප්‍රාදේශීය සභාව තිබෙන කාලයේ ආර්ථික වශයෙන් ඉතා අපහසු කාලයක ඉඩම් හොයාගෙන බෝපේ-පෝද්දල ප්‍රදේශයට දැඩි අවශ්‍යතාවක් වෙච්ච ආදාහනාගාරයක් ඉදිකිරීමේ කටයුතු අපි සිදු කළා. ඒ කටයුත්ත අපේ ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කාලයේ අවසන් කර තිබුණත්, ඔබතුමන්ලාගේ වත්මන් ප්‍රාදේශීය සභාව බලයට පත් වෙලා අදට වසරකට වැඩි කාලයක් ගත වෙලා තිබියදීත්, ඒ බෝපේ- පෝද්දල ආදාහනාගාරය විවෘත කර ගන්න මේ ආණ්ඩුවට, බෝපේ - පෝද්දල ප්‍රාදේශීය සභාවට තවම බැරිවෙලා තිබෙනවා. මේවා මහජන මුදල් වියදම් කර හදා තිබෙන්නේ. නමුත්, ඒ කටයුත්ත අවසන් කර තිබියදීත් වසර ගණනක් තිස්සේ බෝපේ- පෝද්දල ජනතාවට දැඩි අවශ්‍යතාවක්ව තිබෙන ඒ ආදාහනාගාරය විවෘත කරන්න මේ ආණ්ඩුවට තවම බැරිවෙලා තිබෙනවා. ඒ නිසා අපි පළාත් පාලන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරලා බෝපේ - පෝද්දල ප්‍රාදේශීය සභාවේ තිබෙන මේ ගැටලුව විසඳන්න කියලා. මොන ආණ්ඩුවකින් මේ ආදාහනාගාරය හැදුවත්, එය විවෘත කිරීමේ කටයුත්ත ඔබේ ආණ්ඩුව විසින් කරන්න කියලා මේ මොහොතේ ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, මේ මොහොත වන විට ඩෙංගු රෝගය වසංගත තත්ත්වයක් බවට පත් වෙලා තිබෙන බව අපි කවුරුත් දන්නවා. අද සෞඛ්‍ය කාර්ය මණ්ඩල එය මැඩලීම වෙනුවෙන් ඉතාම විශිෂ්ට කාර්යභාරයක් ඉටු කරමින් ඉන්නවා. හැබැයි, අද මේ ඩෙංගු වසංගතය මැඩලන්න ආණ්ඩුව පැත්තෙන් සිදු කරන කාර්යභාරය පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න බැහැ. ලෝකය පුරා ව්‍යාප්ත වෙච්ච කොවිඩ්-19 වසංගතය අපේ රට තුළ පැතිරී ගිය වෙලාවේදී ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා කොවිඩ්-19 වසංගතය පාලනය කරන්න කටයුතු කළ ආකාරය අපට මතකයි. ලෝකයේ මේ වසංගතය පාලනය කරපු රටවල් අතරින් ඉදිරියෙන්ම සිටින රටක් බවට අපේ රට පත් කරන්න එදා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කටයුතු කළා. හැබැයි, අද මේ ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා අධි වසංගතයක් බවට පත් වෙලා තිබෙන මේ ඩෙංගු වසංගතයවත් මර්දනය කරන්න. මේ ඩෙංගු වසංගතය මර්දනය කරන්න බැරිවීමට හේතුව මොකක්ද? අද රට තුළ තිබෙන ප්‍රාදේශීය සභාවල, නගර සභාවල කැළි කසළ එකතු කිරීමේ කටයුතු පිළිබඳ ගැටලුවක් නිර්මාණය වෙලා තිබෙනවා. අද ගාල්ල දිස්ත්‍රික්කයේ හැම තැනම කැළි කසළ එකතු වෙලා තිබෙනවා. ඒ කැළි කසළ නිවැරදිව, ක්‍රමානුකූලව ඉවත් කිරීමේ වැඩ පිළිවෙළක් අද ඔබතුමන්ලාගේ පළාත් පාලන ආයතනවලින් ඉටු කරන්නේ නැහැ. ඒකට ඔවුන් කල් මරමින් ඉන්නවා. ඒ කල් මැරීමත් අද මේ ඩෙංගු වසංගතය වැඩි වෙන්න හේතුවෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ Clean Sri Lanka වැඩසටහන අද අසාර්ථක වෙලා තිබෙනවා. ඒ Clean Sri Lanka වැඩසටහනේ එක් අංගයක් තමයි පරිසරය පිරිසිදු කිරීම. හැබැයි, ඔබතුමන්ලාගේ ප්‍රධානතම වැඩසටහනක් වන ඒ වැඩසටහන අද අසාර්ථක වෙලා තිබෙනවා කියන කාරණය මේ මොහොතේදී මම සිහිපත් කරන්න ඕනෑ. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් මෙන්න මේකත් ඉල්ලා සිටිනවා. කැළි කසළ ප්‍රශ්නය සම්බන්ධයෙන් හැමදාම රැස්වීම් තියලා, කමිටු හදලා, අනුකමිටු හදලා කථා විතරක් පවත්වන්න එපා. මේවාට විසඳුම් ගේන්න කියන කාරණයත් අපි මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න තිබෙන්නේ තව ඉතා සීමිත කාලයක් බැවින් මම මේ කාරණයත් අවසාන වශයෙන් මතු කරන්න කැමැතියි. අද මේ රටේ අපි හැමෝම නඩු ගැන කථා කරනවා; විශේෂ අධිකරණ ගැන කථා කරනවා. අධිකරණ තුළ සිදු වන කටයුතු පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී ඇති තරම් අපි විවාද කළා. අද විනිශ්චයකාරවරු පත් කර ගැනීම පිළිබඳව, සිටින විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ කර ගැනීම පිළිබඳව විශාල මතිමතාන්තර, වාද විවාද මේ පාර්ලිමේන්තුවේදී ඇති වුණා. ඒ වාගේම, ඔබතුමන්ලාගේ ආණ්ඩුව අද විශේෂ අධිකරණ පිහිටුවලා දවසින් දවස නඩු අහනවා. ඒ නඩු ඇහුවාට කමක් නැහැ. ඒක කෙරෙන්න ඕනෑ දෙයක්. ඒක ඉතාම හොඳ දෙයක්. දවසින් දවස නඩු අහලා අපි ඒ නඩු අවසන් කරන්න ඕනෑ. හැබැයි, ප්‍රශ්නය මේකද? අද මේ රටේ දැවැන්ත ප්‍රශ්නයක් තිබෙනවා. අද වන විට ග්‍රාමීය ජනතාව ඇතුළු අපේ රටේ ජනතාව මේ නඩු කටයුතුවල හිර වෙච්ච ගතියක් අපට දැනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර අවස්ථාවලදී ඉඩම් නඩුවලට පැටලිච්ච කෙනෙක් පරම්පරා ගණනක් නඩු

කියන තැනට පත්වෙලා තිබෙනවා. ඒක ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ගැටලුවක් නොවෙයි. ඒක මේ අධිකරණ පද්ධතිය තුළ ඉතාම දැවැන්ත ගැටලුවක් බවට පත් වෙච්ච කාරණයක්. අද සමහර වෙලාවට තමන්ගේ සීයා, තාත්තා, පුතා ආදී වශයෙන් පරම්පරා ගණනක් නඩු කියන තැනට අපේ රටේ අධිකරණ පද්ධතියේ තිබෙන සමහර නඩු පත්වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඉඩම් නඩු ඇතුළු සමහර නඩු අද ඒ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව විශේෂ අධිකරණ පිහිටුවලා නඩු අහනවා වාගේම අතේ සල්ලි නැතිව ඉඩම් නඩුවල පැටලිලා ඉන්න ග්‍රාමීය ජනතාව, පහළ මට්ටමේ ජනතාව, මධ්‍යම පාන්තික ජනතාව වෙනුවෙනුත් යම් ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිමින් මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු පී. රුවන් සෙනරත් මහතා**
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමා කැළි කසළ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු කළා, ඒ වැඩ පිළිවෙළ අසාර්ථකයි කියලා. ඒකට පිළිතුරක් දෙන්න ඕනෑ. මම හිතන විධියට, ගොඩක් කැළි කසළ ඉවත් කරන්න සැලසුම් හදලා තිබෙනවා. ඒවාත් ඉවත් කරන අතරේ, පරිසරයට නිකුත් කර තිබෙන කැළි කසළ ඉවත් කිරීමට අදාළ කරන මූලික මැදිහත්වීම කරමින් තිබෙනවා, සාකච්ඡා කරමින් තිබෙනවා. ඒකට අදාළව අපි තුන් අවුරුදු සැලැස්මක් සකස් කරලා තිබෙනවා. ඒ අනුව දැනට ක්‍රියාත්මක වෙමින් සිටිනවා. ඒ නිසා කවුරුවත් ගැටලුවක් ඇති කරගන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා උදව් කරන්න. කැළි කසළ ඉවත් කිරීමට අවශ්‍ය කරන මැදිහත්වීම අපි සිදුකරමින් තිබෙනවා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තත්පර 30ක් ලබා දෙන්නම්.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මම ඒ කාරණය මතු කළේ ඔබතුමාව අපහසුතාවකට පත් කරන්න නොවෙයි. පසුගිය දවසක අපි දැක්කා, ගාල්ලේ එකතුවෙලා තිබුණු කුණු, රාත්‍රී 12ට ගාල්ලේ ළමා උද්‍යානයේ වළ දමන්න කටයුතු කළ ආකාරය. එහෙම වළ දමන්න සිදුවුණේ ඔබතුමන්ලාට ඒ සම්බන්ධයෙන් යම් වැඩ පිළිවෙළක් නැති නිසායි. ගාල්ලේ එකතු වෙලා තිබුණු කුණු මීට සති දෙකකට පෙර ගාල්ලේ සමනල ළමා උද්‍යානයේ වළ දමන්න කටයුතු කළා. ඒ නිසා තමයි මම ඒ ගැටලුව මතු කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ முஹம்மட் பைசல் அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் உண்டு.

[பி.ப. 1.56]

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் மற்றும் சுங்கக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானம் தொடர்பான விவாதத்தில் எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி!

இன்று இந்தச் சபையில் விவாதிக்கப்படுகின்ற விடயங்கள் எமது நாட்டுக்கு மிக முக்கியமானவை. குறிப்பாக, எமது நாட்டின் பொருளாதாரத்துக்கும் மக்களின் பாதுகாப்புக்கும் மிக முக்கியமானவை. ஏற்கெனவே இருந்த அதிவேக நெடுஞ்சாலை சார்ந்த ஒழுங்குவிதிகள் - highway regulations - மாற்றியமைக் கப்பட்டுள்ளன. அதாவது, மக்களின் பாதுகாப்பைக் கருத்திற் கொண்டு போக்குவரத்து முறைமையை சரியான முறையில் ஒழுங்குபடுத்துவதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டுள்ளன. குறிப்பாக, அதிவேக நெடுஞ்சாலையில் செல்லக்கூடிய வாகனங்கள், செல்ல முடியாத வாகனங்கள், வேகக் கட்டுப்பாடு என்பன குறித்து குறிப்பிடப்பட்டுள்ளது. "L" board இருக்கின்றவர்களும் learner's permit உடையவர்களும் அதிவேகப் பாதையில் செல்ல முடியாதிருக்கின்ற நிலையிலும், அதிவேக நெடுஞ்சாலையில் பயணிக்க முடியுமான அதிகூடிய வேகம் 100 கிலோமீற்றரென வரையறுக்கப்பட்டுள்ளது. எல்லா வாகனங்களும் அதிவேக நெடுஞ்சாலையில் பயணிக்க முடியாது. குறிப்பாக, மூன்று சக்கர வாகனங்கள் செல்ல தடைசெய்யப்பட்டுள்ளது. மேலும், பயணிகளின் பாதுகாப்பு அதிகரிக்கப்பட்டுள்ளது. ஆசனப்பட்டிகளை அணியாத நிலையில், வாகனங்கள் வேகமாகச் செல்லும்போது அனர்த்தங்கள் ஏற்பட்டால் உயிரிழப்புகள் ஏற்படுவதற்கு வாய்ப்பு உண்டு. எனவே, ஆசனப்பட்டிகளை அணிவதற்கான ஏற்பாடுகளும் செய்யப்பட்டுள்ளன. வாகனங்களில் முன் ஆசனங்களிலுள்ள ஆசனப்பட்டிகளும் பின் ஆசனங்களிலுள்ள ஆசனப்பட்டிகளும் சரியான முறையில் இருக்கின்றதா என்பது பார்க்கப்பட வேண்டும். அவற்றைச் சரி செய்வதற்கு மூன்று மாத கால அவகாசம் கொடுக்கப்பட்டுள்ளது. விபத்துகளின் போது உயிரிழப்புகள் ஏற்படாத வகையிலேயே இந்த பாதுகாப்பு ஏற்பாடுகள் செய்யப்பட்டுள்ளன.

சுங்க வரி மறுசீரமைப்பானது எமது நாட்டின் பொருளாதார தத்துவத்தையும் உற்பத்தி முன்னுரிமைகளையும் வர்த்தகக் கொள்கைகளையும் நிதி ஒழுங்கையும் பிரதிபலிக்கக் கூடிய முக்கியமானதொரு திட்டமாக அமைகின்றது. இதை ஒரு திட்டமாக அல்லாமல், கட்டாயமாகச் செய்ய வேண்டிய அடிப்படையில் இருக்கின்றோம். இதனைச் செய்வதன்மூலம் உள்நாட்டு உற்பத்தியாளர்களை வலுப்படுத்தலாம். தற்போது உள்நாட்டு உற்பத்தி குறைவாக இருப்பதனால், வெளிநாட்டி லிருந்து பொருட்கள் இறக்குமதி செய்யப்படுகின்றன. இதனால் உள்நாட்டு உற்பத்தியாளர்கள் பின்னடைந்து வருகின்றனர். அதுமாத்திரமன்றி, இதன்மூலம் அரசின்

[ගරු මුහම්මද් ෆයිසාල් මහතා]

வருவாயும் அதிகரிக்கும். அரசினால் மேற்கொள்ளப்படுகின்ற செலவுகள் இருக்கின்றன. குறிப்பாக, சுகாதாரம், கல்வி, சமூக பாதுகாப்புக்காக எமது அரசாங்கம் அதிகமாகச் செலவு செய்கின்றது. ஏற்றுமதியை மையப்படுத்திய பொருளாதார முறைமையை ஏற்படுத்துவதற்கும், நாட்டின் பொருளாதாரத்தை முன்னேற்றமடையச் செய்வதற்கும் மக்களின் பாதுகாப்பை உறுதிப்படுத்துவதற்கும் இவ்வாறான மறுசீரமைப்புகள் செய்யப்படுகின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று அதிகமாகப் பேசப்படுகின்ற விடயம்தான் சிறைச்சாலையில் நடக்கின்ற பிரச்சினைகள்! இது தற்போது மாத்திரம் நடைபெறுகின்ற விடயமல்ல. வெலிக்கடை சிறைச்சாலையில் இவ்வாறான இரண்டு பிரச்சினைகள் நடைபெற்றிருக்கின்றன. 1983இல் ஜே.ஆர். ஜயவர்தன அவர்கள் சனாதிபதியாக இருந்தபோது இவ்வாறானதொரு பிரச்சினை ஏற்பட்டுள்ளது. அதேபோல், 2012ஆம் ஆண்டு மஹிந்த ராஜபக்ஷ அவர்கள் சனாதிபதியாக இருந்தபோதும் இவ்வாறானதொரு பிரச்சினை ஏற்பட்டுள்ளது. மேலும், 2000ஆம் ஆண்டு சந்திரிக்கா பண்டாரநாயக்க குமாரதுங்க அவர்கள் சனாதிபதியாக இருந்த போது, பிந்துனுவெவ சிறைச்சாலையிலும் இவ்வாறானதொரு பிரச்சினை நடைபெற்றது.

அதேபோல், 2020இல் கோட்டாபய ராஜபக்ஷ அவர்கள் சனாதிபதியாக இருந்த காலத்தில் மஹர சிறைச்சாலையில் பிரச்சினைகள் ஏற்பட்டன. இவ்வாறான பிரச்சினைகள் தொடர்ந்து நடைபெற்று வருகின்றன. இதற்கு முன்னர் நடைபெற்ற பிரச்சினைகள் அங்குள்ள கைதிகளுக்கு இடையில் இடம்பெற்றாலும், அவற்றில் ஏதோ அரசியல் நோக்கம் இருந்திருக்கின்றன. அரசியல் நோக்கங்களுக்காகவே அன்றி, இதற்கு முன்னர் இவ்வாறான பிரச்சினைகள் ஏற்படவில்லை. அரசியல் நோக்கங்களை, இனரீதியான பிரச்சினைகளை ஒட்டித்தான் கடந்த காலங்களில் சிறைச்சாலைகளில் பிரச்சினைகள் நடைபெற்று இருக்கின்றன. எது எவ்வாறு இருந்தபோதிலும், அண்மையில் நீர்கொழும்பு சிறைச்சாலை யில் ஏற்பட்ட அமைதியின்மையின்போது உயிரிழந்த கைதிகளின் உறவினர்களுக்கு எனது ஆழ்ந்த அனுதாபத்தை தெரிவித்துக்கொள்கின்றேன். அதேபோல், உயிரிழந்த சிறைச்சாலை உத்தியோகத்தர்களின் உறவினர்களுக்கும் எனது ஆழ்ந்த அனுதாபத்தை தெரிவித்துக்கொள்கின்றேன். குறித்த சிறைச்சாலையில் நடைபெற்ற அசம்பாவிதம் அரசியல் நோக்கம் கொண்டதும் அல்ல; இனரீதியான பிரச்சினையும் அல்ல. மாறாக, போதைப்பொருள் காரணமாக ஏற்பட்டது. ஏனெனில், இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கம் நாடு பூராவும் போதைப்பொருளை அழித்தொழித்துக்கொண்டு இருக்கின்றது. இதனால் வெளியில் போதைப்பொருள் இல்லாமல் இருக்கின்றது. குறித்த சிறைச்சாலையில் இடம்பெற்ற அசம்பாவிதத்தை கட்டுப்பாட்டுக்குள் கொண்டு வருவதற்கான ஏற்பாடுகளை எமது அரசாங்கம் உடனே செய்திருந்தது. இவ்வாறான பிரச்சினைகள் எவ்வாறு, எதற்காக நடைபெறுகின்றன என்பதை இந்த நாட்டிலுள்ள மக்கள் அறிவார்கள்.

கொரோனா தொற்றைத் தொடர்ந்து ஏற்பட்ட பொருளாதார நெருக்கடி காலத்தில்கூட நிறைய பிரச்சினைகள் ஏற்பட்டன. அப்போது எரிபொருளுக்கான வரிசைகூட இருந்தது. அதில் நின்ற பலர் உயிரிழந்தார்கள். அவர்கள் தொடர்பில் எந்தவித கவனமும் செலுத்தப்படாமல் இருந்தது. சிறைச்சாலைகளில் நடைபெற்ற உயிரிழப்புகள் தொடர்பில் விசாரணை செய்ய குழுக்களை நியமித்தார்கள். அந்தக் குழுக்களின் தீர்மானங்கள் என்னவென்றுகூட அறிய முடியாமல் இருக்கின்றது. இன்று எங்களுக்கிடையில் நிறையப் பிரச்சினைகளை ஏற்படுத்துகின்றார்கள். கடந்த காலங்களில் உலகில் ஏற்பட்ட யுத்த நிலைமை காரணமாக எரிபொருள் பிரச்சினை வருமென்று எதிர்க்கட்சியைச் சார்ந்தவர்கள் வரிசைகளை அதிகரித்தார்கள். அதில் நின்ற மக்கள் கூறியதென்ன? உலகில் ஏற்பட்டுள்ள யுத்த சூழ்நிலையால்தான் இந்த நிலைமை ஏற்பட்டிருப்பதாகவும் அரசாங்கம் சிறந்த முறையில் செயற்பட்டுக்கொண்டு இருப்பதாகவும் அரசாங்கத்தில் எந்தப் பிரச்சினையும் இல்லையெனவும் சொன்னார்கள்.

புத்தளம் மாவட்டத்தில் குறிப்பாக புத்தளம் தொகுதியில் சுற்றுலாத்துறை சார்ந்த அதிகமான பகுதிகள் இருக்கின்றன. குறிப்பாக, கற்பிட்டி, வனாத்தவில்லு, களப்புப் பகுதிகளில் சுற்றுலாத்துறையை மேம்படுத்தலாம். கற்பிட்டியிலிருந்து புத்தளத்துக்கு மக்கள் வருவதென்றால், 50 கிலோமீற்றர் தூரம் பயணம் செய்ய வேண்டும். குறிப்பாக, விவசாயிகளும் பரீட்சைக்குச் செல்லும் மாணவர்களும் அலுவலகங்களுக்குச் செல்லும் அரச ஊழியர்களும் அதிக தூரம் பயணிக்க வேண்டும். கற்பிட்டிக்கும் புத்தளத்துக்கும் இடையிலான பாலத்தை அமைப்பதன்மூலம் பயணிக்க வேண்டிய தூரத்தைக் குறைக்கலாம். சில நேரம் அதிக மழை பெய்தால் வெள்ளப்பெருக்கு ஏற்படும். கற்பிட்டியிலிருந்து பாலாவி ஊடாக தில்லையடியால் வரும்போது, தில்லையடியில் அதிகமான நீரோட்டம் இருந்தால், சில நேரங்களில் நோயாளிகளை, கர்ப்பிணித்தாய்மாரை புத்தளம் வைத்தியசாலைக்குக் கொண்டுசெல்வது சிரமமாக இருக்கும். ஏனெனில், வெள்ளப்பெருக்கால் வாகனங்களும் பழுதடையக்கூடிய சந்தர்ப்பங்கள் இருக்கின்றன. இவ்வாறான அனர்த்தங்கள் ஏற்படும்போது, பாடசாலை மாணவர்களும் அரச உத்தியோகத்தர்களும் சிரமங்களை எதிர்கொள்வதுடன், அவசர நோயாளர்களைக் கொண்டுசெல்வதிலும் சிக்கல்கள் ஏற்படுகின்றன. புத்தளம் - நுரைச்சோலை பாலத்தை அமைப்பதன்மூலம் இவ்வாறான பிரச்சினைகளைத் தீர்க்க முடியும். அதுமாத்திரமன்றி, விவசாயிகளும் தங்களது உற்பத்திப் பொருட்களை புத்தளம் நகருக்குக் கொண்டுசெல்வதற்கு இலகுவாக இருக்கும். கற்பிட்டி - முகத்துவாரம் பாலத்தையும், கற்பிட்டி - கரைத்தீவு பாலத்தையும் அமைப்பதற்கான வேலைகள் ஆரம்பிக்கப்பட இருக்கின்றன. *இன்ஷா அல்லாஹ்!* எதிர்வரும் காலங்களில் புத்தளம் - மன்னாருக்கான பாதையையும் அபிவிருத்தி செய்வதற்கான ஏற்பாடுகள் இருக்கின்றன.

அடுத்து, முக்கியமானதொரு விடயத்தைச் சொல்ல வேண்டும். கற்பிட்டியில் 5 மாடிக் கட்டிடமொன்று கட்டப்பட்டு இரண்டு வருட காலமாக திறக்கப்படாமல் இருக்கின்றது. *இன்ஷா அல்லாஹ்!* எதிர்வரும் கிழமைகளில் அதையும் திறப்பதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டு இருக்கின்றன. புழுதிவயல் வைத்தியசாலையில் ward systemஉம் மகப்பேற்று விடுதியும் கட்டப்பட்டிருக்கின்றன. அவற்றையும் திறந்து வைப்பதற்கான ஏற்பாடுகளைச் செய்திருக்கின்றோம். அதுமட்டுமல்ல, புத்தளத்திலுள்ள ஆயுர்வேத வைத்தியசாலையை மாவட்ட வைத்தியசாலையாகத் தரமுயர்த்துவதற்கான ஏற்பாடுகளும் செய்யப்பட்டு இருக்கின்றன. நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.06]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික බංකොලොත්භාවයකට පත් වෙලා තිබුණු අපේ රට දැවැන්ත ආර්ථික පරිවර්තනයක් කරා ගමන් කරමින් සිටින මොහොතක වර්තමාන රජය දැවැන්ත පියවරක් ගෙන තිබෙනවා, නව තීරු බදු ප්‍රතිපත්ති හඳුන්වා දීම සඳහා. රටක් විධියට ගත්තාම, මේ දශක කීපය තුළ ලංකාවේ ආර්ථිකයේ දැවැන්තම වෙනස්කම සිදු වන්නේ මේ කාල වකවානුවේදීයි. මම විශ්වාස කරනවා, මේ පිළිබඳව මීට වඩා පුළුල් සාකච්ඡාවක්, කතිකාවක් රට තුළ ඇති වෙන්න ඕනෑ කියලා. විපක්ෂය හැමදාම සිල්ලර මාතෘකා ගෙනැල්ලා, දිනෙන් දින සිදු වන කාරණා ගෙනැල්ලා මෙතැන කෑ කෝ ගැහුවාට, රටේ සිදු වන මේ සමස්ත පරිවර්තනය ගැන කරන මේ සාකච්ඡාවට ඵලදායිව දායක වන්නේ නැහැ. එක්කෝ, එතුමන්ලාට ඒ ගැන අවබෝධයක් නැහැ. එහෙම නැත්නම් මෙච්චර කාලයක් ඒක නොකරපු වේදනාවට ඒ ගැන කථා කරන්නේ නැහැ.

මේ ආර්ථික පරිවර්තනය සිදු වන්නේ, ලංකාවේ විතරක් නොවෙයි. අද වේගයෙන් සංවර්ධනය වන රටවල් 1980, 1990, 2000 වර්ෂවල සිටම මේ කියන වෙනස්කම් ඇති කරගෙන තිබෙනවා. ඕස්ට්‍රේලියාව, නවසීලන්තය ආදි රටවල් 1980 ගණන්වලදී, ඉන්දියාව 1990දී, වියට්නාමය ආදි රාජ්‍යයන් 2000 මුල් කාලයේදී, දකුණු කොරියාව ආදි රටවල් 1990දී සිදු කළ වෙනස්කම තමයි තීරු බදු ප්‍රතිපත්ති වෙනස් කරලා ලෝකයට අපනයනය කිරීම සඳහා තමන්ගේ රට සූදානම් කර ගැනීම. එදා අපේ රටේ ආර්ථිකය කළමනාකරණය කරපු අයට කර ගන්න බැරි වෙච්ච මේ දැවැන්ත වෙනස්කම සිදු කිරීමට වර්තමාන රජය ඉතාම ශක්තිමත් විධියට පියවර ගෙන තිබෙනවා. මේ tariff policy එක තුළ මොකක්ද වෙන්නේ? අපට අවශ්‍යතාවක් තිබෙනවා, අපනයන ප්‍රමුඛ ආර්ථිකයක් හදන්න. එතැනදී ලෝකයේ තිබෙන වෙනත් වෙළෙඳ පොළ අවස්ථා ළඟා කර ගැනීම සඳහා වෙළෙඳ ගිවිසුම්වලට එළඹීමේ අවශ්‍යතාවක් අපට තිබෙනවා. ඒක රටවල් අතර සිද්ධ වෙන්නත් පුළුවන්, කලාපීයව සිද්ධ වෙන්නත් පුළුවන්. විශේෂයෙන්ම අපි RCEP Agreement එකට යන්න මේ අවස්ථාවේදී උත්සාහ කරනවා. එතැනින් අපට ලෝක වෙළෙඳ පොළෙන් සියයට 30ක් පමණ විවෘත වෙනවා. මේ වාගේ වෙළෙඳ ගිවිසුම්වලට යනවා නම් අපට මේ ආරක්ෂණ බදු - para-tariffs - තියාගෙන ඉස්සරහට යන්න බැහැ. Para-tariffs කියන්නේ ආනයන රේගු බද්දට අමතරව පනවන තවත් බදු. මේ අමතරව පනවන බදු විධියට CESS සහ PAL තමයි ලංකාවේ තිබෙන්නේ. මේ CESS බද්ද නිසා සමහර ක්ෂේත්‍රවලට අදාළව ආනයනය කරන භාණ්ඩවලට සියයට 80 දක්වා බදු ප්‍රමාණයක් අඩංගු වෙලා තිබෙනවා. මේ CESS බද්ද කාලානුරූපීව ඉවත් කරන්න රජය තීරණය කරලා තිබෙනවා. ඒ අනුව ලංකාවේ CESS බද්ද 2029 වෙනකොට සම්පූර්ණයෙන් ඉවත් වෙනවා. PAL බද්ද 2028 - 2029දී ඉවත් වෙනවා. මේ para-tariffs අයින් වුණාම අපට ලෝක වෙළෙඳ ගිවිසුම්වලට යන්න අවස්ථාව උදා වෙනවා. මේ වෙනස්කම අපි සිද්ධ කරන්නේ කාරණා දෙකක් නිසායි. මේකෙන් අපට ලෝක වෙළෙඳ පොළ විවෘත වෙනවා වාගේම, අපේ ආනයනික අමුද්‍රව්‍ය සහ යෙදවුම්වල මිල ගණන් අඩු වෙනවා. විශේෂයෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රය ඇතුළු විවිධ ක්ෂේත්‍රවලට අදාළ භාණ්ඩවල මිල ගණන් ඉහළ යන්න ප්‍රධානම හේතුවක් තමයි මේ CESS බද්ද. මේ ක්‍රියාවලිය ඇතුළේ අපි ගේන වෙනස්කම තමයි සරල බදු ක්‍රමයක් ඇති කිරීම. මේ මහත්වරු සංකීර්ණ කරලා බදු මඟ හරින්න, පැහැර හරින්න, බදු අහිමි වෙන්න ඉඩ සලසා තිබ්බ ආර්ථිකයක් සංවිධිත කරගෙන යමින් අපි උත්සාහ කරනවා, සරල border tax එකක්, එහෙම නැත්නම් තීරු බදු ප්‍රතිපත්තියක් ගේන්න. ඒ නිසා මේ වෙනස්කම ඇතුළතදී four-band tariff structure එකකට අපි යනවා. ඒ කියන්නේ සියයට බින්දුව, සියයට 10, සියයට 20, සියයට 30 කියන ඉතාම සරල ආනයනික බදු ප්‍රතිපත්තියකට අපි යනවා. එතකොට ලෝකයේ අපනයකරුවන්, නිෂ්පාදනකරුවන්, ආනයනකරුවන්, ආයෝජකයන් කියන මේ සියලුදෙනාම දන්නවා, ලංකාවත් එක්ක ගනුදෙනු කරනකොට මෙන්න මේ භාණ්ඩ වර්ගවලට සියයට බින්දුවයි, මේ භාණ්ඩ වර්ගවලට සියයට 10යි, මේ භාණ්ඩ වර්ගවලට සියයට 20යි, මේ භාණ්ඩ වර්ගවලට සියයට 30යි කියලා.

ලෝකයේ සම්මත, එකඟ වෙච්ච භාණ්ඩ වර්ගීකරණයක් - classification එකක් - අනුව අපි සරල බදු ප්‍රතිපත්තියකට යනවා. දශක ගණනක් තිස්සේ මේ රටේ සිද්ධ කරගන්න බැරිවෙච්ච කාරණාවක් තමයි අපි මේ සිද්ධ කරන්නේ. මෙතැනදී යෙදවුම් අමුද්‍රව්‍යවලට, යෙදවුම් භාණ්ඩවලට අඩු බදු ප්‍රතිශතයකුත්, පරිභෝජන භාණ්ඩවලට සියයට 20ක්, සුඛෝපභෝගී භාණ්ඩවලට සියයට 30ක් හෝ ආරක්ෂණයක් ලබා දෙන්න ඕනෑ කර්මාන්තවලට සියයට 30ක් දක්වා හෝ මේ බදු අඩු වැඩි කරගන්න රජයට හැකියාව තිබෙනවා. මේ බද්දට අමතරව ඉදිරියේදී මේ para-tariffs එහෙම නැත්නම් CESS හෝ PAL කියන බදු අදාළ වෙන්නේ නැහැ. නිෂ්පාදන කර්මාන්තවලට දීලා තිබුණු ආරක්ෂාව මේ විධියට අරගෙන යනකොට මේ රටේ සිදුවෙලා තිබ්බෙ නැති ප්‍රතිපත්තිමය ගැටලු ටිකක් මතුව තිබෙනවා, ආනයන අපනයන සම්බන්ධයෙන්. විශේෂයෙන්ම අපේ දේශීය කර්මාන්තකරුවන්ගේ ශක්තිමත්භාවය පුළුල් කර ගැනීම සඳහා මේ රටේ ආනයනික භාණ්ඩවලට අවශ්‍ය සම්මත පිහිටුවා ගන්න මේගොල්ලන්ට බැරි වුණා; ඒ කියන්නේ standards පිහිටුවා ගන්න බැරි වුණා. අපි මේ අවුරුද්ද ඇතුළත ආනයනික භාණ්ඩ වර්ගවලට - විශේෂයෙන්ම මේ CESS බද්ද ඉවත් වෙන භාණ්ඩ සඳහා සම්මත, standards - පිහිටුවනවා. එතකොට ඒ standardsවලට අඩුවෙන්, එහෙම නැත්නම් ඒ standardsවලට අනුව තමයි ඒ භාණ්ඩ ආනයනය කරන්න හැකියාව ලැබෙන්නේ. ඒ වාගේම, අපේ රට වාගේ රටවලට වෙනත් රටවලින් පිරිවැයට වඩා අඩු මිලට භාණ්ඩ සම්පාදනය කරනවා. ඒකට අපි කියනවා dumping කියලා. අපි ගිය අවුරුද්දේ සම්මත කරගත්ත Anti-Dumping and Countervailing Duties Act එක භාවිත කරන්න අපේ කර්මාන්තකරුවන්ට දැන් අවස්ථාවක් තිබෙනවා. ඔවුන් හිතනවා නම් යම්කිසි රටක්, යම්කිසි ආනයනකරුවෙක් පිරිවැයට වඩා අඩු මුදලට මේ රටට භාණ්ඩ සපයනවා කියලා, ඒ සඳහා අපට නව බද්දක් පනවන්න හෝ ඒ භාණ්ඩ තහනම් කරන්න හැකියාවක් තිබෙනවා.

ඒ වාගේම, අදාළ බදු ගෙවන්නේ නැතුව අපේ රටට විවිධාකාරයෙන් භාණ්ඩ එනවා. ඒවා අඩු කරන්න රේගු දෙපාර්තමේන්තුව කටයුතු කරමින් යනවා. නමුත්, විවිධාකාරයෙන් ඒවා තවම ලංකාවට එනවා. ඒ නිසා කර්මාන්ත අමාත්‍යාංශයත්, රේගු අධිකාරියත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත් එකතු වෙලා backward audit කියන ක්‍රියාවලිය පටන් ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මෙතැනින් පස්සේ කවුරු හරි භාණ්ඩයක් විකුණනවා නම්, ඒක කොහෙන්ද ආවේ කියලා කියන්න වෙනවා. එහෙම නැත්නම් ඒ කඩේ සීල් වෙනවා. එම නිසා කවුරු හරි භාණ්ඩයක් විකුණුවොත්, ඒ භාණ්ඩයේ සැපයුම්කරු කවුද කියලා අනිවාර්යයෙන් තොරතුරු තියාගන්න ඕනෑ. ඒ සැපයුම්කරු ආනයනික සැපයුම්කරුවෙක් නම්, එයා බදු ගෙව්වේ කොහොමද කියන backward audit trail එක පටන් ගන්නවා. මේ වාගේ ක්‍රියාවක් කරපු නැති නිසා තමයි අපේ නිෂ්පාදන කර්මාන්ත CESS බද්ද සහ

[ගරු චතුරංග අබේසිංහ මහතා]

PAL බද්ද යටතේ තිබුණේ. ඉතින්, ඒ කර්මාන්තකරුවන්ගෙන් ඇහුවාම කියනවා, මේ ක්‍රියාවලිය සිද්ධ වෙනවා නම්, ඵලදායිතාව වැඩි කරගෙන, ජාත්‍යන්තරයට ගැළපෙන විධියට ඔවුන්ගේ කර්මාන්තය පවත්වාගෙන යන්න හැකියාවක් තිබෙනවා කියලා. මොකද, තව ඉස්සරහට දේශීය වෙළෙඳ පොළක් කියලා එකක් නැහැ. ලෝක වෙළෙඳ පොළේ තමයි අපි තරග කරන්නේ. එම නිසා දේශීය වෙළෙඳ පොළට තරග කළත්, ලෝක වෙළෙඳ පොළට තරග කළත් අපට පුළුවන් වෙන්න ඕනෑ, ඵලදායි බවින් ඉහළ, ලෝකයත් එක්ක තරග කරන්න පුළුවන් භාණ්ඩ නිෂ්පාදනය කරන්න. ඒ අනුව රජයක් විධියට අපි ඒ කර්මාන්තවලට මැදිහත් වීමක් කරනවා.

මේ භාණ්ඩ සඳහා වන තීරු බදු ඉවත් කිරීම ගත්තොත්, අපි තෝරා ගත් 107ක් පමණ වන HS codes ප්‍රමාණයකට මේ අවුරුද්දේ නැතුව ලබන අවුරුද්දේ ඉඳලා සියයට 25, 25 සහ සියයට 50 ලෙසත්, අනෙකුත් ඒවා මේ අවුරුද්දේ සියයට 50 සහ ඊළඟ අවුරුද්දේ සියයට 25, 25 ලෙසටත් තීරු බදු ඉවත් කිරීම සිද්ධ වෙනවා. මෙන්න මේ දිශානතියට තමයි රට ගමන් කරන්නේ. ඒ දිශානතිය ඇතුළේ තමයි අපේ ආර්ථිකයේ දැවැන්තම පරිවර්තනය සිද්ධ වෙන්නේ. මේ දැවැන්ත පරිවර්තනයට දේශීය නිෂ්පාදකයා, අපනයනකරුවා ඇතුළු ඒ සියලුදෙනාම දායක වෙලා, ශක්තිමත් අපනයන ආර්ථිකයක්, ලෝකයේ වෙළෙඳ දාමවලට එකතු වෙන්න පුළුවන් ආර්ථික පද්ධතියක් නිර්මාණය කර ගන්න එක තමයි රජයේ බලාපොරොත්තුව. ඒ සඳහා අවශ්‍ය සහාය අපට ලෝක බැංකුවෙන් ලැබෙනවා. අපි ඒ පිළිබඳව සාකච්ඡා කරලා, දේශීය කර්මාන්තකරුවන්ගේ ගැටලුත් ඉදිරිපත් කරලා තමයි මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන ආමාත්‍යාංශය සහ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය එකතුවෙලා මේක ක්‍රියාත්මක කරන්නේ. ඒ අනුව, යෙදවුම් අමු ද්‍රව්‍යවල මිල අඩු වීම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ඉදිරියේදී දැවැන්ත ශක්තියක් ලැබෙයි.

මම අවසාන වශයෙන් මේ කාරණයත් සඳහන් කරන්නට ඕනෑ. මේ අය පාර්ලිමේන්තුවේදී පවා ඇහුවා, ඇප රහිත ණය දෙන්නේ කොහොමද කියලා. ඉතින්, අපි රජයක් විධියට කියන්න කැමැතියි, මේ අවුරුදු එකහමාර ඇතුළේ ඊයේ, ජාතික ණය සුරැකුම් ආයතනය - National Credit Guarantee Institution Limited - හරහා 2,000වැනි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයාට ණය ලබා දුන් බව. අපි හිතනවා ඒක ජයග්‍රහණයක් කියලා. ඒ ක්‍රියාමාර්ගය තව තවත් පුළුල් වෙලා තිබෙනවා. ඉදිරියේදී තව ව්‍යවසායකයන් 2,000කට පමණ ඇපකර රහිතව සුරැකුම් පතක් හරහා ණය ලබා දෙන්න අපට පුළුවන් වෙයි. ඉතින්, මේ ආර්ථිකය ශක්තිමත්ව ඉදිරියට යනකොට, දරිද්‍රතාව අඩු වෙනකොට, දරිද්‍රතාව අඩුවෙලා රැකියා උත්පාදනය වෙනකොට, අන්න එතැනින් තමයි මත්ද්‍රව්‍යවලට තිබෙන ඉල්ලුම අඩු කර ගන්න පුළුවන් වෙන්නේ. ඉතින්, දිගු කාලීන සැලැස්මක් යටතේ තමයි අපි ක්‍රියාත්මක වෙන්නේ.

අපේ හිර ගෙවල්වල සෙනඟ වැඩියි නම්, ඒ වැඩිවෙලා තිබෙන්නේ මේ මහත්වරු අපේ තරුණ දරුවෝ හදපු විධිය නිසායි. මේ මහත්වරුන්ගේ බලය පවත්වාගෙන යන්න දූප්පත්කමයි, මත්ද්‍රව්‍යයයි තමයි පාවිච්චි කළේ. අපි ඒ දෙකම මේ රටෙන් තුරන් කරලා, ආර්ථිකය ශක්තිමත් කිරීම තුළින් මත්ද්‍රව්‍යවලට තිබෙන ඉල්ලුම අඩු කරලා, අපේ දරුවන්ගේ ජීවිත බේරාගන්න ක්‍රියාත්මක වෙනවාය කියා මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன் அவர்கள்! உங்களுக்கு 7 நிமிடங்கள் உண்டு.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் மோட்டார் வாகனச் சட்டத்தின் கீழான விவாதம் நடைபெறுகின்றது. அதற்கு அப்பாற் சென்று, எங்களுடைய பகுதியில் இடம்பெற்ற ஒரு சம்பவம் பற்றி பேசவேண்டிய அவசியமிருக்கின்றது. விசேடமாக, தோட்டங்களில் வாழுகின்ற PHDT, NHDA, இந்திய வீட்டுத்திட்டம் போன்றவற்றின்மூலம் வீடுகளைப் பெற்றுக்கொண்ட மக்கள், அங்கிருந்து வெளியேற வேண்டுமென கடிதம் அனுப்பியிருக்கிறார்கள். அந்தக் கடிதத்தின் ஒரு பகுதியை நான் வாசிக்கின்றேன்.

"Pedro Estate, Nuwara Eliya
13.06.2026

**Line Rooms, NHDA, Greengold மற்றும் PHDT வீட்டுத்திட்ட நில ஒதுக்கீடு மற்றும் கடமைக்குச் சமுகமளித்தல் தொடர்பான இறுதி எச்சரிக்கை**

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சினால் விடுக்கப்பட்டுள்ள விசேட அறிவுறுத்தல் களுக்கு அமைய இக்கடிதம் உங்களுக்கு வழங்கப்படுகின்றது.

நமது தோட்ட நிருவாகத்தின்கீழ் பணிபுரிந்த காலத்தில், தோட்டத்துக்குச் சொந்தமான வருமானம் தரக்கூடிய தேயிலைப் பயிர்களை அழித்து, அந்த நிலமானது Line Rooms, NHDA, Greengold அல்லது PHDT வீட்டுத்திட்டங்களின்கீழ் உங்களுக்கு வீடுகளை அமைத்துக்கொள்வதற்காக வழங்கப்பட்டது. தோட்டத்தின் பிரதான பயிரை அழித்து இந்த நிலம் வழங்கப்பட்டதன் அடிப்படை நிபந்தனை, நீங்கள் தொடர்ந்து இத்தோட்டத்தின் வளர்ச்சிக்குப் பங்களிக்க வேண்டும் என்பதாகும்.

எனினும், நீங்கள் தன்னிச்சையாக வேலையிலிருந்து விலகியிருப்பதுன், தோட்ட நிலத்தில் வசித்துக்கொண்டு வெளியிடங்களுக்கு வேலைக்குச் செல்வதும், சட்டவிரோதமாக நிலத்தை விற்பனை செய்துள்ளமையும் அவதானிக்கப்பட்டுள்ளது. இது அமைச்சின் விதிமுறைகள் மற்றும் தோட்ட ஒப்பந்த விதிகளின் பாரதூரமான மீறலாகும். எனவே, இக்கடிதம் கிடைக்கப்பெற்ற 7 நாட்களுக்குள் மீண்டும் தோட்ட நிருவாகத்தில் உங்களின் கடமையைப் பொறுப்பேற்க வேண்டுமென அறிவுறுத்தப்படுகிறீர்கள்.

தவறும் பட்சத்தில், உங்களுக்கு வழங்கப்பட்ட நில ஒதுக்கீட்டை இரத்துச் செய்யவும், உங்களை வெளியேற்றவும் பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு மற்றும் சம்பந்தப்பட்ட அரசாங்க நிறுவனங்களுடன் இணைந்து தகுந்த சட்ட நடவடிக்கை எடுக்கப்படுமென இதன்மூலம் எச்சரிக்கப்படுகின்றீர்கள். .........."

இது மிக மோசமான ஒரு செயலென நான் இந்த நேரத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இந்தத் தோட்டத்தில் நல்ல தேயிலைக் காணிகளை பெற்றுக்கொடுத்ததாகச் சொல்கிறார்கள். நல்ல தேயிலை காணிகளைப் பெற்றுக்கொடுத்தது இந்தத் தோட்டத்தின் துரைமாரின்

அப்பாவோ, தாத்தாவோ அல்லர், தோட்டத்தொழிலாளர்கள்! அந்தக் காலத்தில் இவர்கள் இலங்கைக்கு வந்து, வெள்ளைக்காரர்களால் அடிபட்டு, உதைபட்டு, மிதிபட்டு, தோட்டங்களில் காணிகளைப் பெற்று, தமது உழைப்பின்மூலம் அபிவிருத்தி செய்த காணிகள். எனவே, தோட்ட நிருவாகத்தினர் தாம் நினைத்தமாதிரி செயற்பட முடியாதென நான் இந்த நேரத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இன்று தோட்டத்தில் இருக்கின்ற பெரியவர்கள் வயதாகி ஓய்வுபெற்று இருக்கிறார்கள். அவர்களுடைய பிள்ளைகள் அந்த வீட்டில் இருப்பதில் என்ன ஆட்சேபனை? அப்படியென்றால், இவர்களுக்கு வீடே கிடையாதா? வீடே கொடுக்கமாட்டீர்களா?

මම අහන්නේ මේකයි. ඒගොල්ලන් මෙච්චර කල් ඒ වතුවල වැඩ කළා; අවුරුදු 200ක් ඒ වත්තට වැඩ කළා. දැන් ඒගොල්ලන්ගේ පුතාලා දුවලාට කියනවා, තාත්තලා pension ගත්ත නිසා ගේ දෙන්න බැහැ, දවස් හතකින් එළියට යන්න කියලා. මොන කථාවක්ද මේ? මේ, කොම්පැනිකාරයන් කරන වැඩ. මේ ගැන ජනාධිපතිතුමා බලන්න ඕනෑ. මම උදේ Deputy Minister of Plantation and Community Infrastructure, Hon. Sundaralingam Pradeep එක්කත් මේ ගැන කථා කළා. එතුමා කිව්වා, වහාම මේකට පිළියමක් දෙන්නම් කියලා. ඉතින්, මේක මොන විහිළුවක්ද? මේක සම්පූර්ණ වැරදියි කියලා මම හිතනවා. දැන් Labookellie Tea Estate එක දීලා තිබෙනවා, Westward Estate එක දීලා තිබෙනවා, rooms 500කට වැඩි හෝටලයක් හදන්න. Hotels හදනවා. Nanu Oya Tea Centre, Radella Tea Centre, Talawakelle Tea Centre, St. Clair's Tea Centre කියලා tea centresවලට අක්කර ගණනක් අරගෙන, ඒක දියුණු කරනවා. වත්තට වැඩ කරපු කට්ටියට කියනවා, පර්චස් හතර පහක හදපු ගෙවල්වලින් අයින් වෙලා යන්න කියලා. ඒක සුදුසුද? ඔබතුමන්ලාගේ ආණ්ඩුව- ඊයේ පෙරේදා; 6වෙනි මාසේ 13වන දා තමයි මේ ලියුම එවා තිබෙන්නේ. ඒ කියන්නේ ගිය මාසයේ. ඉතින් මේ වාගේ ලියුමක් එනකොට අපි අවධානයෙන් ඉන්න ඕනෑ. අපිව එළියට දමලා ඔබතුමන්ලා කරන්න යන්නේ මොනවාද? ඒක කියන්න. අපිව එළියට දමනවා; දවස් හතකින් එළියට දමනවා. එළියට දමලා කරන්න යන්නේ මොනවාද? වෙන මිනිස්සු ගෙනැල්ලා පදිංචි කරවනවා. ඒකටද, මේ ආණ්ඩුව ඉන්නේ? පර්චස් 10ක් දෙන්නම් කියලා මේකද අපට පොරොන්දු වුණේ? මේක හරි වදයක්.

මෙහෙම කරන්න එපා. ජනාධිපතිතුමා, මෙහෙම කරන්න එපා. ඔබතුමාගේ හැටන් ප්‍රකාශයේ කිව්වේ, පර්චස් 10ක් දෙන්නම් කියලා. වත්තේ වැඩ කරන හෝ වත්තේ වැඩ නැති අයටත් දෙනවාය කිව්වා. දැන් මොකද මෙහෙම කරන්නේ? මේක සම්පූර්ණ වැරදියි. මෙහෙම වුණොත් වතුවල මිනිස්සු පාරට බැහැලා ලොකු කලබලයක් වෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා මේකට ඉඩ දෙන්න එපා. ගරු සුන්දරලිංගම් නියෝජ්‍ය ඇමතිතුමා ගැන මට විශ්වාසයක් තිබෙනවා. එතුමා උදේම කථා කළා, Secretaryට. Secretary කථා කරලා ඒ කොම්පැනියටත් කිව්වා, මෙහෙම කරන්න එපා කියලා. එක කොම්පැනියක් තමයි එවලා තිබෙන්නේ. Kelani Valley Plantations PLC. ඒකේ තමයි ලොක්කා; රාජතුරෛ ඉන්නේ. ඒ කොම්පැනිය තමයි මේක එවලා තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා මේක නවත්වලා, ඒ මිනිසුන්ට පදිංචි වෙන්න ඉඩ දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ මිනිස්සු කොහොමත් ලංකාවේ මිනිස්සු නේ. ඡන්දය දමනවා නේ. ඉතින් ඡන්දය ඉල්ලනකොට ඡන්දය හම්බ වෙනවා නම්, ඒ මිනිස්සු එළියට දමන්න යන්නේ ඇයි?

ඊළඟට, නුවරඑළියේ ගොවීන් ගැනත් මම කියන්න ඕනෑ. නුවරඑළියේ ගොවීනුත් දැන් අසරණ වෙලා ඉන්නවා. මේ පාර ගොවියෝ ඉවරයි. අලවලට මිලක් දෙන්නම් කිව්වා, ඒකත් නැහැ. එළවලුවලට මිලක් දෙන්නම් කිව්වා, ඒකත් නැහැ. පොහොර මිල අඩු කරලාත් නැහැ. තෙල් මිල අඩු කරලාත් නැහැ. කිසිම දෙයක මිල අඩු කරලා නැහැ. නුවරඑළියේ මිනිසුන්ට වංචා කරනවා, මේ ආණ්ඩුව. මොනවාට කරනවාද දන්නේ නැහැ. ඔබතුමන්ලාගේ තුන් හතරදෙනෙකුට ඡන්දය දීලා මේ පාර පාර්ලිමේන්තුවට එවලා තිබෙනවා. නමුත් ඒ මිනිසුන්ට වංචා කරනවා. එහෙම කරන්න එපා, ජනාධිපතිතුමා. ඒක හොඳ නැහැ. ඔබතුමා ලංකාවේ ඉන්න සියලු මිනිසුන්ට එක විධියට සලකන්න. එක කොටසකට එක විධියකට සලකන්නේ ඇයි?

මම හිතන විධියට වී ගොවියනුත් හුඟක් අමාරුවෙන් ඉන්නේ. අපි උදේ හම්බ වුණා, ඒගොල්ලන්ව. හුඟක් අමාරුවෙන් ඉන්නේ. ඉතින් මේ මොනවාද කරන්නේ? ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය මොකක්ද? Import කරන එකද ප්‍රතිපත්තිය? එහෙමද? දේශීය නිෂ්පාදන ගැන කිසිම වුවමනාවක් නැහැ. Import කරනවා; බෙදනවා. ඒකට ආණ්ඩුවක් ඕනෑද? පිටකොටුවේ මුදලාලි කෙනෙකුට පුළුවන් නේ ඒක කරන්න. ඔබතුමන්ලාට බැරි නම් ඒගොල්ලන්ට දෙන්න. එච්චරයි මම කියන්නේ. இந்த அரசாங்கம் ஒரு கொள்கையில்லாமல் செயற்பட்டுக் கொண்டு இருக்கின்றது என்பதை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும்.

அடுத்து, நேற்று முன்தினம் நீர்கொழும்பு சிறைச்சாலையில் நடைபெற்ற சம்பவம் மிகவும் துக்ககரமான சம்பவமாகும். எது எப்படி இருந்தாலும், மனித உயிர்கள் பறிக்கப்பட்டு இருக்கின்றன. மனித உயிர்களை பறிப்பதற்கு நாட்டில் யாருக்கும் அதிகாரம் இல்லை; கடவுளுக்குக்கூட அதிகாரம் இல்லை. ஆகையால், இவ்வாறான நடவடிக்கைகளை மேற்கொள்ளும்போது நிதானமாகச் செயற்பட வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.24]

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ වර්තමාන ආණ්ඩුව සෑම ක්ෂේත්‍රයකම දැවැන්ත පරිවර්තනයක් ඉලක්ක කරගෙන වැඩසටහන් සංවිධානය කරමින්, ඒකට අදාළ කරන අණ පනත්, රෙගුලාසි සම්මත කරමින් ඉදිරියට යන වටපිටාවක ඉඳගෙන තමයි අපි මේ දේශපාලන කටයුතු කරමින් සිටින්නේ. විශේෂයෙන්ම අද දවසේ සාකච්ඡා වුණු කරුණු කාරණා ගත්තත්, ඒවා යහපත් රටක, යහපත් අනාගතයක් වෙනුවෙන් ගන්නා දැඩි දේශපාලන තීන්දු තීරණ වනවා. ඒ නිසා, විශේෂයෙන්ම අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය පිළිබඳව මම අද අදහස් ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ ගැන මේ උත්තරීතර පාර්ලිමේන්තුවට වාගේම අපේ රටේ ජනතාවටත් අදහසක් තිබෙනවා. අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය ගත්තොත්, විශේෂයෙන්ම එය කඩා වට්ටපු, සමාජ ප්‍රශ්න බරපතළ ලෙස ගොඩනඟපු ක්ෂේත්‍රයක්. හැබැයි, වර්තමාන රජය බලයට පත් වෙනවා. ගරු බිමල් රත්නායක ඇමතිතුමා එහි වගකීම දරනවා. මේ වෙනකොට ඇමතිතුමා ප්‍රමුඛ අදාළ අමාත්‍යාංශය ප්‍රවාහන ක්ෂේත්‍රයේ දැවැන්ත වෙනස්කම් කරමින්, ගුණාත්මක වෙනස්කම් කරමින්, විප්ලවීය වෙනස්කම් කරමින් ඉදිරියට ගමන් කරමින් ප්‍රවාහනය කර්මාන්තයක් බවට පත් කරන්න යන වට පිටාවක් තමයි තිබෙන්නේ.

[ගරු දේවානන්ද සුරවීර මහතා]

අද අපි සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙන්නේ, විශේෂයෙන්ම 2025.09.25වන දා නිකුත් කරපු ගැසට් නිවේදනය ගැනයි. ඒක නැවත දීර්ඝ වෙලා - මාස තුනෙන් තුනට දීර්ඝ වෙලා - තිබෙනවා. මෙහිදී විශේෂයෙන්ම කථා කරන්නේ අධිවේගී මාර්ගයේ ගමන් කරන වාහනවලට seat belts අනිවාර්ය කිරීම සම්බන්ධ කාරණය. ඒ විතරක් නොවෙයි. ප්‍රවාහන ඇමතිවරයා විධියට ඒකට අදාළ තීන්දුවක් ගන්න එතුමාට සිදු වෙනවා. මොකද, අධිවේගී මාර්ගයේ ගමන් කරන වාහනවල රියදුරන්ට සහ ඉදිරිපස  ගමන් කරන්නාට seat belts අනිවාර්ය වෙලා තිබුණත්, වාහනවල පිටුපස ගමන් කරන සමස්ත මගීන් සඳහා seat belts අනිවාර්ය වෙලා තිබුණේ නැහැ. ඒ නිසා තමයි 2025.09.25 වෙනිදා විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් වෙන්නේ. එම ගැසට් නිවේදනය දීර්ඝ කරමින්, අවසාන වශයෙන් 2026.03.19 දින අති විශේෂ ගැසට් නිවේදනයක් මඟින් වාහන අයිතිකරුවන්ට අපි අවස්ථාවක් දුන්නා,  රියදුරු ඇතුළු  සියලු මගී ආසන සඳහා seat belts සවි කරන්නට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,  වර්තමාන ප්‍රවාහන ඇමතිවරයාට එවැනි තීන්දුවක් ගන්න සිදු වෙන්නේ අපේ රටේ දිගින් දිගටම, දිනෙන් දිනම මාර්ගවල සිදු වෙන දැවැන්ත රිය අනතුරු නිසායි. විශේෂයෙන්ම ඒ අනතුරු ඇතුළේ මරණ සහ පූර්ණ ආබාධ සහ අර්ධ ආබාධ සිදු වෙමින්, එක පැත්තකින් රටේ ආර්ථිකයට දැවැන්ත බලපෑමක් කරනවා. අනෙක් පැත්තෙන්, ඒ ඒ අයගේ පවුල් කුටුම්බ ඇතුළේ සිදුවෙන ඛේදවාචකයන් තුළ ඒ පවුල් කුටුම්බ අසරණතාවට පත් වෙනවා. ඒ නිසා ප්‍රවාහන ක්ෂේත්‍රය කර්මාන්තයක් බවට පත් කරලා, අර තරගකාරීත්වය ඇතුළේ එකිනෙකා මරා ගන්නා ක්‍රමය වෙනුවට ප්‍රවාහන ක්ෂේත්‍රයේ දැවැන්ත පරිවර්තනයක් කිරීම අපේ වර්තමාන ආණ්ඩුවේ ප්‍රධාන ඉලක්කය බවට පත් වෙලා තිබෙනවා.

අපි දන්නවා, අපේ රටේ මාර්ග අනතුරුවලින් - road accidentsවලින් - දවසකට 7 දෙනෙක් පමණ මිය යන බව. ඒ වාගේම අවුරුද්දක් ඇතුළත 2,750ක් වාගේ පිරිසක් මිය යනවා. ඒ මිය යන පිරිස් සම්බන්ධව කරපු අධ්‍යයන හරහා අපි සොයාගෙන තිබෙනවා, විශේෂයෙන්ම seat belt එකක් වැනි පොඩි උපකරණයකින් ඒ සිදුවෙන මරණ ප්‍රමාණය අඩු කර ගන්න පුළුවන් කියන කාරණය.

විශේෂයෙන් අධිවේගී මාර්ගවල සිදු වන අනතුරුවලදී ඒ ගමන් කරන මගීන්ගෙන් වැඩි පිරිසක් පූර්ණ ආබාධ සහ අර්ධ ආබාධවලට ලක් වෙලා තිබෙන්නේම ආසන පටිය පැළඳ නොසිටීම නිසායි. ඒ නිසා කුඩා උපකරණයක් වුණාට, මේ seat belt එක පැළඳීම අනිවාර්ය කිරීමෙන් අර විශාල අනතුරුවලට ලක්වන ප්‍රමාණය, අහිමි වන ජීවිත ප්‍රමාණය අවම කර ගැනීමේ හැකියාව ලැබෙනවා කියා අපි විශ්වාස කරනවා. පොදුවේ ගත්තාම අපි විශ්වාස කරනවා, මේ තීන්දුව දැවැන්ත මානුෂීය ක්‍රියාවලියක් කියලා. මොකද, සමහර විට අනතුරකදී අහිමි වන්නේ එක ජීවිතයක් වුණාට නන්නත්තාර වන්නේ එක්කෝ පවුලක්, වග කියන්න ඕනෑකම තිබෙන්නේ රජයක්. ඒ නිසා වාහනයකට නඟිනකොට, වාහනයේ driving seat එකේ ඉඳගන්නකොට ඒ රියදුරාට දැනෙන්න ඕනෑ, මම seat belt එක දමන්න ඕනෑය කියලා, ඒ වාගේම මගියාටත් දැනෙන්න ඕනෑ, මේ වාහනයේ ගමන් කරනවා නම් මමත් seat belt එක දමාගන්න ඕනෑය කියලා. ඒ seat belt එක දමාගන්නේ තමන්ගේ ඥාතියා වෙනුවෙන්, තමන්ගේ පවුල වෙනුවෙන්, තමන්ගේ රට වෙනුවෙන් කියන හැඟීම ඒ කෙනාට එන්න ඕනෑ. ඒ වාගේම අපි විශ්වාස කරනවා, මේක සංස්කෘතියක් බවටත් පත් වන්න ඕනෑය කියලා. වර්තමානයේ බස්වල යන තරුණ දූවා දරුවන්ට මේක ආදර්ශයක් බවට පත් වන්න ඕනෑ. Seat belts පැළඳීම සංස්කෘතියක් බවට පත් කරන්න පුළුවන් නම්, රිය අනතුරුවලින් අපේ රටේ සිදුවන මරණ සංඛ්‍යාව සහ පූර්ණ ආබාධවලට ලක්වන, අර්ධ ආබාධවලට ලක්වන සංඛ්‍යාවත් ගොඩක්දුරට අඩු කරගන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ නිසා මේ seat belts පැළඳීම හුදු ජනතාවගෙන්, රියදුරාගෙන්, එහෙම නැත්නම් මේ ක්‍රියාන්විතයේ යෙදෙන වෘත්තිකයාගෙන් දඩ අය කරගැනීම ඉලක්ක කරගෙන කරන වැඩක් නොවෙයි. පොදුවේ රට ඇතුළේ සිදුවන අනතුරුවලින් අහිමි වන ජීවිත ප්‍රමාණය අවම කරගැනීම රජයක් විධියට කළ යුතු වැඩක් කියා අපි විශ්වාස කරනවා. මොකද, වර්තමාන ආණ්ඩුවට මේ රටේ ඉන්න සෑම පුරවැසියෙකුගේම ජීවිත වටිනවා.

අපි දැක්කා, විශේෂයෙන්ම පසුගිය කාලයේ ජන ජීවිත තුට්ටුවකට මායිම් නොකරපු ආණ්ඩු තමයි අපේ රටේ තිබුණේ කියන එක. ඒක රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව වෙන්න පුළුවන්, රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව වෙන්න පුළුවන්, ඒක ඇතුළේ නියෝජනය කරන සජිත් ප්‍රේමදාස මහත්මයාලා වෙන්න පුළුවන්, නාමල්ලා වෙන්න පුළුවන්, මේ කිසි කෙනෙකුට අපේ රටේ ජන ජීවිත පිළිබඳ වටිනාකමක් තිබුණේ නැහැ. ඒගොල්ලන් නිර්මාණය කළේ දෙමව්පියන්ට දරුවන් නැති කරන සමාජයක්, දරුවන්ට දෙමව්පියන් නැති කරන සමාජයක්, රටට පුරවැසියන් නැති කරන සමාජයක්. කොටින්ම කිව්වොත්, පාතාල රාජ්‍යයක් තමයි ඒගොල්ලන් ගොඩනඟමින් සිටියේ. ඒ අනුව රට විනාශය කරා යමින් තිබුණේ. වර්තමාන ජාතික ජන බලවේග ආණ්ඩුවට අපේ රටේ සෑම මිනිසෙකුගේම, ගැහැනියකගේම ජීවිත අතිශය වැදගත් වනවා. ඒ නිසා අපි කල්පනා කරමින් ඉන්නවා, ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ ගුණාත්මක පිම් ගණනාවක් පනින්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, විශේෂයෙන්ම මේ වනකොට ග්‍රාමීය මාර්ග සුරක්ෂිතතාව වෙනුවෙන් රුපියල් මිලියන 1,500ක් අපි වෙන් කර තිබෙන බව. මම මේ කථා කරන්නේ RDA එකේ පාරවල් හෝ PRDA එකේ පාරවල් ගැන නොවෙයි. ඒ අනුව දිස්ත්‍රික්කයකට රුපියල් මිලියන 60 ගණනේ අපි වෙන් කරලා තිබෙනවා, මේ අවුරුද්දේ මේ මාස 6 ඇතුළේ. එතකොට ආණ්ඩුවක් විධියට අපි ජනතාව ගැන කල්පනා කරන විධිය ඔබට හිතාගන්න පුළුවන්. මේ ආණ්ඩුව ජනතාව ගැන එහෙම කල්පනා කරමින් ඉන්නේ. අපේ රටේ ග්‍රාමීය මාර්ගවල අනතුරු සිද්ධ වනවා. සමහර විට ඒවා පුංචි කාරණාවක් නිසා සිදුවන්න පුළුවන්. එක්කෝ පාලමක් අබලන් වීම නිසා, එහෙම නැත්නම් පාරක තිබෙන වළක් නිසා, එහෙම නැත්නම් road bumpers දමන්න ඕනෑ තැන්වල ඒවා නොදැමීම නිසා මේ අනතුරු සිදුවන්න පුළුවන්. ඒවා වැළැක්වීම පිළිබඳව පවා ජාතික වශයෙන් හිතන මට්ටමට මේ ආණ්ඩුව පත්වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව එහෙමයි වැඩ කරන්නේ.

අපි මේ වෙනස කරමින් ඉන්නේ ප්‍රවාහන පද්ධතිය තුළ විතරක් නොවෙයි. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළත් අපි මේ වෙනස කරමින් ඉන්නවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය දෙස බලන්න. දැවැන්ත පරිවර්තනයකට මුල්ගල තබා සෞඛ්‍ය සම්පන්න නීරෝගීමත් මිනිසෙක් බිහි කිරීම ඉලක්ක කර ගත් වැඩ පිළිවෙළකයි අපි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ මේ රට හපයක් කළ කණ්ඩායම් අද අපට එරෙහිව අවි අමෝරාගෙන කෑ ගහන්නේ මොන පදනම මතද කියන එක අපි කවුරුත් දන්නවා. මොකද, සකල දේශවාසී සියලු හතුරන් අද ජාතික ජන බලවේගය පැත්තට හැරිලා ඉන්නවා. මේගොල්ලන් ගොඩනඟපු පාතාලය, කුඩු රාජ්‍යය ඇතුළේ තමයි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර කිහිපයක් දෙන්න, පුංචි දෙයක් කියලා කථාව නතර කරනවා.

මීට කලින් කථා කළා, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. දැන් අපට මෙතුමන්ලා චෝදනා කරනවා, උපදෙස් දෙනවා, බන්ධනාගාර පිළිබඳව, බන්ධනාගාර රැඳවියන්ගේ සුරක්ෂිතතාව පිළිබඳව, රටේ සුරක්ෂිතතාව පිළිබඳව. හැබැයි, පාතාලයත් එක්ක ටෙලිෆෝන් ගනුදෙනු කරන මන්ත්‍රීවරු, පාතාලය නිර්මාණය කළ මිනිස්සු, ඒකේ නිර්මාතෘවරු අද මොකක්ද කරන්නේ? ආණ්ඩුවක් විධියට අපි මේ රට ගොඩනඟනවා, විප්ලවීය වෙනසක් කරනවා. ඒ සඳහා අපි ගමනක් ආරම්භ කරලා තිබෙනවා, අපි ඒ ගමන යනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.35]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කථා කරනවා, පාතාලය ගැන. හැබැයි, අද බන්ධනාගාරවලදී මිනිස්සු මැරෙනවා. පසුගිය දිනවල මීගමුව බන්ධනාගාරයේ සිදු වුණු ඝාතන සම්බන්ධව මේ රජය වග කියන්න ඕනෑය කියලා මා හිතනවා. මම ඒ ගැන කථා කරන්නේ එච්චරයි.

අද මේ රටේ හතරෙන් එකක් විතර ඉන්න ගොවි ජනතාව ඉතා අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. තමන් නිෂ්පාදනය කරන වී ටික අඩුම තරමින් නිෂ්පාදන මිලටවත් විකුණා ගන්න බැරි තත්ත්වයකට ඔවුන් පත් වෙලා තිබෙනවා. මේ රට සහලින් ස්වයංපෝෂිත කළේ අපේ නායකයෝ. එදා පැවති ආණ්ඩු වැඩියෙන් මුදල් වෙන් කළේ කෘෂිකර්මයට. නමුත් අද ගොවියා ගැන බලන්නේත් නැහැ. අද ගොවියාගේ වියදම එන්න එන්න වැඩි වනවා. යහ පාලන ආණ්ඩුවෙන් අපි රුපියල් 1,500ට දුන් පොහොර මිටියක් අද ගොවියා කඩෙන් ගන්නවා නම් රුපියල් 17,000ක් වනවා. ඒ වාගේම අද ට්‍රැක්ටර් ගාස්තුවත් වැඩි වෙලා තිබෙනවා. පොහොරවලට විතරක් ගොවියෙකුට දැන් තිබෙන මිල අනුව රුපියල් 32,000ක් යනවා, අක්කරයක් වගා කරන්න. ට්‍රැක්ටර් ගාස්තු යනවා, තව රුපියල් 30,000ක් විතර. අනෙක් වියදම් ඔක්කෝම ගත්තාම ගොවියෙකුට වී කිලෝ එකක් නිෂ්පාදනය කරන්න අඩුම තරමින් රුපියල් 135ක් යනවා. අද ඒ අයට වී විකුණා ගන්න විධියක් නැහැ. එක පැත්තකින් නිෂ්පාදන වියදම වැඩි වෙලා, අනෙක් පැත්තෙන් පොහොර ටික නැතිව අස්වැන්න අඩු වෙලා. ගොවියා රුපියල් 80ට, 85ට තමයි අද වී කිලෝ එකක් විකුණා ගන්නේ. ඉතින් අද ගොවියා ගොවිතැන අතහරින තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

අපි ගොවි නායකයෝත් එක්ක සාකච්ඡා කළා. ඒ අය මොකක්ද කිව්වේ? මහ කන්නයේ වී තවම ගෙවල්වල තිබෙනවා කිව්වා. යල කන්නයේ වී ටිකත් ඉදිරියේදී එනවා. මහ කන්නයේ වී තිබියදී මේ ආණ්ඩුව මොනවාද කළේ? හාල් ටොන් 157,000ක් ඉන්දියාවෙන් ගෙනාවා. කථා කළේ කීරි සම්බා ගේන්න. අන්තිමට ගෙනැල්ලා තිබෙන්නේ ස්වර්ණ නාඩුයි, පොන්නි සම්බායි. ඒ නිසා අද වී ටික තිබෙන්නේ ගෙවල්වල.

එදා මේ ආණ්ඩුව ආපු ගමන් ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් ගිහිල්ලා වී ගබඩා අසල වැතිලා තිබුණු කැලේ සුද්ධ කළා. කැලේ සුද්ධ කළා විතරයි, කොයි ගබඩාවද ඇරලා තිබෙන්නේ? තමුන්නාන්සේලා වී කිලෝවකට රුපියල් 120ක සහතික මිලක් නියම කරලා තිබෙනවා. අපි ආණ්ඩුවෙන් අහනවා, -ඇමතිතුමාත් සභාවේ නැහැ, කුඹුරේ හිටපු නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ නැහැ- වී අලෙවි මණ්ඩලයේ කොයි ගබඩාවේද රුපියල් 120ට වී කිලෝවක් ගන්නේ කියලා. ආණ්ඩුව අද මේක අතහැරලා. වී මෝල් හිමියෝ තමන්ට රිසි සේ රුපියල් 80ට, 85ට වී කිලෝවක් ගන්නවා. හැබැයි හාල් කිලෝවක් අද රුපියල් 200ත් පැනලා. ඉතින්, ආණ්ඩුව අද වී මෝල් හිමියන්ට ඕනෑ විධියට හම්බ කර ගන්න ඉඩ දීලා තිබෙනවා.

ඉස්සර නම් හෙලිකොප්ටර් ගත්තේ කොළඹ ඉන්න ලොකු ලොකු කොම්පැනිකාරයෝ. අද හෙලිකොප්ටර් ගන්නේ වී මෝල්හිමියෝ. අද ලක්ෂ දෙතුන්දාහේ ලොකු කාර් ගන්නේ කොළඹ ඉන්න අය නොවෙයි, වී මෝල් හිමියෝ. ඒ කියන්නේ, ආණ්ඩුව අද වී මෝල් හිමියන්ට ඕනෑ විධියට වී මිලදී ගන්න ඉඩ දීලා තිබෙනවා. මේ රටේ ඉතිහාසයේ වී මිල පාලනය කළේ වී අලෙවි මණ්ඩලයෙන්. සියයට ගණනක් වී මිලදී ගන්නවා, වී අලෙවි මණ්ඩලයෙන්. එතකොට මාර්කට් එකේ වීවලට හොඳ මිලක් ලැබෙනවා.

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා අද පොහොර සහනාධාරය සම්බන්ධයෙන් බොරුවක් කරනවා. තමුන්නාන්සේලා කිව්වා, පොහොර සහනාධාරය ලබා දෙනවා කියලා. එහෙම කියලා තමයි තමුන්නාන්සේලා බලයට ආවේ. යහ පාලන ආණ්ඩුව රුපියල් 1,500ට පොහොර මිටියක් ලබා දුන්නා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයට ආවාම ඒ සහනාධාරය අයින් කරලා දැම්මා. තමුන්නාන්සේලා අද බොරුවක් කියනවා, රුපියල් 17,000 පොහොර මිටියක් සහනාධාරයක් විධියට රුපියල් 10,200ට දෙනවා කියලා. මේ ආණ්ඩුව මොනවාද කළේ? ආණ්ඩුව කළේ මේකයි. පෙබරවාරි මාසය අවසන් වනකොට තමයි මැද පෙරදිග යුද්ධය පටන් ගත්තේ. පොහොර ටික ගෙනෙන්න කොම්පැනිවලට දුන්නා. ඒ විධියට ගෙනාපු පොහොර මිටියක් රුපියල් 10,000 ගණනේ පවරාගෙන ආණ්ඩුව තවත් මුදලක් එක්කහු කරලා ගොවීන්ට දුන්නා. හැබැයි, දීලා තිබෙන්නේත් යූරියා පොහොර විතරයි. TSP ඇතුළු අනෙක් පොහොර සියල්ල ගොවියෝ ඒ මිටියක් රුපියල් 17,000ට ගන්න ඕනෑ. අද ගොවියෝ ගොවිතැන අත්හරින තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මොකද, එක පැත්තකින් ගොවීන්ගේ නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් අලි, රිළවු, මොනරු වාගේ සතුන්ගෙන් වගාවට හානි සිදු වනවා. මට මතකයි, රිළවු පාලනය කරන්නත් ඔබතුමන්ලාගේ ඇමතිවරයෙක් හිටපු බව. රිළවු ටික දූපතකට ගිහිල්ලා දමන්න රුපියල් කෝටි ගණනක් වියදම් කළා. රිළවු ටික විතරක් නොවෙයි, එතුමාවත් ඒ දූපතට ගෙනිහිල්ලා දමන්න ඕනෑ. අද ගොවියා ගොවිතැනින් ඉවත් වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මේ සභාවට ඇවිල්ලා සභානායකතුමා කිව්වා, සල්ලි ටොන් ගණනක් ඉතුරු වෙලා තිබෙනවාය කියලා. සල්ලි ටොන් ගණනක් ඉතුරු වෙලා තිබෙනවා නම් ඒකෙන් කොටසක් වියදම් කරලා ගොවියාගේ ගෙදර තිබෙන නිෂ්පාදනය ලබා ගන්න කටයුතු කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. මම දන්නේ නැහැ, තමුන්නාන්සේලා ගොවිතැන විනාශ වෙන්න ඉඩ හරිනවාද කියලා. ගොවිතැන විනාශ කරන්නත් තමුන්නාන්සේලා කටයුතු කළා. මෙතුමන්ලා ඒ කාලයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන විතරක් එකසිය ගණනක් ගිනි තැබුවා. ඒ නිසා ගොවීන්ගේ ඔප්පු,

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

ලේබන ඔක්කෝම නැති වුණා. ඒ පුරුද්ද අනුව අද වනකොට ගොවිතැන නැති කරන තත්ත්වයට මෙතුමන්ලා කටයුතු කරනවා. කෘෂිකර්ම ඇමතිතුමාට හෝ නියෝජ්‍ය ඇමතිතුමාට මම අභියෝග කරනවා, පුළුවන් නම් කුඹුරකට බහින්න කියලා. ඉස්සර නම් එතුමන්ලා කුඹුරුවලමයි හිටියේ. අද ගොවි ජනතාව මේවාට විරුද්ධව කටයුතු කරනවා.

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා පොහොර සහනාධාරය දෙනවා කිව්වාට සමහර අයට ඒ සහනාධාරය දීලා තිබෙන්නේ අස්වැන්නත් නෙළා ගත්තාට පසුවයි. හැබැයි, එදා ගිනි තැබූ ගොවිජන සේවා මධ්‍යස්ථාන දැන් හදලා තිබෙනවා. දැන් කියනවා, ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් පොහොර ගන්නවා නම් පොහොරවලට සල්ලි බඳින්න ඕනෑ කියලා. සමහර ගොවීන් සල්ලි බැඳලා තිබෙනවා. නමුත්, පොහොර නැහැ. අද ගොවියාට මුදලුත් නැහැ, පොහොරත් නැහැ, සහනාධාරයත් නැහැ. ගොවියාව මේ තත්ත්වයට තමුන්නාන්සේලා පත් කරලා තිබෙනවා. අපි ලාල් කාන්ත ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ වෙනුවෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. ලාල් කාන්ත ඇමතිතුමා කියනවා, වැඩිය බත් කාලා ගොවීන්ට සීනි හැදිලාය කියලා. මම හිතන්නේ පසුගිය දවස් ටිකේ හොඳට කාලා ඇමතිතුමාගේ නම් සීනි වැඩි වෙලා ඇති. කරුණාකරලා ගොවීන්ට විහිළු කරන්නේ නැතුව, කුල භේදය ගැන කථා කරන්නේ නැතුව කටයුතු කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. නැත්නම් ගොවියෝ අද හෙටම තමුන්නාන්සේලාට විරුද්ධව පාරට බහීවි. දැන් ගම්වල ඔවුන් එක්කහු වෙලා ඉන්නවා. ගොවියා පාරට බැස්සොත් තත්ත්වය බොහොම නරක අතට පත් වෙයි. එම නිසා අපි ආණ්ඩුවට කියනවා, ගොවියාට සහනාධාර දෙන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ உறுப்பினர் கந்தசாமி பிரபு, உங்களுக்குப் 10 நிமிடங்கள் வழங்கப்படும்.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. M.K.M. ASLAM left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[பி.ப. 2.43]

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நாங்கள் இச்சபையில் 2005ஆம் ஆண்டின் 28ஆம் இலக்க, கொடுப்பனவு மற்றும் தீர்ப்பனவு முறைமைகள் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள், சுங்கக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானம், மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள், 1979ஆம் ஆண்டின் 40ஆம் இலக்க, இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டத்தின் கீழான கட்டளைகள் தொடர்பில் விவாதித்துக்கொண்டு இருக்கின்றோம்.

நாட்டின் பொருளாதார வளர்ச்சி தொடர்பில் நாங்கள் முக்கியமாக கருத்திற்கொள்ள வேண்டும். இந்த நாட்டின் பொருளாதார வளர்ச்சியை 7.8 சதவீதத்திலிருந்து 8 சதவீதமாக அதிகரிக்க வேண்டுமென்ற இலக்கு தேசிய மக்கள் சக்தி அரசாங்கத்திடம் இருக்கின்றது. அதற்கேற்ப, எங்களது செயற்பாடுகளை நாங்கள் முன்னெடுத்து வருகின்றோம். முதலில் பணக் கொடுக்கல்வாங்கலுடன் தொடர்புடைய வெளிநாட்டு நாணயமாற்று விடயம் தொடர்பில் பேசலாமென நினைக்கின்றேன்.

தேசிய தீர்வை கொள்கைக் குழுவின் ஊடாக 40 பரிந்துரைகள் முன்வைக்கப்பட்டு இருக்கின்றன. அந்தப் பரிந்துரைகளில் முக்கியமான சில விடயங்களைத் திருத்துவதற்காகவே நாங்கள் இந்தச் சட்ட ஏற்பாட்டை கொண்டுவந்து இருக்கின்றோம். பணக் கொடுக்கல்வாங்கலில் ஈடுபடுகின்ற நிறுவனம் தொடர்பில் நாங்கள் பல விதமான முரண்பாடுகளை கடந்த காலங்களில் அவதானித்து இருக்கின்றோம். வெளிநாட்டில் இருக்கின்ற குறித்த நிறுவனத்தின் முகவர்கள் ஊடாகவும், இலங்கையில் இருக்கின்ற முகவர்கள் ஊடாகவுமே அந்தப் பணக் கொடுக்கல்வாங்கல் இடம்பெறுகின்றது. அது சட்டரீதியாக இடம்பெறுகின்றதா? என்பது தொடர்பில் நாங்கள் எங்களது அவதானத்தைச் செலுத்த வேண்டும். ஹவாலா முறை, உண்டியல் முறை எனப் பல முறைகளினூடாக சட்டரீதியற்ற முறையில் பணப் பரிமாற்றம் செய்யப்படுவதை அவதானிக்க முடியும்.

கடந்த காலங்களில் இந்த நாட்டில் இனவாதம் இருந்தது; மதவாதப் போக்குகள் இருந்தன. அதனூடாகப் பயங்கரவாதச் செயற்பாடுகள் நடைபெற்றன. பண மோசடி தொடர்பான விடயங்களில் பணக் கொடுக்கல்வாங்கல் மிக முக்கியமானதொரு விடயமாக இருக்கின்றது. இந்தச் செயற்பாடுகளை தடுத்துநிறுத்த வேண்டும் அல்லது கட்டுப்படுத்த வேண்டுமாயின், பணக் கொடுக்கல்வாங்கல் விடயத்தில் கூடுதல் அக்கறை செலுத்த வேண்டும். பணக் கொடுக்கல்வாங்கலில் ஈடுபடும் நிறுவனங்கள் 2007ஆம் ஆண்டின் 07ஆம் இலக்க, கம்பனிச் சட்டத்தின்கீழ் பதிவுசெய்யப்பட்டிருக்க வேண்டும். பதிவுசெய்த பின்னரே, அவற்றுக்கு பணக் கொடுக்கல்வாங்கலில் ஈடுபடுவதற்கான சந்தர்ப்பம் வழங்கப்படும். வெளிநாட்டு நாணய மாற்று விடயங்கள்தான் இதில் பிரதானமாக இருக்கின்றது. வெளிநாட்டு நாணய மாற்று விடயங்களில் ஈடுபடும் நிறுவனங்கள் மத்திய வங்கியில் பதிவு செய்திருத்தல் வேண்டும். இல்லையெனில், அதன் விதிமுறைகளைப் பின்பற்றி அதனை நடைமுறைப்படுத்த முடியாத நிலைமை ஏற்படும். அந்நிய நாணயத்தின்மூலம் பணக் கொடுக்கல்வாங்கலில் ஈடுபடும்போது, நாணய இருப்புத் தொடர்பான பல விடயங்களில் நாங்கள் கவனம் செலுத்த வேண்டும்.

அடுத்து, சுங்கக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானமும் இன்று சபையில் சமர்ப்பிக்கப்பட்டு இருக்கின்றது. கடந்த காலங்களில் 0-20 சதவீதம் வரை வரி அறவிடப்பட்டது. தற்போது அதில் சில மாற்றங்களை மேற்கொண்டு இருக்கின்றோம். மூலதனப் பொருட்களுக்கு 0-10 சதவீதமும், இடைநிலைப் பொருட்களுக்கு 0-10 சதவீதமும், நுகர்வுப் பொருட்களுக்கு 20-30 சதவீதமும் வரி விதிக்கப்பட்டு இருக்கின்றது. நாங்கள் சில பொருட்களுக்கு வரி விலக்கு வழங்கியிருக்கிறோம். சுங்க குறியீடு - HS codesஇன்படி, 3,725 பொருட்களுக்கு பூச்சிய சதவீத வரி விதித்திருக்கின்றோம். அதாவது, tax free. மேலும், 526 பொருட்களுக்கு 15 சதவீத வரியும், 2,660 பொருட்களுக்கு 20 சதவீத வரியும் விதிக்கப்பட்டு இருக்கின்றது. கலப்பு வரி 413 பொருட்களுக்கும் விசேட வரி 852 பொருட்களுக்கும் விதிக்கப்பட்டு இருக்கின்றது. இது 2026.03.31ஆம் திகதி வரை நடைமுறையில் இருந்தது. 2026.04.01ஆம் திகதிக்குப் பின்னர், பொருட்களில் மாற்றங்களைக் கொண்டுவந்து இருக்கின்றோம். 3,756 பொருட்களுக்கு வரி விடுவிப்பு வழங்கப்பட்டுள்ளதுடன், 406 பொருட்களுக்கு 10 சதவீத வரியும், 2,195 பொருட்களுக்கு 20 சதவீத வரியும், 582 பொருட்களுக்கு 30 சதவீத வரியும் விதிக்கப்பட்டு இருக்கின்றது. மேலும், கலப்பு வரி, விசேட வரி என்பன ஏனைய பொருட்களுக்கு விதிக்கப்பட்டு இருக்கின்றன. முதற்கட்டமாக விதிக்கப்பட்டிருந்த இந்த வரி வீதத்தை, சில முக்கியமான பொருட்களுக்கு குறைப்பதற்கான ஏற்பாடுகளைச் செய்திருக்கின்றோம். ஒரு நாடு வருமானத்தைப் பெற்றுக்கொள்கின்ற வழிகளில் மிக முக்கிய இடத்தை வகிப்பது சுங்க வரியாகும். 2025ஆம் ஆண்டு ஏப்பிரல் மாதத்துடன் ஒப்பிடும்போது, 24 பில்லியன் ரூபாய் சுங்க வரியாக அறவிடப்பட்டு இருந்தது. நாங்கள் இதற்கு முன்னர் கொண்டுவந்த திருத்தச் சட்டத்தின் ஊடான வரி மாற்றத்தால், 2026ஆம் ஆண்டில் 39 பில்லியன் ரூபாய் வரியாக அறவீடு செய்யப்பட்டு இருக்கின்றது. பொருட்களை ஏற்றுமதி - இறக்குமதி செய்யும்போது, para-tariffs உட்பட பல வரிகள் அறவிடப்படுகின்றன.

CESS வரி தொடர்பாகவும் நாங்கள் கூடுதல் கவனம் செலுத்த வேண்டும். 1979ஆம் ஆண்டின் 40ஆம் இலக்க, இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டத்தின்கீழும் ஒரு திருத்தத்தைக் கொண்டுவந்து இருக்கின்றோம். நாங்கள் 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் சில உறுதிமொழிகளை வழங்கியிருந்தோம். அதன் அடிப்படை யில், CESS வரியை படிப்படியாக குறைப்பதற்கான நடவடிக்கைகளை முன்னெடுத்து வருகின்றோம். அதில் 17 எனும் குறியீட்டு இலக்கம் கொண்ட பொருட்களுக்கு வரி விடுவிப்பு வழங்கப்பட்டு இருக்கின்றது. இலங்கை - சிங்கப்பூர் சுதந்திர வர்த்தக ஒப்பந்தத்தில்கூட, இந்த வரி விடுவிப்பு தொடர்பான விடயம் கூறப்பட்டு இருக்கின்றது. நாங்கள் தொடர்ச்சியாக வரி விடுவிப்பை வழங்குவதற்கான நடவடிக்கைகளை முன்னெடுத்து வருகின்றோம்.

மேலும், உற்பத்திக் கைத்தொழிலை மேம்படுத்துவது தொடர்பான விடயத்திலும், சர்வதேச வியாபாரத்தில் ஈடுபடும்பொழுது ஏற்படுகின்ற தடைகள் தொடர்பான விடயத்திலும், விவசாயம் மற்றும் உள்நாட்டுக் கைத்தொழில் தொடர்பான விடயத்திலும் கவனம் செலுத்தி, அவை சார்ந்த கருத்திட்டங்களுக்கு வரி விடுவிப்பு வழங்குவது தொடர்பில் நாங்கள் கலந்தாலோசித்து வருகின்றோம். மேலும், ஆடை ஏற்றுமதி தொடர்பான விடயத்தில், HS codes - 265இன்கீழ் வருகின்ற பொருட்களுக்கு CESS வரியை நீக்குவது தொடர்பில் நாங்கள் கலந்தாலோசித்து வருகின்றோம்.

அடுத்து, இன்றைய தினம் மோட்டார் வாகனச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகளும் சபைக்குச் சமர்ப்பிக்கப்பட்டு இருக்கின்றன. போக்குவரத்துப் பாதையில் அதிவேகமாகப் பயணிக்கும்பொழுது பல விபத்துகள் இடம்பெறுகின்றன. இதனால் பெருமதியான பல உயிர்கள் காவுகொள்ளப்படுகின்றன. சிலர் நிரந்தரமாக அல்லது பகுதியளவில் அங்கவீனம் அடைகிறார்கள். இது தொடர்பில் மிக முக்கியமானதொரு விடயத்தைக் கூற வேண்டும். இந்த நாட்டில் தொடர்ச்சியாக விபத்துகள் ஊடாகப் பல இறப்புகள் இடம்பெறுகின்றன. அதற்குப் பிரதான காரணமாக இருப்பது, seat belt அணியாமை ஆகும். எங்களுடைய கௌரவ பாராளுமன்ற உறுப்பினர் இராமநாதன் அர்ச்சுனா அவர்கள்கூட, பல இடங்களில் வேகமாகப் பயணித்ததால் දඩ කොළයஐப் பெற்றுக்கொண்டு பாராளுமன்றத்துக்கு வந்திருந்தார். அவரது அந்தப் போக்கு தொடர்பாகப் பல விமர்சனங்கள் முன்வைக்கப்பட்டு இருந்தன. அவரையும் காப்பாற்றிக்கொள்வதற்காகத்தான் நாங்கள் இந்தச் சட்ட ஏற்பாட்டைக் கொண்டுவந்து இருக்கின்றோம். இப்பொழுது, seat belt அணிவது கட்டாயமாக்கப்பட்டு இருக்கின்றது. வாகனத்தின் முன் ஆசனத்தில் அமர்ந்து பயணிக்கும்போது மாத்திரம் seat beltஐ அணியாமல், பின் ஆசனத்தில் அமர்ந்து பயணிக்கும்போதும் seat beltஐ கட்டாயம் அணிய வேண்டும் என்பதுதான் இந்தச் சட்ட ஏற்பாட்டின் நோக்கமாக இருக்கின்றது. விபத்துகளை குறைப்பதும், அதனூடாக இடம்பெறுகின்ற உயிரிழப்புகளை தவிர்ப்பதும்தான் எங்களுடைய நோக்கமாக இருக்கின்றது. தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் ஊடாக இன்னும் பல விடயங்களை நாங்கள் முன்னெடுத்து வருகின்றோம்.

அண்மையில் நீர்கொழும்பு சிறைச்சாலையில் இடம்பெற்ற சம்பவத்தால் அநாவசியமாகப் பல உயிரிழப்புகள் ஏற்பட்டன. அந்த உயிர்களின் ஆத்மாக்கள் சாந்தியடைய வேண்டுமென பிரார்த்தித்து, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி! வணக்கம்.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ නම සඳහන් කළා. මට කිව්වා, නඩුව තිබෙනවා කියලා. මම දෙමළෙන් කියන්නම්. முதலில் குழந்தைப் பிள்ளைகளுக்கு licence இருக்க வேண்டும், மோட்டார் சைக்கிள் ஓடுவதற்கும் கார் ஓடுவதற்கும். பிரபு என்ற எங்களுடைய பாராளுமன்ற உறுப்பினருக்கு - குழந்தைப் பிள்ளைக்கு - licence இல்லை. Licence இருக்கின்றவனைத்தான் பொலிஸ்காரன் நிறுத்துவான்; உங்களை எப்படி நிறுத்துவான். நன்றி!

**ගරු කන්දසාමි ප්‍රභු මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තත්පර 30ක් දෙන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
හොඳයි, තත්පර 30ක් දෙන්න.

ගරු மன்த்ரீதுமனி, குழந்தைப் பிள்ளைகளுக்கு எங்கேயும் licence கொடுப்பதில்லை. வேண்டுமென்றால், சிறு பிள்ளைகள் ஓடக்கூடிய toy வாகனங்களில் பயணிக்க முடியும். நல்லதொரு வைத்தியரும் நல்லதொரு பாராளுமன்ற உறுப்பினருமான உங்களை பாதுகாக்க வேண்டும் என்பதற்காகத்தான் இந்த விடயத்தைக் கொண்டுவந்து இருக்கின்றோம். எனவே, சந்தோஷமாக, நிம்மதியாக, பாதுகாப்பாக பயணிக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.55]

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම පාර්ලිමේන්තුවට විවිධ විවිධ පනත් ගෙනෙමින්, විවිධ විවිධ සුරංගනා කථා කියමින් ආණ්ඩුව වැඩ පිළිවෙළක් අරගෙන යනවා. හැබැයි, ආණ්ඩුව මොන දේවල් රට ඉස්සරහා, පාර්ලිමේන්තුව ඉස්සරහා කිව්වත්, ආණ්ඩුවේ අකාර්යක්ෂමතාව, ආණ්ඩුවේ නොහැකියාව, ආණ්ඩුවේ දුර්වලකම පෙන්නුම් කරමින් හැම සතියකම රටේ කුමන හෝ ප්‍රශ්නයක් ඇති කරමින් තිබෙනවා. දැන් අලුත්ම තත්ත්වය තමයි, මීගමුව බන්ධනාගාරයේ රැඳවියන් සහ නිලධාරින් ඝාතනය කිරීම. මේ වාගේ තත්ත්වයක් ඇති කරන්න නොවෙයි මේ ආණ්ඩුව බලයට ආවේ. මේ ආණ්ඩුව බලයට එන්න පෙර වේදිකාවල බුද්ධි අංශ වාර්තා ගැන මහ ලොකුවට කථා කළේ, ජාතික ආරක්ෂාව පිළිබඳ ටියුෂන් දෙන්නයි ආවේ. හැබැයි, අද සිද්ධ වන හැම සිදුවීමකින්ම පෙනෙන්නට තිබෙන්නේ ආණ්ඩුවේ නොහැකියාව, ආණ්ඩුවේ අකාර්යක්ෂමතාව.

මේ සතියේ අලුත් ප්‍රශ්නයක් ආවාට පසුගිය කාලය පුරාම ගොවි ජනතාවට තමයි විශාලම ප්‍රශ්නය ඇති වුණේ. අද මේ පාර්ලිමේන්තුවට ආවා, මුළු ලංකාවේම ගොවි ජනතාව නියෝජනය කරන ගොවි නායකයින් ටික. අද ඒ අයට මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා විපක්ෂ නායකතුමා එක්ක සහ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා එක්ක ඒ අයගේ ප්‍රශ්න කථා කරන්න සිද්ධ වුණා. ඇයි අද එහෙම වෙලා තිබෙන්නේ? ඒ අය තමයි පසුගිය කාලයේ මාලිමාව ආණ්ඩුව ගෙනෙන්න කැස කවපු, මාලිමාව ආණ්ඩුව ගෙනෙන්න පාරට බැහැලා අරගළ කළ ජනතාව. එහෙම අරගළ කරපු ජනතාවට අද ආණ්ඩුවේ කිසිම සාකච්ඡාවක් නැහැ. අද ගොවි ජනතාවට ඇති වෙලා තිබෙන ප්‍රශ්නය සම්බන්ධව කෘෂිකර්ම ඇමතිවරයා ඇතුළු ආණ්ඩු පක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයකුගේ අවධානය යොමු වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් අනුරාධපුරය දිස්ත්‍රික්කය නියෝජනය කරන කෙනෙක්. සියලු ගොවි ජනතාව අද පාරට බැහැලා ඉන්නේ. ඒ අයට කුඹුරට ගිහිල්ලා තමන්ගේ ගොවිතැන කරනවා වෙනුවට පාරට බැහැලා අරගළ කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඇයි ඒ? ඇයි, ගොවි ජනතාව මෙහෙම පාරට ඇද දමලා තිබෙන්නේ? මොකක්ද ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ විසඳුම? කිසිම විසඳුමක් නැහැ.

අද වී මිල සම්බන්ධව මොකක්ද වෙලා තිබෙන්නේ? අපි දැක්කා කෘෂිකර්ම ඇමතිවරයා කියනවා, තුන් වේලටම බත් තම්බ තම්බා කෑම නිසා මේ රටේ මිනිස්සුන්ට දියවැඩියාව හැදෙනවා කියලා. ඔබතුමන්ලාගේ ජනාධිපතිවරයා කිව්වා වාගේ "ටොප් බඩුවක්" තමයි කෘෂිකර්ම ඇමති කරලා තිබෙන්නේ. හැබැයි, අපි එතුමාට මේ කාරණය කියන්න ඕනෑ. ගොවිතැන් කරන ජනතාව තුන්වේලටම බත් කාලා නිකම් ගෙදරට වෙලා ඉන්නේ නැහැ. ඒ මිනිස්සු මහන්සි වෙනවා. ඒ අය මහන්සි වෙලා තමයි කෘෂි කර්මාන්තය කරන්නේ. හැබැයි, අද ශීත කාමරවලට වෙලා හැම්බෙකන්, චීස්, බටර් කාලා ලාල් කාන්ත අමතිවරයාට දැන් දියවැඩියාව ඇවිල්ලා ඇති. ගොවි ජනතාව මහන්සි වෙලා නිෂ්පාදනය කරලා දෙන වී ටිකට සාධාරණ මිලක් දෙන්න අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවට කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසා අපි ලාල් කාන්ත ඇමතිවරයා, නියෝජ්‍ය ඇමතිවරයා ඇතුළු මේ අයට කියන්නේ, කරුණාකරලා ගොවි ජනතාවට සාධාරණ මිලක් ලබා දීමට කටයුතු කරන්න කියලායි. එහෙම නොවුණොත්, හෙට අනිද්දා වනකොට ඔබතුමන්ලාගේ කොට්ට, පැදුරු හකුළාගෙන ඔබතුමන්ලාට යන්න සිද්ධ වනවා.

අපි දැක්කා පසුගිය කන්නයේදී, අප්‍රේල් 2වැනි දා ඉඳන් අප්‍රේල් 30 වනතුරු මේ අය හාල් මෙට්‍රික් ටොන් 157,000ක් ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. හාල් මෙට්‍රික් ටොන් 157,000ක් ගෙන ඒම නිසා ගොවි ජනතාවට වීවලට ලැබිය යුතු සාධාරණ මිල අද ලැබිලා නැහැ. ඒ නිසා අපි ලාල් කාන්ත ඇමතිවරයාට විශේෂයෙන්ම කියනවා, ඔබතුමා ඉන්නේ අපේ රටේ ගොවි ජනතාවගේ ඕනෑ එපාකම් ඉෂ්ට කරන්න මිසක් පාකිස්තානයේ, ඉන්දියාවේ හෝ වෙන රටවල ගොවි ජනතාවගේ වුවමනා ඉෂ්ට කරන්න නොවෙයි කියලා.

වසන්ත සමරසිංහ ඇමතිතුමා මේ රටේ වෙළෙඳ ඇමතිවරයා. එතුමා කිව්වා, ගිය අවුරුද්දේ දෙසැම්බර්වලින් පස්සේ එක හාල් ඇටයක් මේ රටට ගෙනෙන්න දෙන්නේ නැහැ කියලා. හැබැයි, එතුමා අද හාල් ටික පිට රටින් ගෙනැල්ලා ගොවි ජනතාවට සාධාරණ මිලක් නොලැබෙන විධියට කටයුතු කරනවා. ඒ නිසා එතුමාට නැවත වරක් කියන්න පුළුවන්ද ඒ කථාව?

විශේෂයෙන් මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මේ වෙද්දිත් මහ කන්නයේ වී අස්වනු විශාල ප්‍රමාණයක් තවම ගොවි ජනතාවගේ ගෙවල්වල තිබෙනවා. අද වී කිලෝව රුපියල් 80ට, 85ට වැටිලා තිබෙන්නේ. හැබැයි, මහ කන්නයේ වී අලෙවි මණ්ඩලය මිලදී ගත්ත, ගබඩාවල තිබෙන වී ටික නිදහස් කරගන්නවත් මේ ආණ්ඩුවට තවම වැඩ පිළිවෙළක් නැහැ.

ඉස්සෙල්ලාම මේ ගබඩා ටික හිස් කරලා ගොවි ජනතාව සතුව තිබෙන පසු ගිය මහ කන්නයේ වී ටික සාධාරණ මිලකට ගන්න කටයුතු කරන්න කියන ඉල්ලීම මා විශේෂයෙන්ම කරනවා.

එදා කුඹුරට ගිහිල්ලා ගොවි ජනතාව සමඟ නියරේ එකට කහට කෝප්පය බී ගෙන හිටපු කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිවරයා එක්ක සාකච්ඡාවක් ගන්න අද ඒ ගොවි ජනතාවට බැරි වෙලා තිබෙනවා. ඒ කට්ටිය තමන්ගේ පක්ෂයට අදාළ කිහිප දෙනෙකු විතරක් අමාත්‍යාංශයට ගෙනැල්ලා සාකච්ඡා කරනවා. මේ සමස්ත

ගොවි ජනතාවගේ ප්‍රශ්නයට හරි විසඳුමක් දෙන්න ආණ්ඩුවට තවමත් හැකියාව ලැබිලා නැහැ. හැබැයි, මේ වෙලාවේ ගොවියාත් එක්ක මේ ප්‍රශ්නය දිගටම අරගෙන යන්න එපා. එදා නාමල් කරුණාරත්න මැතිතුමා ගොවියාට කිව්වේ, වී කිලෝවක් සඳහා රුපියල් 150ක සහතික මිලක් දෙනවා කියලා. එදා රුපියල් 150ක සහතික මිලක් ඕනෑ කියපු නාමල් කරුණාරත්න අද කියනවා, රුපියල් 150ක් නොවෙයි රුපියල් 120 සාධාරණයි කියලා. ගිය සතියේ පැවැති එක් වැඩසටහනකදී කෘෂිකර්ම ඇමතිවරයා කිව්වා, වී සඳහා යන නිෂ්පාදන වියදම රුපියල් 137ක් විධියට හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනය විසින් ගණනය කරලා තිබෙනවා කියලා. එය රුපියල් 137ක් ලෙස ගණනය කරලා තිබෙනවා නම් ආණ්ඩුව අද කොහොමද, රුපියල් 120ක සහතික මිලක් තීරණය කරන්නේ? එහෙම නම්, ගොවි ජනතාව පාරට බස්වාගන්නේ නැතිව ගොවි ජනතාවට වී සඳහා සාධාරණ මිලක් ලබා දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.02]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ගොවි ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන යුගයක, ගොවි ජනතාවගේ දුකට ඇහුම්කන් දෙන්න රජය අපොහොසත් වී තිබෙන යුගයක, ගොවි ජනතාව විසින් ඉදිරිපත් කර තිබෙන "සය වැදෑරුම් ගොවිජන යෝජනාවලිය" මගේ කථාව ආරම්භයේදීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් **සභාගත*** කරනවා.

ගොවියාට ආකර්ෂණීය පොරොන්දු මාලාවක් ඉදිරිපත් කරලා ගොවියාගේ හිත දිනාගෙන බලයට ආපු වර්තමාන ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය මේ මොහොත වන විට ගොවි ජනතාව අතරමං කරලා තිබෙනවා; සම්පූර්ණයෙන්ම අනාථ කරලා තිබෙනවා. අපට මතකයි, එදා කිව්වා "ගොවියා දෙවියා" කියලා; "ගොවි ජනතාව රජවරුන් බවට පත් කරන්න ඕනෑ" කියලා. එදා එහෙම කියලා ආණ්ඩු බලය ලබා ගත් වර්තමාන රජයේ සමහරු අද ගොවි ජනතාවට අපහාස කරනවා; අවලාද කරනවා; 'කසිප්පුකාරයෝ' කියලාත් හඳුන්වනවා. ආටිෆිෂල් ගොවියෝලු. ඒ අය රටට බත සපයන්නේ නැහැලු. ගොවි ජනතාව රජ කරවනවා කියන එක තීරණය වෙන්නේ තමන්ගේ උත්පත්තිය, උප්පැන්නය අනුවලු. මෙන්න මේ ආකාරයට ගොවි ජනතාවට පහර පිට පහර එල්ල කරන යුගයක අපි රජයෙන් ඉල්ලා සිටිනවා, එදා ගොවි බිම්වලට ගිහිල්ලා, ගොවි ජනතාවගේ දුක, කඳුළ, වේදනාව ගැන කථා කරලා ගොවියාට පොරොන්දු වුණු සහන ටික ලබා දෙන්න කියලා. වර්තමාන කෘෂිකර්ම අමාත්‍යවරයාම කියනවා, "වී කිලෝවක් නිෂ්පාදනය කරන්න අවම වශයෙන් රුපියල් 137ක් වැය වෙනවා" කියලා. වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 137ක් වැය වෙනවා නම්, එතරම් මුදලක් වැය වෙනවා කියලා කෘෂිකර්ම ඇමතිතුමා කිව්වාට පස්සේත් රුපියල් 120ක මිලක් ලබා දෙමින්, එදා ඔබට දස ලක්ෂ ගණනින් ඡන්දය ලබා දුන් ගොවි ජනතාවට වී කිලෝවකට රුපියල් 17ක පාඩුවක් සිදු කරන්නේ ඇයි?

අපට මතකයි, වර්තමාන රජය නියෝජනය කරන ඇමතිවරුන් එදා ගොවි බිමට ගිහිල්ලා ගොයම් කකා කිව්වා වී කිලෝවකට රුපියල් 150ක් දෙනවා කියලා. එපමණක් නොවෙයි, ඒ ස්ථාවර මිල රටේ නීතිය බවට පත් කරනවා කිව්වා; ඒ සඳහා වන අණ පනත් ගෙනෙනවා කිව්වා. මේවා අපි නොවෙයි කිව්වේ, මේ රජය නියෝජනය කරන මැති ඇමතිවරුයි කිව්වේ. අද මේ මොහොත වන විට ගොවියාගේ නිෂ්පාදන චක්‍රයේ හැම ක්‍රියාවක්ම අසාර්ථක වෙලා තිබෙනවා. ගුණාත්මකභාවයෙන් ඉහළ බීජ වී දරාගත හැකි මිලකට ලැබෙන්නේ නැහැ. පොහොර සහනාධාරය වෙනුවෙන් ලබා දෙන මුදල් ප්‍රමාණවත් නැහැ. ලබා දෙන දේවල් ගුණාත්මකභාවයෙන් ඉහළ නැහැ. තෙල් පොහොර මිල කඩෙන් කඩේට වෙනස් වෙනවා. ඒවායේ අධික මිලක් තිබෙන්නේ. ඒවායේත් ගුණාත්මකභාවය ගැන බරපතළ ප්‍රශ්න තිබෙනවා. කෘෂි උපකරණවල මිල ශීඝ්‍රයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා.

ඊළඟට, වනඅලි-මිනිස් ගැටුම නිසා, වනසතුන්-මිනිස් ගැටුම නිසා බරපතළ විධියට වගා හානිය සිදු වෙනවා. තමන්ගේ කන කර බඩු උකස් කරලා ගොවිතැන් කරන දසලක්ෂ සංඛ්‍යාත ගොවි ජනතාව ස්ථාවර මිලක් නොමැතිව අද අන්ත අසරණභාවයට පත් වෙලා සිටිනවා. අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර වීවලට සාධාරණ සහතික මිලක්, ඒ කියන්නේ ඒ නිෂ්පාදන මිල ආවරණය වන ආකාරයේ මිලක්වත් - අඩුම ගණනේ රුපියල් 140ක්වත් - ලබා දෙන්න කටයුතු කරන්න කියලා. ඒ වාගේම පොහොර සහනාධාරය වැඩි කරන්න, ඒකට ලබා දෙන සහන මුදල වැඩි කරන්න. ඒ වාගේම කෘෂි උපකරණවල මිල ඉහළ යෑමත්, ඉන්ධන මිල ඉහළ යෑමත් හේතුවෙන් ගොවියාගේ වියදම වැඩි වෙලා තිබෙනවා. ඒ ඉන්ධන ක්ෂේත්‍රයෙන් සහනයක් ලබා දෙන්න. ඒ වාගේම, සහල් ආනයනය කිරීම විශේෂයෙන්ම දේශීය ගොවියාට හානිදායක ආකාරයට සිදු වී තිබෙන මේ මොහොතේ සහල් ආනයනයෙන් වැළකී සිටින්න. සහල් පමණක් නොවෙයි, අල, බී ලූනු වැනි කෘෂි භෝගවල අස්වනු නෙළන කාලයට ආනයනය කිරීම නැවැත්වීමට කටයුතු කරන්න.

වනඅලි-මිනිස් ගැටුම, වනසතුන්-මිනිස් ගැටුම අවම කරන්න වහාම පියවර ගන්න. අද ගොවි ජනතාව තමන්ගේ දුක, කඳුළ, වේදනාව ඉදිරිපත් කරන කොට ඒ අයගේ චරිතය ඝාතනය කිරීමෙන් වළකින්න; අනිසි ලෙස විවේචනය කිරීමෙන් වළකින්න. දසලක්ෂ ගණනින් ගොවි ජනතාව අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ප්‍රමුඛ වර්තමාන රජය කෙරෙහි විශ්වාසය තබලා, මහා විශාල වරමක් ලබා දුන්නා. ඒ ජන වරමට ගරු කරලා, කරුණාකර ගොවි ජනතාව වෙනුවෙන් ඒ යුතුකම ඉෂ්ට කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම තවත් පොඩි වෙලාවක් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.**
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

බලය ලැබූ පමණින් තමන් ඔය තැනට ගෙන ආ ජනතාව අමතක කරන්න එපා; අනාථ කරන්න එපා. මා ඉහතින් සඳහන් කළ සය වැදෑරුම් ගොවිජන යෝජනාවලිය මම මගේ මේ කථාව ආරම්භයේදීම සභාගත කළා. ඒක කියවා බලන්න. අපේ ගරු සභානායකතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටිනවා. අපි ඔබතුමාටත් එහි පිටපතක් එවන්නම්. කරුණාකරලා ඒ යෝජනා පිළිබඳව සංවේදීව, සානුකම්පිකව අවධානය යොමු කරලා ඔබ මේ තැනට ගෙන ආ ගොවි ජනතාව අනාථ කරන්නේ නැතුව කරුණාකර ඒ අයගේ අයිතීන් සුරක්ෂිත කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට කාලය ගන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ.

එසේ නොකළොත් ඔබ කරන්නේ ජනතා වරම උල්ලංඝනය කිරීමක්. ඒ විතරක් නොවෙයි, අපේ රටේ වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි ඇතුළු ඉපැරණි සංස්කෘතිය හා බද්ධ වුණු මේ ගොවිතැන විනාශ කිරීම තුළ ඔබ කරන්නේ මේ රටේ ගොවි ජනතාවගේ මූලික මානව අයිතිය උල්ලංඝනය කිරීමක්. ඒසේ නොකොට මේ රටට බත සපයන, අපේ රටේ ආහාර සුරක්ෂිතභාවයට දැවැන්ත ශක්තිය ලබා දෙන,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව ගන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ. වෙන කාගෙන්වත් නොවෙයි, අපේ පැත්තෙන් ගන්නේ. කරුණාකරලා මට අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට කාලය ගන්න, ඔබතුමාගේ පාර්ශ්වයේ වෙන කෙනෙක් නැහැ කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමාවෙන්න, එහෙනම් මම ඉතාම කෙටියෙන් අවසන් කරන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව තත්පර 30ක් දෙන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කරුණාකරලා ගොවි ජනතාව සුරක්ෂිත කරන්නට, ගොවි අයිතීන් රැකගන්නට මේ රජය වහාම කටයුතු කරන්න. සමගි ජන බලවේගය, සමගි ජන සන්ධානය හැටියට මේ රටේ ගොවි ජනතාවගේ අයිතීන් සුරක්ෂිත කරන්නට ඕනෑම කැප කිරීමක් කරන්නට අපි සූදානම් බව ප්‍රකාශ කරමින් මට අවස්ථාව ලබා දුන් ඔබතුමාට මගේ ස්තුතිය සහ ප්‍රණාමය පුද කරනවා.

අපේ සභානායකතුමා මොකක්දෝ කියනවා. මොකක්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමාට අවශ්‍ය නම් ආණ්ඩු පක්ෂයේ කාලයෙන් විනාඩි දෙකක් දෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපි අවශ්‍ය වෙලාවට ඉල්ලා ගන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අද අපේ සභානායකතුමා බොහොම හොඳයි. බොහොම ස්තුතියි, මට විනාඩි දෙකක් දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.12]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ඉදිරිපත් කළා, විවිධ අණපනත් යටතේ නියෝග, නියම දෙකක් සහ යෝජනා සම්මතයක්. ඒ අතරින් මම පළමුකොටම අදහස් දක්වන්න කැමැතියි, 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ ගෙනෙන ලද නියෝගවලට අදාළ කරුණු රටේ ආර්ථිකයට මොන ආකාරයෙන්ද වැදගත් වන්නේ කියන කාරණා ගැන.

විශේෂයෙන්ම ලෝකයේ දියුණුවත් එක්ක මූල්‍ය ගනුදෙනු ඇතුළු විවිධ ගනුදෙනුවලදී, අපේ සියලු ක්‍රියාකාරකම්වලදී, නිෂ්පාදන ක්‍රියාවලියේදී වැනි හැම තැනකදීම තාක්ෂණය ක්‍රියාත්මක වෙනවා. හැබැයි අනෙක් පැත්තෙන් ලෝකය පුරාම වංචාව, දූෂණය හරහා විවිධ ආකාරයට උපයාගත්තු ධනය එක් ස්ථානයක ඉඳලා තව ස්ථානයකට මාරු කිරීමටත් මේ තාක්ෂණය යොදාගන්නවා. ඒ නිසා මේ මුදල් විශුද්ධිකරණය කියන කාරණය ප්‍රබල අනතුරක්, මේ ලෝකයේ තිබෙන යහපත් ගනුදෙනුවලට,

වෙළෙඳාමට සහ යහ පැවැත්මට. මේ තත්ත්වය වළක්වා ගැනීම සඳහා 1989දී ලෝක තත්ත්වයෙන් මූල්‍ය කාර්ය සාධක බලකායක් - Financial Action Task Force එකක් - ස්ථාපිත කර තිබෙනවා. අපිත් දැන් එහි සාමාජිකත්වය ලබාගෙන කටයුතු කරනවා. විශේෂයෙන්ම ඔවුන් නිර්දේශ 40ක් ඉදිරිපත් කරනවා, මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම කියන කාරණා අවම කරගන්නේ කොහොමද, එහෙම නැත්නම් ඉවත් කරගන්නේ කොහොමද කියලා. එහිදී ප්‍රධාන වශයෙන් ප්‍රතිපත්ති කරුණු දෙකක් ඉදිරිපත් කරනවා. ඒ වාගේම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට සහ රහස්‍යභාවය සහතික කිරීමට අදාළ තවත් කාරණා දෙකක් තිබෙනවා. ඒ වාගේම, ත්‍රස්තවාදය මූල්‍යනය කිරීම සම්බන්ධ නිර්දේශ 3ක් තිබෙනවා. ඒ වාගේම, මෙවැනි විශුද්ධිකරණ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වළක්වා ගැනීමේ ක්‍රම 9 සිට 23 දක්වා නිර්දේශවල තිබෙනවා.

ඒ වාගේම මේ මුදල් ගනුදෙනු සහ වටිනාකම් පැවරීමේදී එහි පාරදෘශ්‍යභාවය වාගේම, ඒ ගනුදෙනුව කවුද කරන්නේ, කාටද අවසානයේදී ළඟා වෙන්නේ කියන කරුණුත් බලන්න ඕනෑ. ඒ සඳහා අපි තවත් අණපනත් සම්බන්ධ කරලා මාසයකට විතර උඩදී beneficial ownership සම්බන්ධයෙන් මේ පනත් කෙටුම්පතට අදාළ සංශෝධන ඉදිරිපත් කළා. ඒ වාගේම තවත් අංශයක් තිබෙනවා, බලයලත් අධිකාරිය නමින්. ඒ කටයුතු නියාමනය කරන අධිකාරියට අදාළ නිර්දේශත්, ජාත්‍යන්තර සහයෝගිතාව ලබා ගැනීමේ නිර්දේශත් එතැන තිබෙනවා. මේවා තමයි Financial Action Task Force එකේ තිබෙන කාරණා.

විශේෂයෙන්ම එහි 14වැනි නිර්දේශය ඉතාම වැදගත් වෙනවා. තව රටක ඉඳලා මේ රටට මුදල් මාරු කිරීම් අපි සාමාන්‍යයෙන් දන්න විවිධ නම්වලින් තිබෙන MoneyGram, Western Union, වෙනත් මාර්ග පාවිච්චි කරමින් සිද්ධ වෙනවා. විවිධ ආකාරයට මුදල් හෝ වටිනාකම් මාරු කිරීමේ සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම හෝ ඔවුන්ට බලපත්‍ර ලබා දීම සහතික කිරීම තමයි ඒ 14වැනි නිර්දේශයෙන් අපේ බලයලත් අධිකාරියට පැවරෙන වගකීම. මේ කාරණය අපි නිශ්චිතව කරලා නැති නිසා රට ඇතුළේ මේ විධියට මුදල් හෝ වටිනාකම් හුවමාරු කිරීමට සම්බන්ධ වෙන සේවා සපයන්නන් නියාමනය කරන්න අපට බැරි වෙනවා. ඒ නිසා අපි මේ ගැසට් නිවේදනය මඟින් සිදු කරන්නේ ඔවුන් මේ යන්ත්‍රණයට තව තව අද්දවා ගැනීම සහ ඒ නියාමනය වැඩි දියුණු කිරීමේ කාර්යයයි.

ඒත් එක්කම, ඒකට පදනම් වෙන තවත් කාරණයක් තිබෙනවා. අපි 2026 ඔක්තෝබර් මාසයේදී මුහුණ දෙනවා, mutual evaluation එකට. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම කියන කාරණය ගැන සාමාන්‍යයෙන් වසර 10කට වරක් ඒ ඒ රටවලට ඇවිල්ලා පරීක්ෂා කරලා බලනවා, අපි ගත්තු ක්‍රියා මාර්ග, නීතිමය රාමුව, ආයතන ව්‍යුහය ඇතුළු අදාළ කටයුතු නිවැරදිව කරලා තිබෙනවාද කියලා. ඒක පළමු වරට 2007දී සිදු කරලා තිබෙනවා. ඊට පස්සේ 2017දී ඒ වාගේ වර්ගීකරණයක් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අවස්ථා දෙකේදීම සිදු වෙලා තිබෙන්නේ අපේ රටේ ප්‍රමාණවත් නීති රීති පද්ධතිය, ඒ ව්‍යුහය නොමැති වීම නිසා අප grey list එකට වැටුණු එක. Grey list එක කියන්නේ ඉතාම අධික අවදානම් සහිත කලාපයක් කියන එක. ඒ තුළ මේ මුදල් ගනුදෙනු හරහා මුදල් විශුද්ධිකරණය කිරීමට පහසු ඉඩකඩක් නිර්මාණය වෙනවා. ඒ නිසා තුන්වැනි අවස්ථාවේදී සිදු කරන mutual evaluation එකේදී අපට විශාල වගකීමක් තිබෙනවා, grey list එකට වැටෙන්නේ නැතිව, මේ රට ඇතුළේ මුදල් සහ වටිනාකම් පැවරීමේ කාර්යයන් සිද්ධ කිරීමේදී අපි නිසි ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා, ඒ සඳහා මැදිහත් වෙනවා කියන කාරණය පෙන්වීමට. අපේ තුන්වැනි evaluation එක මේ ඔක්තෝබර් මාසයේ 26වැනි දා ඉඳලා නොවැම්බර් 6වැනි දා වෙනකන් තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ ඉදිරිපත් කරන සංශෝධනත් සමඟින් අපි grey list එකට වැටෙන්නේ නැතිව හොඳ මට්ටමක් අත්පත් කරගන්න. ඒක අපට ඉතාම වැදගත් වෙනවා. අපි මේ යන අභියෝගාත්මක ගමනේදී රට ඇතුළට වෙළඳාම සහ ආයෝජනය කැන්දා ගෙන එනකොට විදේශ ආයෝජකයන්ගේ වාගේම ඕනෑම ආකාරයක ක්ෂේත්‍රයක විශ්වාසය ඉතාම වැදගත් වෙනවා. ඒ වාගේම තමයි රටේ වර්ගීකරණය. මූල්‍ය ගනුදෙනු කිරීම සඳහා, ආයෝජන කිරීම සඳහා, වෙළඳාම සඳහා මේ රට සුරක්ෂිතද, ඒ සුරක්ෂිතභාවය පිළිබඳ gradings ඉහළ යැමටත් මේක උපකාර වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ අර්ථයෙන් ගත්තාම මේ ඉදිරිපත් කරන ගැසට් නිවේදනයේ ඇති කාරණා ඉතාම වැදගත්. අපි බලාපොරොත්තු වෙනවා, ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක අනුකූලතාව - compliance - වැඩි දියුණු කර ගැනීමට.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ මෙහෙයුමේ නිරත වන විදේශ මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවා සපයන්නන්ට ලියාපදිංචි වීම සඳහා වූ ඉඩ ප්‍රස්තාව ලබා දෙනවා. ඊළඟට, පිටරටක තිබෙන සමාගමක නියෝජිතයෙකුට නම් ඒ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය මූල්‍ය අවශ්‍යතාව ලෙස දැනට තිබෙන රුපියල් මිලියන 20 සීමාව අපි රුපියල් මිලියන 15 දක්වා අඩු කරනවා, එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට දේශීය මුදල් මාරු කරනවා නම්. විදේශීය මුදල්, ඩොලර් ඇතුළු වෙනත් විදේශීය මුදල් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට මාරු කරනවා නම් ඒ සඳහා අවශ්‍ය මූලික මුදල ඩොලර් ලක්ෂ දෙකක් ලෙස අලුත් කොටසක් මෙතැනට එකතු කරනවා. ඒ, ප්‍රාග්ධන අවශ්‍යතාව.

ඊළඟට, මේ ලියාපදිංචි කිරීම අලුත් කිරීම වසර තුනකට වරක් සිදු කළ යුතුව තිබුණා. අපි ඒ කොටස ඉවත් කරලා, ලියාපදිංචි කිරීමේ කාලසීමාව පිළිබඳ දින වකවානු ඉදිරිපත් කරලා තිබෙනවා. ඇත්ත වශයෙන් ජාත්‍යන්තර ගනුදෙනු සිද්ධ කරනකොට අපට මුදල් හුවමාරු කරන්න සිද්ධ වෙනවා. මේ ලිහිල් කිරීම හරහා නීති විරෝධී ක්‍රමවලින්, අයථා මාර්ගවලින් තොරව, නීත්‍යනුකූල මාර්ගය හරහා ඒ කටයුත්ත කිරීමට අනුබල දීමට සහ අනුකූලතාව දැක්වීමට අපි බලාපොරොත්තු වෙනවා.

අපට මෑතකදී යම් සිද්ධියක් වාර්තා වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ මහජන ආරක්ෂක ඇමතිතුමාත් ඒ ගැන පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කළා. මත්ද්‍රව්‍ය උවදුරට අපරාධවලට විරුද්ධව, දූෂණවලට විරුද්ධව ගෙන යන ක්‍රියාමාර්ගවලදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරින් සිදුකළ කටයුතුවල ප්‍රතිඵලයක් විධියට ලැබුණු තොරතුරු මත අත්අඩංගුවට ගත් පුද්ගලයන් සතුව තිබුණු විශාල මුදල් ප්‍රමාණය ගැන දිගටම පරීක්ෂණ කරමින් ගියාට පස්සේ අපට සොයාගන්න පුළුවන් වුණා, අවුරුදු දෙකක් වාගේ කාලයක් ඇතුළත ඩොලර් විශාල ප්‍රමාණයක් රටින් පිටමං කර තිබෙනවා කියලා. පළමුවැනි කාරණය, වංචා, දූෂණ සිදුකිරීමේදී රට ඇතුළේ අසාධාරණයක් සිද්ධ වෙනවා. දූෂණයකදී යම් කුඩා පාර්ශ්වයක් අයථා විධියට ධනය ගොඩගසා ගන්නවා. මේ අසාධාරණය තව දෙගුණ තෙගුණ වෙනවා, එහෙම උපයා ගන්නා ධනය විදේශ විනිමය විධියට රටින් පිටමං කළවිට. මේ පරීක්ෂණවලින් සොයාගෙන තිබුණා, ඩොලර් බිලියනයකට වැඩි ප්‍රමාණයක් රටින් පිටමං කරලා කියලා. ඒවා වළක්වා ගැනීම සඳහා අපි දැන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා.

ඒ වාගේම අපි ක්ෂණික ක්‍රියාමාර්ගයක් ගත්තා. මේ රටින් මුදල් පිටමං කිරීමට තිබෙන නීති විරෝධී ක්‍රමවලට අමතරව මේ ඩොලර් බිලියනය රටින් එළියට ගෙනිහිල්ලා තිබුණේ සාමාන්‍යයෙන් අපි ආනයනය කරන්න භාවිත කරන නීතිමය රාමුව ඇතුළේමයි. ඒ එහි තිබුණු යම්, යම් අඩුපාඩු ප්‍රයෝජනයට

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ගනිමින්. ඒ නිසා අපි ක්‍රියාමාර්ගයක් ගත්තා. දැන් අලුතින් භාණ්ඩ ආනයනය කරනකොට LCs විවෘත කිරීමට හෝ TT advance payment සිදු කිරීමට ඔහු ලියාපදිංචි ආනයනකරුවෙක් කියලා රේගුවෙන් ලැබෙන සහතිකය ඒ බැංකුවට අවශ්‍ය කරනවා. අපි ඒ නීතිය ඉක්මනින්ම ක්‍රියාත්මක කළා. ඒ නීතිය ක්‍රියාත්මක කරපු ගමන් පුංචි ප්‍රශ්නයක් පැන නැඟුණා. ආනයනකරුවන් විශාල ප්‍රමාණයක් රේගු දෙපාර්තමේන්තුවට එන්න පටන් ගත්තා. අපි ඒකත් දවස් කිහිපයක් ඇතුළත විසඳුවා. කොහොමද විසඳුවේ? දැනට ලියාපදිංචි ආනයනකරුවන් 18,000ක් විතර ඉන්නවා. එයින් ක්‍රියාකාරී ආනයනකරුවන් 8,000ක්, 9,000ක් වාගේ ප්‍රමාණයක් ඉන්නවා. ඒ සහතිකය අරගෙන බැංකුවට යනවා වෙනුවට, රේගු දෙපාර්තමේන්තුව වේගයෙන් බැංකු පද්ධතියේ බැංකු 25ක් එක්ක සාකච්ඡා කරලා ඔවුන්ගේ දත්ත පද්ධතිය හුවමාරු කරගත්තා, බැංකු පද්ධතියත් එක්ක. ඒ නිසා දැනට ලියාපදිංචි වෙලා සිටින ආනයනකරුවන් සැබෑ ලෙසම නීත්‍යානුකූල ආනයනයක නිතර වෙලා තිබෙනවා. ඔවුන්ට ගැටලුවකින් තොරව ආනයන කටයුතු කරගන්න පුළුවන්. හැබැයි අලුත් ආනයනකරුවෙක් එනවා නම්, ඔහුට ලියාපදිංචි කටයුත්ත කරන්න සිද්ධ වෙනවා. දිනකට සාමාන්‍යයෙන් 30, 40, 100 දක්වා වාගේ ලියා පදිංචිය සඳහා එනවා. රේගු දෙපාර්තමේන්තුව අවශ්‍ය කටයුතු යොදාගෙන තිබෙනවා, දවසක් දෙකක් ඇතුළත ඔවුන්ගේ ලියාපදිංචි කිරීමේ කටයුතු කරලා දෙන්න. ඒ නිසා එය හොඳ තත්ත්වයක් විධියට දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට මාසයකට විතර උඩදී මෙවැනි තත්ත්වයන් නිර්මාණය වූ අවස්ථාවේ රට ඇතුළේ අවිනිශ්චිතතාවක් නිර්මාණය කරන්න විවිධ වූ බලවේග උත්සාහ කළ බව ඔබතුමාට මතක ඇති. එහි එක් අවස්ථාවක් තමයි ඩොලරයට සාපේක්ෂව රුපියල අසාමාන්‍ය ලෙස අවප්‍රමාණය වෙමින් ආර්ථික අර්බුදයක් දක්වා වර්ධනය වෙනවා කියලා රට ඇතුළේ විශාල ගැටලුවක් නිර්මාණය කරන්න උත්සාහ දැරීම. අපි ගත්ත උචිත ක්‍රියාමාර්ග හරහා එය පාලනය කරගන්න පුළුවන්කම ලැබුණා. මම ඒ කාරණය සඳහන් කරන්නේ රුපියල අවප්‍රමාණය වීම, ඩොලර් රටින් පිටමං කිරීම, ඩොලරයට තිබෙන ඉල්ලුම වැඩි වීම කියන කාරණා එකකට එකක් ගැට ගැහිලා තිබෙන නිසායි. මෙවැනි තත්ත්ව ඇතුළේ දූෂණය, නැත්නම් මුදල් විශුද්ධිකරණය වැනි කාරණා තනි, තනිව නොවෙයි, ඒවා ජාලයක් විධියට තමයි සිද්ධ වෙන්නේ කියන එක අපට පෙනෙනවා. දූෂණය සිද්ධ වෙන විධියට, අපරාධ සිද්ධ වෙන විධියට - ජාලගත ක්‍රමවේදයට - තමයි මුදල් විශුද්ධිකරණය සිද්ධ වෙන්නෙත් කියන කාරණය පැහැදිලි වෙනවා. ඒ නිසා මෙම ගැසට් නිවේදනය මඟින් ඉදිරිපත් කර තිබෙන කාරණා රටේ ආර්ථික ක්‍රියාවලියට ඉතාම වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අද විවාදයට ගන්නා අනෙක් යෝජනාව ගැන කරුණු දක්වන්න මම කැමතියි. රටක් ආර්ථික වශයෙන් දියුණු වෙනකොට, අපි අත්පත් කරගත් ස්ථාවරත්වයෙන් ඔබ්බට යනකොට ආයෝජන අවශ්‍ය වෙනවා. වෙළෙඳාම වැඩි කරන්න අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම විදේශීය වෙළෙඳාම. විදේශීය වෙළෙඳාමේ පංගුව ගැනත් මෙහිදී සඳහන් කළ යුතුයි. අපේ රටේ මිනිසුන්ගේ අවශ්‍යතා සඳහා අපි රට තුළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කර ගන්නවා. ඒ කියන්නේ භාණ්ඩ හා සේවා පරිභෝජනය සඳහා. අද වනවිට අපි ලෝකයත් එක්ක ගැට ගැසී තිබෙනවා. ඒ නිසා අපේ රටේ අවශ්‍යතාව සඳහා නිෂ්පාදන කටයුතු සිදුකර ගන්නවා වාගේම අපේ රටට භාණ්ඩ ආනයනය කර ගැනීමේ අවශ්‍යතාව සඳහාත්, ලෝකයත් එක්ක ගනුදෙනු කිරීමේ අවශ්‍යතාව සඳහාත් අවශ්‍ය වන අපේ විදේශ විනිමය වැඩි කර ගැනීමට අපනයනය වැඩි කර ගැනීමේ අවශ්‍යතාවකුත් තිබෙනවා. ඒක ප්‍රවණතාවක් විධියටත් පෙනෙනවා. ඒ අනුව ලෝක නිෂ්පාදනයේ ප්‍රතිශතයක් විධියට ගත්තාම, ක්‍රමිකව ලෝක වෙළෙඳ පොළේ අපේ රටට තිබෙන පංගුවත් වර්ධනය වෙමින් එනවා. ඒ අනුව මැතක් වෙනකොට අපේ සමස්ත ධනයෙන් සියයට 57ක් විතර ලෝක වෙළෙඳාමට උරුමකම් කිව්වා. අපිට අභියෝග ජයග්‍රහණය කරන්න නම්, දුප්පත්කම තුරන් කරන්න නම්, ඒ වාගේම මිනිස්සුන්ට සැපවත් ජීවිතයක් ලබා දෙන්න නම් ඒ සඳහා වන පරිවර්තනයේදී ඉතාම වැදගත් වෙන ක්ෂේත්‍රයක් තමයි අපනයනය වර්ධනය කර ගැනීම; විදේශ වෙළෙඳ පංගුව වැඩිදියුණු කර ගැනීම. අද අපි ඒ සඳහා වූ සංශෝධන දෙකක් ඉදිරිපත් කරනවා.

අපි දන්නවා, ජාත්‍යන්තර වෙළෙඳාම සිදු වෙනකොට, එක රටකින් තව රටකට යනකොට රේගු බදු, cross-border tariff පනවන බව. මේ රේගු බදු විවිධ ආකාරයෙන් පනවන්න පුළුවන්. ඒ කියන්නේ තරගකාරිත්වයට හානි වන විධියට, තවත් රටවල් එක්ක ගැටුම් ඇති වන විධියට එය නිර්මාණය වෙලා තිබෙන්න පුළුවන්. එවැනි තත්ත්වයක් ලෝකයේ දකින්නත් පුළුවන්. හැබැයි, අපේ උපක්‍රමය, අපේ වැඩ පිළිවෙළ වන්නේ ලෝකය පිළිගත්, තරගකාරිත්වයට ඉඩ සලසන, ඒ වාගේම අපේ රට ඇතුළේ කර්මාන්ත දියුණු කරන ආකාරයට මෙන්න මේ වෙළෙඳ ප්‍රතිපත්ති සකස් කර ගැනීමයි. ඒ අනුව විශේෂයෙන්ම ආනයනයේදී භාණ්ඩ ප්‍රධාන කාණ්ඩ තුනකට වර්ගීකරණය වෙනවා. ඒ, ප්‍රාග්ධන භාණ්ඩ, අතරමැදි භාණ්ඩ සහ පරිභෝජන භාණ්ඩ වශයෙන්. මේ භාණ්ඩ සඳහා යොදා ගත් තීරු බදු විවිධ ආකාරයෙන් පැනවී තිබුණා. සමහර ඒවා 0, 15, 20, 30 වශයෙනුත්, සමහර ඒවා මිශ්‍ර අනුපාත වශයෙනුත් විවිධ ආකාරයට බදු පැනවී තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සංශෝධනය මඟින් සිද්ධ කරන්නේ භාණ්ඩ ආනයනය සඳහා වූ ඒ ක්‍රමවේදය තර්කනයකට; උසස් ප්‍රමිතියකට අනුව ගෙනැවිත් ඒ අනුව ප්‍රාග්ධන භාණ්ඩ සඳහා සියයට බින්දුව හෝ 10 වශයෙන්, අතරමැදි භාණ්ඩ සඳහා සියයට බින්දුව හෝ 10 වශයෙන් සහ පරිභෝජන භාණ්ඩවලට සියයට 20 හෝ 30 වශයෙන් මේ ප්‍රතිපත්ති වැඩි කිරීමයි. ආර්ථිකයට මෙයින් තිබෙන වැදගත්කම මොකක්ද? විශේෂයෙන්ම ප්‍රාග්ධන භාණ්ඩත්, පරිභෝජන භාණ්ඩත් අතර අනුපාතය, - ප්‍රාග්ධන භාණ්ඩ වැඩි කර ගැනීමට, අතරමැදි භාණ්ඩ වැඩි කර ගැනීමට යන ගමන තමයි මේ තිබෙන්නේ; දේශීය නිෂ්පාදනයට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය ගෙන්වා ගැනීමේ ගමන තමයි මෙතැන සිදු වන්නේ. ඒ අනුව ප්‍රාග්ධන භාණ්ඩ වැඩි වුණොත් අනාගතයේදී ඒ රටේ ආර්ථික වෘද්ධිය වැඩි වෙනවා. අන්න ඒ දිශාවට යන ඉතාම වැදගත් සංශෝධනයක් තමයි අපි මේ ඉදිරිපත් කරන්නේ.

අපේ අපනයන ආදායම වර්ධනය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව අපට ලබා දෙන සහාය ඉතාම වැදගත් වෙනවා. රේගුවේ කටයුතුවලට මිනිසුන් සම්බන්ධ කරන්නේ නැතුව තාක්ෂණය වැඩිදියුණු කර, තාක්ෂණයෙන් අවදානම් කළමනාකරණය සහිතව නිදහස් කිරීම් කරන්න මෑත කාලීනව ඔවුන් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම ඒක පෙන්නුම් කරමින් තිබෙනවා. දැනටමත් රේගු දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත ආදායම් ප්‍රමාණයට වඩා - සෑම දිනකම, සෑම මාසයකම අඛණ්ඩව මෙහෙයුම් සිදු කර - ආදායමක් එකතු කර තිබෙනවා. ඒ අනුව සමස්ත ආදායම් එකතු කිරීම ගත්තාම ජූනි මාසයේ 06වැනි දා වෙනකොට අපේක්ෂිත ආදායමෙන් - සමස්තයක් වශයෙන් ගත්තත් - සියයට 57.6ක් ලබා ගැනීමට අපට පුළුවන්කම ලැබී තිබෙනවා. තවම අවුරුද්දෙන් භාගයයි ගත වුණේ. ඒ අනුව අවුරුද්දෙන් භාගයක් ගත වෙද්දී, සියයට 50 ඉක්ම වූ ආදායමක් අපි ලබා ගෙන තිබෙනවා. ඒ අනුව අපේ ආදායම් ඒකාග්‍රකරණය - එකතු කිරීම - ඉතා ඉහළ මට්ටමක තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මේ ඉලක්ක ඇතුළත අද ගෙනෙන සංශෝධන තුළින් ඊළඟට යොමු වන්නේ අපනයන ප්‍රවර්ධනයටයි. මීට පෙර යම් නිශ්චිත අපනයන ප්‍රමාණයක්, නිශ්චිත වෙළෙඳ පොළක් කෙරෙහි තිබුණු තත්ත්වය වෙනස් කරමින් අපි අපනයන විවිධාංගීකරණය ඇතුළත් කරන ලද ජාතික සැලැස්මක් ඉදිරිපත් කර තිබෙනවා. අපි 2026-2030 ජාතික අපනයන සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කළා. අපි ඩොලර් බිලියන 36ක ඉලක්කයක් ළඟා කර ගන්නේ කොහොමද කියන කාරණා එහි සඳහන් කර තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ආදායම් සුරක්ෂිත කිරීම, රේගු බදු, ඒ වාගේම මුදල් සහ වටිනාකම් හුවමාරු කිරීම් සම්බන්ධයෙන් අද දින ඉදිරිපත් කරන ලද මෙම යෝජනා රටේ ආර්ථික වර්ධනය සඳහා සහ විදේශීය වෙළෙඳාම වර්ධනය කර ගැනීම සඳහා මහත් සේ පිටුවහලක් වන බව සඳහන් කරමින්, ඒ සඳහා සියලු දෙනාගේම සහයෝගයත් අපේක්ෂා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රේගු ආඥාපනත: යෝජනා සම්මතය
## சுங்கக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## CUSTOMS ORDINANCE: RESOLUTION

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධව 2026.06.24 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2026 මාර්තු 03 දිනැති අංක 2478/03 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මෝටර් වාහන පනත: නියෝග
## மோட்டார் வாகனச் சட்டம்: ஒழுங்குவிதிகள்
## MOTOR TRAFFIC ACT: REGULATIONS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 141, 143, 144, 157අ, 168 සහ 190 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මාර්තු 19 දිනැති අංක 2480/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත: නියමය
## இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்: கட்டளை
## SRI LANKA EXPORT DEVELOPMENT ACT: ORDER

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ ද එකඟතාව ඇතිව, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 03 දිනැති අංක 2478/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලමූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ අය කළ යුතු සහ ගෙවිය යුතු සෙස් බදු අනුප්‍රමාණයන් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ ද එකඟතාව ඇතිව, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 10 දිනැති අංක 2479/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4 සහ 5 යථා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

## විදෙස්ගත ශ්‍රමිකයින් මුහුණ දෙන ගැටලු
## புலம்பெயர் தொழிலாளர்கள் எதிர்கொள்ளும் பிரச்சினைகள்
## ISSUES FACED BY MIGRANT WORKERS

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "රටේ ආර්ථිකයට ශක්තියක් සපයන විදෙස්ගත ශ්‍රමිකයින් මේ වන විට විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් ඇති බවට තොරතුරු වාර්තා වේ. දැනට ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් මිලියන 1.7ක් පමණ විදේශයන්හි සේවය කරන අතර, වාර්ෂිකව සාමාන්‍යයෙන් ශ්‍රී ලාංකිකයින් ලක්ෂ 2.5-3 අතර සංඛ්‍යාවක් අලුතින් විදේශ රැකියා සඳහා යොමුවීම සිදු වේ.
>
> පසුගිය වසර තුළ පමණක් විදෙස්ගත ශ්‍රමිකයින්ගෙන් ලැබුණු විදේශ ප්‍රේෂණවල වටිනාකම ඩොලර් බිලියන 8 ඉක්මවා ඇත.
>
> එවන් පසුබිමක ඔවුන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීමටත්, ඔවුන් මුහුණ දෙන ගැටලු අවම කිරීමටත් පහත සඳහන් කරුණු පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරමි.
>
> 1. ශ්‍රමිකයින් විදේශගතවීමේදී නීත්‍යනුකූල නොවන ඒජන්සි හෝ අතරමැදියන් හරහා විදේශගතවීම හා රැකියා නොලැබීමේ දුෂ්කරතාවන්ට ලක්වීම.
> 2. පොරොන්දු වැටුප් නොලැබීම, සේවා කාලය ඉක්මවා වැඩ ගැනීම හා ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය වීම.
> 3. සේව්‍යයන් අතින් කාන්තාවන් කායික, මානසික හිංසනයන්ට මෙන්ම අපයෝජනයට ලක්වීම.
> 4. සේවයේ නියුතු වන රටවල භාෂාවන් හා සංස්කෘතීන් පිළිබඳව අවබෝධය අඩුවීම හා එම රටවල නීති පද්ධති පිළිබඳ අවබෝධය නොමැතිවීම මත අනවශ්‍ය ලෙස බන්ධනාගාරගතවීම.
> 5. මෙවැනි අවස්ථාවල තානාපති සේවාවන්හි සහනය ප්‍රමාදවීම හෝ ප්‍රමාණවත් නොවීම හා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා සබඳතා නොමැති රටවල රාජ්‍ය තාන්ත්‍රික සබඳතාව පුළුල් කිරීමට කටයුතු කිරීම.
>
> මෙමඟින් ශ්‍රී ලාංකික විදේශගත ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, සුබසාධනය නඟාසිටුවීමටත්, ඔවුන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු බවට මේ ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ වෙලාවේ මා මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ රටින් විදේශගත වූ ශ්‍රී ලාංකිකයින් අද කරන්නේ විශේෂ කාර්යයක්. ඒ කාර්යය අපි මුදල්මය වශයෙන්, වටිනාකම වශයෙන් ගණනය කළාට, ඊට එහා ගිය සම්පත් ගොඩක් රටට ඒක රාශි කර ගන්න වැදගත් වනවා. ඒ කියන්නේ, විදේශගත ශ්‍රී ලාංකිකයින් රැකියාව කරලා ලංකාවට මුදල් එවන කටයුත්ත පමණක් නොවෙයි සිද්ධ වන්නේ. ඒ ඒ රටවල් එක්ක ඇති වන සම්බන්ධතාව, ඒ සහෝදරත්වය, ඒ බැඳීම සහ ඒ රටවලින් ගන්නා පළපුරුද්ද පවා මෙහිදී වැදගත් වනවා. ඒ වාගේම ඒ සම්බන්ධතාව මත සංචාරක ව්‍යාපාරයට වෙන්න පුළුවන්, ආයෝජන ක්‍රියාවලියට වෙන්න පුළුවන්, අධ්‍යාපනය පැත්තෙන් වෙන්න පුළුවන්, සෞඛ්‍ය පැත්තෙන් වෙන්න පුළුවන්, සහනාධාර පැත්තෙන් වෙන්න පුළුවන්, මේ ආකාරයෙන් විශේෂිත වූ කාර්යයන් රාශියක් ඒක රාශි වන අවස්ථා මේ විදේශ රටවල සේවය කරන අපේ සහෝදර සහෝදරියන්ගෙන් ලැබෙනවා. එහිදී ඒ රටවලින් ගන්නා පළපුරුද්ද මත නැවත ශ්‍රී ලංකාවට ඇවිල්ලා ඒ අය ආයෝජනය කරද්දී, ඒ ආයෝජන වැඩසටහනේ එක් කාර්යයක් තමයි දැනුම ඒක රාශි කර ගැනීම. ඊළඟට, මුදල් ඒක රාශි කර ගැනීම. ඒ වාගේම සම්බන්ධතා ගොඩනඟාගැනීම. ඊළඟට, විදේශ වෙළෙඳ පොළ හඳුනා ගෙන ලංකාවට පැමිණීම. මේ කරුණු කාරණා සියල්ලම මේකට එකතු වනවා. හැබැයි, අපි කොයි ස්ථානයද විදේශගත ශ්‍රී ලාංකිකයාට ලබා දීලා තිබෙන්නේ, කොයි විධියටද තානාපති කාර්යාල විදේශගත ශ්‍රී ලාංකිකයා වෙනුවෙන් වැඩ කටයුතු කරන්නේ, වගකීම් හරියට ඉෂ්ට කරනවාද, නැද්ද, කොතරම් අඩුපාඩු තිබෙනවාද කියන එක බලන්න ඕනෑ.

ඊළඟට, විදේශගත ශ්‍රී ලාංකිකයා ඒ රටේ ගිහිල්ලා රැකියාව කරද්දී, - ව්‍යාපාරයක් වෙන්න පුළුවන්, තවත් කටයුත්තක් වෙන්න පුළුවන් ඒක කරද්දී - ඒ අයගේ පවුලේ අයට ලැබෙන අවස්ථා මොනවාද? ඒ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා, ඒ පවුලේ සෞඛ්‍ය කටයුතු සඳහා, සුබසාධන කටයුතු සඳහා කොතෙක්දුරට රජය මඟින්, ආණ්ඩුව මඟින් සහයෝගයක් ලබා දෙනවාද? සමාජය විසින් සහයෝගයක් ලබා දෙනවාද?

දැන් අපේ රටේ කුඩු ඇතුළු මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. මේ ප්‍රශ්නයට බිලිවෙච්ච විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ දරුවෝ විශාල ප්‍රමාණයක් ඉන්නවා. හැබැයි, ඒ වෙනුවෙන් අපි වෙනම වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද? ඊළඟට, විශේෂයෙන්ම අධ්‍යාපන කටයුතු ගැනත් අපි බලන්න ඕනෑ. තමන්ගේ දෙමව්පියන් නැතිව ගියාම දරුවෝ බොහෝ වෙලාවට අයාලෙ යන තැන් තිබෙනවා. ඒවා නිවැරදි කරන්න අපි වැඩ පිළිවෙළක් හරියට සකස් කර තිබෙනවාද? මේ කටයුතු සියල්ලම මේකට එකතු වනවා. එම නිසා අපි කියන්නේ, නිවැරදි ක්‍රමවේද තවදුරටත් සකස් විය යුතුයි කියලායි. ඒ වාගේම එය සැලසුම් සහගත විය යුතුයි.

මේ අවස්ථාවේදී මම තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. විදේශගත ශ්‍රී ලාංකිකයින් ගත්තාම මම ගොඩක් සමීප වනවා, ඉතාලියට. අපේ ප්‍රදේශයේ ශ්‍රී ලාංකිකයින් බොහෝදෙනෙක් ඉතාලියේ ඉන්නවා. ශ්‍රී ලාංකිකයින් බොහෝ කාලයක් තිස්සේ ඉතාලියට ගිහින් ඉන්නවා. සමහර වෙලාවට අවුරුදු 40, 35, 25 ආදී වශයෙන් අවුරුදු ගණනාවක් තිස්සේ ඉතාලියේ ඉන්න පිරිසකුත් ඉන්නවා. ඒ වාගේම ඉතාලියට අලුතින් ගිය අයත් ඉන්නවා. ඒ වාගේම ඒ රටට ගිහිල්ලා වීසා නැති අයත් ඉන්නවා,

වීසා තිබෙන අයත් ඉන්නවා. මේ විධියට අපේ රටේ ශ්‍රී ලාංකිකයින් නානාප්‍රකාර විධියට ඒ රටේ රැඳිලා ඉන්නවා. හැබැයි, ඒ හැම කෙනෙක්ම විශාල මුදලක් මේ රටට විදේශ විනිමය හැටියට එවනවා.

දැනට ඒ රටේ refugees හැටියටත් යම් යම් පිරිස් සිටිනවා. ඕනෑම රටක කවුරු හරි ශ්‍රී ලාංකිකයෙක් ඉන්නවා නම්, ඒ කෙනා ශ්‍රී ලාංකිකයෙක් කියලා හඳුනාගන්න හැඳුනුම්පත හෝ මොකක් හරි තිබෙනවා නම්, ඒ කෙනාට ඒ තානාපති කාර්යාලයෙන් සේවා සැපයිය යුතුමයි. ඒ සම්බන්ධයෙන් තානාපති කාර්යාල වගකිව යුතුයි. ඉතාලියේ refugee තත්ත්වයේ ඉන්න ශ්‍රී ලාංකිකයින්ට මේ වනකොට තානාපති කාර්යාලයෙන් කිසිදු දෙයක් සම්පාදනය කරන්නේ නැහැ, කිසිම සහයෝගයක් දෙන්නේ නැහැ, පහසුකම් සපයන්නේ නැහැ කියලා අපි දන්නවා. ඒකට හේතුව තමයි, අපේ අමාත්‍යාංශයෙන් නිකුත් කර තිබෙන චක්‍රලේඛ. නැත්නම් විශේෂයෙන්ම තානාපති කාර්යාල ඒවා නොකර ඉන්න සූදානම් නැහැ. ඒගොල්ලන් ඒවා කරන්න සූදානම්. නමුත් දැන් ඒ අය කිසිදු ලියවිල්ලක් සහතික කර දෙන්නේවත් නැහැ. සමහර වෙලාවට ඒ රටේ අධිකරණයෙන් ලබා දෙන තීන්දු මත ඒ අයට පාස්පෝට් එකක් නැත්නම් පාස්පෝට් එකක් ගන්න කියලා අවස්ථාව ලබා දෙන කොට ඒ පාස්පෝට් එක අපි ලබා දෙන්නේ නැහැ. ඒ ශ්‍රී ලාංකිකයින් අපේ රටින් වෙනත් රටකට ගිහිල්ලා තවදුරටත් කොහේ හරි වැඩ කරලා අපේ රටට මුදල් එවනවා. මේ රටේ අපි ඒ මුදල් ටික නම් අරගන්නවා. හැබැයි, ඔවුන්ට සපයන්න ඕනෑ සේවාව අපි සපයන්නේ නැහැ. ඒ අය සමහර වෙලාවට අනාථ වනවා, ප්‍රශ්න ගොඩක ඉන්නවා. සමහර අයට තමන්ගේ දරුවන්ගේ ප්‍රශ්නයකටවත් ලංකාවට එන්න බැහැ. ඒක වෙන කථාවක්. හැබැයි, තාත්තා කෙනෙක්, අම්මා කෙනෙක් හැටියට දරුවාට අවශ්‍ය කරන ලියවිල්ලක්වත් සපයන්න බැහැ, අවශ්‍ය විධියට සහතික කරලා. ඒ නිසා මෙවැනි ප්‍රශ්න ගොඩක් ඔවුන්ට තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලනවා, මේ අයට අවශ්‍ය පහසුකම් සපයන්න කියලා. මොකද, ඉන්දියාව, බංග්ලාදේශය, මාලදිවයින ඇතුළු අනෙක් රටවල් ගත්තාම ඒ රටවල මිනිස්සු refugees ලෙස හිටියත්, මේ පහසුකම් ටික සපයනවා. විශේෂයෙන්ම ඉතාලියේ refugees ලෙස ඉන්න අපේ ශ්‍රී ලාංකිකයින්ට අවශ්‍ය සේවා ටික තානාපති කාර්යාලය හරහා සපයන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ හදන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ඉතාලියේ සිටින ශ්‍රී ලාංකිකයින්ට තිබෙන තවත් ප්‍රශ්නයක් තමයි, driving licence එක සම්බන්ධ ප්‍රශ්නය. ඒකට ලොකු සටනක් දුන්නා, මමත් ඒකට විශාල වශයෙන් සම්බන්ධ වුණා. ඔබතුමන්ලා ඒක අත්සන් කරලා ඒ අවස්ථාව ලබා දුන්නා. එතැනදි බර වාහන සඳහා වූ driving licence එක තවම ලබා දුන්නේ නැහැ. හැබැයි, බර වාහන සඳහා driving licence එක ලබා දීමේ වැඩ පිළිවෙළ අපි කෙසේ හෝ ක්‍රියාත්මක කළ යුතුයි. ඔබතුමන්ලා වුවමනාවෙන්, ඊට වැඩිපුර සම්බන්ධ වුණොත් එය ක්‍රියාත්මක කරගන්න පුළුවන්. ඉතාලි රජයත් එක්ක ඉතා ළඟින් කථා කළොත් ඔයගොල්ලන්ට බර වාහන සඳහා driving licence එක ලබා ගන්න පුළුවන්. බර වාහන සඳහා driving licence එක ලබා දුන්නාම විශේෂයෙන්ම යුරෝ 2,500කට, 3,000කට වැඩි වටිනාකමකින් යුතු වැටුපක් ලබා ගන්න ඒ අයට අවස්ථාව ලැබෙනවා. ඒක ශ්‍රී ලංකාවේ විදේශ විනිමය හැටියට ලැබෙන මුදලක්. ඒක එක පැත්තකින් ඒ පුද්ගලයාගේ පවුලේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න වාගේම අනෙක් පැත්තෙන් අපේ රටට විදේශ විනිමය ලැබීමක්. ඒ නිසා මේකත් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අද මිලානෝවල පිහිටි කොන්සල් ජෙනරාල් කාර්යාලය හරහා driving licence එකක් ගන්න අයදුම්පතක් බාර දුන්නාම, ඒක ඉතාලි භාෂාවට පරිවර්තනය කරන්න අවශ්‍ය පහසුකම් තවම ලබා දීලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා එම කාර්යාලයෙන් මේක සහතික කර ලබා දෙන්න විශාල කාලයක් ගතවනවා. ඒ වැඩ පිළිවෙළ නිදහස් කරලා, ඒකට භාෂා පරිවර්තකයින් වැඩි වශයෙන් යොමු කරමින් මේ අයට පහසුකම් වැඩියෙන් ලබා දෙන්න කියලා විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා.

විශේෂයෙන්ම මතක් කළ යුතු තවත් කරුණු කාරණා කිහිපයක් තිබෙනවා. නමුත්, ඒ සඳහා මට කාල වේලාව මදි. මම එයින් කීපයක් පමණක් කියන්නම්. මීට පෙර, ඉතාලියත් එක්ක ගිවිසුමක් හැටියට රැකියා කෝටා ලබා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළට ඉල්ලීමක් කරලා තිබුණා. ඒකත් driving licence පිළිබඳව තිබුණු MoU එකේම තිබුණා. හැබැයි, ඒ MoU එක තවම අත්සන් කරලා නැහැ. ඔබතුමන්ලාට රජයක් හැටියට මැදිහත් වෙලා ඒක අත්සන් කරන්න පුළුවන්.

ඒ වාගේම ඉතාලියේ රෝමයේ තිබෙන තානාපති කාර්යාල ගොඩනැඟිල්ලේ අඩුපාඩු තිබෙනවා. ඒ අඩුපාඩු තානාපති කාර්යාලයේ වරදක් නිසා සිදු වුණු දෙයක් නොවෙයි. අපි ඒ සම්බන්ධයෙන් සොයා බලා වැඩ කටයුතු කරන්න ඕනෑ. ඒ තානාපති කාර්යාලයේ වැසිකිළි පද්ධතිය දිහා බැලුවාම ඒක ඉතාලියේද තිබෙන්නේ කියලා හිතා ගන්න බැහැ. එම නිසා ඒ අඩුපාඩු නිවැරදි කළ යුතුයි. මොකද, ඉතාලියේ ඉන්න ශ්‍රී ලාංකිකයින් මේ රටට විශාල මුදලක් එවනවා. ඒ වාගේම ඒ තානාපති කාර්යාලත් එම වැඩ කටයුතු ටික හරියටම කරනවා. තානාපති කාර්යාලයේ ඉන්න නිලධාරින් ඇතුළු සියලු දෙනාටම අවශ්‍ය ඒ පහසුකම් ටික සැපයීම සඳහා වැඩ පිළිවෙළක් චක්‍රලේඛ මඟින් හෝ වෙනත් ක්‍රමවේදයකින් මේ අමාත්‍යාංශය මඟින් සකස් කර දෙන්න කියලා විශේෂයෙන්ම මම අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, ඒක කළ යුතුමයි. ඒ කටයුත්ත නොකර ඉන්න තාක්කල් ඒ තානාපති කාර්යාලයට ගිහිල්ලා අපහසුකම් විඳින හැම කෙනෙකුම බණින්නේ අපේ රටට සහ ආණ්ඩුවට. එම නිසා ඒ සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. රෝමයේ තානාපති කාර්යාලයේ වැසිකිළි පද්ධතියේ photos මගේ ළඟ තිබෙනවා. ඒ photos දැක්කොත් ඔබතුමන්ලාට ඇත්තටම දුක හිතෙයි, ඉතාලියේ සිටිමින් ශ්‍රී ලංකාවට විශාල මුදලක් එවන අපේ ශ්‍රී ලාංකික සහෝදර සහෝදරියන්ට තිබෙන පහසුකම් මේවාද කියලා. තානාපතිතුමා ඒ වෙනුවෙන් කටයුතු කරන්න ඇත්තටම සූදානම්. ඒක ඒගොල්ලන්ගේ අඩුපාඩුවක් නිසා සිදු වුණු දෙයක් නොවෙයි. හැබැයි, ඒවා නිවැරදි කළ යුත්තේ විශේෂයෙන්ම ශ්‍රී ලංකාවෙන්. මේ සම්බන්ධව අපට කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා. ඒ නිසා අපි ඉදිරි කාලයේදීත් තවදුරටත් මේ ගැන සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.42]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා විසින් විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අද දින සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද මේ කාලෝචිත යෝජනාව මම ඉතාම සතුටින් ස්ථිර කරනවා.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

ඒ යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්න ඉස්සෙල්ලා මේ වනකොට අපේ රටේ සිදු වෙලා තිබෙන කාරණා කිහිපයක් ගැන කථා කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම මීගමුව බන්ධනාගාරය තුළ මේ වනකොට ඇති වෙලා තිබෙන තත්ත්වය ඉතාම කනගාටුදායකයි. ඊකට හේතුව තමයි, මේ ආණ්ඩුවට මාස 13ක් යනකම් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයෙකු පත් කර ගන්න බැරි වීම. ඒ නොහැකියාව තුළ තමයි මේ අවාසනාවන්ත සිද්ධිය ඇති වෙලා තිබෙන්නේ. මේ වනකොට, පළපුරුද්දක් නැති නිලධාරින් පත් කිරීම තුළ ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද කියලා අපි දන්නවා. බන්ධනාගාරයේ නිලධාරින් ඇමතිවරයාගේ මුණටම කියනවා අපි දැක්කා, අපට අවශ්‍ය සහයෝගය සහ උපදෙස් ලැබුණේ නැහැ කියලා. මේක නියපොත්තෙන් කඩා ගන්න තිබුණු දෙයක් කියාත් ඒගොල්ලන් කියනවා. ඒක තමයි ඇත්ත කථාව.

ඊට ඉස්සෙල්ලා දවසේ ඇති වුණු සිද්ධිය සමනය වුණා කියලා රජය පහුවදා වෙනකොට ප්‍රකාශයට පත් කළා. නමුත් ඒ සිද්ධියට අදාළව ජීවිත දෙකකට හානි වෙලා තිබුණු නිසා අනිවාර්යයෙන් ඊට එහාට සිද්ධියක් සිදු වෙන්න පුළුවන් බව කවුරුත් දන්නා දෙයක්. බන්ධනාගාරයේ ඉන්න ඕනෑම නිලධාරියෙකුගෙන් ඇහුවොත් ඒක කියයි. එහෙනම් කළ යුතුව තිබුණේ මේ කණ්ඩායම් දෙක වෙන් කරන එකයි. එහෙම වෙන් නොකිරීම නිසා තමයි රැඳවියන් විසි ගණනක ජීවිත අහිමි වෙලා, බන්ධනාගාර නිලධාරින් හත්දෙනෙකු ජීවිතක්ෂයට පත් වුණේ. මම හිතන විදියට, මෙහෙම දෙයක් සිද්ධ වුණේ ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට. ඒක නොහැකියාව නොවෙයිද?

වර්තමාන ජනාධිපතිතුමා විපක්ෂයේ ඉන්නකොට මේ ඉස්සරහා සීට් එකේ ඉඳගෙන කොහොමද කථා කළේ කියන එක අපි දැක්කා. විජිත හේරත් මැතිතුමනි, ඔබතුමාත් ඒ අවස්ථාවේදී හිටියා නේ. මීට ඉස්සෙල්ලාත් බන්ධනාගාරයේ මෙවැනි සිදුවීම් ඇති වුණාම, ඒකේ වගකීම සම්පූර්ණයෙන්ම රජය භාර ගන්න ඕනෑය කිව්වා. දැන් තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා තිබෙනවා. මේ රජය තමන්ගේ අසමත්භාවය හැම ක්ෂේත්‍රයක් තුළින්ම පෙන්නුම් කරලා තිබෙනවා.

අද විපක්ෂ නායකතුමාව හමු වෙන්න මේ රටේ ඉන්න ගොවි සංවිධානවල නායකයින් පාර්ලිමේන්තුවට ආවා. ඒ ගොවි නායකයින්ගේ අදහස් බැලුවාම පෙනෙනවා, එක පැත්තකින් තමුන්නාන්සේලා ගොවියාට පොරොන්දු ගණනාවක් දීලා තිබෙන බව. හැබැයි, බලයට ආවාට පස්සේ තමුන්නාන්සේලා ගොවියා එළියට දැම්මා. ඔබතුමන්ලා ඒ ගොවීන් එක්ක තමයි මුලින්ම පාරට බැස්සේ. නමුත් දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් තමුන්නාන්සේලා ආණ්ඩු කරනවා. හැබැයි, ගොවියා පාරට වැටිලා. ඒ වාගේම තමුන්නාන්සේලා ගොවියා ගැන කථා කරන්නේ නැහැ, ගොවීන්ට අපහාස කරනවා. ගොවියා රජකමටත් සුදුසුයි කියලා තිබුණු ඒ කථාව තමුන්නාන්සේලා විකෘති කරනවා. ගොවියාට දීලා තිබුණු තත්ත්වයට තමුන්නාන්සේලා කැමති නැහැ, ඒ අයගෙන් බලයට ආවාට. තමුන්නාන්සේලාගේ ඇමතිවරු ගොවියාට කියනවා, "කසිප්පුකාරයෝ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුරාධපුර ප්‍රදේශයෙන් ආපු මන්ත්‍රීවරයෙක් නිසා ඔබතුමා මේ ගැන හොඳට දන්නවා. මෙවැනි තත්ත්වයක් තිබෙන්නේ. තමුන්නාන්සේලා මෙහෙම කටයුතු කරන්නේ ඇයි? මේ විදියට හැම අංශයකම ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා.

දැන් හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා අපේ රටේ විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සභාව කල් තැබීමේ යෝජනාවක් ගෙනාවා. මේ වෙනකොට අපේ රටට යම් ඩොලර් ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා. පසුගිය වසරේදීත්, මේ වසරේදීත් ඩොලර් බිලියන 7කට වැඩි ප්‍රමාණයක් උපයා තිබෙන්නේ විදේශ රැකියා ක්ෂේත්‍රයේ රැකියා කරන අපේම සහෝදර සහෝදරියන්ගෙන්. මේක මේ ආණ්ඩුවේ හපන්කමක් නොවෙයි. දිගින් දිගටම මේ කටයුත්තට සම්බන්ධ වෙලා ඉන්නේ පෞද්ගලික අංශය, ඒජන්තවරු හරහා. එතකොට විදේශ සේවා නියුක්ති කාර්යාංශය තිබෙන්නේ මොකටද? මේ කටයුතු නියාමනය කරලා ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්නයි. නමුත්, තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා අද වනකොට මොකක්ද වෙලා තිබෙන්නේ?

සාමාන්‍යයෙන් විදේශගත වෙන්නේ අවුරුදු දෙකකට, අවුරුදු තුනකට ගිවිසුම් ගහලා. තමුන්නාන්සේලා බලයට පත් වෙලා මේ වනකොට අවුරුදු එකහමාරයි. මම පැහැදිලිව කියනවා, ඉදිරි වර්ෂවල අනිවාර්යයෙන්ම අපේ රටේ ආදායම අඩු වෙනවා කියන එක. ඒකට බලපාන හේතු ගණනාවක් තිබෙනවා. එක පැත්තකින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අකාර්යක්ෂමතාව ඒකට බලපානවා. අද වනකොට නිලධාරින් නිවැරදි තීන්දු තීරණ ගන්නේ නැහැ. අද වනකොට නිලධාරින්ට ඒ තීන්දු තීරණ ගන්න හයියක් දීලා නැහැ. මොකද, ඒ නිලධාරින් ඒවායේ වගකීම ගන්නේ නැහැ. නිලධාරියෙකුගෙන් වැරැද්දක් වුණාම ඔහුට ඒකේ වැරැද්ද පටවනවා මිසක්, ඒ නිලධාරියාට අවශ්‍ය සහයෝගය, දේශපාලන හයිය රජය පැත්තෙන් ලබා දෙන්නේ නැහැ.

මේ වෙනකොට අපේ රටට ලැබෙන්න තිබෙන රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් අහිමි වෙලා තිබෙනවා. තානාපති කාර්යාලවල ඉන්නවා, විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් අනුයුක්ත කරපු නිලධාරින්. ගිවිසුම්ගත වෙනකොට තානාපති සේවයේ නිරත අයට වඩා විශේෂයෙන්ම විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අය තමයි මේවාට මැදිහත් වෙන්නේ. මේ වෙනකොට රටවල් ගණනාවක රැකියා තිබෙනවාය කියන එක අපි දන්නවා. කටාර් රාජ්‍යයෙන් අපිට කථා කරලා තිබෙනවා. කටාර් රාජ්‍යයේ මේ වෙනකොට රැකියා අවස්ථා 800ක් තිබෙනවා. "ලයිෆ් ටයිම්" කියලා කොම්පැනියකින් අපේ රටට රැකියා අවස්ථා සඳහා ඉල්ලීම් කරලා තිබෙනවා. අපේ රටට මේ අවස්ථාව ලැබෙන්නේ තවත් රටවල් ගණනාවක් එක්ක තරග කරලා. මේ රැකියා අවස්ථා සඳහා අපේ රටින්ම ගන්න ඕනෑ කියලා නීතියක් නැහැ. ඉන්දියාව කියන්නේ විශාල රැකියා වෙළෙඳ පොළක් තිබෙන රටක්. නේපාලය, බංග්ලාදේශය කියන්නේ විශාල රැකියා වෙළෙඳ පොළවල් තිබෙන රටවල්. විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා තමුන්නාන්සේලා තානාපති කාර්යාලවලට පත් කරලා ඉන්නේ අපිට ලැබෙන දේවල් හරියාකාරව ක්‍රියාත්මක කරන්න බැරි නිලධාරි මණ්ඩලයක් නම්, ඒක ඉතා කනගාටුදායක තත්ත්වයක්. මොකද, එක පැත්තකින් අපේ රටේ තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් අද වනකොට ජීවත් වෙන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. රජයේ රැකියා කරන අය පවා තමන්ට ජීවත් වෙන්න බැරි නිසා අද වනකොට විදේශගත වෙන්න බලනවා.

අපිට මේ වෙනකොට විදේශ විනිමය ලැබෙන ප්‍රධානම වැඩ පිළිවෙළ විදේශ රැකියා ක්ෂේත්‍රය නම් ඒක දිරිමත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළවල් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ වාගේම ඒ සඳහා සහයෝගය ලබා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ සඳහා තමයි විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිහිටුවා තිබෙන්නේ. නමුත්, අද වනකොට මොකක්ද වෙන්නේ? අද වනකොට වෙන්නේ මේකයි. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඉන්න නිලධාරින්, තානාපති කාර්යාලවල ඉන්න නිලධාරින් තමන්ගේ රාජකාරිය හරියාකාරව ඉෂ්ට කරන්නේ නැතිව, - යම් යම් වරදාන, වරප්‍රසාද බලාගෙන ද දන්නේ නැහැ - මේවා ප්‍රමාද කිරීම තුළ, එහෙම නැත්නම් නොයෙකුත් වගකීම් ගන්න බැරිකම තුළ අසාධාරණයට පත් වෙන්නේ කවුද? විදේශගත වෙන්න බලාගෙන ඉන්න අපේම සහෝදර සහෝදරියන්. ඒ ගැනත් මම මතක් කරන්න ඕනෑ.

අපේ හෙක්ටර් අප්පුහාමි මැතිතුමා කිව්වා, ඉතාලිය වැනි රටවල තිබෙන ප්‍රශ්න ගැන. ඒ වාගේම මේ වෙනකොට මැද පෙරදිග රටවල පවතින යුද්ධය එක්ක ප්‍රශ්න ගණනාවක් ඇති වෙලා තිබෙනවා. ඩුබායි රාජ්‍යය ගත්තත් එහෙමයි. හෝටල් ක්ෂේත්‍රයේ නියුතු විශාල ප්‍රමාණයකගේ රැකියා අහිමි වෙලා තිබෙනවා. ඒ රටවල ඉන්න අය අපට කථා කරනවා. ඒ අයගේ රැකියා නැතුව දැන් මාස 6ක්, 7ක් විතර වෙනවා. සමහර විට ඒ අයට ආපහු ලංකාවට එන්න වෙයි. මොකද, ඒ රටවල රැකියා නැතිව ජීවත් වෙන්න පුළුවන්කමක් නැහැ. කටාර් රාජ්‍යයේත් ඒ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. මේවා සඳහා රජයක් හැටියට ඔබතුමන්ලා ගන්න විකල්පය, වැඩ පිළිවෙළ මොකක්ද? ඒ විධියට අපේ රටේ ජනතාව අනාථ වෙන්න, අසරණ වෙන්න දෙනවාද? ඒ අය අපේ රටට ලොකු කාර්යභාරයක් කරන කණ්ඩායමක්. ඒ අය මුදල් එවන හින්දා තමයි වාහන ගෙන්වන්න, අපි පාවිච්චි කරන telephones පවා ගෙන්වන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අපේ රටට විදේශ විනිමය ලැබෙන්නේ විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියුතු අය නිසායි. ඒක අපට පැහැදිලියි. වසර ගණනාවක් තිස්සේ පළමුවෙන්ම අපේ රටට විදේශ ආදායම එන්නේ එතැනින්. හැබැයි, ඒ සඳහා තමුන්නාන්සේලා දක්වන උනන්දුව, ආකල්පය, සහයෝගය ප්‍රමාණවත් නැහැ කියන එකත් පැහැදිලිවම කියන්න ඕනෑ. මම හිතන විධියට, ඇමතිතුමා වැඩිපුරම අවධානය යොමු කරන්නේ විදේශ කටයුතු ක්ෂේත්‍රය සම්බන්ධයෙන්. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානය විදේශ රැකියා ක්ෂේත්‍රයටත් මීට වඩා ලබා දෙන්න. රාජ්‍ය ඇමතිතුමාට මේ සම්බන්ධයෙන් හරියාකාර අවබෝධයක් තිබෙනවා කියලා මා හිතන්නේ නැහැ, කරන වැඩ පිළිවෙළ දැක්කාම. ඒකත් මම කියන්න ඕනෑ. මොකද, යම් යම් කාරණා අපි කථා කළාම එතුමාගෙන් ලැබුණේ ඉතාම බොළඳ පිළිතුරු. මේක එහෙම කටයුතු කරන්න පුළුවන් ක්ෂේත්‍රයක් නොවෙයි, ව්‍යාපාරයක්. එක පැත්තකින් මේක අපේ රටේ ජනතාවට කරන විශාල සේවයක්. ඒ වාගේම රටට විදේශ විනිමය ලැබෙන පළමු අංශය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා කටයුතු කළේ නැත්නම් ඩොලර් බිලියන 8ක් එනවා කියලා අපි කෑ ගැහුවාට ලබන අවුරුද්දේ ඉඳලා ඒ මුදල් ප්‍රමාණය අඩු වෙන එක අපට නවත්වන්න බැරි වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.52]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமசந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම වැදගත් යෝජනාවක් තමයි හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ කරපු දේවල් සම්බන්ධවත්, අනාගතයේදී අපි කරන්න යෝජනා කර තිබෙන දේවල් සම්බන්ධවත් සාකච්ඡා කරන්නට, ඒ විස්තර සභාගත කරන්නට යම්කිසි අවස්ථාවක් ලැබෙයි කියන විශ්වාසය මට තිබෙනවා.

විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තමයි මේ යෝජනාව ඉදිරිපත් වෙලා තිබෙන්නේ. විදේශ රැකියා ක්ෂේත්‍රයේ නිරත වී සිටින සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ට මේ මොහොතේදී අපේ ස්තුතිය පුද කරන්නට ඕනෑ, විවිධ ගෝලීය අර්බුද මැද්දෙත් අපේ රටට අවශ්‍ය කරන විදේශ විනිමය අපේ රටට එවීම සම්බන්ධයෙන්. කිසිම අඩුපාඩුවක් නොවී අපේ රටට අවශ්‍ය කරන ඒ අපේක්ෂිත මුදල මේ රටට එවීම පිළිබඳව අපි ස්තුතිය පුද කරනවා. මේ මොහොත වෙනකොට ලක්ෂ 17ක පමණ පිරිසක් නිල වශයෙන් විවිධ රටවල වැඩ කරනවා. පසුගිය අවුරුද්ද ගත්තොත්, ඩොලර් බිලියන 8.2ක විදේශ විනිමය ප්‍රමාණයක් අපේ රටට නිල වශයෙන් ලබා දී තිබෙනවා. සමහර විට ඒක වැඩි වෙන්නත් පුළුවන්. හැම මුදලක්ම හරි විධියට එන්නෙත් නැහැ. ඒ නිසා ඒකේ ප්‍රතිශතයක් ගත්තොත් වැඩි වීමක් තිබෙන්න පුළුවන්.

විදේශ රැකියා ක්ෂේත්‍රය පසුගිය කාල වකවානුව තුළ විවිධ විධියට දේශපාලනීකරණයට ලක් වෙලා තිබුණා. ඒ වාගේම තමයි අපගේ තානාපති සේවයත් පසුගිය කාල වකවානුව තුළ විවිධ විධියට දේශපාලනීකරණයට ලක් වෙලා තිබුණා. අපි දැක්කා, හිටපු අමාත්‍යවරු, හිටපු මන්ත්‍රීවරු විසින් විවිධ තානාපති කාර්යාලවලට තමන්ගේ ඥාතීන්, හිතවතුන් පත් කරගත් ආකාරය. Quota බෙදා ගත්ත විධියට තමයි ඒක කරගෙන ගියේ. ඒ නිසා අපි මුලින්ම ගත්ත තීරණය තමයි ඒ දේශපාලන පත්වීම් ලබා ගත්ත කට්ටියට ලංකාවට ආයෙත් එන්න කියපු එක. ඒ සියලුම තනතුරුවලට සුදුසු පුද්ගලයන් අපි පත් කරනවා. ඒ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාවලියක් මේ මොහොත වෙනකොටත් අපි අරගෙන තිබෙනවා. ඉතාම පළපුරුදු, ඒ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අත්දැකීම් තිබෙන පුද්ගලයන් පත් කරන්න තමයි අපි සූදානම් වෙලා ඉන්නේ.

ජපානය කියන්නේ, විදේශ ශ්‍රමිකයන් විශාල සංඛ්‍යාවක් වැඩ කරන රටක්. අවාසනාවන්ත විධියට, පසුගිය කිසිම ආණ්ඩුවක් අපේ තානාපති කාර්යාලවල කම්කරු අංශයක් පටන් ගෙන තිබුණේ නැහැ. මේ මොහොත වෙනකොට අපි සාර්ථක වෙලා තිබෙනවා, ජපානයේ පිහිටි අපගේ තානාපති කාර්යාලයේ කම්කරු අංශයක් පටන් ගන්න. ඉතා කෙටි කාලයකින් ඒ නිලධාරින් ගිහිල්ලා වැඩ භාර ගන්නවා.

විදේශ රැකියාවලට ඒ ශ්‍රමිකයන් යන්න පෙර ඔවුන් ලංකාවේ මුහුණ දීපු ප්‍රශ්න පිළිබඳවත් මේ යෝජනාවේ සඳහන් කර තිබෙනවා. ඒ නිසා ඒ අය රට යන්නට පෙර මුහුණ පාන්න සිද්ධ වෙච්ච සමහර ප්‍රශ්නවලට අදාළවත්, පිට රට ගියාට පසුව ඒ අය මුහුණ දෙන ප්‍රශ්නවලට අදාළවත් අපි ගත්ත ක්‍රියාමාර්ග ඇතුළත් ලේඛන කිහිපයක් මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

මෙහිදී අපි 2025 අවුරුද්ද ගත්තොත්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් වැටලීම් - raids - 21ක් කරලා තිබෙනවා. ඒ වාගේම, 2026 අවුරුද්දේ මැයි මාසය දක්වා අපි වැටලීම් 15ක් කරලා තිබෙනවා. ගිය අවුරුද්දේ 21යි, මේ අවුරුද්දේ මේ වනතුරු 15යි. මේ දේවල් කරන්න අපට දැන් පුළුවන් වෙලා තිබෙන්නේ, ශ්‍රී ලංකා පොලීසියත් එක්ක එකතුවෙලා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විශේෂ විමර්ශන ඒකකයක් පිහිටුවීම නිසා. විදේශ රැකියා ක්ෂේත්‍රයේ විමර්ශනවලට අදාළව අපි ලබා දුන් ප්‍රමුඛත්වය තමයි මේ තුළින් පෙන්නුම් කරන්නේ.

ඒ වාගේම 2025 අවුරුද්ද ගත්තොත්, 128දෙනෙක් අත්අඩංගුවට පත් වුණා. ඊළඟට, 2026 වසරේ මැයි මාසය වෙනකොට 81දෙනෙක් අත්අඩංගුවට පත්වෙලා තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

පසුගිය කාල වකවානුව තුළ නීති විරෝධී - illegal - බඳවා ගැනීම්වලට සම්බන්ධ වුණු පුද්ගලයින්, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයෙන් කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කළ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙක් ඇතුළුව යම් සංඛ්‍යාවක් අපි අත්අඩංගුවට අරන් තිබෙනවා. ඒ අයත් පසුගිය කාලයේ තිබුණු දේශපාලන සංස්කෘතියේම යම් කිසි ඉතුරුවක් විධියට තමයි අපි දකින්නේ. දේශපාලනඥයින් මැදිහත් වෙලා, නීති රීතිවලින් තොරව, මිනිස්සු නොමඟ යවලා, තමන්ට ජාවාරමක් විධියට මේක කර ගන්න පුළුවන් කියලා ඒ කාලයේ යම් කිසි සංකල්පයක් නිර්මාණය වෙලා තිබුණා නම්, අපි ඒ සංකල්පය මුළුමනින්ම පරාජයට පත් කරලා තිබෙනවා. එම නිසා කවුරුන් හෝ කෙනෙක් ලියාපදිංචි නොවී විදේශ රැකියා සඳහා බඳවා ගැනීම්වලට සම්බන්ධ වෙනවා නම්, අපි කොන්දේසි විරහිතව ඒ සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්නවා. මීට කලින් කිසිම ආණ්ඩුවක් මේ වාගේ තීන්දු තීරණ අරගෙන නැහැ. නමුත්, ජාතික ජන බලවේගය ආණ්ඩුව, විශේෂයෙන්ම ගරු විජිත හේරත් ඇමතිතුමා ප්‍රමුඛ අපේ අමාත්‍යාංශය ඒ කාර්යය කරන්න සමත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව පවරා ඇති නඩු ප්‍රමාණය ගත්තොත්, 2025 අවුරුද්දේ එවැනි අයට විරුද්ධව නඩු 78ක් පවරා තිබෙනවා. ඊට කලින් අවුරුද්ද ගත්තොත්, නඩු 10යි පවරා තිබෙන්නේ. ඒ වාගේම, වර්තමාන තත්ත්වය ගත්තොත්, මේ අවුරුද්දේ මැයි මාසය වෙනකොට අපි 29දෙනෙකුට විරුද්ධව legal action අරගෙන තිබෙනවා.

එමෙන්ම සමථ මණ්ඩල සහ අධිකරණ ක්‍රියාමාර්ග ගැන සඳහන් කළොත්, 2025 අවුරුද්දේ පැමිණිලි 3,450ක් සම්පූර්ණ කර තිබෙනවා. මේ අවුරුද්දේ අපි 1,172ක් සම්පූර්ණ කරලා තිබෙනවා. විශේෂයෙන්ම දෙපාර්ශ්වය කැඳවලා, විභාග කරලා, නඩුවක් නැතුව ඒ පාර්ශ්ව දෙක සමථයකට පත් කරන ක්‍රියාවලිය ගත්තොත්, - අපි ඒකට conciliation කියලා කියනවා - 2025 අවුරුද්දේ රුපියල් මිලියන 388.04ක් සහ 2026 අවුරුද්දේ මේ මොහොත දක්වා රුපියල් මිලියන 168.94ක් ඒ සඳහා ලබා දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය සාපේක්ෂව ගත්තොත්, 2022 අවුරුද්දේ conciliation process එක හරහා නැවත ලබා දුන් මුදලේ වටිනාකම රුපියල් මිලියන 38.08යි; 2023 අවුරුද්දේ රුපියල් මිලියන 107.94යි; 2024 අවුරුද්දේ රුපියල් මිලියන 182.58යි. නමුත්, අපි බලයට පත් වුණාට පස්සේ ඒ process එක ඉතාම විනිවිදභාවයක් සහිතව කරගෙන යෑමත්, අවශ්‍ය කරන කණ්ඩායම ඉතාම ශක්තිමත් විධියට පවත්වාගෙන යෑමත්, ඒ වාගේම තිබුණු පුරප්පාඩුවලට අවශ්‍ය සේවකයින් නිවැරදි විධියට පත් කිරීමත් එක්ක, පසුගිය කාල වකවානු තුළ අය කරපු ගණනට වඩා, එහෙම නැත්නම් සමථයට පත් කරපු ගණනට වඩා අපේ ආණ්ඩු කාලය තුළදී පංගු කිහිපයකින් වැඩි කරන්න අපි සමත් වෙලා තිබෙනවා. මේක ඉතාම වැදගත් කාරණාවක්.

ඊළඟට, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ Consular Affairs Division එක ගත්තොත්, අපි දන්නවා ඒ අංශයත් මේකට ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව. මීට කලින් තත්ත්වය ගත්තොත්, විදේශ කටයුතු අමාත්‍යාංශය වෙනම තිබුණා, විදේශ රැකියා අමාත්‍යාංශය කම්කරු අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධ වෙලා වෙනම තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව විද්‍යාත්මක විධියට කල්පනා කළා, විදේශ කටයුතු සහ විදේශ රැකියා කියන ක්ෂේත්‍ර දෙකම ඒකාබද්ධව තිබෙන්න ඕනෑ කියලා. ඒ සඳහා එක් අමාත්‍යවරයෙක් පත් වුණා. නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට මම පත් වුණා. එතකොට, අපේ කාර්යභාරය විද්‍යාත්මක විධියට බෙදාගෙන, අපේ පැත්තෙන් දරන්න පුළුවන් උපරිම මහන්සිය දරමින් මේ ක්ෂේත්‍රය වෙනස් කිරීමට අදාළව, මේ ක්ෂේත්‍රය ගොඩනැඟීමට අදාළව, මේ රටට එන විදේශ විනිමය වැඩි කිරීමට අදාළව, ඒ වාගේම පසුගිය කාල වකවානු තුළ අර්බුදයක ප්‍රතිඵලයක් විධියට නිර්මාණය වුණු විදේශ රැකියා ක්ෂේත්‍රයේ පරිවර්තනයක් ඇති කරමින්, ඒ වාගේම විදේශ රැකියා ක්ෂේත්‍රය කාගේ හෝ අවසන් තේරීමක් විධියට පත්වෙලා තිබුණා නම් ඒකත් වෙනස් කරමින්, කෙනෙකුගේ පළමුවැනි තේරීමක් විධියට පත් කරන කාර්යභාරය අපි ක්‍රමානුකූලව, ක්‍රමානුකූලව කරගෙන යනවා. ගෙවී ගිය කාල වකවානුව තුළ, විශේෂයෙන්ම 2024 සැප්තැම්බර්, නොවැම්බර් කියන කාල පරිච්ඡේදය කෙටි කාලයක්. ඒ කාල වකවානුව තුළත් අපට කරන්න පුළුවන් උපරිම වෙනස්කම්, උපරිම මැදිහත්වීම් අපි කළා.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අපි හොඳ සභාපතිවරයෙක් පත් කළා. පසුගිය කාල වකවානුවල එහි හිටපු සභාපතිවරුන් සම්බන්ධව විවිධ චෝදනා, විවිධ නඩු, විවිධ පැමිණිලි, විවිධ විමර්ශන තිබෙනවා. නමුත් අපි ඒ තත්ත්වය වෙනස් කරමින් එම තනතුරට හොඳ පුද්ගලයෙකු පත් කරගෙන, එම ආයතනයේ කටයුතු ඉතාම විනිවිදභාවයෙන් යුතුව කරගෙන යනවා.

2024 නොවැම්බර් මාසයේ සිට අද දක්වා අපි හැම පැත්තෙන්ම අපට කරන්න පුළුවන් දේවල් කළා. එය, pre-departure වෙන්න පුළුවන්, training එක වෙන්න පුළුවන්, අපේ තානාපති කාර්යාල හරහා සිද්ධ වන කාර්යයන් වෙන්න පුළුවන්, තානාපති කාර්යාලවලට සුදුසු පුද්ගලයන් බඳවා ගැනීම සඳහා වන පත්වීම් වෙන්නත් පුළුවන්. අපි ඒ සියලු දේම හරි විධියට කරගෙන යනවා. ඒ වාගේම ඒ අය රට රටවලදී යම්කිසි ප්‍රශ්න, ගැටලුවලට මුහුණ දෙනවා නම්, ඒ සම්බන්ධවත් හරි විධියට මැදිහත් වෙමින් කටයුතු කරනවා. ඒ වාගේම, නැවත ලංකාවට ආපු ගමන් reintegration process එකට අදාළව කටයුතු කරන්නත් අපි බැඳිලා ඉන්නවා. ඒ නිසා අපි හොඳ විධියට ඒ වැඩ කටයුතු කරගෙන යන බවට මට විශ්වාසයක් තිබෙනවා.

ඒ වාගේම මා විශේෂයෙන් සඳහන් කරපු කොන්සියුලර් අංශය සම්බන්ධවත් කථා කරන්න කැමැතියි. කොන්සියුලර් අංශය ගත්තොත්, ඒ හරහා ලොකු කටයුත්තක් කෙරෙනවා. එය, ඕනෑම පිටපතක් සහතික කර ගැනීම වෙන්න පුළුවන්, Sri Lanka Bureau of Foreign Employmentහි register නොවුණු ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ප්‍රශ්න වෙන්නත් පුළුවන්. ඒ වාගේ විවිධ දේවල් සම්බන්ධව ඒ අය මැදිහත් වෙනවා. ඉතින් ඒ කෙරෙහිත් අවධානය යොමු කරලා, කොන්සියුලර් අංශයට අවශ්‍ය කරන process එක, විශේෂයෙන්ම ඩිජිටල්කරණය බෙහෙවින් ශක්තිමත් කරගෙන ඉස්සරහට අරගෙන යන වැඩ පිළිවෙළක් අපි සකස් කර තිබෙනවා. ඒ වාගේම අපේ තානාපති කාර්යාලවල සති අන්තයේදීත් කොන්සියුලර් සේවාව ලබා දෙන ක්‍රියාවලියක් පටන් ගෙන එය ක්‍රමානුකූලව කරගෙන යනවා. ඒ වාගේම තමයි, passport applicationsවලට අදාළ ඩිජිටල්කරණය. ඒ වාගේ විවිධ දේවල් සම්බන්ධයෙන් අදාළ හැම අංශයම ඒකාබද්ධ කරමින්, අපට මැදිහත් වෙන්න පුළුවන් උපරිම විධියට මැදිහත් වෙමින් මේ කියපු කටයුතු ටික අපි දැන් කරගෙන යනවා.

මෙහිදී ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඉතාලිය සහ ශ්‍රී ලංකාව අතර රියැදුරු බලපත්‍ර සම්බන්ධයෙන් තිබෙන ගිවිසුම ගැන යම්කිසි ප්‍රශ්නයක් මතු කළා. ඕනෑම ගිවිසුමක් lapse වෙන්න කලින් අලුත්වැඩියා කරන්න ඕනෑ. නමුත් රියැදුරු බලපත්‍ර සම්බන්ධව දෙරට අතර පැවැති ගිවිසුම පසුගිය ආණ්ඩු කාලයේ lapse වුණා; අවලංගු වුණා. අවලංගු වුණාට පස්සේ එය ආයෙත් අලුත්වැඩියා කරන එක ලෙහෙසි නැහැ. නමුත් අපි ඊට අදාළ කටයුතු පටන් ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ ප්‍රථම වතාවට අපි ඉතාලිය සහ ලංකාව අතර political

consultation, ඒ කියන්නේ දේශපාලන උපදේශන යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා වන වැඩසටහනක් පටන් ගත්තා. අපට ඉතාලියත් එක්ක දීර්ඝ කාලීන රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තිබුණත්, පසුගිය කිසිම ආණ්ඩුවක් එවැනි ක්‍රියාමාර්ගයක් ගෙන තිබුණේ නැහැ. නමුත් අපි එය පටන් ගත්තා. ඉතාලියේ මරියා ට්‍රිපෝඩි කියන නියෝජ්‍ය අමාත්‍යවරිය ලංකාවට ආවා. එම සංචාරයේදී දෙරට අතර අත්සන් කරපු ගිවිසුමට අපේ පැත්තෙන් මම අත්සන් කළා. ඊට පස්සේ අපි සාකච්ඡා කළා. විශේෂයෙන්ම රියැදුරු බලපත්‍ර සම්බන්ධ ප්‍රශ්නය ගැනත් අපි කථා කළා. මේ කාරණයේදී බර වාහන රියැදුරු බලපත්‍ර සම්බන්ධව යම්කිසි ඉල්ලීමක් තිබෙනවා. ඒ සම්බන්ධවත් අපි සාකච්ඡා කරගෙන යනවා. අප හැම රටක් සමඟම මැදිහත් වෙලා අපේ පුරවැසියන්ට ලෝකයේ අනෙක් රටවල පුරවැසියන්ට ලැබෙන සියලුම අයිතිවාසිකම් ලබා දෙන්න අපි සූදානම්. ඒ සඳහා අමාත්‍යාංශය විධියට අපි මැදිහත් වෙන්න ලෑස්තියි කියන කාරණයත් ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියපු ඒ කාරණාවට අදාළව නිවැරදි කිරීමක් කළ යුතුයි. ඒ driving licence සම්බන්ධ කාරණාවට අදාළව පසුගිය ආණ්ඩුව කටයුතු කළේ නැහැ කියන කථාව ඔබතුමා කිව්වා. නමුත් මතක තියා ගන්න, ඒක අපේ ආණ්ඩු කාලයකදී සිද්ධ වෙච්ච දෙයක් නොවන බව. එය, 2022දී හිටපු තානාපතිවරයා ඒ පැවැති ආණ්ඩුවත් එක්ක ඇති කර ගත්තු ප්‍රශ්නයක්. හැබැයි, අපි සහයෝගය දුන්නේ, ආණ්ඩුවක් තියාගෙනවත්, එය නැති කරගෙනවත් නොවෙයි. මේ කාරණය නිවැරදි නොකළොත්, වැරදි අවබෝධයක් එන්න පුළුවන්. ඒ වාගේම 2022න් පසුව තිබිච්ච ආණ්ඩුත් ඒකට අවශ්‍ය කරන සහයෝගය ලබා දුන්නා; එම කටයුත්ත අවසානය දක්වා ගෙනැල්ලා තිබුණා. හැබැයි, එහි අවසාන කොටස ඔබතුමන්ලා කළා. එහෙම නම්, හැම තිස්සේම ඔබතුමන්ලා විතරක් ඒවායේ ගෞරවය ගන්න එපා. මොකද, එය ඒ හැම කෙනාම සම්බන්ධ වෙලා කරපු දෙයක්. අවසාන කොටස කරපු එකට අපි ඔබතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 4.06]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා විසින් වැදගත් ක්ෂේත්‍රයක් ගැන කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කර තිබියදී මටත් අදහස් ස්වල්පයක් ප්‍රකාශ කරන්න ලැබීම ගැන මම බෙහෙවින්ම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කවුරුත් දන්නවා, ඉස්සර අපේ තරුණ තරුණියන් අධ්‍යාපනය නිම කරලා රැකියාවක් සොයා ගන්න කොට ඔවුන්ට තරගයක් හැටියට තිබුණේ, රට තුළ පුංචි රැකියා වෙළෙඳ පොළකට සීමා වුණු රැකියා ප්‍රමාණයක් බව. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මතක තියාගන්න ඕනෑ, අපේ වර්තමාන තරුණ පරපුරට මේ වන විට තරග කරන්න සිදු වෙලා තිබෙන්නේ ලෝක රැකියා වෙළෙඳ පොළත් සමඟයි කියන එක. ඒක තමයි මේ විශ්ව ගම්මානයේ යථාර්ථය. ඒ නිසයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විදේශගත ශ්‍රමිකයන්ගේ ගැටලු ගැන කෙරෙන මේ යෝජනාව වර්තමානයට වාගේම අනාගතයටත් වැදගත් වෙයි කියා අප හිතන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ සමස්ත රාජ්‍ය සේවකයන් ඉන්නේ ලක්ෂ 14ක් වාගේ ප්‍රමාණයක් වුණාට මේ වන කොට විදේශ රැකියාවල නිරත වන ශ්‍රී ලාංකිකයන්ගේ සංඛ්‍යාව ලක්ෂ 17 ඉක්මවා තිබෙනවා. අපේ රටේ ඉන්න රාජ්‍ය සේවකයන්ට වඩා විදේශ රැකියාවල නිරත වෙච්ච ශ්‍රී ලාංකිකයන් පිරිස වැඩියි. ඒ වාගේම, මේ වන විට විදේශ රැකියාවලට යොමු වන පිරිස ඉතාම වේගයෙන් වැඩි වෙමින් පවතිනවා. අපි දන්නවා, අපේ ගම්වල තරුණ තරුණියන් එක්ක කථා කරන කොට කියන කථා. ඒ හැමෝටම වාගේ ආසාව වී තිබෙන්නේ රටින් පිට රස්සාවකට යා ගන්න එකයි. තරුණ තරුණියෝ ඒ සඳහා ලොකු උනන්දුවක් දක්වනවා. හැම අවුරුද්දකම ලක්ෂ දෙකහමාරක් විතර විදේශ රැකියාවලට අලුතින් යොමු වන බව අපට පෙනෙන්නට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විදේශ රැකියා කියන්නේ අපේ රටේ ආර්ථිකයේ ප්‍රධානතම කුලුනක් බව මම මේ වෙලාවේ සඳහන් කරන්න කැමැතියි. ඒ විතරක් නොවෙයි, අපේ රටට විදේශ විනිමය උපයා දෙන ප්‍රධානතම අංශයක් තමයි, විදේශ රැකියා අංශය. අපට මතකයි, කොවිඩ් වසංගතයෙන් පසුව රට බංකොලොත් වූ බව කිව්වාම, ඒ වෙලාවේ සමහර දේශපාලන පක්ෂ රටට එක ඩොලරයක්වත් එවන්න එපා කියද්දීත්, විදේශගත ශ්‍රමිකයන් එවපු විදේශ ප්‍රේෂණ නිසා අපේ විදේශ සංචිතය යම් ප්‍රමාණයකින් හරි ශක්තිමත් කර ගන්නට එදා පුළුවන්කම ලැබුණා කියන කාරණය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අදටත් මේ ආසියානු කලාපයේ රටවල් බොහොමයක් ප්‍රධාන ආර්ථික උපාය මාර්ගයක් හැටියට තමයි මේ විදේශ ප්‍රේෂණ පාවිච්චි කරන්නේ. අපේ අසල්වැසි ඉන්දියාව දිහා බැලුවොත්,

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ඉන්දියාවේ විදේශගත ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව අපේ රටේ සමස්ත ජනගහනය වාගේ දෙගුණයකටත් වඩා වැඩියි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි නිකමට වාගේ හිතමු, විදේශගත ඉන්දියානුවන් මාසයකට එක ඩොලරය බැගින් ඉන්දියාවට එවනවා කියලා. ඉන්දියාවට ඩොලර් කෝටි හතරහමාරක් විතර විදේශ රැකියාවලින් විතරක් ලැබෙනවා. ඉන්දියානුවන්ට විදේශ රැකියා වෙළෙඳ පොළට අවතීර්ණ වෙන්න ඒ තරමට පුළුවන්කම ලැබුණේ අඛණ්ඩ ජාතික වැඩ පිළිවෙළක් මේ අංශයෙන් ඉන්දීය රජය සතුව තිබීම නිසා යැයි මට එක වෙලාවකට හිතෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටටත් එවැනි ජාතික වැඩ පිළිවෙළකට යන්න දැන් කාලය එළඹිලා තිබෙනවා කියන එක තමයි මගේ විශ්වාසය. අපි ගරු ඇමතිතුමාට කියනවා, ඒ පිළිබඳව අවධානය යොමු කරලා මේ විදේශ රැකියා අංශය පිළිබඳව ජාතික වැඩ පිළිවෙළක් ගැන කඩිනමින් අවධානය යොමු කළොත් හොඳයි කියා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විදේශ රැකියා අංශය අපට දැවැන්ත ශක්තියක් කියලා කොයි තරම් උදන් ඇනුවත් අපි අමතක කරන්න නරකයි තවමත් මේ විදෙස්ගත ශ්‍රමිකයන් වැඩි පිරිසක් ඉතා කටුක අම්හිරි අත් දැකීම් ලබමින් එම රැකියාවල නිරත වෙලා ඉන්නවා කියන කාරණය. ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය විතරක් නොවෙයි ගැටලුවක් වෙලා තිබෙන්නේ. යුදමය තත්ත්වයන් හමුවේ ඇතැම් අවස්ථාවල ඔවුන්ගේ ජීවිතවලට අනාරක්ෂිත වටපිටාවක් ගොඩ නැඟී තිබෙනවා. පසුගිය කාලයේත් එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා අපි දැක්කා. ඉතා අනාරක්ෂිත වටපිටාවක රැකියා කරන්නත් පිට රට රස්සා කරන අපේ රටේ උදවියට සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම, ගෘහ සේවයට යන අපේ කාන්තාවන්ටත් විවිධ හිංසනවලට, අපයෝජනවලට ලක් වෙන අවස්ථා උදා වෙනවා. බොහෝ විට එවැනි සිදුවීම් වාර්තා වෙනවාටත් වඩා වාර්තා නොවී කාලයේ වැලිතලාවෙන් වැසී යන වාර වැඩියි කියලාත් අපට හිතෙනවා. ඒ විතරකුත් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. විවිධ ජාවාරම්කරුවන්ට අහුවෙලා, රැවටිලා, නොදන්නා රටවලට ගිහින් අතර මං වන පිරිසකුත් මේ අය අතර අපට බහුලව වාර්තා වෙනවා. විශේෂයෙන්ම එම රටවල පවතින නීති-රීති ගැන විදේශ රැකියාවලට යන අපේ අයට දැනුම අඩුයි. ඒ රටවල භාෂාව ගැන, ඒ රටවල සංස්කෘතිය ගැන තිබෙන අනවබෝධය නිසා අපේ සමහර ශ්‍රමිකයන්ට හිරේ විලංගුවේ වැටෙන්නත් වෙන අවස්ථා ගැන අපට වාර්තා වෙනවා. සමහර අය ඒ රටවලින් පිටුවහල් කරන අවස්ථාත් තිබෙනවා.

පිට රට රස්සාවකට යන්න අවස්ථාව ලැබුණාම, අපේ රටේ තරුණ තරුණියන්, විශේෂයෙන්ම දෙමාපියන් ඉඩකඩම් විකුණලා, ගෙවල් දොරවල් උකස් තියලා, ණය වෙලා, මුදල් සොයාගෙන දහසකුත් බලාපොරොත්තු ඇතිව තමයි විදේශ රැකියාවලට යන්නේ. සමහර අය ආපසු එනකොට ඒ සියලු සිහින බොඳ වෙලා ඉවරයි. එම නිසා රටට විදේශ විනිමය සොයා දෙන මේ වටිනා පිරිසගේ පවුල්වල සුබසාධනය සහ සුරක්ෂිතභාවය ගැන මීට වඩා අවධානය යොමු කිරීමේ බලවත් යුතුකමක් පක්ෂ, විපක්ෂ අපි කාටත් තිබෙනවා කියලා මම හිතනවා. මේ විදේශ රැකියා ක්ෂේත්‍රය හැම අතින්ම සුරක්ෂිත විය යුතුව තිබෙනවා. ඔවුන්ගේ විශ්‍රාම දිවිය පවා ගෞරවනීය විධියට ගත කරන්න පුළුවන් කියන විශ්වාස ඇති වුණොත් පමණයි මේ ක්ෂේත්‍රය තවදුරටත් රැකගන්නත්, වර්ධනය කරගන්නත් අපට පුළුවන් වෙන්නේ කියලා අපි හිතනවා. විශේෂයෙන්ම විදේශ රැකියාවල යෙදී සිටින අයට විශ්‍රාම වැටුප් දෙන හැටි නොයෙක් අවස්ථාවල කථා කරලා තිබෙනවා. ඒවා ප්‍රායෝගික යථාර්ථයක් බවට පත් කරගන්න පුළුවන් ක්‍රම කොයි විධියෙන් හරි ඇතිවෙන්න අවශ්‍යයි කියලා මම හිතනවා.

වර්තමානයේ අපේ ආර්ථිකයේ ප්‍රධානතම ක්ෂේත්‍ර ගණනාවක විශ්වාසය බිඳ වැටෙමින් පවතිනවා. බලන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ සභාවේ බොහෝදෙනෙක් පෙන්වා දුන් පරිදි, මාසයකට වැඩි කාලයක් තිස්සේ අපේ රටට බත සපයන වී ගොවීන්ගේ අස්වැන්නට සාධාරණ මිලක් ඉල්ලා උද්ඝෝෂණය කරන හැටි රට පුරාම දකින්න ලැබෙනවා. අද උදේත් ගොවි ජනතාව මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපේ මහජන නියෝජිතයන් සමඟ ඒ ගැන කථා කරනකොට මම දැක්කා, ඔවුන් මොන තරම් ගැටලු රාශියකට මුහුණ දෙනවාද කියන එක. රජය විසින් පොරොන්දු වෙච්ච සහතික මිල වෙනුවට කුණු කොල්ලයට වී විකිණීමට සිදුව තිබීමේ විලාපය අද වෙද්දී රට පුරාම ගොවි ජනතාවගෙන් බුර බුරා මතු වෙනවා. දැන් ඒ ගොවි ජනතාවට ඡන්ද කාලවල ලැබිච්ච, ඊට පෙර වේදිකාවල ඇහුණු සුරංගනා කථා නොවෙයි අහන්න වෙන්නේ. ගොවි ජනතාවගේ කර මතින් බලයට ඇවිත්, ඒ මිනිස්සුන්ට විවිධ අපහාස, උපහාස කරමින්, ඔවුන් සමච්චලයට ලක් කරන්න ආණ්ඩුව පැත්තෙන් දැන් පටන්ගෙන තිබෙන බව පසුගිය කාලයේ විවිධ උදවිය කරන ප්‍රකාශවලින් අපි දැක්කා.

වී ගොවියාගේ විතරක් නොවෙයි, අපේ පළාත්වල කුඩා තේ වතු හිමියන්ගේ පවා විශ්වාසය ඉතා වේගයෙන් බිඳ වැටෙමින් පවතිනවා. මේ වගාවේ ඉඳලා වැඩක් වෙයිද, අනාගතයක් තිබේද, තවදුරටත් අපි මේ වගාවේ හිටියොත් අපට වෙන්නේ මොකක්ද කියන එක ගැන දෙතුන් පාර හිතන්න දැන් විවිධ ක්ෂේත්‍රවල උදවිය කල්පනා කර තිබෙනවා. ඒ අයට පොහොර ටික දමාගන්න විධියක් නැහැ. පොහොර මිල දරාගන්න බැහැ. නිෂ්පාදන වියදම් ඔරොත්තු දෙන්නේ නැහැ. හරි මිලක් ලැබෙන්නේ නැහැ ඔවුන්ගේ නිෂ්පාදනවලට. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "මඩ සෝදාගත් කල ගොවියා රජකමට සුදුසුයි" කියන ඉපැරණි වැකිය පවා අද මේ ආණ්ඩුවේ සමච්චලයට ලක්වෙලා තිබෙනවා. කොහොමටත් ගොවියා මඩ සෝදාගෙන ගොඩට එනවාට මේ ආණ්ඩුව කැමැති නැති බව තමයි අපට නම් පෙනෙන්නේ. ගොඩ එන්න උත්සාහ කරන ගොවි ජනතාව තවදුරටත් මඩේම ඔබන්න තමයි රජයට වුවමනා වෙලා තිබෙන්නේ කියන එක ආණ්ඩුවේ ක්‍රියාකාරකම්වලින් අපට වැටහෙනවා.

මම මීට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අවසාන වශයෙන්, ලක්ෂ සංඛ්‍යාත ගොවි ජනතාවට අත් වුණු ඉරණම විදේශගත ශ්‍රමිකයන්ට අත් වන්නට නොදී, ඔවුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමට ජාතික වැඩ පිළිවෙළක් ඇති කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මම තව මොහොතක් ඉල්ලනවා, බන්ධනාගාරයේ සිදු වුණු අවාසනාවන්ත, ඛේදජනක තත්ත්වය නිසා මිය ගිය නිලධාරින්ගේ පවුල්වලට සහ රැඳවියන්ගේ පවුල්වලට අපගේ සංවේගය පළ කරන්නත්, තුවාල ලැබුවන්ට ඉක්මන් සුවය ලැබෙන්න කියලා ප්‍රාර්ථනය කරන්නත්. මෙතෙකින මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.16]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ යෝජනාවට අනුව, විදේශ රැකියාවල නියුතුව ඉන්න ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් පිළිබඳව රජයක් විධියට අපට ඉතාම හොඳින් කරුණු දක්වන්න පුළුවන්. මොකද, ලෝකයේ මොන ආර්ථික කඩා වැටීම් තිබුණත්, මොන යුද්ධමය ප්‍රශ්නය තිබුණත් අපේ රට ශක්තිමත් කළේ අපේ විදේශගත ශ්‍රමිකයන්. ඒ නිසා මුලින්ම ඔවුන් අපට දක්වන දායකත්වය පිළිබඳව පමණක් නොවෙයි විශ්වාසය පිළිබඳවත් ඔවුන්ට රජයේ කෘතවේදීතාව පුද කරන්න ඕනෑ.

ඔවුන් මේ යන්නේ - ගිහිල්ලා තිබෙන්නේ - සුව පහසු ගමනක් නොවෙයි. ඒ වාගේම කරන සමහර රැකියාත් සුව පහසු ඒවා නොවෙයි. ඒ අය දරුවන්, ඥාතීන් සියලුදෙනාගෙන් වෙන් වෙලා නොදන්නා රටකට ගිහිල්ලා රැකියා කරලා මේ වැටුප මේ රටට එවන්නේ තමන්ගේ පවුල වෙනුවෙන්, තමන්ගේ රට වෙනුවෙන්.

2025 වර්ෂයේදී ඩොලර් බිලියන 8කට වැඩි ප්‍රමාණයක් විදේශ ශ්‍රමිකයන් අපේ රටට එවලා තිබෙනවා. ඒ ප්‍රමාණය ඓතිහාසික ප්‍රමාණයක් බව අපි දන්නවා. මේ වෙනකොට ඒ ක්ෂේත්‍රයේ වෙනස්කම් කිහිපයක් සිද්ධ වෙලා තිබෙනවා. 2020දී විදේශගත පිරිමි ශ්‍රමිකයන්ගේ ප්‍රතිශතය සියයට 46.4යි. කාන්තා ශ්‍රමිකයන්ගේ ප්‍රතිශතය සියයට 53.6යි. හැබැයි අපේ රටේ සහ ලෝකයේ ඇති වුණු විවිධ වෙනස්කම් එක්ක 2025 වෙනකොට ඒ සංඛ්‍යාලේඛනවල විශාල වෙනසක් පෙන්වනවා. ඒ අනුව විදේශගත ශ්‍රමිකයන්ගෙන් සියයට 63ක් පිරිමි ශ්‍රමිකයන් බවට පත් වෙලා තිබෙනවා. කාන්තා ශ්‍රමිකයන් ප්‍රමාණය සියයට 37 දක්වා අඩු වෙලා තිබෙනවා. එසේ තිබියදීත් අපට විදේශවලින් එවන මුදල් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා.

ඒකේ තිබෙන logic එක මේකයි. පසුගිය කාලයේ මේ ශ්‍රමිකයන්ගෙන් වැඩි ප්‍රමාණයක් විදේශගත වුණේ පුහුණු ශ්‍රමිකයන් හැටියට නොවෙයි. නුපුහුණු ශ්‍රමිකයන් රට යවද්දී හොඳ වැටුපක් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම සේවා ගිවිසුම් අනුව නොවෙයි යන්නේ. ඒ වාගේම ප්‍රමිතිගත රැකියාවලට නොවෙයි යන්නේ. හැබැයි ක්‍රමක්‍රමයෙන් අපේ රට පරිවර්තනය වෙමින් පවතිනවා ප්‍රමිතිගත රැකියා සඳහා රට යවන ප්‍රමාණය වැඩි කරන්න. ඒ වාගේම අපි මැද පෙර දිග රටවලට අමතරව ඊශ්‍රායලය, කොරියාව, ජපානය වාගේ රටවලට ශ්‍රමිකයන් යවන්න පටන් අරගෙන තිබෙනවා. එහිදී ඔවුන්ට ලැබෙන වැටුප වැඩි වෙලා තිබෙනවා. ඒ වැටුප්වලින් විශාල ප්‍රමාණයක් අපේ රටට ලැබෙනවා.

කාන්තා ශ්‍රමිකයන් විදේශගත කරනවා නම් අපි විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා, අඩුම ගානේ NVQ Level 3 හෝ NVQ Level 4 කියන මට්ටමේ අය යැවිය යුතුයි කියලා. පසුගිය ආණ්ඩු කාලයේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය තුළ ප්‍රශ්න රාශියක් තිබුණා. විශේෂයෙන් මැද පෙර දිගට යවපු කාන්තාවන් යවලා තිබෙන්නේ අඩුම ගණනේ මේ NVQ Level 3 වත් කරවන්නේ නැතිව, කිසිම පුහුණුවක් නැතිව. හැබැයි, සමහර පුහුණු වැඩසටහන් කළා කියලා වාර්තා වෙලා තිබෙනවා සහ ඒවාට මුදල් ගෙවලා තිබෙනවා කියලා අපි දැක්කා. හැබැයි, ඔවුන්ට ඒ පුහුණුව ලබා දීලා නැහැ. එහෙම පුහුණුවක් නැතිව ගෘහ සේවිකාවන් විධියට ගිය අපේ රටේ කාන්තාවන් විශාල විධියේ හිරිහැරවලට ලක් වෙලා තිබෙනවා. හැබැයි, දැන් නව රජයේ ප්‍රතිපත්තිය තමය ප්‍රමිතිගත රැකියාකරණය සඳහා ඔවුන් යොමු කරමින් ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත වන විධියට හා ඔවුන්ටත් වටිනාකමක් ලැබෙන විධියට විදේශ රැකියාකරණයේ පරිවර්තනයක් කිරීම. ඒකෙදී කාන්තාවන්ගේ ජීවිතවලට සුරක්ෂිතභාවයකුත්, ඔවුන්ට වටිනාකම් ප්‍රමාණයකුත් ලැබෙනවා. මම හිතන විධියට කාර්යාංශය පැත්තෙන් වැඩි බරක් තිබෙන්නේ සාත්තු සේවිකාවන් වශයෙන් පුහුණුව ලබා දෙමින්, ළමයින් බලා ගන්නා අය වශයෙන් පුහුණුව ලබා දෙමින්, සූපවේදීන් වශයෙන් පුහුණුව ලබා දෙමින් රට යවන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් දන්නවා ඇති අද අපි සිටින වට පිටාවේ පවුලක් ගත්තොත් වැඩි වශයෙන් තරුණයන් මත් ද්‍රව්‍යවලට බහුල විධියට ඇබ්බැහි වෙලා තිබෙන බව. ඔවුන්ට නැවතත් ජීවිතය ලබා දෙන්න අම්මලා, තාත්තලා සැහෙන උත්සාහයක් ගන්නවා. මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා සිටින අයට පවා පුහුණුව ලබා දෙමින්, ඔවුන්ව විදේශගත කරන්න විශේෂ ව්‍යාපෘති රජයෙන් යෝජනා කරලා තිබෙනවා, අපි දැක්කා. සාමාන්‍යයෙන් අම්මා කෙනෙක් රැකියා සඳහා පිට රට යවනවාට වැඩිය, විවිධ දේවල්වලට ඇබ්බැහි වෙලා ඉන්න එවැනි පුහුණුවක් ලත් තරුණයන් විදේශගත වෙලා ඔවුන්ට ඒ පවුලේ වගකීම ගන්න පුළුවන් වෙනවා නම්, එක පැත්තකින් මේ දැවැන්ත ප්‍රශ්නයක් වෙලා තිබෙන මත් ද්‍රව්‍ය උවදුරට ගොදුරු වුණු අපේ තරුණ ජීවිතවලට වටිනාකමක් ලබා දෙන්න අපට පුළුවන්. ඒ තුළින් මත් ද්‍රව්‍ය උවදුරෙන් දරුවන් බේරා ගන්න පුළුවන් වෙනවා වාගේම එම පවුලත් ශක්තිමත් වනවා. අපට ඕනෑ වෙලා තිබෙන්නේ අපේ ආර්ථික ප්‍රතිපත්තිය මේවාත් එක්ක හැදෙන්න. ප්‍රමිතිගත රැකියාකරණයකට පරිවර්තනය වන ගමන්, විශේෂයෙන්ම තරුණ දරුවන්ට මේ අවස්ථාව ලබා දෙන්න අපි කටයුතු කරනවා. මොකද, විදේශ රැකියා සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ වැඩි ඉඩකඩක් ලැබිලා තිබෙනවා. ඒ සඳහා ඔවුන්ව යොමු කිරීමට මේ වෙද්දි කාර්යාංශය මැදිහත් වනවා. එය අපේ ප්‍රමිතිගත රැකියාකරණයේ ඉදිරි ගමනක් විධියට අපි සලකනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය කාලයේ සිදුවුණු සිද්ධීනුත් මම මතක් කරන්න ඕනෑ. මොකද, ලියාපදිංචි වෙලා නැති ඒජන්සිවලින් විශාල ප්‍රමාණයක් විදේශගත වුණා. විදේශගත වුණාට පසුව ඒ අය ගැන සමහර විට තානාපති කාර්යාලවලින් හරියට සොයා බැලීමක් තිබුණේ නැහැ. හැබැයි. දැන් online සේවයක් ක්‍රියාත්මක වනවා. ඒ කියන්නේ, විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් mobile app එකක් හඳුන්වා දීලා තිබෙනවා. විදේශගත වෙලා සිටින ඕනෑම සේවක සේවිකාවකට ඕනෑම වෙලාවක තමන්ගේ ගැටලු ඉදිරිපත් කරන්න පුළුවන්. එම සේවය විදේශගත ශ්‍රමිකයන්ට හොඳ අවස්ථාවක්. ඒ වාගේම තමයි විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක වන සුභසාධන වැඩ පිළිවෙළ. මේ රජය මඟින් විදේශගත ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා, ඒ කියන්නේ අවුරුදු පහට අඩු පෙර පාසල් යන වයසේ දරුවන් ඉන්නවා නම් ඒ දරුවන් බලා ගැනීම සඳහා, ඒ පෙර පාසලට හෝ day-care centresවලට එක දරුවෙක් වෙනුවෙන් රුපියල් 10,000ක් වෙන් කරලා තිබෙනවා. එය විදේශගත ශ්‍රමිකයන්ගේ දරුවන්ගේ සුභසාධනය සඳහා යොදවපු හොඳ මුදලක්. ඒ වාගේම 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, A/L සහ විශ්වවිද්‍යාල අධ්‍යාපන කටයුතුවලටත් කාර්යාංශය මඟින් මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ සුභසාධන වැඩ ටික තව තවත් ශක්තිමත් කරන්න ඕනෑ. මොකද, විදේශගත ශ්‍රමිකයන්ගෙන් මේ රටට ලැබෙන ප්‍රේෂණ අපට අවශ්‍යයි. පවුලේ ආර්ථිකය ශක්තිමත් කරන්න නම් තරුණ දරුවන් වැඩිපුර විදේශ රැකියා සඳහා යොදවා ගැනීමේ සැලැස්මක් තිබිය යුතු බව ඇත්ත. හැබැයි, ඒකේදී වංචනිකයන්ගෙන් මුදා ගනිමින් වගකීමෙන් කටයුතු කරන විදේශ රැකියා ඒජන්සි සඳහා දරුවන් යොමු කරන එක අපේ රජයේ මූලික වගකීමක් කියලා

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

මම හිතනවා. ඒ නිසා නියාමනය කිරීමේ කාර්ය තමයි එම ආයතනයට වැඩිපුරම තිබෙන්නේ. ඒ නියාමනයේදී ඔවුන් දක්වන වැඩ පිළිවෙළ හරහා තමයි අපේ ශ්‍රමිකයන්ට වැඩිපුරම ඒ සේවාව ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විදේශගත ශ්‍රමිකයන්ට ඡන්ද අයිතිය ලබා දීම පිළිබඳව ලොකු කථාබහක් තිබුණා. දායක විශ්‍රාම අරමුදල වාගේම අපේ විදේශගත ශ්‍රමිකයන්ට ඡන්ද අයිතිය ලබා දෙන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව සාකච්ඡාවක් තිබුණා. මම හිතන්නේ අමාත්‍යාංශය දැනටමත් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා ඡන්ද ක්‍රමය පිළිබඳව සාකච්ඡා කරමින් යනවා. ඒ නිසා, අපට රටක් විධියට ඔවුන්ගේ අයිතිය වෙනුවෙන් පෙනී සිටින්න පුළුවන් කියලා අපි හිතනවා. කලින් විදේශ ශ්‍රමිකයන් සඳහා නොතිබුණු මෙන්න මේ වටිනාකම් එක් කරන්න පුළුවන් වීම හොඳ දෙයක්. මොකද, ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව පවා, ඒ වාගේම වෙනත් ආයතන පවා ප්‍රායෝගික වන්නේ මොන ඡන්ද ක්‍රමයක් ද කියන කාරණය පිළිබඳව සාකච්ඡා කරමින් පවතිනවා. ඒකත් අපේ විදේශගත ශ්‍රමිකයන් වෙනුවෙන් අපට ලබා දෙන්න පුළුවන් හොඳ අවස්ථාවක්.

ඊළඟට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල DOsලා ඉන්නවා. එම DOsලාට තමයි විදේශගත ශ්‍රමික කාන්තාවන්ගේ පවුලේ ප්‍රශ්න ටික එන්නේ. විශේෂයෙන්ම කාන්තාවක් විදේශගත වනවා නම් එම පවුලේ කටයුතු පිළිබඳව වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. අපි හිතමු, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු දරුවෙක් ඉන්න පවුලක් කියලා, එහෙම නම් ඒ පවුල සඳහා අනිවාර්යයෙන්ම plan එකක් හදන්න ඕනෑ. ඒ plan එක තමයි ඔවුන් විදේශගත වුණාට පස්සේ ඔවුන්ගේ family එකේ ඉලක්කය මොකක්ද, ඔවුන්ගේ ආර්ථික සැලැස්ම මොකක්ද, ඔවුන් විදේශගත වෙලා නැවතත් මේ රටට ආවාට පස්සේ ස්වයං රැකියාවක් කරනවාද, එහෙම නැත්නම් ආර්ථික වැඩ පිළිවෙළක් සකස් කරනවාද කියන එක. ඒ නිසා මේ monitoring එක හරිම වැදගත්. ඒ නිසා, ඔවුන්ගේ මුදලින් මේ රටේ පුරවැසියෙක් විධියට නැවතත් ඉතාම සාර්ථක ආර්ථික සැලැස්මකට අනුව ඔවුන්ව ගොඩ නඟන එකත් DOsලා හරහා කරනවා. ඒ නිසා මට හිතෙන්නේ මෙවැනි වැඩ පිළිවෙළවල් හරහා, - අපට ප්‍රශ්න නැතුවා නොවෙයි, ප්‍රශ්න තිබෙනවා - හැබැයි, මෙවැනි සුබසාධන වැඩ පිළිවෙළවල් ශක්තිමත් කිරීම තුළින් තව තවත් අපේ විදේශගත ශ්‍රමිකයන්ගේ ආරක්ෂාවටත් අපේ අමාත්‍යාංශය හරහා අවස්ථාවක් හැදෙනවා. ඒකත් ඒ අයගේ ශක්තිය තවදුරටත් වර්ධනය කරන එකක්. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඊළඟට, ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.28]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் கௌரவ ஹெக்டர் அப்புஹாமி அவர்களால் கொண்டுவரப்பட்டுள்ள புலம்பெயர் தொழிலாளர்களின் நலன் மற்றும் பாதுகாப்புத் தொடர்பான சபை ஒத்திவைப்பு வேளையின்போதான பிரேரணையை ஆளுங்கட்சி சார்பில் வரவேற்று உரையாற்ற விரும்புகின்றேன். இந்த விவாதமானது, வெறுமனே வெளிநாட்டு வேலைவாய்ப்புடன் மட்டும் தொடர்புடைய விவாதமல்ல. மாறாக, எமது நாட்டின் பொருளாதாரம், இலட்சக்கணக்கான குடும்பங்களின் எதிர்காலம், மனித வளத்தின் பாதுகாப்பு, சமூகநலன் என்பவற்றுடன் தொடர்புடைய மிக முக்கியமானதொரு விவாதமாகும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, வெளிநாடுகளில் பணிபுரியும் இலங்கை தொழிலாளர்கள் எமது பொருளாதாரத்தின் முக்கிய தூண்களில் ஒன்றாகக் கருதப்படுகின்றார்கள். பொருளாதார நெருக்கடி நிலவிய காலத்தில் அவர்கள்மூலம் கிடைத்த அந்நியச் செலாவணி நாட்டின் பொருளாதார மீட்சிக்குப் பெரும் ஆதரவாக அமைந்தது. நாம் அவர்களை வெறும் அந்நியச் செலாவணியை ஈட்டித்தரும் மனித வளமாக மட்டும் பார்க்க முடியாது. அவர்கள் ஒவ்வொருவரும் ஒரு குடும்பத்தின் நம்பிக்கை! அதுமாத்திரமல்ல, ஒரு தாயின் தியாகம்; ஒரு தந்தையின் கனவு; ஒரு குழந்தையின் எதிர்காலம்! The migrant workers are not just foreign exchange earners, they are also nation builders. எனவே, அவர்களின் பாதுகாப்பு, உரிமைகள் மற்றும் கண்ணியத்தை உறுதிசெய்வது எமது அரசாங்கத்தின் பொறுப்பாகும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, புலம்பெயர் தொழிலாளர்களின் பாதுகாப்பை உறுதி செய்வதற்காக எமது அரசாங்கம் பல்வேறு நடவடிக்கைகளை எடுத்து வருகின்றது. குறிப்பாக, வெளிநாட்டு வேலைவாய்ப்பு சேவைகளை நவீனமயப்படுத்துதல், தொழிலாளர்களின் முறைப்பாடுகளை விரைவாகக் கையாளும் முறைமைகளை உருவாக்குதல், வெளிநாடு செல்லுமுன் தேவையான பயிற்சிகளை வழங்குதல், தூதரக சேவைகளை வலுப்படுத்துதல் போன்ற நடவடிக்கைகளை முன்னெடுத்து வருகின்றது. அதுமாத்திரமன்றி, டிஜிட்டல் தொழில்நுட்பத்தின் மூலம் புலம்பெயர் தொழிலாளர்களுக்கு நேரடி சேவைகளை வழங்கும் முயற்சிகளும் மேற்கொள்ளப்பட்டு வருகின்றன. Technology should become a protection mechanism for our migrant workers. தொழிலாளர்கள் பிரச்சினையில் சிக்கிய பின்னர் உதவுவதோடு மட்டும் நின்றுவிடாது, அவர்கள் பிரச்சினையில் சிக்காமல் தடுக்கும் முறைகளையும் உருவாக்க வேண்டும். அதற்காக எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் பல்வேறு முயற்சிகளை எடுத்து வருகின்றது.

இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகமானது, புலம்பெயர் தொழிலாளர்களின் பிள்ளைகளுக்குப் புலமைப் பரிசில்களை வழங்கி வருகின்றது. அவ்வாறானதொரு நிகழ்வு கடந்த வாரம் யாழ்ப்பாணத்தில் நடைபெற்றது. நாங்கள் 33 மாணவர்களுக்கு அந்தப் புலமைப்பரிசிலைப் பெற்றுக் கொடுத்தோம். அதாவது, scholarship பரீட்சையில் சித்தியடைந்த மாணவர்களுக்கு 25,000 ரூபாயும், GCE (O/L) பரீட்சையில் சித்தியடைந்த மாணவர்களுக்கு 30,000 ரூபாயும், GCE (A/L) பரீட்சையில் சித்தியடைந்து பல்கலைக்கழகம் செல்கின்ற மாணவர்களுக்கு 40,000 ரூபாயும் வழங்கப்பட்டது.

நாம் வெளிநாட்டு வேலைவாய்ப்புத் துறையில் முக்கியமானதொரு மாற்றத்தை நோக்கி நகரவேண்டிய தேவையிருக்கின்றது. Simply we can say, from labour migration to skilled migration. வெறுமனே குறைந்த திறன்கொண்ட தொழிலாளர்களை அனுப்பாமல், உலக தொழிற்சந்தைக்கு ஏற்றவகையில் தேவையான திறன்களைக்கொண்ட, மொழி அறிவுகொண்ட, தொழில்நுட்ப அறிவுகொண்ட தொழிலாளர்களை உருவாக்க வேண்டும். அதற்காக அரசாங்கமாகிய நாங்கள் பல்வேறு முயற்சிகளில் ஈடுபட்டு வருகின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2026ஆம் ஆண்டு யூன் மாதம் வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சு, இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம், சர்வதேச தொழிலாளர் அமைப்பு - ILO - ஆகியன இணைந்து, "LankaKonect" என்ற mobile செயலியை அறிமுகப்படுத்தியுள்ளன. உலகில் எந்தவொரு நாட்டிலிருந்தும் இலங்கை புலம்பெயர் தொழிலாளர்கள் தங்களது முறைப்பாடுகளைப் பதிவுசெய்யவும், அவற்றின் முன்னேற்றத்தைக் கண்காணிக்கவும், தேவையான அரசாங்க உதவிகளைப் பெறவும் இந்தச் செயலி உதவுகின்றது. இது தொழிலாளர்களின் பாதுகாப்பை டிஜிட்டல் தொழில்நுட்பத்தினூடாக வலுப்படுத்தும் ஒரு முக்கிய விடயமாகும்.

2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின் ஊடாக புலம்பெயர் தொழிலாளர்களுக்குப் பங்களிப்பு அடிப்படையிலான ஓய்வூதியத் திட்டமொன்றை அறிமுகப்படுத்தவும், சலுகை அடிப்படையில் வீடமைப்புக் கடன் திட்டத்தை நடைமுறைப்படுத்தவும் நடவடிக்கை எடுப்பதாக அரசாங்கம் அறிவித்துள்ளது. இதற்கு ஆரம்ப கட்டமாக 2,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது.

இன்று வெளிநாட்டு வேலைவாய்ப்புத் துறையின் தேசியக் கொள்கையானது, "safe, orderly and regular migration" என்ற சர்வதேச அங்கீகாரம் பெற்ற அணுகுமுறையை அடிப்படையாகக்கொண்டு முன்னெடுக்கப்படுகின்றது. திறமைமிக்க மற்றும் அரைத் திறன்மிக்க தொழிலாளர்களுக்கான உலகளாவிய வேலைவாய்ப்புகளை விரைவுபடுத்தல், தொழிலாளர் குடும்பங்களின் நலனை உறுதிப்படுத்துதல் என்பன அமைச்சின் முக்கிய இலக்குகளாகக் காணப்படுகின்றன.

அண்மையில் மாண்புமிகு சனாதிபதி அவர்கள், மத்திய கிழக்கு நாடுகளில் ஏற்பட்டுள்ள பாதுகாப்பு நிலைமைகளை முன்னிட்டு, வெளிநாடுகளிலுள்ள இலங்கை தொழிலாளர்களின் பாதுகாப்பை மீளாய்வு செய்து, 24 மணி நேர அவசர உதவிச் சேவைகள் மற்றும் அவர்களுக்கான பாதுகாப்பு நடவடிக்கைகளை மேலும் வலுப்படுத்துமாறு அதிகாரிகளுக்கு அறிவுறுத்தியிருந்தார். இதுபோன்ற பல நடவடிக்கைகளை எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் தொடர்ந்து முன்னெடுத்து வருகின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்தத் தேசிய விடயத்துடன் தொடர்புபடுத்தி, வடக்கு மாகாணம் எதிர்கொள்ளும் சில தனித்துவமான பிரச்சினைகளை இந்த உயரிய சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். யாழ்ப்பாணம், கிளிநொச்சி, முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களிலுள்ள பல இளைஞர்களும் பெண்களும் பொருளாதாரக் காரணங்களால் வெளிநாடுகளுக்குச் செல்கின்ற நிலையை அடைகின்றனர். யுத்தத்துக்குப் பின்னரான பொருளாதாரத் தாக்கம், உள்ளூர் வேலைவாய்ப்பு பற்றாக்குறை, குடும்ப வருமானத் தேவைகள், வாழ்க்கைச் செலவு அதிகரிப்பு என்பன இதற்குக் காரணங்களாக அமைகின்றன. வெளிநாடு செல்வது என்பது, அவர்களுக்குப் பல நேரங்களில் ஒரு வாய்ப்பு அல்ல; ஒரு கட்டாயமான வாழ்க்கைத் தீர்மானமாக மாறியுள்ளது. Migration should be a choice, not a desperation. எனவே, வடக்கு மாகாணத்துக்கு விசேடமான வேலைவாய்ப்பு மற்றும் திறன் அபிவிருத்தி அணுகுமுறை தேவைப்படுகின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று வடக்கு மாகாணத்தில் மிகவும் கவலைக்குரிய விடயமாக, சுற்றுலா விசாமூலம் நடைபெறும் வேலைவாய்ப்பு மோசடி காணப்படுகின்றது. சில போலி முகவர்கள், இளைஞர்களின் வெளிநாடு செல்லும் கனவைப் பயன்படுத்தி அவர்களை ஏமாற்றுகின்றனர். சுற்றுலா விசா, மாணவர் விசா அல்லது போலியான வேலை ஒப்பந்தங்கள்மூலம் வெளிநாடுகளுக்கு அனுப்பப்படும் சிலர் அங்கு சென்ற பின்னர், வேலையில்லாமல் தவிக்கின்றனர்; கடன் சுமையில் சிக்குகின்றனர்; சட்டப் பாதுகாப்பை இழக்கின்றனர்; மனிதக் கடத்தல் வலையமைப்புகளால் பாதிக்கப்படுகின்றனர். The visa fraud is not only a financial crime, but also a human rights issue. எனவே, போலி வேலைவாய்ப்பு முகவர்களுக்கு எதிராக கடுமையான சட்ட நடவடிக்கை எடுத்தல், மாவட்ட மட்டத்தில் விழிப்புணர்வை ஏற்படுத்தல், தமிழ் மொழியில் ஆலோசனை சேவைகளை வழங்குதல், பதிவுசெய்யப்பட்ட முகவர்களின் தகவல்களை மக்களுக்கு வழங்குதல் போன்றவற்றை மேற்கொள்ள வேண்டிய தேவை இருக்கின்றது. யாழ்ப்பாணம் உள்ளிட்ட வடக்கு மாகாணத்திலுள்ள மாவட்டங்களில் வெளிநாட்டு வேலைவாய்ப்புத் தொடர்பான விசேட ஆலோசனை மற்றும் கண்காணிப்பு அமைப்புகள் உருவாக்கப்பட வேண்டியது மிகவும் அவசியமாகும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த இடத்தில் என்னுடைய சில ஆலோசனைகளை முன்வைக்க விரும்புகின்றேன். முதலாவது, வட மாகாணத்தில் Migrant Resource Centre ஒன்று அமைக்கப்பட வேண்டும். இதன்மூலம் வெளிநாடுகளுக்குச் செல்கின்ற இளைஞர் - யுவதிகளின் தேவைகள் மற்றும் பாதுகாப்பைக் கருத்திற்கொண்டு, அவர்களுக்குச் சரியான வழிகாட்டல்கள் வழங்கப்பட வேண்டும். இரண்டாவது, வடக்கு இளைஞர்களுக்கென Skilled Migration Training Hub ஒன்று உருவாக்கப்பட வேண்டும். அதனூடாக அவர்களுக்குத் தேவையான தொழிற்பயிற்சி, மொழிப்பயிற்சி, ஆலோசனைகள், அந்தந்த நாடுகளிலுள்ள சட்ட திட்டங்கள் பற்றிய அறிவு வழங்கப்பட வேண்டும். இதன்மூலம் எங்களுடைய தொழிலாளர்களைப் பாதுகாக்க முடியும். மூன்றாவது, வெளிநாட்டிலிருந்து நாடு திரும்புகின்ற தொழிலாளர்களுக்கு Reintegration and Entrepreneurship Support Programme ஒன்று உருவாக்கப்பட வேண்டும். ஏனெனில், அங்கிருந்து வருபவர்களை வரவேற்று, அவர்கள் இங்குள்ள நிலைமையோடு சேர்ந்து வாழக்கூடிய தன்மையையும், தொழில்வாய்ப்புகளைப் பெறக்கூடிய நிலைமையையும் ஏற்படுத்த வேண்டிய தேவை இருக்கின்றது. நான்காவது, மனிதக் கடத்தல் மற்றும் போலி வேலைவாய்ப்பு முகவர்களைத் தடுக்கும் விசேட கண்காணிப்பு முறைமை உருவாக்கப்பட வேண்டும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, புலம்பெயர் தொழிலாளர்கள் எமது நாட்டின் பொருளாதார வளம் மட்டுமல்ல, அவர்கள் எமது சமூகத்தின் முக்கிய அங்கமுமாகும். அவர்களின் பாதுகாப்பு என்பது பணம் சார்ந்த விடயமல்ல, அது மனிதக் கண்ணியம் சார்ந்த விடயமாகும். Safe migration, skilled workforce, protected families என்பனவே எம்முடைய இலக்காக இருக்க வேண்டும். எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் இந்த விடயங்களை கருத்திலெடுத்து, நல்லதொரு பாதுகாப்பான புலம்பெயர் தொழிலாளர் சமூகத்தை உருவாக்க வேண்டிய தேவையிருக்கிறது. அதை நாங்கள் உருவாக்குவோமென இந்த இடத்தில் கூறி, வாய்ப்பு வழங்கிய உங்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.38]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මම ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා, ඉතාම කාලෝචිත මාතෘකාවක් සහ වැදගත් කරුණක් පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරලා, මේ රට වෙනුවෙන් කැප වන විදෙස්ගත ශ්‍රමිකයින් කරන්නා වූ සේවය පිළිබඳව කථා කරන්න අද අවස්ථාව ලබා දීම පිළිබඳව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා මෙන්න මේ කරුණු ඔබතුමියගේ අවධානයට යොමු කරනවා. "Worker remittances to Sri Lanka hits a new all-time high of US Dollars 8 billion in 2025." What does this mean? ඒ කියන්නේ, ශ්‍රී ලාංකිකයින් ලෝකයේ රටවලට ගිහිල්ලා මහන්සි වෙලා වැඩ කරලා, මේ රටට මුදල් එවනවා. ඒ විතරක් නොවෙයි. "This marked a 22.8 per cent growth compared to US Dollars 6.6 billion recorded in 2024." ඒ වාගේම, "Workers' remittances cover almost 80 per cent of Sri Lanka's annual trade deficit." ගරු ඇමතිතුමනි, මේකේ තිබෙන වැදගත්කම මොකක්ද? Our people have gone out of the country and are working for Sri Lanka. That is why we have been able to keep our US Dollar remittances at this range.

දැන් බලන්න, අපේ රටේ දරුවෝ ඉගෙන ගන්න ලෝකයේ වෙනත් රටවලට යනවා. ඒ විධියට 2026දී higher educationවලට රුපියල් බිලියන 300කට ආසන්න ප්‍රමාණයක් වියදම් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අපේ රටට ඩොලර් බිලියන 8ක් එවලා තිබෙන ශ්‍රී ලාංකිකයින් වැඩි හරියක් unskilled workersලා. අපේ රටට තිබෙන ලොකුම සම්පත මානව සම්පත. එහෙම නම්, අපි කරන්න ඕනෑ මොකක්ද? අපි කරන්න ඕනෑ දේ තමයි, මේ රටේ උගත් පිරිසක් බිහි කරලා ඒ අය ලෝකය ජය ගන්න පුළුවන් පිරිසක් බවට පත් කරන එක. ඒ අයට අවශ්‍ය විශ්වවිද්‍යාල අධ්‍යාපනය මේ රටේ ඇති කරන එක. අපි රුපියල් බිලියන 300ක් අවුරුද්දකට වියදම් කරනවා, මේ රටෙන් පිට යන දරුවන්ට උගන්වන්න. ඒ දරුවන්ට මේ රට තුළ උගන්වලා, මේ රටේ මානව සම්පත දියුණු කරලා ලෝකය ජය ගන්න පුළුවන් සමාජයක් ගොඩනඟන්න පුළුවන් නම් ඒකයි වැදගත් වන්නේ.

"Combined with tourism, US Dollars 11 billion was earned in 2025." මේකේ වැදගත්කම මොකක්ද? ගරු විජිත හේරත් ඇමතිතුමාත් නියෝජනය කරන්නේ මගේ දිස්ත්‍රික්කය. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි මේ රටට ඩොලර් එන ප්‍රධාන මාර්ග දෙකම තිබෙන්නේ. හැබැයි, අපේ රටට ශ්‍රමිකයින් එනකොට Airport එකේදී ඒ අයට කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ, ලංකාවට ආ පසුත් ඔවුන්ට කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ. මේ රටට මෙච්චර ඩොලර් ප්‍රමාණයක් එවන ඒ අයට යම් සහනදායී වැඩ පිළිවෙළක් නැහැ. ගෙයක් හදාගන්න, වාහනයක් ගන්න, දරුවන්ට උගන්වන්න, හොඳ පාසලක් ලබා දෙන්න අපි කිසිම දෙයක් කරන්නේ නැහැ. හැබැයි මතක තබා ගන්න, මේ රටේ ආර්ථිකය මේ මට්ටමින් අද පවතින්නේ, ඩොලරය 335ට තිබෙන්නේ මේ අහිංසක ශ්‍රමිකයින් මේ රටට එවන සල්ලිවලින් කියන එක. හැබැයි, සමස්ත දේශපාලන ප්‍රවාහයම ඒ ගැන කනගාටු වෙන්න ඕනෑ වාගේම ලජ්ජා වෙන්න ඕනෑ. ඒ, මොකටද? අපි විදේශ රැකියාවලට යවන්නේ අපේ අම්මලා, නංගිලා, සහෝදරයෝ, අපේ බිරින්දෑවරු. ඒ අය පිට රටවලට ගිහිල්ලා ඒ ගෙවල්වල වළං හෝදනවා. අපි රටක් හැටියට අපොහොසත් වෙලා තිබෙනවා, මේ රටේ බුද්ධිමත් තරුණ ප්‍රජාවක් ගොඩනඟලා ඒ අයව වෛද්‍යවරු එහෙම නැත්නම් ඉංජිනේරුවරු හැටියට ලෝකයට විවර කරන්න. ඒ අයගේ අනාගතය ශක්තිමත් කරලා, මේ රටේත් අනාගතය සහ ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඔබතුමන්ලා දෙපළට තිබෙන වගකීම තුළ, විශේෂයෙන්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක කථා කරලා මේ රටට විශ්වවිද්‍යාල ගෙනෙන්න, විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්න දරුවන්ට අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දීලා, ඒ දරුවන්ව ලෝකයේ අනෙක් රටවලට යවන්න පුළුවන් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

Silicon Valley එක ගත්තොත්, අද වනකොට ඉන්දියානු ජාතිකයන් තමයි එහි වැඩිපුර ඉන්නේ. ලෝකයේ දියුණු රටවල වෛද්‍යවරු හැටියට ඉන්නේ ආසියානු කලාපයේ වෛද්‍යවරු. ශ්‍රී ලාංකීය වෛද්‍යවරුත් ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි වෛද්‍යවරු ගැන කථා කරනකොට මේ කාරණයත් කියන්න කැමතියි. විදෙස්ගතව ඉගෙන ගත් වෛද්‍යවරු ලංකාවට ඇවිල්ලා, Act 16 Examination එක කරලා, ERPM කරලා, internship එක කරන්න හැදුවත් ඒ අයට තවම දින ලබා දීලා නැහැ. කවදාද දිනය ලබා දෙන්නේ කියලා ඒ අයව දැනුවත් කරලා නැහැ. එවැනි ළමයි 500කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. අපේ රටේ මුදල් වියදම් කරලා අධ්‍යාපනය ලබපු ළමයින්ට මේ රටේ දොරවල් විවෘත කරනවා වෙනුවට අපි මෙහේ දොරවල් වහනවා. ඒ විතරක් නොවෙයි, දැනට internship අවසන් කරපු දරුවෝ ඉන්නවා, House Officersලා හැටියට. ඒ අය RHOsලා හැටියට කටයුතු කරන්න ජූලි 01වැනි දා ඉඳන් බලාපොරොත්තුවෙන් ඉන්නවා. නමුත්, ඒ අයට ඒ වෙනුවෙන් ක්‍රමවේදයක් නැහැ. එම නිසා ඒ කටයුතු පහු වෙනවා. එම නිසා මේ පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම නියෝජනය කරන මීගමුව ආසනයේ පිහිටි බන්ධනාගාරය තුළ සිදු වුණු සිදුවීම සම්බන්ධයෙන් අපි කනගාටු වෙනවා. එම සිදු වීමෙන් විශේෂයෙන්ම නිලධාරීන්ගේ වාගේම රැඳවියන්ගේ ජීවිත අහිමි වුණා. මගේ ආගම අනුව ඒ අයට මොක්සුව ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම මෙහෙම දෙයක් සිදු වුණේ ඇයි කියන එක පිළිබඳව හොයනවා වාගේම මේ රටේ යථාර්ථය පිළිබඳවත් අපි කල්පනා කරන්න ඕනෑ. 11,000ක් සිරකරුවන්ව සිර මැදිරිවල තියන්න පුළුවන් රටේ සිරකරුවන් 48,000කට ආසන්න ප්‍රමාණයක් බන්ධනාගාර තුළ ඉන්නවා. ඒ කියන්නේ සියයට 286කට වැඩි ප්‍රමාණයක් සිරකරුවන් මේ රටේ බන්ධනාගාරවල ඉන්නවා. "සැමන් පැක් කරනවා" කියලා තමයි ඒ අයව නිදි කරවන්නේ. ඒ අය නිදා ගන්නේ එහෙමයි. එක්කෙනෙක් පිට එක්කෙනෙක් නිදා ගන්නේ. ඒ නිසා හමේ හට ගන්නා රෝග තත්ත්වයන් වන කුෂ්ඨ, දද වාගේ රෝග බෝ වෙන්න පටන් ගන්නවා. ඒ අයට යන්න වැසිකිළියක් නැහැ. ඔවුන්ට වැසිකිළියට යන්න බැහැ. මම දන්නා සමහර සිරකරුවන් මට කියලා තිබෙනවා, රෑට ඒ අය කුඩුවට දාලා වැහුවාට පස්සේ පහුවැනි දා උදෑසන වෙනකල් වැසිකිළියට යන්න බැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඔබතුමාට ලැබී ඇති කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ කුඩුව ඇතුළේදී තමන්ගේ වැසිකිළි-කැසිකිළි පහසුකම් කරගන්න ඒ අයට බකට්

එකක් තමයි දෙන්නේ. සමහර අය රට කන්නේ නැහැ. ඇයි, ඒ? තමන්ගේ අවශ්‍යතාවට එළියට යන්න බැරි නිසා. හදිසියේ බඩේ අමාරුවක්වත් හැදුණොත් ඒ මිනිසුන්ට එතැන ජීවත් වෙන්න විධියක් නැහැ. මේ ඔක්කෝම මිනිස්සු. සමහර අය වැරදි කරලා ඉන්න පුළුවන්. සමහර අය ඇප පිට ඉන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියන කාරුණික ඉල්ලීම කරමින්, මෙම සභාව කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, අපේ විජිත හේරත් ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් සුබ පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ටී.කේ. ජයසුන්දර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.46]

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ මාතෘකාව ගැන කථා කරන්න පෙරාතුව විශේෂයෙන් මම මේ කාරණය සම්බන්ධයෙන් වචන කිහිපයක් කියන්න ඕනෑකම තිබෙනවා. විපක්ෂයේ ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් අද උදේ ගාල්ලේ බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාව මඟින් පාලනය වන ආදාහනාගාරය ගැන කථා කළා. ඒ සම්බන්ධයෙන් ලොකු විවේචනයකුත් කළා. බෝපෙ-පෝද්දල ආදාහනාගාරය සම්බන්ධයෙන් අපට කියන්න තිබෙන්නේ මෙයයි. එහි සිදු වුණු වංචා සහ දූෂණ සම්බන්ධයෙන් ඉදිරියට ක්‍රියාමාර්ග ටිකක් ගන්න තිබෙනවා. මොකක්ද ඒකට හේතුව? ඒගොල්ලන්ගේ පාලන කාලය ඇතුළත මේ ආදාහනාගාරය සම්බන්ධයෙන් කරපු වංචා සහ දූෂණ ගැන තොරතුරු විශාල ප්‍රමාණයක් එළියට ඇවිල්ලා තිබෙනවා. පාරවත් හරියට නැති නුසුදුසු තැනක ඉඩමක් අරගෙන ඒ කරපු දූෂණ ක්‍රියා පිළිබඳව දැන් තොරතුරු ලැබිලා තිබෙනවා. ඒගොල්ලන් බලයට එනකොට කණු 4ක් විතරක් තිබුණු ආදාහනාගාරය අපේ මාලිමාව රජය බලයට ඇවිල්ලා අවුරුදු එකහමාරක් ඇතුළත පාවිච්චි කළ හැකි මට්ටමට පත් කර තිබෙනවා. ඒ අනුව තව මාසයක් ඇතුළත මේ ආදාහනාගාරය ජනතාව සතු කරනවා. ඒ ගැන දැනගෙන අද පාර්ලිමේන්තුවේදී ඒ පිළිබඳව කථා කළා. නමුත් එතුමාට කියන්න තිබෙන්නේ එහි ඉතුරු දූෂණ චෝදනා ටිකත් ඉදිරියට එන්න නියමිතයි, ඒකටත් සූදානම් වෙන්න කියන එකයි.

විශේෂයෙන්ම ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කරපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව අපි සතුටින් භාර ගන්නවා. ඒ විතරක් නොවෙයි, ඒ පිළිබඳව කරුණු දක්වන්න අපිට අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද අපි කථා කරන්නේ විදේශ සංක්‍රමණිකයන් එහෙම නැත්නම් විදේශ රැකියා කරන අය පිළිබඳ කාරණා. අපේ රජය එන්න කලින් පිට රටවල සේවය කරන අය ඉතාම දුක් මහන්සියෙන් හම්බ කරලා එවන මුදල් ටික පිළිබඳව ඒගොල්ලන්ට තිබුණු මතය මොකක්ද? ඒගොල්ලන්ට තිබුණු ලොකුම මතය තමයි, ඒ එවන මුදල් ටික මේ රටේ පාලකයෝ කාබාසිනියා කරනවාය කියන එක. ඒ මිනිස්සු තමන්ගේ මව් බිමෙන් එළියට ගිහිල්ලා දුක් මහන්සියෙන් වසර ගණනාවක් වැඩ කරලා, සමහර වෙලාවට අනාරක්ෂිත තත්ත්වයන් යටතේ වැඩ කරලා එවපු ඒ මුදල් ටික මේ රටේ පාලකයෝ කාබාසිනියා කළා. ඒ පාලකයෝ මේ රටේ අනාගතය වෙනුවෙන් වැඩ කළේ නැහැ. මේවා විනාශ කළා. ඒ මිනිස්සු පිට රටවල කාලයක් වැඩ කරලා ලංකාවට එනකොට පාලකයෝ ලංකාව අපායක් බවට පත් කරලා තමයි තිබුණේ. ඒ නිසා මුලින්ම ඒ අයගේ වුවමනාව වුණේ තමන් එවන මුදල් ටිකට සාධාරණය වෙන රටක් හදලා දෙන්න කියන එකයි. ඒ නිසා තමයි විදේශ රටවල "එතෙර අපි" වැනි සංවිධාන හැදිලා, ඒ අය එකතු වෙලා විශේෂයෙන්ම මේ රටේ පාලන බලය වෙනස් කරන්න කැපවීම් කළේ.

අපිට ශ්‍රී ලංකාවේ වාගේම විදේශ රටවලත් විශාල ජන ප්‍රසාදයක් ලැබුණේ මෙන්න මේ අවශ්‍යතාව ඉටු කිරීම නිසායි. ඒ විධියට අපේ ජාතික ජන බලවේගය රජය ඒ අයව අමතක කරන්නේ නැහැ. ඒ අයගේ මූලික අවශ්‍යතාව, ඒගොල්ලන්ගේ පූර්ණ බලාපොරොත්තුව අනිවාර්යයෙන් දවසින් දවස සපල කරන අරමුණකින් වැඩ කරන රජයක් තමයි මේ තිබෙන්නේ. ජාතික ජන බලවේගය රජය බලයට පත් කරන්න ඒ අය මහන්සි වුණු වෙලාවේදී මේ රටේ දැන් ඉන්න විපක්ෂය ඒ අයට මෝඩයෝ කියලා දොස් කිව්වා. ඒ වාගේම ඒ අයට විවිධ ආකාරයෙන් අපහාස කළා. අද මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඒ අය වෙනුවෙන් කථා කරන්න ලැබීම ඇත්තටම හොඳ අවස්ථාවක්. මොකද, ඒ ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් කථා කරන එක ඇත්තටම හොඳයි.

මීට මොහොතකට කලින් කිව්වා, අපේ රටේ අය විදේශ රටවලට ගිහිල්ලා වළං හෝදනවාය කියන කථාවක්. අපි එතුමන්ලාට කියන්න කැමැතියි, ඒ අය තමන්ගේ කැමැත්තෙන් පිට රටවලට ගිහිල්ලා ඒ කටයුතු කරනවා නොවෙයි කියන එක. මෙච්චර කාලයක් ඒ අය එතැනට පත් කළේ මේ රටේ හිටපු පාලකයෝ. ඒ අය තමයි ලංකාව එපා කරවලා ඒ රටවල ගිහිල්ලා ඕනෑම වැඩක් කරලා මුදල් හොයාගෙන එන තැනට ඒ අම්මලාව පත් කළේ. ඒ නිසා ඒගොල්ලන්ට අද ඒවායෙන් නිදහස් වෙලා, කැලණි ගඟෙන් නාලා ඇවිල්ලා වාගේ මෙතැන කථා කරන්න බැහැ. ඒ අයට එහෙම කරන්න බැහැ. ඉතිහාසය තුළ ඒ අය කරපු දේවල් මේ රටේ ජනතාවට මතකයි. අපි ඒවා ගැන මතක් කරනවා. දැන් අපේ වගකීම වෙලා තිබෙන්නේ මෙන්න මේවා නිවැරදි කරමින් ක්‍රම-ක්‍රමයෙන් විදේශ ශ්‍රමිකයන්ගේ මුදල් ටික ගෙනැල්ලා ඒ අයගේ දූ දරුවන් වෙනුවෙන් මේ මව් බිම ගොඩනැඟීමයි.

විශේෂයෙන්ම මොකක්ද මෙහි පළමු කාරණය? පළමු කාරණය තමයි, විදේශ රටකට ගිහිල්ලා සේවය කරනකොට ඒ රට ඇතුළේ ඔවුන්ට අභිමානයක් තිබෙන්න ඕනෑය කියන එක. මොකද, ඒ අය වැඩ කරන්නේ වෙන රටවල ජනතාවත් එක්ක. ඒගොල්ලන් ඉන්දියාවේ අය වෙන්න පුළුවන්, චීනයේ අය වෙන්න පුළුවන්. වෙන රටවල ජනතාවත් එක්ක වැඩ කරනකොට ශ්‍රී ලංකාව ගැන ඒ රටවල අයට මැවෙන චිත්‍රය මොකක්ද? ඒගොල්ලන්ට මැවිලා තිබුණේ ලංකාව කියන්නේ හොරුන්ගේ දේශයක්, අමුතු ජාතියේ ජාතිවාදීන්ගේ රටක් කියන චිත්‍රය. එතකොට ඒගොල්ලන් විදේශ රටකට ගිහිල්ලා අභිමානයක් ඇතුව වැඩ කරන්නේ කොහොමද?

ජාතික ජන බලවේගය රජය බලයට ඇවිල්ලා විදේශ රටවල වැඩ කරන අපේ මිනිස්සු ටිකට අභිමානයක් ඇතුව ඒ රටවල වැඩ කරන්න පුළුවන් අවස්ථාව දැන් සලසා තිබෙනවා. ඒක සෙල්ලමක් නොවෙයි. ඒක අවුරුදු 40ක්, 50ක් තිස්සේ හිටපු පාලකයන්ට කරන්න බැරි වෙච්ච වැඩක්. ඒක කළේ මේ ජාතික ජන බලවේගය රජය. ඒ විතරක් නොවෙයි, ඔවුන් සේවය කරන රටේ පාලකයන් එක්ක අපි සුහද ගනුදෙනුවක් ඇති කරගත යුතුයි. ඇයි, ඒ? අපේ ශ්‍රී ලාංකිකයා පිළිබඳව රැකවරණය පැවරී තිබෙන්නේ ඒ රටේ පාලකයන්ට, ආණ්ඩුවට වාගේම එම රජයට.

[ගරු ටී.කේ. ජයසුන්දර මහතා]

එතකොට ඒ පාලකයන් තුළ ලංකාව පිළිබඳ විශ්වාසය හැදුණේ නැත්නම්, ඒ ගොල්ලන්ට ලංකාව පිළිබඳව ගෞරවයක් නැත්නම්, ඒ රටවල් පාලනය කරන පාලන තන්ත්‍රය තුල අපේ රටේ පුරවැසියාට ලැබෙන්නේ තුන්වැනි මට්ටමේ පුරවැසියෙකුගේ තත්ත්වයක්. එතකොට රටවල් අතරින් අපේ රට පහළට වැටෙනවා. අපේ රට කඩාගෙන වැටෙන රටක් නම්, අපේ රට බංකොලොත් වෙච්ච රටක් නම්, අපේ පුරවැසියා සම්බන්ධයෙන් ඒ රටේ පාලකයාට තිබෙන්නේත් ඒ වාගේ හැඟීමක්.

නමුත්, දැන් එහෙම නැහැ. මේ අවුරුදු එකහමාර ඇතුළත අපේ රජයට, අපේ ජනාධිපතිවරයාට, අපේ විදේශ ඇමතිවරයාට සහ මේ රටේ ඉන්න ඒ රටවල් නියෝජනය කරන අයට පුළුවන් වෙලා තිබෙනවා, ලංකාවේ ඉන්න පාලකයෝ දූෂිත නැහැයි කියන මතය ඒ රටවල් ඇතුළේ ගොඩ නඟන්න, ඒ රටවල පාලකයන් ඇතුළේ ගොඩ නඟන්න. ඒ නිසා ඒ රටවල තානාපතිවරු බොහොම අභිමානයෙන් යුතුව අපිත් එක්ක ගනුදෙනු කරනවා. අපේ රටේ තානාපතිවරු ඒ රටවල අභිමානයෙන් යුතුව ගනුදෙනු කරනවා, සම මට්ටමේ ඉඳගෙන ගනුදෙනු කරනවා. ඒ තත්ත්වයට පත් කරන එක සෙල්ලම්, පහසු වැඩක් නොවෙයි. ඒක පරණ කිසිම කෙනෙකුට කරන්න බැහැ. මේ රට පාලනය කරපු පරණ කිසිම කෙනෙකුට කරන්න බැහැ.

ඒ ගොල්ලෝ කළේ තමන්ගේ දරු පරම්පරා තානාපති කාර්යාල ඇතුළට ගෙනිහිල්ලා දාලා ඔවුන්ට උපාධි ගන්න අවස්ථාව සලසපු එක. ඒ අය අපේ රටේ වැඩ කරන මිනිසුන් වෙනුවෙන් වගකීම ඉෂ්ට කළේ නැහැ. මිනිසුන් තානාපති කාර්යාලයට ගියාම ඒ අයට කන් දුන්නේ නැහැ. ඒ ගොල්ලෝ මෙතැන හිටපු දේශපාලනඥයන්ගේ හරි, මේ රටේ බලවත් අයගේ දූ දරුවන් ඒ තැන්වලට ගෙන ගිහින් දාලා උපාධි ගන්න සලස්වලා, නිවාඩු නිකේතන බවට පත් කළා ඒ තානාපති කාර්යාල. එහෙම කරලා දැන් ඇවිල්ලා මෙතැන කියනවා, ඒ රටවල ප්‍රශ්න ටික. අවුරුදු 50ක් විතර ඒ කරපු විනාශයේ ප්‍රතිඵල තමයි දැන් ඔබ ඔය ඔබගේ කටවල්වලින්ම කියන්නේ.

අපි දැන් මොකක්ද කරන්නේ? අපි මේ වෙනකොට මම කියපු රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනුවල සුරක්ෂිතභාවය රකින අතරේ, අපෙන් යන සේවකයා, අපෙන් යන ශිල්පියා, දියුණු මට්ටමට ගේන්න කටයුතු කරනවා. මට මතකයි මේ මෑත කාලයේ යැව්වේ අදාළ අය නොවෙයි. අපේ ගාල්ල දිස්ත්‍රික්කයේ ඇමතිවරයෙක් මේ අමාත්‍යාංශය භාරව ඉන්නකොට ලංකාව පුරාම අය වෙන රටවලට යැව්වා මුදලට. විශේෂයෙන් ඊශ්‍රායලයට යැව්වා. හැබැයි යැව්වේ රැකියාවලට අදාළ නොවන අය. ඒ විතරක් නොවෙයි, ඔහුගේ මල්ලිලා බිස්නස් කළා. බිස්නස් කරලා ඒකේ අවසාන ගනුදෙනුව බේරා ගන්න බැරුව ඊයේ පෙරේදා වෙඩි තියලා දෙදෙනෙකු මැරුවා. අන්න තවම හිරේ. තවම හිර ගෙදර. ඒ ගොල්ලන්ගේ දේශපාලන පක්ෂයේ ඉතිහාසය මොකක්ද කියලා හොයලා බලන්න. කොහෙන්ද ආවේ කියලා හොයලා බලන්න. ඒ ගොල්ලෝ ඒ කරපු වැරදි තුළ මිනිසුන් වෙඩි තියලා මරා දමන තත්ත්වයට පත් කළා.

ඒ වාගේම තව සිද්ධ වුණු දෙයක් තමයි අපේ රටේ රැකියාලාභීන් පිළිබඳව ඊශ්‍රායලය තබා තිබූ විශ්වාසය බිඳ වැට්ටවීම. විශ්වාසය බිඳ වට්ටමින්, ඒ ගොල්ලෝ විවිධ companies හරහා කරපු ඒ දහජරා වැඩේ නිසා අද වනකොටත් ඊශ්‍රායලයට මිනිස්සු යවනකොට ඒ ගොල්ලන්ට අපේ රට දිහා තවමත් බලන්න වෙලා තිබෙන්නේ සැකයෙන්. ඒ නිසා තමයි අපේ විදේශ ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමා මැදිහත් වෙලා බොහොම වගකීමෙන් පොරොන්දු වෙලා, අපි නැවත විධිමත් ක්‍රමයකට ඊශ්‍රායලය, කොරියාව වාගේ රටවලට වැඩිපුර ප්‍රමාණයක් මේ යවන්නේ.

අපි දන්නවා, කාන්තාවෝ දූෂණය කරන තත්ත්වයට පවා පත් කරලා තිබුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
දැන් අපි විශ්වාසය හදමින් යනවා. ඊශ්‍රායලය වෙන්න පුළුවන්, කොරියාව වෙන්න පුළුවන්, ජපානය වෙන්න පුළුවන්, මැද පෙරදිග රටවල් එක්ක වෙන්න පුළුවන්, දැන් අපි ක්‍රම ක්‍රමයෙන් විශ්වාසය ගොඩ නඟමින් යනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි එතැනින් නොනැවතී එහේ ඉන්න අපේ රටේ පුරවැසියාට ශ්‍රී ලංකාවේ හිටියා වාගේම ඔහුට මේ රටේ පාලකයන් තෝරා ගැනීමේ බලය දෙන වැඩ පිළිවෙළකට අපි යමින් තිබෙනවා. ඒ පිළිබඳව -ඒක කොහොමද කරන්නේ කියලා- සාකච්ඡා සිදු වෙනවා. ඔවුන්ට විශ්‍රාම වැටුපක් දීලා සුරක්ෂිත බව රකිනවා. ඒ විතරක් නොවෙයි. ඔවුන් ඒ රටේ ඉඳලා මේ රටට එන මොහොත වනකොට මේ මව්බිම ගොඩ නඟලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග අරගෙන මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව ඒක නියම ආකාරයට ඉෂ්ට කරනවා කියන එක විශ්වාසයෙන් යුතුව කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.56]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் கௌரவ ஹெக்டர் அப்புஹாமி அவர்கள் கொண்டுவந்திருக்கின்ற புலம்பெயர் தொழிலாளர்களின் பிரச்சினை சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மகிழ்வுறுகின்றேன். தங்களுடைய உறவுகளைப் பிரிந்து, தங்களுடைய சுய விருப்பு, வெறுப்புகளைக் கடந்து, வெளிநாடுகளில் உழைத்து இந்த நாட்டுக்குப் பெருமளவு வருமானத்தை ஈட்டித்தருகின்ற புலம்பெயர் தொழிலாளர்களின் கஷ்ட, நஷ்டங்களைப் பற்றி இந்த இடத்தில் பேசுவதற்குச் சந்தர்ப்பத்தை பெற்றுத்தந்தமைக்கு கௌரவ ஹெக்டர் அப்புஹாமி அவர்களுக்கு நன்றிகளை தெரிவித்துக்கொள்கின்றேன்.

இந்த நாட்டுக்குப் பெருமளவு வருமானத்தைப் பெற்றுக்கொடுக்கின்ற அந்தச் சகோதரர்கள் வெளிநாடுகளில் பல கஷ்டங்களை அனுபவிக்கின்றார்கள். அவர்கள்

அனுபவிக்கின்ற கஷ்டங்களைவிட அதிகமான கஷ்டங்களை இந்த நாட்டில் இருக்கின்ற அவர்களுடைய உறவுகள் அனுபவிக்கின்றன. இந்த நாட்டிலிருந்து வெளிநாடுகளுக்கு தொழில்வாய்ப்புக்காகச் செல்கின்றவர்கள் சிறந்த கல்வியலாளர்களாக இருக்கின்றார்கள். அதேநேரம், தொழில்புலமைமூலம் செல்கின்றவர்களும் இருக்கின்றார்கள். அவர்களுக்கேற்ற தொழில்வாய்ப்பு இந்த நாட்டில் இல்லாமையால்தான் அவர்கள் வெளிநாடுகளுக்குச் செல்கின்றார்கள். அவர்கள் வெளிநாட்டுக்குச் செல்வதற்குத் தேவையான பணத்தைக்கூட, கடன் அடிப்படையில் வங்கிகளில் அல்லது வேறு இடங்களிலிருந்து பெற்றுத்தான் செல்கின்றார்கள். இவ்வாறானதொரு சூழலிலே, அரசாங்கத்தின் மூலம் அவர்களுடைய குடும்பத்தின் ஏழ்மைக்காக வழங்கப்படுகின்ற வரப்பிரசாதங்கள் எல்லாம் தடைப்படுகின்றன.

வெளிநாட்டுக்குச் சென்ற நபர், தான் பெற்ற கடனை முழுமையாகச் செலுத்தி முடிப்பதற்குத் தேவையான தொகையைப் பெறமுடியாமல் கஷ்டப்படுகின்ற சந்தர்ப்பத்தில், இங்கிருக்கின்ற 4-5 அங்கத்தவர்களைக் கொண்ட அவருடைய குடும்பத்தினர் எந்தவித வருமானமும் இல்லாமல் கஷ்டப்படுகின்றார்கள். இந்தச் சந்தர்ப்பத்தில், அரசாங்கத்தால் வழங்கப்படுகின்ற 'அஸ்வெசும' போன்ற நலன்புரி உதவிகளும் தவிர்க்கப்படுவதனால் அவர்கள் மேலும் கஷ்டங்களுக்கு உள்ளாகின்றார்கள். எனவே, அரசாங்கம் இந்த விடயத்தை கவனத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

இந்த நாட்டிலிருந்து வெளிநாடுகளுக்கு தொழில் வாய்ப்புக்காகச் செல்பவர்களில் அதிகமானவர்கள் ஏழைகளாக இருக்கின்றார்கள். சாதாரண ஒரு தொழிலாளியாகச் சென்று 50,000 ரூபாய், 70,000 ரூபாய் என 150,000 ரூபாய்க்கு உட்பட்ட தொகையை சம்பளமாகப் பெறுகின்றவர்கள், சில நாடுகளில் கூடுதலான செலவினங்களைச் செய்யவேண்டி இருக்கின்றது. எனவே, இந்த விடயத்தை கௌரவ அமைச்சர் அவர்கள் கவனத்திற்கொள்ள வேண்டுமென இந்தச் சந்தர்ப்பத்தில் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன். மேலும், வீட்டு வேலைகளுக்காகச் செல்கின்ற பணிப்பெண்களுடைய குடும்பங்களையும் கவனத்திற்கொள்ள வேண்டுமென கேட்டுக் கொள்கின்றேன்.

மத்திய கிழக்கு நாடுகளுக்கும் மேற்கத்தேய நாடுகளுக்கும் தொழில்வாய்ப்புக்காகச் செல்கின்றவர்கள், இந்த நாட்டின் நேரடியான அனுமதிமூலம் அல்லது முகவர்கள்மூலம் செல்கின்ற சந்தர்ப்பத்தில், உரிய நிபந்தனைகளின் அடிப்படையில் அவர்களால் ஒப்பந்தமிடப்பட்ட சம்பளம் அல்லது தொழில் கிடைப்பதில்லை. இந்த விடயத்தை எங்களுடைய தூதுவராலயங்களுக்குக் கொண்டுசென்று, அங்கிருக்கின்ற தூதுவர்களைச் சந்திப்பதில்கூட அவர்களுக்குப் பல தடைகள் ஏற்படுகின்றன. அந்த விடயங்களை வெளிநாடுகளிலிருந்து எங்களுக்கு அனுப்பி, நாங்கள் இங்கிருக்கின்ற அந்த நாட்டுத் தூதுவர்களோடும் ஏனையவர்களோடும் பேசி, தொடர்புகளை ஏற்படுத்தக்கூடிய சந்தர்ப்பங்கள் இருக்கின்றன. இந்த விடயத்தில் மொழிசார்ந்த பிரச்சினைகளும் இருக்கின்றன. எனவே, நாங்கள் இந்த விடயங்களை கவனத்திற்கொள்ள வேண்டும்.

1985ஆம் ஆண்டு காலப்பகுதியில் மத்திய கிழக்கு நாடுகளுக்கு தொழிலுக்குச் சென்றவர்கள் 300 - 350 ரியாலை சம்பளமாகப் பெற்றார்கள். இன்று அவர்களுடைய பிள்ளைகள் 10,000 ரியாலுக்கும் மேற்பட்ட தொகையை சம்பளமாகப் பெற்று, இந்த நாட்டுக்கு அந்நியச் செலாவணியை ஈட்டித் தருகின்றார்கள். இவ்வாறு பல முன்னேற்றங்கள் ஏற்பட்டு இருக்கின்ற போதிலும்கூட, சில பிரச்சினைகள் இருக்கத்தான் செய்கின்றன. எனவே, இந்த விடயங்களையும் கவனத்திலெடுக்க வேண்டுமென இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

இன்று போலி முகவர்கள் என்ன செய்கின்றார்கள் என்றால், மேற்கத்தேய நாடுகளில் அல்லது வேறு நாடுகளில் கூடுதலான சம்பளத்துடனான தொழில்வாய்ப்புகளைப் பெற்றுத்தருவதாகக் கூறி, இந்த நாட்டில் இருக்கின்ற இளைஞர்களிடம் passportsஐயும் ஓர் இலட்சம் - இரண்டு இலட்சம் ரூபாய் வீதம் பணத்தையும் பெற்றுக்கொண்டு தலைமறைவாகின்றார்கள். அதாவது, 500 - 1,000 passportsஐ collect பண்ணி, ஒருவரிடம் இரண்டு இலட்சம் ரூபாய் வீதம் பெற்று, பத்து கோடி ரூபாய்க்கும் மேற்பட்ட பணத்துடன் தலைமறைவாகின்றார்கள். மேலும் சிலர், இளைஞர் - யுவதிகளை தொழில்வாய்ப்பு பெற்றுத்தருவதாக அழைத்துச் சென்று, வேறு இடங்களில் - துபாய் போன்ற இடங்களில் - அவர்களை விட்டுவிட்டுத் தலைமறைவாகின்றார்கள். இதனையும் கவனத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். எதிர்வரும் காலத்தில் புலம்பெயர் தொழிலாளர்களுக்கு வாக்களிப்பதற்குரிய சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுப்பது தொடர்பிலும் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

இந்த அரசாங்கம் போதைப்பொருளை ஒழிக்கும் விடயத்தைக் கையிலெடுத்து, அதனை நேர்த்தியாகச் செய்துவருகின்ற சந்தர்ப்பத்தில்தான் நீர்கொழும்பு சிறைச்சாலையில் மோதல் சம்பவம் இடம்பெற்றுள்ளது. அந்தச் சம்பவத்தில் மரணித்தவர்களின் உறவினர்களுக்கு எனது ஆழ்ந்த அனுதாபத்தை தெரிவித்துக்கொள்கின்றேன். போதைப்பொருளைத் தடுக்கின்ற வகையில்தான் எங்களுடைய மதம் சார்ந்த விடயங்கள் இருக்கின்றன. போதைப்பொருளை முற்றுமுழுதாகத் தடைசெய்ய வேண்டுமென்ற விடயம் இஸ்லாம் மதத்தில் ஆணித்தரமாகக் கூறப்பட்டு இருக்கின்றது. இவ்வாறான விடயங்கள் கூறப்பட்டுள்ள அல்-குர்ஆனின் பிரதிகளை இதற்கு முன்னர் இருந்த அரசாங்கம் இந்த நாட்டுக்குள் கொண்டுவருவதற்குத் தடைவிதித்தது. அந்தத் தடை இன்றும் இருக்கின்றது. நேற்றைய தினம் கௌரவ பிரதி அமைச்சர் அவர்கள், தடுத்துவைக்கப்பட்டுள்ள அல்-குர்ஆன் பிரதிகளை நாட்டுக்குள் கொண்டுவருவதற்கான முயற்சிகளை இந்த அரசாங்கம் முன்னெடுத்திருக்கின்றது என்ற சந்தோஷமான செய்தியைக் கூறியிருந்தார். அதற்காக அரசாங்கத்துக்கு இந்தச் சந்தர்ப்பத்தில் எங்களுடைய சமூகம் சார்பில் நன்றிகளை தெரிவித்துக்கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

அடுத்து, விவசாயிகளுடைய பிரச்சினை பற்றிக் கூற வேண்டும். அவர்களுடைய பிரச்சினை இங்குள்ள எல்லோருக்கும் நன்றாக விளங்கும். ஒரு கிலோகிராம் நெல்லை 120 ரூபாய்க்குக் கொள்வனவு செய்ய வேண்டுமென்ற ஏற்பாடு இருந்தபொழுதிலும், எந்தவோர்

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

அரிசி ஆலை உரிமையாளரும் அந்த விலைக்கு நெல்லைக் கொள்வனவு செய்வதற்குத் தயாரில்லை. அதுமாத்திரமன்றி, அரசாங்கத்துக்குச் சொந்தமான களஞ்சியசாலைகளில் இடமில்லாத சூழலும் காணப்படுகின்றது. இந்தப் போக அறுவடைக்காகக் காத்திருக்கும் விவசாயிகளின் நிலைமை என்ன என்பதைப் பார்ப்போம். ஒரு கிலோகிராம் நெல்லுக்கான உற்பத்திச் செலவு 135 ரூபாய்க்கு மேல் செல்கின்ற நிலையில், 85 ரூபாய்க்கு நெல்லை விற்பனை செய்வதன்மூலம் இந்த விவசாயிகள் நஷ்டமடையப் போகின்றார்கள். 'எல் நினோ' காரணமாக இந்தப் போகத்தில் விளைச்சலும் குறைவடைவதற்குச் சந்தர்ப்பங்கள் இருக்கின்றன. இந்த அரசாங்கத்தால் உரிய காலத்தில் உரத்தை வழங்க முடியாத சூழ்நிலையில், கூடுதலான விலைகொடுத்து - 20,000 ரூபாய் கொடுத்து - உரத்தைக் கொள்வனவு செய்ததன்மூலம், இன்னும் அதிக நஷ்டம் விவசாயிகளுக்கு ஏற்பட்டு இருக்கின்றது. எனவே, அவர்களுக்கு மானியத்தை வழங்குவதற்கான ஏற்பாட்டை அல்லது அவர்களுடைய நெல்லை அரசாங்கம் கொள்வனவு செய்வதற்கான ஏற்பாட்டைச் செய்ய வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.04]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් කිව්වා වාගේ මේ යෝජනාව හරහා යම් සාකච්ඡාවක් කර ගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. 80 දශකයේ මුල ඉඳලා තමයි අපේ ශ්‍රමිකයන් විදෙස් රැකියා සඳහා යන්න පටන් ගත්තේ. ඒකට හේතුව වුණේ එවකට පැවැති ආණ්ඩුව විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමත් එක්ක වෙළෙඳ පොළ විවෘත කිරීමයි. ඒක භාණ්ඩවලට පමණක් සීමා වුණේ නැහැ. ශ්‍රමයටත් ඒ වෙළෙඳ පොළ විවෘත වුණා. ඉන් පසුව අපේ රටේ ඩුබායි ගීත වැනි ගීත නිර්මාණය වුණා, ඩුබායි කවි, ඩුබායි නාට්‍ය ආදිය බිහි වුණා; විවිධ සාහිත්‍ය අංග බිහි වුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අදටත් අපේ රටේ සමහර ගෙවල්වලට "ඩුබායි ගෙදර" කියලා කියනවා; සමහර ගෙවල්වලට "ඉතාලි ගෙදර" කියලා කියනවා. ඒකෙන් පසුව තමයි එහෙම හැඳින්වුයේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, අපේ කාන්තාවන් විදේශවල වළං හෝදන්න යන්න පටන් ගත්තා කියලා. ඇත්තටම ඕකම තමයි වැරැද්ද වුණේ. සමහර අය හිතුවා, ලංකාවෙන් යවන කාන්තාවන්ට ඒ රටවලට ගිහිල්ලා කරන්න තිබෙන්නේ මෙහේ කරනවා වාගේ පොල් මුඩ්ඩයි, සබන් කැල්ලයි අරගෙන දැලි හූරන එකයි කියලා. නැහැ. ඒක ඊට වඩා වෙනස්. එහේ ඊට වඩා දියුණු තත්ත්වයක් තිබුණේ. එහේ තිබුණා, දියුණු යන්ත්‍රෝපකරණ. එදා හිටපු පාලකයන් වගවීමක් නැතිව මෙහේ හිටපු කාන්තාවන් එක පාරටම පිට රටවලට පටවන්න පටන් ගත්තාට පසුව ඒගොල්ලන් මුහුණ දුන්නු පළමුවැනි අර්බුදය තමයි ඒක. තමන්ට හුරු නැති දියුණු තාක්ෂණයත් එක්ක තමන්ගේ රැකියාව කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය ඒ අයට මතු වුණා. හැබැයි, අද තත්ත්වය ඊට වඩා වෙනස්. අද අපට ආණ්ඩුවක් හැටියට කරන්න සිදු වෙලා තිබෙන්නේ අදට ගැළපෙන විධියට මේ දේවල් අලුත් කරලා, පාලනය කරලා, විදෙස්ගත වන අයට අවශ්‍ය වාතාවරණය හදලා විදෙස් රැකියාවලට යන්න ඉස්සෙල්ලා පුහුණුවක් ලබා දෙන්න කටයුතු කිරීමයි. පුහුණුව කියලා කියන්නේ නිකම් කට වචනයෙන් ලබා දෙන පුහුණුවක් නොවෙයි; සහතිකය ගන්න විතරක් ලබා දෙන පුහුණුවක් නොවෙයි. ඇත්තටම ප්‍රායෝගික පුහුණුවක් දීලා ඒ අය විදේශගත කරන්න සිදු වෙලා තිබෙනවා. ඒක තමයි අද කරන්න සිදු වෙලා තිබෙන්නේ.

විදෙස් රැකියා මඟින් විදේශ විනිමය උපයා දෙන අයට අපි කියනවා "විදෙස්ගත ශ්‍රමිකයින්" කියලා. මම හිතනවා, එහි තවත් කොටසක් ඉන්නවා කියලා. ඒගොල්ලෝ විදෙස්ගත වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. හැබැයි, ඒගොල්ලන් විදෙස් ශ්‍රමිකයින්. අද අපේ අලුත් පරපුර - 2000 වර්ෂයෙන් පස්සේ බිහි වෙච්ච පරපුර - විදෙස් ශ්‍රමිකයින් හැටියට කටයුතු කරනවා. ඒ අය විදෙස්ගත වෙන්නේ නැතිව මෙහේ ඉඳගෙන ශ්‍රමිකයින් හැටියට කටයුතු කරනවා; මෙහේ ඉඳගෙන ඩොලර් සොයනවා. එහෙම නම්, ආණ්ඩුව හැටියට අද අපිත් - අපේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, විදේශ සේවා නියුක්ති කාර්යාංශය - ඩොලර් සොයන්න සැලසුම් හදන කොට මේ ගැන කල්පනා කරන්න ඕනෑ. මොකද, මෙය 70 දශකය නොවෙයි. ඒ නිසා අද අලුත් පරපුර අප කිව්වත් නැතත් ඩොලර් සොයනවා. ඒගොල්ලෝ ඒකට ක්‍රමවේද හදාගෙන තිබෙනවා. ඒගොල්ලෝ මෙහේ ඉඳගෙන අන්තර්ජාලය පාවිච්චි කරමින් විදේශ ශ්‍රමිකයන් හැටියට වැඩ කරනවා. අපි අද අන්න එතැනට පරිවර්තනය වෙලා තිබෙනවා; ඒ තත්ත්වයට දියුණු වෙලා තිබෙනවා.

ලංකාවට හොඳ මානව සම්පතක් තිබෙනවා; දියුණු මානව සම්පතක් තිබෙනවා. අන්න ඒ මානව සම්පත අදට ඔබින විධියට අපේ රටට ආදායම් එකතු කරන්න, ඩොලර් එකතු කරන්න යොදවා ගැනීම තමයි අපේ අමාත්‍යාංශයට කරන්න සිදු වෙලා තිබෙන්නේ. අන්න ඒක තේරුම් අරගෙන තමයි අපේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයත්, විදේශ සේවා නියුක්ති කාර්යාංශයත් කටයුතු කරන්නේ. එය, එදා එක පාරටම ඩුබායි යැව්වා වාගේ යවනවා නොවෙයි. අද ඊට වඩා හොඳ ක්‍රමවේදයක් හදලා තිබෙනවා. මම කියන්නේ නැහැ, මේ සම්පූර්ණ ක්‍රමවේදයම අපේ ආණ්ඩුව විසින් පටන් ගත්තා කියලා. ඒ ක්‍රමවේද තිබුණා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ ක්‍රමවේද නමට තිබුණාට ඒවා ප්‍රායෝගිකව රට තුළ ක්‍රියාත්මක වුණේ නැහැ. අද අපට අලුත් දෙයක් නොවෙයි කරන්න තිබෙන්නේ. එදා පටන් අරගෙන තිබුණු, එදා පාලකයන් සොයා ගෙන තිබුණු, නමුත් ක්‍රියාත්මක නොවුණු ක්‍රමවේද අදට ඔබින විධියට, රටට ඔබින විධියට සකස් කරගෙන ඒ අනුව විදෙස්ගත ශ්‍රමිකයන්ට අවස්ථාව හදා දෙන එක තමයි අපට කරන්න තිබෙන්නේ.

අද හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුබද්ධ නිලධාරි මහත්මයෙක් හෝ මහත්මියක් ඉන්නවා. ඒ නිසා අද හැම දේකටම, ඒ කියන්නේ මොකක් හරි ගැටලුවක් මතු වුණොත් ඒ ගැටලුව විසඳා ගැනීම සඳහා බත්තරමුල්ලේ තිබෙන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයටම එන්න ඕනෑ නැහැ. මේ ආණ්ඩුව යටතේ අපි ඉතා හොඳින් ඒ ගැටලුව කළමනාකරණය කර දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ඒ නිලධාරින් හොඳින් දැනුවත් කර තිබෙනවා. ඇත්තටම බිම් මට්ටමේ අය ඒ ගැන දන්නේ නැත්නම්, බිම් මට්ටමේ අය ඒ ගැන දැනුවත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ළඟදී විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සාකච්ඡාවක් කළා. මම හිතන විධියට, ඒ සාකච්ඡාවේ කරුණු අපේ නියෝජ්‍ය ඇමතිතුමා හැම දිස්ත්‍රික්කයකටම අරගෙන ගියා. අද මේ සභාව කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කළාට පසුව කථා කළ මන්ත්‍රීතුමෙක් කිව්වා, නියෝජ්‍ය ඇමතිතුමා සාර්ථක කෙනෙක් නොවෙයි කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කියන්න කැමැතියි, තරුණ ඇමතිවරයකු හැටියට එතුමා ඉතාම හොඳ වැඩ කොටසක් මේ වෙනුවෙන් කරන බව. ගරු ඇමතිතුමා ලොකු කාර්යභාරයක් කරනවා වාගේම, ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් ලොකු කාර්යභාරයක් කරනවා. මම දන්නා විධියට අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා හැම දිස්ත්‍රික්කයකටම ගිහිල්ලා දිස්ත්‍රික් මට්ටමින් සියලු නිලධාරින් කැඳවා දැනුවත් කර තිබෙනවා. ඒ වාගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයාටත් මේ සම්බන්ධ මූලික වගකීමක් තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ පැවැති සාකච්ඡාවට මමත් සම්බන්ධ වුණා. ඒ අනුව මෙහි තිබෙන වටිනාකම මොකක්ද, මොන වාගේ වැඩ පිළිවෙළක්ද මේ අමාත්‍යාංශය යටතේ තිබෙන්නේ සහ අපි ක්‍රමවත් විය යුත්තේ කොහොමද කියන කාරණා පිළිබඳ හොඳ අවබෝධයක් බිම් මට්ටම දක්වාම ලබා දීලා තිබෙනවා. ඒ වාගේම නිලධාරින්ටත් ඒ අවබෝධය ලබා දීලා තිබෙනවා.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු කැඳවීමේදී, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු කැඳවීමේදී විශේෂයෙන්ම අපේ සභාපතිවරුන්ට වගකීමක් තිබෙනවා ඒ න්‍යාය පත්‍රයට මේ මාතෘකාව යොදා ගන්න. එසේ කිරීමෙන් තමන්ගේ බලප්‍රදේශවල තිබෙන ගැටලු මොනවාද, හඳුනා ගත්ත දේ මොනවාද යනාදී සියල්ල ගැන සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් හැටියට කටයුතු කළ හැකි වෙනවා. අර කලින් ගියා වාගේ වළං සෝදන්න දැන් කවුරුවත් පිට රටකට යන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි මේ නවීන ලෝකයට අනුව update වෙන්න හැදුවාට, අපේ සමහර දේශපාලකයෝ තවම ඉන්නේ පරණ තැන. ඒ අය තවම එතැන ඉඳගෙන තමයි කටයුතු කරන්නේ. එදා කල්පනා කරපු විධියටම තමයි තවම කල්පනා කරන්නේ. එහෙම නොවෙයි. ඊට වඩා හොඳ තැනකට, අලුත් තැනකට අපි මේ සාකච්ඡාව දැන් ගෙනැවිත් තිබෙනවා. එහිදී විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ කරන කටයුත්ත ගැන මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සාකච්ඡාව ඇතුළේ කියැවුණා, තානාපතිවරු ගැන. ඇත්තටම විදෙස්ගතව කටයුතු කරන මේ ශ්‍රමිකයන් කියන්නේ, අපේ රටේ නිල නොවන තානාපතිවරු. ඔවුන් හරහා තමයි ලෝකය අපි දිහා බලන්නේ. මේ ලංකාවෙන් ඇවිල්ලා ඉන්න අය, මේ ඉන්දියාවෙන් ඇවිල්ලා ඉන්න අය, මේ පිලිපීනයෙන් ඇවිල්ලා ඉන්න අය වශයෙන් ලෝකය අපේ රටවල් දෙස බලනවා. විශේෂයෙන්ම විදෙස්ගත වෙන අපේ ශ්‍රමිකයන්ට හොඳ මඟ පෙන්වීමක් කරනවා නම්, ඇත්තටම ඔවුන් නිල නොවන තානාපතිවරු බවට පත් වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේම, ඒ කාලයේ තානාපති කාර්යාලවල තිබුණේ ඉතා හොඳ තත්ත්වයක් නොවෙයි. ඇත්තටම හිටපු පරණ දේශපාලනඥයන්ගේ ගෙවල්වල කට්ටිය, ඥාතීන්, එහෙම නැත්නම් යහළුවන් තමයි ඒවායේ කටයුතු කළේ. ඒ නිසා අද අපි ඉතා ප්‍රවේශම් විය යුතුයි. මොකද, තවම ඒ දේවල් අපේ පාලනය යටතට ඇවිල්ලා නැත්නම් ඒ සම්බන්ධව සොයා බලා ඒවාට අවශ්‍ය කටයුතු ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ සිදුවිය යුතුයි, මේ අමාත්‍යාංශය යටතේ සිදුවිය යුතුයි කියා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වනවිට 2000 වර්ෂයෙන් පසුව බිහි වුණු පරපුරට උචිත විධියට මේ කටයුතු ඉස්සරහට ගෙන යෑම සඳහා මේ අමාත්‍යාංශය යටතේ කටයුතු සිද්ධ වෙනවා. ඒ සම්බන්ධ වන සොයා බැලීම, පසු විපරම අනිවාර්යයෙන්ම සිදු විය යුතුයි. ඔවුන් වෙනුවෙන් කළ යුතු කාර්යභාරය අපි වගකීමක් ඇතුව කළ යුතුයි. ඒ සඳහා කටයුතු කරන බව මා විශේෂයෙන්ම පෙන්වා දෙන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.14]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා අද ඉතාම කාලෝචිත මාතෘකාවක් යටතේ මේ සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ඒ වාගේම විදේශගත ශ්‍රමිකයන් ගැන කථා කරපු සියලුදෙනාට ස්තුතිය පළ කිරීමට මේ අවස්ථාව යොදා ගත්තා. විදේශගතව මහන්සි වෙලා අපේ රටට විදේශ විනිමය එවන ශ්‍රමිකයන්ට කෘතගුණ පූර්වක ස්තුතිය පිරිනමන්නට මමත් මගේ හදවතින්ම මෙය අවස්ථාවක් කර ගන්නවා.

මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, දැන් වළං හෝදන්නේ නැහැ කියලා. දැන් වළංවලට වඩා ඒවා හෝදනවා, දැලි විතරයි නැත්තේ. අපි ගිහින් ඒවා බලලා තිබෙනවා. ඒක නිසා ඒ මහන්සියේ අඩුවක් නැහැ. ඒකට අපි ගමේ භාෂාවෙන් කියන්නේ "සුමේ" කියලා. ඒ "සුමේ" අඩුවක් නැහැ, මන්ත්‍රීතුමා. වළං වුණාට දැලි විතරයි නැත්තේ. අනෙක් හැමදෙයක්ම ඒ සියලුදෙනා සෝදනවා. අපි ගිහින් ඒවා බලලා තිබෙනවා.

ඒ වාගේම, මේ ගැන කථා කරද්දී අපේ මන්ත්‍රීතුමා කිව්වා, ජාවාරම්කාරයෝ ගැන, වංචා ගැන. ඇත්තටම ඒක ගැන කියන්නට තිබෙන්නේ දුක්ඛිත කථාවක්. විශේෂයෙන්ම මම කථා කරන්නේ ඉතාලිය ගැන. ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාත්, මමත් නියෝජනය කරන ප්‍රදේශයේ අය වතු වීසාවලින්, එහෙම නැත්නම් කෘෂිකාර්මික වීසාවලින් ගෙනිහිල්ලා අතහැරලා දාලා, කොන්ත්‍රාත්තුවක් කර ගන්න බැරිව, හරිහමන් වැටුපක් ගන්න බැරිව ඉන්නවා. ඒ පහසුකම් ටික ලැබෙන්නේ නැහැ. ඊට පස්සේ ඒ රටේ ඉන්නත් බැහැ, ලංකාවට එන්නත් බැහැ. මොකද, ලක්ෂ 30ක්, 40ක් ණය වෙලා, දරුවන්ගේ කන කර බඩු පවා උකස් තියලා තමයි ඒ අය ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා විශාල දුකක් එතැන ඉඳගෙන විඳිනවා. ඒකට කරන්න තිබෙන්නේ මෙහේ ඒ ජාවාරම්කාරයෝ අල්ලා ගන්නා එකයි. මම දැක්කා, ඒවාට අදාළ නඩු මෙච්චර ප්‍රමාණයක් තිබෙනවා කිව්වා. ඒ ගැන අපි සතුටු වෙනවා. ඒ සොයා බැලීම් තවදුරටත් වැඩි කරන්න. ඉතාලියේත් ඉන්නවා මේ ජාවාරම්කාරයන්ගේ හවුල්කාරයෝ. ඉතාලි රජය ඒ පිළිබඳව කටයුතු කරනවා අපි දැකලා තිබෙනවා. කරුණාකරලා මැදිහත් වෙලා ඒ කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා.

ඊළඟට, තානාපති සේවය වාගේම තානාපති කාර්යාල ගැන කියන්න ඕනෑ. අපි ගිහින් ඒවා බලලා තිබෙනවා. ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කිව්වා වාගේම, විශේෂයෙන්ම රෝමයේ තානාපති කාර්යාලයට ගිහින් බැලුවාම ඇත්තටම දුක හිතෙනවා.

[ගරු නිතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

මම ඒ තානාපතිතුමා සමඟ කථා කළා. ඇත්තටම අපි ගිහින් විදේශගත ශ්‍රමිකයන් හමු වුණාම, "තානාපතිතුමා මෙහෙම කරන්නේ නැහැ, තානාපති කාර්යාලයෙන් ඒ සේවය ලබා දෙන්නේ නැහැ" කියලා ඔවුන් බණින්නේ තානාපතිතුමාට. හැබැයි, අපි එතැනට ගිහින් බැලුවාම ඒ සේවය ලබා දෙන්නට තිබෙන පහසුකම් ප්‍රමාණයේ ඉතා අඩුපාඩු තිබෙනවා. මම counter එකට, ඒ ජනතාවට රැඳී ඉන්න තිබෙන ස්ථානය ගිහින් බැලුවා. ඉඩ තිබෙන තැනක තහඩු මඩුවක් වාගේ තිබෙන්නේ. ඒ, ඉතාලිය කියන රටේ, රෝමයේ ප්‍රධාන තානාපති කාර්යාලය. ඒක විශාල පිරිසක් ඉන්න තැනක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් යුරෝපය පුරා තාප රැල්ලක් යනවා. මම ගිහින් බලන වෙලාවේ එච්චර රස්නයක් තිබුණේ නැහැ. හැබැයි, මේ වෙනකොට උෂ්ණත්වය සෙල්සියස් අංශක 38ට, 40ට එහා යනවා. විශ්වාස කරන්න, අපේ තානාපතිතුමාට තිබෙන කාර්යාලයේ වායු සමීකරණයවත් වැඩ කරන්නේ නැහැ, කැඩිලා තිබෙන්නේ. මේ, ඉතාලියේ රෝමය කියන නගරයේ. ඒ නිසා අපි තානාපතිවරුන්ගේ සේවය බලාපොරොත්තු වෙනවා වාගේම, ඒ තානාපතිවරුන්ට පහසුකම් ලබාදීමත් කළ යුතුයි. මොකද, ඒ පහසුකම් තුළින් පහසුකම ලැබෙන්නේ එතැන ඉන්න ජනතාවටයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කලින් මන්ත්‍රීවරයෙක් කථා කළා. මම ඒ කවුද දන්නේ නැහැ, අදයි එතුමා දැක්කේත්. එතුමාත් හැමෝම වාගේම හිටපු ආණ්ඩුවල පලු අරින්න ගත්තා. එතුමා කිව්වා, හිටපු ආණ්ඩු තානාපති සේවයට දරුවෝ දැම්මා, දේශපාලනය කරපු අය දැම්මා, දේශපාලන හිතවතුන් දැම්මා කියලා. ඉතින්, ඒක නේන්නම් ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ. ඒවා නැති කරනවා කියන එක නේද ඔබතුමන්ලා දීපු පොරොන්දුව? "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, "විදේශ සේවය සඳහා වෘත්තීය විශිෂ්ටත්වය, සදාචාරය, ඉහළම ප්‍රමිතිය, රාජ්‍ය තාන්ත්‍රික විචක්ෂණ බුද්ධිය සහිත සුදුසුකම් සහිත නිලධාරීන් පත් කළ යුතුය" කියලා. ඒක ඔබතුමන්ලා කිව්වේ. ඉතින්, ඒකට නේ ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ. දැන් ඒක කරලා තිබෙනවා නේද? දැන් හරි නේ. ප්‍රශ්නයක් නැහැ නේ. ඒක කරලා තිබෙනවා නේ.

ඊළඟට, වෘත්තීය විශිෂ්ටත්වය තිබෙන්න ඕනෑ, ඉහළම ප්‍රමිතිය තිබෙන්න ඕනෑ, ප්‍රත්‍යක්ෂ වාර්තා සහිත වෘත්තීය රාජ්‍ය තාන්ත්‍රිකයන් පත් කරන්න ඕනෑ කියලා ඔබතුමන්ලා පොරොන්දු වුණා. මිනිස්සු ඒකට ඡන්දය දුන්නා නේ. ඉතින්, එහෙම කරලා තිබෙනවා නේ. ප්‍රශ්නයක් නැහැ නේද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඒකේ ඉංග්‍රීසි පිටපත බැලුවාම ඒකේ වෙන කථාවක් තිබෙනවා. මේ, ඒකේම translation එක: "Immediate remedial action must be taken to depoliticize the Foreign Service and make appointments on merit." ඒ කථාව සිංහල පිටපතේ නැහැ; දේශපාලනයෙන් තොර කරනවා කියලා නැහැ. ඒක හිතාමතාම කරපු එකක්ද දන්නේ නැහැ. ඒ මන්ත්‍රීතුමා කිව්වා නේ ඒ කාලයේ ගිය කට්ටිය ගැන. දූ දරුවෝ ඔක්කොම ගියා කිව්වා නේ. බලන්න, මේ ඡායාරූපයේ ඉන්නේ කියුබාවේ ශ්‍රී ලංකා තානාපති, මහින්ද රත්නායක මහත්මයා. ඒ කවුද? ජාතික ජන බලවේගයේ නායකත්ව මණ්ඩලයේ සාමාජිකයෙක්. එතුමා අවුරුදු පහකට කලින් කරපු කථා තිබෙනවා, YouTube එකට ගිහින් බලන්න. එතුමා කිව්වා, "එකම ආයුධයෙන් හැම වැඩේම කරන්න ගියාම, ඔවුන්ට අපි කියන්නේ 'මකබාස්ලා' කියලා" යනුවෙන්. හිටපු ආණ්ඩුවලට බැන්නේ එහෙම කියලා. ඉතින් අද අහන්න තිබෙන්නේ, හැම එකකටම පැලවත්තේ කාර්යාලයේ මිනිස්සු ටිකද දමන්න තිබෙන්නේ කියලා. මකබාස්ලා තමයි දාලා තිබෙන්නේ. ඒ, එක කාරණයක්.

ඊළඟට බලන්න, මේ ඡායාරූපයේ ඉන්න පිවිතුරු ජනක් කුමාරසිංහ, ජපානයේ තානාපතිතුමා. එතුමා කවුද? එතුමා 2022.10.13දා කරපු කථාවක් තිබෙනවා. මේ ඔක්කොම අය ජාතික ජන බලවේගයේ වැඩ කරපු මිනිස්සු. එතුමා මෙහෙම කිව්වා. ජාතික ජන බලවේගයේ රජයක් ආවාම ජනතාවගේ අතමිට සරු කරනවා කියලා කිව්වා. නමුත්, මේ රජයෙන් කරන්නේ රත්‍රන් බිත්තර දමන කිකිළිව මරලා එක පාරටම බිත්තර ටික ගන්න හදනවා වාගේ වැඩක්. මහා භාණ්ඩාගාරය පුරවන්න අද මොනවාද කරලා තිබෙන්නේ? එතුමා ජපානයේ ඉන්න නිසා ඒක දන්නේ නැතිව ඇති. ඊළඟට, ෆ්‍රෙඩ් සෙනෙවිරත්න තමයි පාකිස්තානයේ මහ කොමසාරිස්තුමා. එතුමා මොනවාද කරන්නේ? පාකිස්තානයේ මහ කොමසාරිස්තුමා ත්‍රිවිධ හමුදා සාමූහිකයේ වැඩ කරපු කෙනෙක්. නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, ජපාන තානාපති කාර්යාලයේ කම්කරු අංශයක් ගැන. නේද, නියෝජ්‍ය ඇමතිතුමා? කම්කරු අංශය නොවෙයි, මේ තානාපති සේවයට පැලවත්තේ ඉන්න කම්කරුවෝ ටික ද කොහේද දාලා තිබෙන්නේ. ඉතින්, මේ කියලා තිබෙන දේවල් ඉෂ්ට කරලා තිබෙනවාද? මේ දේවල් කරන්න නේද ඔබතුමන්ලාට ජනතාව ඡන්දය දුන්නේ? දැන් ඇවිල්ලා අපිට බණින්න එපා. දැන් ඇවිල්ලා අපට බණිනවා, තිබුණු ආණ්ඩුවලට බණිනවා. ඒක නේ, රටේ ජනතාව ඔබතුමන්ලාට ඡන්දය ලබා දුන්නේ. ඒ නිසා මම කියනවා, ඔබතුමන්ලා කරුණාකරලා මේ දේවල් හිතට ගන්න කියලා.

අපි මෙතැනට ඇවිල්ලා විදේශගත ශ්‍රමිකයින්ට හොඳ කියනවා; ඔවුන් අපේ රටට එවන සල්ලිවලට අපි ස්තුති කරනවා. ඒ වාගේම අපි බලන්න ඕනෑ, අපි ඔවුන්ට අනෙක් පැත්තෙන් සලකලා තිබෙනවා ද කියලා. ඒ දේවලුත් බලන්න ඕනෑ. මොකද, රට යන්න කලින් තිබෙන ප්‍රශ්න ප්‍රමාණයක් ගැනත් අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කළා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සමහර රටවලින්, interview එකට යන්න කලින් ඩොලර්වලින් මුදලක් ඉල්ලනවා. මම හිතන විධියට, රුමේනියාව වාගේ රටවලින් ඩොලර් 300ක් දක්වා වූ මුදලක් ඉල්ලනවා. මේ ජනතාවට අද බැංකුවලින් ඩොලර් ගන්න පුළුවන්ද? වීසා එක හම්බ වෙනකම් බැංකුවලින් ඩොලර් දෙන්නේ නැහැ. එතකොට පිට රටක ඉන්න කාට හරි වැඳ වැටිලා, එහෙම නැත්නම් ජාවාරම්කාරයෙකුගෙන් තමයි ඩොලර් ටික ගන්න වෙන්නේ. ඒ නිසා, කියන තරම් මේක සැහැල්ලු නැහැයි කියන එක මතක තියා ගන්න. වළං හෝදනවා නොවෙයි, ඒ ඔක්කෝම machinesවලින් කෙරෙන්නේ කියලා දැන් කියන්න එපා. මොකද, ඔය යන ගමන් පොඩ්ඩක් ඒ ගෙවල්වලට ගිහිල්ලා, එහෙම නැත්නම් ඒ අය වැඩ කරන තැන්වලට ගිහිල්ලා බලන්න. පොඩ්ඩක් ඒ තැන්වලට ගිහිල්ලා කථා කරලා බලන්න, ඒ උදවිය විඳින දුක. යුරෝ 50 ඒවා මිටි ගහගෙන, සාක්කුවේ දාගෙන එහෙම යටිමඩි ගහගෙන එනවා. අපි ඒක දන්නවා. හැබැයි, ඒ මිනිස්සු විඳින දුකත් කරුණාකරලා ගිහිල්ලා බලන්න කියලා මම කියනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අර රියැදුරු බලපත්‍ර ප්‍රශ්නය සම්බන්ධයෙන් මැදිහත්වීම වෙනුවෙන් ඉතාම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම බර වාහන සඳහා රියැදුරු බලපත්‍ර ලබා දීමටත් කටයුතු කරන්න. කලින් පැවති ආණ්ඩුවලට බැණ බැණ ඉන්නේ නැතිව ඔවුන් කරපු දේත් යම්කිසි ප්‍රමාණයකින් අගය කිරීමක් කරන්න කියන එකත් මතක් කරමින්, ඔබ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු විජිත හේරත් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.21]

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විදේශ සේවයේ නියුක්ත ශ්‍රී ලාංකිකයන් පිළිබඳව මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට ඇත්තටම මම ස්තුතිවන්ත වෙනවා. අපි රජයක් විධියට මේ කෙටි කාලය තුළ විදේශගත ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් පියවර ගණනාවක් අරගෙන තිබෙනවා. ඉන් පළමුවැනි කාරණය මේකයි. ප්‍රධාන වශයෙන්ම මේ පවතින පනතේ ගොඩක් දුර්වලතා තිබෙනවා. නීතියේ අඩුපාඩුකම් තිබෙනවා. ඒ නිසා අපි නව පනත් කෙටුම්පතක් සම්පාදනය කරලා තිබෙනවා. මේ වෙලාවේත් මගේ ළඟ ඒ පනත් කෙටුම්පත තිබෙනවා. එම පනත් කෙටුම්පත අපි තව ටික දවසකින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුව හරහා සම්මත කර ගන්න බලාපොරොත්තු වෙනවා. ඊළඟට, විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ ඡන්ද අයිතිය ලබාදීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා කමිටුවක් පත් කළා. එම කමිටු වාර්තාව දැන් ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම, මැතිවරණ කොමිසමත් යම් වාර්තාවක් ලබා දීලා තිබෙනවා. මේ වාර්තා දෙකෙනුත් නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිර්දේශ මත පදනම්ව, විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්ද අයිතිය ලබාදීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන්න ඉදිරියේදී පියවර ගන්නවා.

ඒ වාගේම, විදේශගත ශ්‍රී ලාංකිකයන්ට, විශේෂයෙන්ම රැකියාවල නිරත වෙලා සිටින අයට දායක විශ්‍රාම වැටුපක් ලබා දෙන්න අපි විවිධ ආකාරයෙන් මැදිහත් වෙමින් තිබෙනවා. එහි යම් සංකීර්ණතාවක් මතුවෙලා තිබෙනවා. හේතුව තමයි, විදේශගත ශ්‍රී ලාංකිකයින් ඒ රටවල රැකියා කරන්නේ විවිධ මට්ටම්වල වීම. සමහරු වසර 2ක්, සමහරු වසර 4ක්, සමහරු වසර 10ක්, 15ක්, සමහරු වසර 30ක්, 40ක් තිස්සේ සේවය කරනවා. ඒ නිසා විවිධ කාලවකවානු තිබෙනවා. ඒ අනුව පොදු සූත්‍රයක් හදන්න ගියාම යම් සංකීර්ණතාවක් මතු වෙලා තිබෙනවා. නමුත්, අපි ඒ අයට දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙන්න දැනටමත් මැදිහත් වෙලා ඒ සඳහා අවශ්‍ය කරන මූලික කටයුතු කරමින් පවතිනවා. තවම ඒක අවසන් වෙලා නැහැ. අවසන් වුණාම එය සම්පූර්ණ කරලා අපට ඉදිරිපත් කරන්න පුළුවන්. ඊළඟට, ඕනෑම විදේශගත ශ්‍රී ලාංකිකයෙකුට තමන්ට ඇති වෙන ප්‍රශ්නයක්, යෝජනාවක්, තමන්ට ඉදිරිපත් කළ හැකි යෝජනාවක්, අදහසක් ඉදිරිපත් කරන්න අපි ඩිජිටල් තාක්ෂණය හරහා "LankaKonect" කියලා අලුත් app එකක් හඳුන්වා දීලා තිබෙනවා. ඒ app එක හරහා තමන් අතේ තිබෙන ජංගම දුරකථනයෙන් ලෝකයේ ඕනෑම තැනක ඉඳලා අදහසක්, යෝජනාවක්, තමන්ගේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න පුළුවන්. එයට මැදිහත් වීම සඳහා වෙච්ච යන්ත්‍රණයක් විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා අපි හදලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පිටරට රැකියාවලට යවද්දී ඒජන්සිවලින් සල්ලි ගන්න, රැකියාවලට යන අයගෙන් සල්ලි ගන්න ජාවාරමක් පසුගිය කාලය පුරාවට ක්‍රියාත්මක වුණා. ඒක ප්‍රසිද්ධ රහසක්. හිටපු ඇමතිවරු, හිටපු නියෝජ්‍ය ඇමතිවරු ඒජන්සිවලින් සල්ලි ගත්ත ඉතිහාසයක් තිබුණා. නමුත් අද ඒ කිසිවක් නැහැ. ඒ වාගේම අපි ඒ කිසිදු දෙයකට ඉඩ තියලාත් නැහැ. නිලධාරින්ටත් ඒ දේවල් කරන්න අපි ඉඩ තියන්නේ නැහැ. එවැනි අක්‍රමිකතා සිදු කරපු කිහිප දෙනෙකුගේ වැඩ තහනම් කරන්න අපි ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. එවැනි දෙයක් සිදුවෙන බව අපට යම්කිසි ආකාරයකින් දැනගන්න ලැබුණොත් අපි නීතිය ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා විශේෂ විමර්ශන ඒකකයක් පිහිටුවා තිබෙනවා. ඒ විමර්ශන ඒකකයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අයත් ඉන්නවා. ඒ නිසා රහසිගතව හෝ එවැනි දේවල් කරන අය ගැන අපි හොයලා බලනවා. ඒ සඳහාත් අපි ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා.

ඊළඟට, විදේශගත වෙලා නැවත ලංකාවට එන අයට බොහෝ සහන ප්‍රමාණයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඒ අයගේ පාසල් දරුවන්ට අවශ්‍ය පොත්පත් ගන්න ආධාර දෙනවා. විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ආධාර දෙනවා. පහේ ශිෂ්‍යත්ව විභාගය පාස් වෙන දරුවන්ට ආධාර උපකාර ලබා දෙනවා. ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් රුපියල් ලක්ෂ පහේ, රුපියල් ලක්ෂ දෙකහමාරේ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ වාගේම යම්කිසි කෙනෙකු විදේශගත වෙලා සිටියදී මිය ගියොත් ඒ අයට පසුගිය කාලයේ ලබා දුන්නේ රුපියල් ලක්ෂ 6ක වන්දි මුදලක්. අපි බලයට ඇවිල්ලා, අවුරුද්දයි මාස 9යි. දැන්, අපි ඒ අයට රුපියල් ලක්ෂ 20ක් ලබා දෙනවා. අපි ඒ වන්දි මුදල වැඩි කළා. එවැනි පියවර ගොඩක් අපි අරගෙන තිබෙනවා.

ඒ වාගේම කාලයක් තිස්සේ තිබුණු ප්‍රශ්නයක් තමයි, ඉතාලියේ රියදුරු බලපත්‍රය - ලයිසන් එක - ලබා ගන්න එක. අපි ඇවිල්ලා, කෙටි කාලයක් තුළ ඒ ප්‍රශ්නය අවසන් කළා. දැන් ඒ රියදුරු බලපත්‍ර ප්‍රශ්නය විසඳලා තිබෙනවා. බර වාහන රියදුරු බලපත්‍රය සඳහා ඉතාලි ආණ්ඩුව එකඟ වුණේ නැහැ. අපි ඒ ගැන සාකච්ඡා කළා. කලින් අවස්ථාවේ ගිවිසුම අත්සන් කරද්දී බර වාහන රියදුරු බලපත්‍රයත් ඒගොල්ලෝ පිළිගත්තා. නමුත් මෙදා සැරේ තදින්ම කිව්වා, ඒක පිළිගන්න බැහැ කියලා. කලින් ඒ බලපත්‍රය ලබා දීපු අය කරපු වැරදි නිසා ඒක ලබා දෙන්න බැහැ කිව්වා. දැනට තිබෙන තත්ත්වය ඒක තමයි. ඉදිරියේදී ඒක ලබාගන්න පුළුවන් වෙයිද කියන එක දැන් නිශ්චිතවම කියන්න බැහැ. නමුත් අපි ඒකට උත්සාහ කරනවා. මේ අවබෝධතා ගිවිසුමට ඒක ඇතුළත් කරන්න ඉතාලි ආණ්ඩුව විරුද්ධ වුණා. යුරෝපයේ වෙනත් රටක බර වාහන රියදුරු බලපත්‍රයක් තිබෙනවා නම් ඉතාලිය ඒක පිළිගන්නවා. නමුත් දැන් ලංකාවේ බර වාහන ලයිසන් එක පිළිගන්නේ නැහැ.

ඒ වාගේම රෝමයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ඉඩපහසුකම් මදියි කියපු කාරණාව මම පිළිගන්නවා. අපි දැනටමත් තානාපතිවරයාට කියලා තිබෙනවා, අලුත් තැනක් හොයන්න කියලා. අපි තානාපති කාර්යාලය අලුත් තැනකට ගෙන යන්න සැලසුමක ඉන්නවා. එතකොට එතැන තිබෙන ඉඩපහසුකම් නැති එකට පිළිතුරක් ලැබෙනවා. ඒකට අවශ්‍ය මූලික පියවර පිළිබඳව අපි දැනුම් දීලා තිබෙනවා. ඒ වාගේම තානාපති කාර්යාලවලදී අපේ ලාංකිකයන්ගේ සහතික පත්‍ර, සහතික කිරීම වැනි දේවල් කඩිනම් කිරීම සඳහාත් අපි විවිධ පියවර අරගෙන තිබෙනවා. සමහර තැන්වල යම් යම් ප්‍රමාදයන් ඇතිවෙන බව ඇත්ත. අපි ඒවාත් නිවැරදි කරන්න යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. අපි පසුගිය අවුරුද්දේ වෙනමම මුදල් වෙන්කරලා, සියලුම තානාපති කාර්යාලවල කොන්සියුලර් අංශයට අවශ්‍ය කරන යටිතල පහසුකම් වර්ධනය කරන්න මුදල් ලබා දුන්නා. මේ වෙනකොට ගොඩක් තැන්වල වෙනස්කම් සිදුකරලා තිබෙනවා. තව වෙනස් කළ යුතු තැන් බොහෝ ප්‍රමාණයක් තිබෙනවා. අපි ඒකටත් ප්‍රමුඛතාව දීලා තිබෙනවා.

ඊළඟට, කටාර්වල ප්‍රශ්නයකුත් මතු කළා, රැකියා 420ක් තානාපති කාර්යාලය භාරගත්තේ නැහැ කියලා. ඔව්, ඒක ඇත්ත. එහේ කොම්පැනියකින් රැකියා 420ක් ඇවිල්ලා තිබුණා. අපි ඒක සහතික කරලා නැත්තේ, 2024දී ඒ ආයතනය තුළ හට ගත් ගින්නක් නිසා අනතුරට පත් වූ ලාංකිකයන් දෙදෙනෙකුට කටාර්

[ගරු විජිත හේරත් මහතා]

රියාල් 80,000ක් සහ 51,000ක් වශයෙන් කටාර් රියාල් 131,000ක වන්දි මුදලක් ලබා දෙන්න තිබුණත් ඒ වන්දි මුදල් තවම ලබා දීලා නැති නිසායි. ඒ සම්බන්ධව අපි දිගින් දිගටම මැදිහත් වෙනවා. අපි ඒ company එකට කිව්වා, ඒ මුදල ලබා දෙන තෙක් ඒ රැකියා අවස්ථාවට අදාළව ගිවිසුම් අත්සන් කරන්නේ නැහැ කියලා. ඒක තමයි ඇත්ත කථාව. මොකද, අපි යම් ආයතනයක් එක්ක රැකියා ගිවිසුම් අත්සන් කරද්දී ඒ අය බැඳිලා ඉන්නවා, යම්කිසි අනතුරක් වුණොත් අපේ ලාංකිකයින්ට වන්දි ගෙවන්න. වන්දි ගෙවන්නේ නැත්නම් අපේ අයගේ ජීවිත අනතුරට ලක් වනවා. ඒ නිසා අපේ පැත්තෙනුත් අපි යම් යම් ක්‍රියාමාර්ග ගන්නවා, ඒ වන්දි ලබා ගැනීම සඳහා. ඒක තමයි ඇත්ත තත්ත්වය.

ඊළඟ කාරණය මේකයි. ආදායම් අඩුවීමක් වෙන්නේ නැහැ. ලබන අවුරුද්දේ ආදායම් අඩු වනවා කියලා බය කරන්න එපා. අපි ඇවිල්ලා තවම අවුරුද්දයි. අපේ ආණ්ඩුව බලයට පත් වෙලා ගත වුණු පළමුවෙනි අවුරුද්ද ලංකා ඉතිහාසයේ විදේශ ප්‍රේෂණ වැඩිම ප්‍රමාණයක් ලැබුණු අවුරුද්ද බවට අපි පත් කළා. ඒ අවුරුද්ද තුළ ඩොලර් බිලියන 8ක් අපි ලබාගෙන තිබෙනවා. මේ අවුරුද්දේ මේ මාස හයට - මැද පෙරදිග යුද්ධය තිබෙන වෙලාවේත් - ඩොලර් බිලියන 4.75ක් ලංකාවට එවා තිබෙනවා. මැද පෙරදිග, යුරෝපය සහ ඕස්ට්‍රේලියාව ඇතුළු විවිධ රටවල වැඩ කරන අපේ ලාංකිකයෝ මේ මාස 6ටත් ඩොලර් බිලියන 4.75ක් එවා තිබෙනවා. ඉතිරි මාස හයේත් ඒ විධියේ ප්‍රමාණයක් එව්වත් ඩොලර් බිලියන 9 ඉක්ම වූ විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් අපේ රටට ලැබෙනවා. ඒ නිසා එහි අඩුවීමක් වන්නේ නැහැ. අපි ස්තුතිවන්ත වනවා වාගේම අපේ ගෞරවය සහ ප්‍රණාමය පුද කරනවා, විදේශගත සියලුම ශ්‍රී ලාංකිකයින්ට. ඔබ ඒ රටවල සේවය කර එවන සල්ලිවලින් තමයි පසුගිය කාලයේ බංකොලොත් කරපු රට නැවත අපි ගොඩ ගත්තේ. ඒ නිසා ඔබට අපගේ ප්‍රණාමය නැවතත් පිරිනමනවා.

අලුත් රැකියා අවස්ථා ගැන කථා කළොත්, අපි අලුත් රැකියා අවස්ථා හොයා ගන්නවා. ජපානයේ අලුත් රැකියා වෙළෙඳ පොළක් අපට ලැබී තිබෙනවා. අපි බලයට ආ මේ කෙටි කාලය තුළ අවබෝධතා ගිවිසුම් 3ක් අත්සන් කර තිබෙනවා. ජපානයට truck driversලා 1,000ක් යවන්න පුළුවන්. හෙට වුණත් යවන්න පුළුවන්. එකම සුදුසුකම වශයෙන් ඔවුන් ඉල්ලන්නේ, ජපන් භාෂාව පිළිබඳ විභාගය - JLPT Level 4 එකත්, JFT එකත් - පාස් වෙලා තිබීම. ජපන් භාෂාව යම් මට්ටමකට කථා කරන්න පුළුවන් කියන ඒ පරීක්ෂණය සමත් වෙලා තිබෙනවා නම් ඒ ගිවිසුම අනුව අපි දැනටත් රැකියා අවස්ථා 1,000ක් අරගෙන තිබෙනවා. ඒ, ජපානයේ truck driversලා සඳහා. අපේ රටේ එහෙම සුදුසුකම් තිබෙන අය ඉන්නවා නම් ඔවුන්ට අපි ආරාධනා කරනවා හෙටම ඉදිරිපත් වන්න කියලා. මොකද, රැකියා අවස්ථා 1,000ක් තිබෙනවා. ඉක්මනින් යවන්න පුළුවන්. ඇත්තටම ගත්තොත්, බර වාහන රියදුරු බලපත්‍රය අවශ්‍ය නැහැ. සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රය තිබෙනවා නම් ඒ අවශ්‍ය කරන පුහුණුව ඒ රටේදී මාස 3ක් ඇතුළත ලබා දෙනවා. මේ රැකියා අවස්ථාව තිබෙනවා, අපි අත්සන් කරපු ගිවිසුම අනුව.

ඒ වාගේම තමයි, ජපානයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේත් රැකියා අවස්ථා සඳහා අපි ගිවිසුමක් අත්සන් කළා. ඒ හරහා අපට රැකියා අවස්ථා ලැබී තිබෙනවා. දැනටමත් තරුණ සේවා සභාව හරහා සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයේ ජපන් භාෂාව සහ විදුලි කාර්මික සේවය පිළිබඳ පුහුණු කිරීමක් සිද්ධ වනවා. තරුණයින් කණ්ඩායමක් එතැන පුහුණුවීම් පටන් ගෙන තිබෙනවා. ඒ හරහාත් අපට තව බොහෝ පිරිසක් යවන්න පුළුවන්. එතැනදීත් සුදුසුකම් වශයෙන් ඉල්ලනවා, වෘත්තීය හැකියාව සහ භාෂා හැකියාව. ඒ අවස්ථාවත් අපි අරගෙන තිබෙනවා.

ඊළඟට මම කියන්න කැමැතියි, ජපානයට පුහුණු ශ්‍රමිකයින් සහ වෘත්තියවේදීන් යවන්න, උපාධිධාරීන් - graduatesලා - යවන්න අපි මේ සතියේ ගිවිසුමක් අත්සන් කරන බව. අපි අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනවා, ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් ජපානයේ රැකියා සඳහා යවන්න. මේවා මේ කෙටි කාලය තුළ අප ලද අලුත් අවස්ථා. අපි ඇවිත් අවුරුද්දයි මාස 9යි. අපි අලුත් අවස්ථා, වෙළෙඳ පොළවල් සොයලා තිබෙන්නේ. ඒ, මැද පෙරදිග රටවල විතරක් නොවෙයි. ඇත්තටම ගත්තොත්, මැද පෙරදිග රටවලට දැන් කාන්තාවන් වැඩිපුර යන්නේ නැහැ. සවුදි අරාබිය ගත්තොත්, වැඩියෙන් වැඩ කරන්නේ පිරිමි. කාන්තාවන් අඩු වෙලායි තිබෙන්නේ. පොදුවේ ගත්තත් මැද පෙරදිග කලාපයේ රටවලට ලංකාවෙන් යන ශ්‍රමිකයින්ගෙන් වැඩි ප්‍රතිශතයක් යන්නේ පිරිමි අය. කාන්තාවන් නොවෙයි. පුහුණු ශ්‍රමිකයින් යවන එක අපි ක්‍රමානුකූලව වැඩි කරමින් තිබෙනවා. අපේ ඉලක්කය තිබෙන්නේ, housemaidsලා යවන එකට එහා ගිහිල්ලා වෘත්තිකයින් සහ පුහුණු ශ්‍රමිකයින් පිටරට රැකියා සඳහා යැවීම. ඒ කාරණය අපි ඉතා වගකීමෙන් කියන්න කැමැතියි.

ඊශ්‍රායලය සම්බන්ධයෙන් ගත්තොත්, පසුගිය 2025 අවුරුද්දේ රජය මඟින් යවලා තිබෙනවා, 8,931දෙනෙක්. පෞද්ගලික ආයතන හා ඒජන්සි මඟින් 3,264ක් යවලා තිබෙනවා. තනි තනිව - individually - රැකියා හොයාගෙන තිබෙනවා, 1,054දෙනෙක්. ඒ කියන්නේ පසුගිය අවුරුද්ද පුරාවට ඊශ්‍රායලයට විතරක් 13,249ක් අපි රැකියා අවස්ථා සඳහා අලුතෙන් යවලා තිබෙනවා. මේ අවුරුද්දේ ගෙවිච්ච මාස කිහිපයට විතරක් 6,435ක් ඊශ්‍රායලයට ගිහිල්ලා තිබෙනවා. ඉතිරි මාස 6ට තව ගිවිසුම් ගොඩක් ඇවිල්ලාත් තිබෙනවා. ඊශ්‍රායලයට යාමට සුදුසුකම් ලබා website එකෙන් තේරී පත් වෙලා ඉන්න පිරිසක් දැන් එළියේත් ඉන්නවා. ඒගොල්ලන් කලබල වෙන්න එපා. මම ඒගොල්ලන්ට ඉතාම ඕනෑකමින් මෙය කියනවා. ඔබට අවස්ථාව තිබෙනවා, ඊශ්‍රායලයෙන් ඒ job agreement එක ආපු ක්ෂණයෙන්ම ඔබව ඊශ්‍රායලයේ රැකියා සඳහා යවනවා.

ඊශ්‍රායලයේ හෝ වෙනත් රටක රැකියා සඳහා යද්දී අපේ Bureau එකේ නීතිය තමයි, විදේශ රැකියාවෙන් ලැබෙන වැටුප වාගේ දෙගුණයක් පමණයි පෞද්ගලික ඒජන්සියකට අය කරන්න පුළුවන් වන්නේ කියන එක. ඒ කියන්නේ, සාමාන්‍යයෙන් ඊශ්‍රායලයේ රැකියාවකදී ලංකාවේ මුදලින් රුපියල් ලක්ෂ 9ක හෝ 10ක වැටුපක් හම්බවෙනවා නම්, අපේ රටේ පෞද්ගලික ඒජන්සියකට උපරිම වශයෙන් අය කරන්න පුළුවන් වන්නේ රුපියල් ලක්ෂ 18යි, 20යි. රුපියල් ලක්ෂ 40ක්, 45ක් ගන්න බැහැ. එම නිසා, ඒ විධියට සල්ලි දෙන්න එපා. පෞද්ගලික ඒජන්සිවලට එහෙම සල්ලි ගෙවන්න එපා කියලා පෞද්ගලික ආයතන හරහා ඊශ්‍රායලයේ රැකියාවලට යන්න බලාපොරොත්තු වන අයට අපි කියනවා. මොකද නීතියක් තිබෙනවා, උපරිම වශයෙන් අය කරන්න පුළුවන් තමන්ගේ වැටුප වාගේ දෙගුණයක් පමණයි කියලා. ගනු ලබන මුදල් ප්‍රමාණය අනිවාර්යයෙන්ම website එකේ පළ කරන්න ඕනෑ, ඒ වාගේම ඒක Bureau එකට දැනුම් දෙන්නත් ඕනෑ. එම නිසා පෞද්ගලික ආයතන හිතුමනාපයට සල්ලි ගන්නවා නම් ඒක වැරදියි. ඔබ එහෙම සල්ලි දෙන්නත් එපා. දුන්නේ නැත්නම් ඔවුන්ට එහෙම සල්ලි ගන්න බැහැ නේ. ඒ කාරණයත් කියන්නම ඕනෑ.

අද තවත් යෝජනාවක් ඉදිරිපත් වුණා, උතුරු පළාතට අපේ Bureau එකේ centre එකක් හදන්න කියලා. ඔව්, අපට ඒ සඳහා සැලසුමක් තිබෙනවා. අපි ඒ කටයුත්ත ඉක්මනින්ම අවසන් කරන්න බලාපොරොත්තු වනවා. මොකද, පසුගිය කාලය තුළ උතුරු පළාතේ එවැනි centre එකක් ඇති වුණේ නැහැ. විදේශ රැකියා සඳහා පුහුණු වෙන්න බලාගෙන සිටින තරුණ තරුණියන් උතුරේත් ඉන්නවා. අපි ඉක්මනින්ම ඒ කටයුතු ආරම්භ කරලා ක්‍රියාත්මක කරනවා.

අද සමහර පෞද්ගලික විදේශ රැකියා ඒජන්සි විවිධ ආකාරයට සල්ලි ගන්නවා. ඒ වාගේම job visa දෙනවා කියලා අතරමං කරලා එනවා. එවැනි ජාවාරම්වලට අහුවෙන්න එපා, එවැනි අයට සල්ලි ගෙවන්න එපා. මේක රජය මඟින් කරන වැඩක් නොවෙයි, විවිධ ආයතන මඟින් නීති විරෝධීව කරන දෙයක්. අපේ තරුණ තරුණියන් එවැනි ජාවාරම්වලට අහුවෙලා තමන්ගේ සල්ලි ටිකත් නැති කරගෙන, ඇත්තටම තමන්ගේ ජීවිතයත් අනාථ කර ගන්නවා. අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, එවැනි ඒජන්සිවලට අහුවෙන්න එපා කියලා. එවැනි තොරතුරක් ලැබුණොත් පොලීසිය හෝ අපේ විශේෂ ඒකකයෙන් ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වනවා, අදාළ අය අත්අඩංගුවට ගන්නවා, උසාවියට දාලා නීතිය ක්‍රියාත්මක කරනවා.

ඒ පැත්තෙන් අපි ඒ මෙහෙයුම පටන් අරගෙන තිබෙනවා. ඒ සඳහා තමයි සමහර නීති තද කළ යුත්තේ. මීට අදාළව පනතේ තිබෙන නීති ප්‍රමාණවත් නැහැ. ඒ නිසා අපේ අලුත් නීතිය හරහා එවැනි වැරදි කරන ඒජන්සි හෝ වැරදි කරන වෙනත් කවුරු හෝ අහුවුණොත්, ඒ අයට දෙන දඬුවම, ඒ අයගෙන් අය කරන දඩ මුදල වැඩි කරන්න අපි මේ අලුත් පනත මඟින් යෝජනා කරලා තිබෙනවා. ඒ මඟින් දැනට සිදු වන යම් යම් ජාවාරම් ක්‍රමානුකූලව අඩු කරන්න අපි බලාපොරොත්තු වනවා.

අවසාන වශයෙන් අපි සියලුම විදේශගත ශ්‍රී ලාංකිකයින්ට කියන්න ඕනෑ, මේ කෙටි කාලය තුළ විදේශ සේවා නියුක්ති කාර්යාංශය විධියට, ඒ වාගේම අමාත්‍යාංශය විධියට අපි ඔබගේ ජීවිතවල අයිතිය ආරක්ෂා කරන්න, ඔබගේ ගරුත්වය ආරක්ෂා කරන්න ක්‍රමානුකූලව පියවර ගණනාවක් අරගෙන තිබෙන බව. ඒ වාගේම ඔබ මේ රටට කරන සේවය වෙනුවෙන් ඔබේ ඒ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න රජයක් විධියට අපි උපරිමයෙන් බැඳී සිටිනවා, අපි ඒ වෙනුවෙන් කටයුතු කරනවා කියන සහතිකය ලබා දෙමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.37ට, 2026 ජූලි 09වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.37க்கு, பாராளுமன்றம் 2026 யூலை 09, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.37 p.m. until 9.30 a.m. on Thursday, 09th July, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.